සිංහල ව්‍යාකරණ-

# සිදත්සඟරා සන්නය.

කොළඹ විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ

ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය

හික්කඩුවේ

## ශ්‍රී සුමඞ්ගල ප්‍රධාන නායක

ස්ථවිරයන්වහන්සේ විසින් කරණලදී.

ජේ. ඩී. ප්‍රනාන්දු විසින්

හතරවෙනි වරම

කොළඹ

ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රණයකරවා ප්‍රසිඞ කරණලදී.

1914.

# THE SIDATSANGARA.

BY THE

VEN. ANAVAMADARSI

WITH

A COMPLETE COMMENTARY

BY THE

Rt. Rev. H. Sri SUMANGALA
CHIEF HIGH PRIEST

AND

THE LATE PRINCIPAL

OF

VIDYODAYA ORIENTAL COLLEGE.

---

FOURTH EDITION.

---

PRINTED & PUBLISHED BY

J. D. FERNANDO,

AT THE GRANTHAPRAKASA PRESS,

COLOMBO.

1914.

# විඥාපනය.

---

මෙම සිද්ධාන්තසංග්‍රහය ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 1791 ක් වන්නෙහි හෙවත් ක්‍රිස්තු වර්ෂයෙන් 1247 වන්නෙහි රාජ්‍යශ්‍රීපදප්‍රාප්ත **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහානරේන්ද්‍රයන්ගේ** කාලයෙහිදී **ප්‍රතිරාජදේව** නම් එතුමන්ගේ අමාත්‍යයන් විසින් ආරාධනා කරණලදින් ප්‍රතිරාජපරිවෙණාධිපති නානාශාස්ත්‍රප්‍රවීණ ආචාර්ය **අනවමදර්ශිනම් මහාස්ථවිරපාදයන්වහන්සේ** විසින් සංග්‍රහකරණලදී මෙම සංග්‍රහයෙහි කොතැන්හිවත් ග්‍රන්ථකර්තෘගේ නාමය නොදක්වනලදින් වර්තමානකාලික පණ්ඩිතයන් අතර සංග්‍රහකර්තෘ සම්බන්ධ නානා මත පවත්නාබව පෙණේ. සංග්‍රහකර්තෘ විජානනය සඳහා මෙහි යොදනලද්දේ **"පතිරජපිරුවන"** යන්න පමණසි. ඉන් මෙය සංග්‍රහකෙළේ ප්‍රතිරාජපරිවෙණාධිපතියන් විසින්සී හැඟෙනවා විනා සංග්‍රහකර්තෘගේ සම්පූර්ණ නාමයක් නොහැඟෙසි. මෙය සංග්‍රහකෙළේ ආනන්දාභිධාන වනරතන ස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ වෛදෙහ ස්ථවිරපාදයන්වහන්සේ විසින්ය යනු වර්තමානකාලික බොහෝ පණ්ඩිතයන්ගේ කල්පනාසි. එය ස්ථිරකරණු සඳහා ඔවුන් කියන කාරුණුනම් —

> " යෝ'කා සීහලභාසාය සීහලං සද්දලක්ඛණං,
> යො ච සමන්තකූටස්ස වණ්ණනං වණ්ණයී සුභං,
> තෙන වෙදෙහථෙරෙණ කතා'යං රසවාහිනී"

යන ආදියසි. මින් හැඟෙන්නේ වෛදෙහ ස්ථවිරපාදයන් විසිනුත් සිංහල ශබ්දලක්ෂණයක් කළබව මිස **සිදත්සඟරා** නම් මෙම ප්‍රකරණය එතුමන් විසින් කළබවක් නොවෙසි.

මෙම කියූ වෛදෙහ **අනවමදර්ශි සහ ස්ථවිරපාදයන්** කලිකාල සාහිත්‍ය පණ්ඩිත පරාක්‍රමබාහු මහරජානන්ගේ කාලයෙහිම වැජඹුනු බව පුරාණ කථාවලින් පෙණෙසි. නුමුත් එතුමන් දෙපලම ප්‍රතිරාජ පිරිවෙණේ අධිපතිව සිටිබවක් දැනගන්නටද නැත්තේසි. ඒ එසේ නුමුත් ප්‍රතිරාජපරිවෙණයෙහි අධිපතිභාව උසුලනලද්දේ දෛවඥ සාමමෙධතු ආදියෙහි කර්තෘභූත ආචාර්ය **අනවමදර්ශි** මහාස්ථවිරපාදයන් විසින්ය යනු,

> " ප්‍රතිනෘපති මහාවිහාරනෙතා
> ක්ෂිතිසුරවංශජනිර්මුනීන්ද්‍රසූනුඃ,
> මුනිරනවමදර්ශිනාමධෙයඃ
> පරමකරොත් කරණං පරොපකාරම්".

යනුවෙන් පෙණේ. මහරජතුමා ප්‍රතිරාජ දෙවාමාත්‍යයන් ලවා අත්තනගලු තුවර තුන්මහල් ප්‍රාසාදයක් කරවා **අනවමදර්ශි ස්ථවිරයන්ට** පිදූබවද,

> " තතො ගන්ත්වාන සොභන්තං වනගලල්ලවිහාරකං,
> රක්ඛණූවුත්තනියාමෙන කත්වා බහු ධනබ්බයම්.
> කාරාපෙත්වාන පාසාදං තුඞ්ගසීමං තිභූමකං,
> **අනොමදස්සි** නාමස්ස මහාසාමිස්ස ධීමතො,
> තං දත්වාන තතො තස්ස මහාරාජනියොගතො.
> දානවට්ටම්පි කප්පෙත්වා සිලාලෙඛමකාරයී".

ඌහුමෙන් පෙණෙයි. එහෙයින් අනවමදර්ශී ස්ථවිරපාදයන් අත්තනගලු විහාරයෙහි වැඩසිටිබව හැඟේ. ප්‍රතිරාජපිරිවෙණ තිබුණේ කොතැන්හිදැයි නිශ්චයකොට කියනොහැකියි. තුමුත් අත්තනගලු විහාරයෙහි ප්‍රතිරාජ නමින් පිරිවෙණක් තිබුනුබවක් දැනගන්නට නොමැතිනිසා **අනවමදර්ශී ස්ථවිරයන්වහන්සේ** මෙසේ දෙතන්හිම වැඩසිටිබව පෙණේ.

මෙයින් ප්‍රතිරාජපරිවෙණාධිපති ස්වාමින් විසින් විරචිත මේ සිද්ධාන්ත සඞ්ග්‍රහයේ අවසානයෙහි පෙණෙන ඉෂ්ටානිෂ්ටාධිකාරය හා අලඞ්කාරාධ්‍යායද ව්‍යාකරණයට ඇතුළත්නොවේ, අලඞ්කාරාධ්‍යායාරම්භයෙහිවූ "පදිදුබාමැද සසඳ සඳ සමස්පස්" යනාදිය ව්‍යාකරණ වශයෙන් යෙදියහැක්කේවීනමුත් එහෙද අලඞ්කාර ශාස්ත්‍රාගතනයින් ප්‍රකාශිතයි—ඉෂ්ටානිෂ්ටාධිකාරයෙහි ලෝකයට රෝග ශෝක මරණයන් දීමට ක්‍රමය උගන්වාතිබේ-මේ ග්‍රන්ථකර්තෘවයෙහි සලකණලද මෙදෙක ස්ථවිරයන්වහන්සේ හෝ අනවමදර්ශී ස්වාමින්වහන්සේ හෝ ඒ ක්‍රම ඉගැන්වූයේයයි සිතිය නොහැකිවේ. එය ග්‍රන්ථයෙහි අනාගත වූකල්හි ඒ ග්‍රන්ථයද අනර්ථජනක සංඛ්‍යාවට ඇතුළත්වේ මාරණාදි මන්ත්‍රකම්ද භික්ෂූන්ට තහනම්කරණලදී. එහෙයින් මේ රෝග ශෝක මරණ ව්‍යසන දෙන්නාවූ අනර්ථජනක ඉෂ්ටානිෂ්ටාධිකාරය මේ සිද්ධාන්තසඞ්ග්‍රහයට ඇතුළත්නොවේමැයි සිතම්හ. අලඞ්කාර ශාස්ත්‍රශික්ෂාවට යෝග්‍යවූ ස්වභාෂාලඞ්කාරාදි පොත් රාශියක් සිංහල ශිෂ්‍යයන්ට විද්‍යමානයි-මේ සිදත්සඟරාවේ දැක්වූ ලකර අදියරින් අලඞ්කාර ශාස්ත්‍රය මධ්‍යම ප්‍රමාණයෙන්වත් උද්ග්‍රහණය නොකොට හැකිවේ—එබැවින් මේ ස්වල්පය දක්වීමෙන් විපුල ප්‍රයෝජනයක් නොවේ-මෙසේයින් මේ ඉෂ්ටානිෂ්ටාධිකාරයෙහි උගන්වනු ලබන ජනයාට ව්‍යාධිමරණදීම සාමාන්‍ය බෞද්ධොපාසකයෙකුත් නොකරණ ක්‍රියාවකි. එබැවින් මේ සිද්ධාන්තකර්තෘ ස්ථවිරස්වාමින් විසින් ඒ ඉෂ්ටානිෂ්ටාධිකාරය හා අලඞ්කාරාධිකාරයද නොකළබැව් සැලකියයුතුයි-එබැවින් මේ සිංහල ව්‍යාකරණයට ඒ ඉෂ්ටානිෂ්ටාධිකාරාදිය ඇතුළත් නොකරණලදී. මේ සිංහල ව්‍යාකරණවූ සිද්ධාන්තසඞ්ග්‍රහනම් ශබ්දශාස්ත්‍රයට විස්තර ව්‍යාඛ්‍යානයක් බාලයන්ගේ සුඛාවබෝධය පිණිස අතිශයින්ම අභිමතහෙයින් විද්‍යෝදය පරිවෙණාධිපති **ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන ප්‍රධාන නායකස්වාමීන්වහන්සේ** විසින් එය රචනාකරණලදුව සමයසඞ්ග්‍රහයෙහි මුද්‍රිතකොට ප්‍රසිද්ධ කරණලදී. නැවතද එය වෙන්වශයෙන් පොතක්කොට තිපවරක් මුද්‍රිතකරවා ප්‍රසිද්ධකරණලදී. හතරවෙනි වර මෙහි පහත නම්ලේඛක මවිසින් විද්‍යෝදය පරිවෙණාධිපති **ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය ශ්‍රී ඥානේශ්වර ප්‍රධාන නායක** ස්වාමින්වහන්සේගේ අවසරයපිට මුද්‍රණය කරවනලදී.

**ජේ. ඩී. ප්‍රනාන්දු.**



ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය
හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගල ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ.

# සිංහල ව්‍යාකරණ.

ව්‍යාකරණනම් අර්ථවත් ස්වභාවයෙන් ශබ්දයන් පිළිවෙළ කරණ ශාස්ත්‍රයයි—හෙවත් අර්ථ නියමවන පිළිවෙළට වචන ගැළපීමේ ශාස්ත්‍රයවේ-"ව්‍යාකරණ" යන ශබ්දයේ අර්ථයනම් විශෙෂයෙන් ප්‍රකාශකිරීමයි-එය, ඒ ඒ භාෂාවන් අර්ථ නියම විධියට ගළපන්නට කාරුණ්‍යවූ ශාස්ත්‍රයෙහිද, රූපාරූප ධර්ම විභාග වශයෙන් සර්වඥයන්වහන්සේ විසින් දෙශනාකරණලද අභිධර්මයෙහිද, ශබ්දයන් යහපත් භාවයෙන් අවබොධකරවන වෙදාඞ්ග ශාස්ත්‍රයෙහිද වෙදාන්ත ශාස්ත්‍රයෙහි කියනලද නාම රූප දෙකින් ලොකය ප්‍රකාශකිරීමෙහිද; වැටේ.

මාගධ ව්‍යාකරණ, සංස්කෘත ව්‍යාකරණ, යනාදීන් කියන තන්හි ඒ ඒ භාෂාවල අර්ථ නියමවන පිළිවෙළින් පද ගැළපීමට කරණලද ශබ්දශාස්ත්‍රයෙහි වැටේ.

සිංහල ව්‍යාකරණ යන තන්හිදු එබදු අර්ථඇති හෙයින් සිංහල භාෂාව අර්ථාවිපරිතවූ ක්‍රමයට පද ගළපන ශාස්ත්‍රය සිංහල ව්‍යාකරණ නම්වේ.

පූරාණ කාලයෙහි; සිංහල භාෂාවට කරණලද නොයෙක් ව්‍යාකරණ පොත් තිබුනුබව පූරාණ කථාවලින් ප්‍රකාශවන නුමුත් ඒ පොත් කලින්කල නැතිවීයාමෙන් දැන් එයින් ඉතිරිව තිබෙන්නේ ප්‍රතිරාජ පරිවෙන සාමීන් විසින් කරණලද සිදත් සඟරාව පමණකි-ඊට සංස්කෘත ශබ්ද ව්‍යවහාරලෙසින් කියන ලද්දේ "සිද්ධාන්තසංග්‍රහ" යන නාමයයි-එහි වචනාර්ථයනම්, සිද්ධකරණලද අන්තය යමකින්ද ඒ සිද්ධාන්තයි—ප්‍රමාණාදිය හෙලා පළමු තිබුනු පක්ෂයහැර සිද්ධකරණලද පක්ෂය පිහිටු වන ස්වභාවවූ වාක්‍ය සමූහයක් සිද්ධාන්ත නම්වේ.

සිදත්සඟරාවෙහි මෙසේයි—මහඉසුරු, මහඋර, ලඹඋදරා යනාදිය පූර්වපක්ෂයට අයිතියි-ඒ පළමු තිබුනු පක්ෂයහැර සිද්ධ කරණලද පක්ෂය මෙහෙසුරු, මොහොර, ලඹෝරා යනාදියයි. මෙබදු පිහිටුවනලද වාක්‍ය සමූහයක් සිද්ධාන්ත නම්වේ.

සඞ්ග්‍රහ යනු, සමූහයෙහිද, සංක්ෂෙපයෙහිද, බොහෝ අර්ථ ඇති වාක්‍යයන් එකතැන එකතුකිරීමෙහිද වැටේ-මෙතැන්හි සංක්ෂෙපාර්ථය අභිමතවේ—එහෙයින් සිද්ධකරණලද අන්ත ඇති සංක්ෂෙපවූ ප්‍රකරණය "සිද්ධාන්ත සංග්‍රහ" නම්වේ.

සිද්ධාන්ත සංග්‍රහයේ සමහරතැන් ඉතා සංක්ෂිප්ත නමුත් නැණවත් ගුරුවරයන්ගේ උපදෙශයෙන් විස්තරදැනීම දුෂ්කර නොවේ-සිංහලභාෂාව අවුරුදු දහස්ගණනක් මනුෂ්‍යයන්ගේ කථාව්‍යවහාරයෙහි පවත්නාහෙයින් කලින්කල භාෂාවේ වාග්ව්‍යවහාරය වෙනස්ව එන බැවින් පූරාණ කරණලද සිදත් සඟරා නම්වූ ව්‍යාකරණය මේ කාලයෙහි පවත්නා භාෂාවේ වචන ගැළපීම පිණිස ප්‍රමාණ නොවේයයි ඇතැම් පණ්ඩිත යන්ගේ මතයකි-සිදත්සඟරාවෙන් පූරාණකාලයෙහිවූ වාග් ව්‍යවහාරයට අයිතිවූද පූරාණ ලියනලද පොත්වල වාක්‍ය ගැළපීමට අයිතිවූද ව්‍යාකරණවිධි සම්පූර්ණයෙන් ඉගෙණ ගැණීම හැකිවේ. එසේ උගත්කල්හි මේ කාලයෙහි කථා ව්‍යවහාරයෙහි පවත්නා වෙනසද ලියුම්වල පවත්නා ව්‍යක්ත ව්‍යවහාරයෙහි ඇත්තාවූ ස්වල්ප වෙනසද දැනගතහැකිවේ.

එසේහෙයින් මේ කාලයෙහිදු; සිදත්සඟරාවෙන්ම සිංහල ව්‍යාකරණ ඉගෙණගැන්ම යොග්‍යවේ.

ඊට කරණලද පූරාණ සන්නවලින් එකක් ඉතාම යහපත් නුමුත් කොයියම් සන්නයක්වත් සිදත්සඟරාවට කවඳුනු විස්තර නැතිහෙයින් අලුත ඉගෙණගන්නාවුන්ට පදාර්ථ භාවාර්ථ දෙක සුවසේ දැනගතනොහැකිවේ.

මේ කාලයෙහි ඉගෙණගන්නාවුන්ට ඒ සන්නවල විස්තර නැති තැන් විස්තරකරදීම යොග්‍යබැවින් ඒ සඳහා මේ ව්‍යාඛ්‍යානය කරණලදී.

# නමව් මුනි සරණ.

මහද ගඳකිළිකර සව්නේ ගෙවාදත්හට,
දුහුනන් දැනුම් සඳහා කරමෙණම් සිදත්සගරා-a
සදරුත්විදි සියල්-අනුරූ සේ පියෝනන්,
ඉති සත් සඳ සමස් ඇ-වහරනුසෙරෙන් සපසා-b

a පදාර්ථ-සව්නෙන්, සියලු දතයුතුදේ; ගෙවා, අවසන්කොට; දත්හට, අවබොධකළාහට; මහද, මාගේ සිත; ගඳකිළිකර, ගන්ධකුටියක් (සුවඳගෙයක්) කොට; දුහුනන්, ආධුනිකයන්ගේ; (අළුත් අයගේ) * දැනුම් සඳහා, දැනගැන්ම පිණිස; සිදත්සගරා, සිද්ධාන්ත සඞ්ග්‍රහය; කරමෙණම්, කරන්නෙමි නොහොත් ආරම්භකරමි. සියලු දතයුතු දෙය ගෙවා දත්තාහටය කීමෙන් සර්වඥයා හටයයි ගැණේ. ඒ සර්වඥයන්වහන්සේට මගේ සිත සුවඳ ගෙයක්කොටයයි කීමෙන් සිත්හි බුදුන් වාසයකරවාගෙණයයි ගැණේ-බුදුන් සිහිකොටය යන අර්ථයි, බුදුන් සිහිකොට අළුත ඉගෙණගන්නන්ගේ දැනීම පිණිස සිද්ධාන්ත සඞ්ග්‍රහය කරන්නෙමි යන අභිප්‍රායයි.

මෙහි, කරමෙණම් යන ක්‍රියාව මශබ්දකාරක ඒකවචන හෙයින් ඊට යෙදෙන මම යනු "අධ්‍යාහාර" වශයෙන් ගැණේ. කරමෙණම් යන කර්තෘකාරක ක්‍රියාව හා සම්බන්ධවීමෙන්, මම යනු උක්ත කර්තෘයි-කර යනු පූර්වක්‍රියායි, එසිනුත් මම යනු උක්තයි-මහද, යනු අනුක්ත ප්‍රකෘති කර්මයි-ගඳකිළි යනු, අනුක්ත විකෘතිකර්මයි-අන් ආකාරයකට පැමිණීම විකෘතියයි-සඳහා යනු පිණිසයයි අර්ථ කියන නුමුත් 'සන්ධාය' යන පාලිවචනයෙන් බිඳුනහෙයින් පූර්වක්‍රියායි-නිසා යන්නේ අර්ථ සමානයි, එසිනුත් මම යනු උක්තයි-දැනුම්, යනු අනුක්ත කර්මයි-ගෙවා යනු දත් යන අර්ථක්‍රියාවට පූර්වක්‍රියායි-සව්නෙන් යනු එසින් අනුක්තකර්මයි.

b මේ ගීයේ මූලඅර්ථය අධඝස්ථුත්‍රයයි—එහි පදාර්ථ-සියල්, සියලු; සදරුත්විදි, ශබ්දාර්ථවිධිතෙම; සේපියෝනන්, ජෙකයන්ගේ ප්‍රයොගයන්ට (පණ්ඩිතයන්ගේ වාක්‍ය යෙදුම්වලට) අනුරූ, යොග්‍යස්වරූප ඇත්තේවේ-සියලු වචනාර්ථ විධිය උගතුන් යෙදූ පොත්පත්වල වාක්‍ය ක්‍රමයට එකඟය යන අභිප්‍රායයි. †

* අධූනිකයයි බොහෝසේ කියනුලැබෙන නමුත් "ආධුනික" යන නාමයයි-අධූනික යනු මේ රටේ කිසිකලක ව්‍යවහාරයකි.

†පුරාණ සන්නයෙහි "ඉක්බිති ශබ්ද පාරායනයෙහි" 'ශිෂ්ටප්‍රයොගාභ්‍යාසාභවඃ' යන එක සූත්‍රයෙන් ශුකාලශබ්ද විධිය කළාක්මෙන් මෙහිදු සදරුත් විදි

මෙසබඳ සිදත් පිරිසත්හිමි–a
එබැවින් සන් සඳ ලිඟු විබත් සමස් පියවි,
පස කිරිය ලොපදෙස් අගම් පෙරරූ දෙරූ පෙරළි
වැඩි අඩු නිපා නියම් අනියම් අවිදුමන්විදි,
වී විසි වැදෑරුම් වියරණවිදි සපයා–b

---

ප–ඉති, මෙසේ; (මේ අධිගසූත්‍රයෙන්) සන්–සඳ–සමස්ආ, සංඥා,සන්ධි සමාසාදිය; වහරනුසෙරෙන්, ව්‍යවහාරානුසාරයෙන්; සපයා, සම්පාදනයකරව.

මේ කියනලද අධිගසූත්‍රයේ අර්ථක්‍රමයෙන් සංඥා, සන්ධි, සමාස, හා වෙනත් ව්‍යාකරණවිධි (පණ්ඩිතයන්ගේ) ව්‍යවහාරය පස්සේ යාමෙන් සිධකරගණ්ව යන අභිප්‍රායයි.

අනුරූ යන තන්හි වේ යන ක්‍රියාවක් * අධ්‍යාහාර වශයෙන් ගත යුතුයි–සපයා යන තන්හි–තොපි යන කර්තෘවක් ගතයුතුයි–සපයා යනු තශබ්දකාරක බහුවචන විධික්‍රියා වශයෙන් ආචාර්‍ය්‍යයන් විසින් යොදනලදී.

a සිදත්පිරියත්හිමි, සිධාන්තපරිසමාප්තිය දක්වා; මෙසබඳ, මේ අධිගසූත්‍රය සම්බන්ධකරණු ලැබේ.

සිදත්සඟරාව කෙළවරවනතෙක්ම මේ සදරුත් යනාදි සූත්‍රය සියලු සූත්‍රයන් හා සම්බන්ධවේ–එසින් සියලුම ව්‍යාකරණ ක්‍රම ජේකයන්ගේ ප්‍රයොගයන්ට යොග්‍ය ස්වරූප ඇත්තේයයි දතයුතු.

එබැවින්, ඒ භාවයෙන්; සන්, සඥාය; සඳ, සන්ධිය; ලිඟු, ලිඞ්ගය; විබත්, විභක්තිය; සමස්, සමාසය; පියවි, ප්‍රකෘතිය; පස, ප්‍රත්‍යයය; කිරිය, ක්‍රියාය; ලොප්, ලොපය; අදෙස්, ආදෙශය; අගම්, ආගමය; පෙරරූ, පූර්වරූපය; දෙරූ, ද්විරූපය; පෙරළි, විපර්‍ය්‍යාසය; වැඩි,

---

සියල් අනුරූසේපියෝතන්–යන එක සූත්‍රයකින්ම සියලු ව්‍යාකරණවිධි හදනු පිණිස සදරුත් යනාදි කව කියනලදී" යයි පෙණේ—මෙකල්හි ලඞ්කාවේ ශබ්දපාරායණ ව්‍යාකරණයක් දක්නානොලැබේ–පාණිනීය ව්‍යාකරණයෙහි–චතීයාධ්‍යයෙහි ප්‍රථම සූත්‍රය "සමර්ථඃ පදවිධිඃ" කියාවේ–මෙහි අර්ථ, පදවිධිඃ, පදයන් සම්බන්ධවූ යම් විධියක්වේද; සමර්ථඃ, සඞ්ගතාර්ථ ඇත්තේවේ යනුයි–පදවිධිය සඞ්ගතාර්ථ ඇත්තේය–යන්හෙන් ජේකයන්ගේ සඞ්ගතාර්ථවූ සමාසාදි පදවිධිය හැසේ.

සදරුත් යනාදි සූත්‍රයේ අභිප්‍රායද සියලු ව්‍යාකරණවිධි උගතුන් පදයෙදු ක්‍රමයට පියයුතුය යනුවේ.

* අධ්‍යාහාරනම් නොකියනලද්දවූ එකාන්තයෙන් කියයුත්තක් ගෙණකීමයි.

**පණකුරු ගතකුරු ඇනම් ලකුණෙන් හඳුන්වනු සන්නම.**
**පණකුරු පසෙක් එද ලුහුගුරුබෙයින් දසවේ,**
**ගතකුරුද වේ විස්සෙක් වහරට යුහු සියබසැ.**
**අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ මේ දස පණකුරු නම.**
**ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ අං මේ**
**විසි ගතකුරු නම්**-1

---

වෘද්ධිය; අඩු, හානිය; නිපා, නිපාතනය; නියම්, නියමය; අනියම්, අනියමය; අවිද්‍යමන්විදි, අවිද්‍යමානය යන විධිය; වී, කියා; විසිවැදෑරුම් විසිආකාරවූ; වියරණවිදි, ව්‍යාකරණවිධිය; සපයා, සම්පාදනයකරවී; සපයා, යන්න තොපි; යන්නක් සමග සම්බන්ධවේ-සංඥාවිධිය ආදි කොට ව්‍යාකරණවිධි විස්සකි, ඒ පිළිවෙළින් කියත්.

1 ප-පණකුරු ගතකුරු ඇ, ප්‍රාණාක්‍ෂර ගාත්‍රාක්‍ෂරාදිය; නම් ලකුණෙන්, නාමයෙන් හා ලක්‍ෂණයෙන්; හඳුන්වනු, ඇඳින්විම; සන්නම්, සංඥානම්වේ-ප්‍රාණාක්‍ෂරද ගාත්‍රාක්‍ෂරද තවත් ඊට ඇතුළත්දේද නාමයෙන්ද ලක්‍ෂණයෙන්ද අඳුන්වාදිම සංඥායි-සංඥානම් නාමයයි-හඳුන්වනු යනු ප්‍රකෘති කතෘයි, සත් යනු විකෘතිකතෘයි.

ප-සියබසැ, ස්වකීය භාෂාවෙහි; වහරටයුහු, ව්‍යවහාරයට යොග්‍යවූ; පණකුරු, ප්‍රාණාක්‍ෂර; පසෙක්, පචකයෙකි; එද, එයද; ලුහු ගුරු බෙසින්, ලඝුය ගුරුය යන භෙදයෙන්; දසවේ, දශකයෙක්වේ; ගතකුරුද, ගාත්‍රාක්‍ෂරද; විස්සෙක් වේ-විස්සක් වේ-අ-ඉ-උ-එ-ඔ-කියා ප්‍රාණාක්‍ෂර පසයි-මීට ප්‍රාණාක්‍ෂරය කියන්නේ-කග-යනාදී අකුරු සමග මේ ප්‍රාණාක්‍ෂරයක් යෙදූවිට ව්‍යක්තශබ්දයක් එයින් නැගෙණහෙයිනි පණකුරක් සමග නොයෙදුනුවිට මළසතුන් සමානයි-ස්වභාවයෙන් ගාත්‍රාක්‍ෂර-ක්-ග්-යනාදී ක්‍රමයෙන්, අල්වසිරි—ඉන් එකකට මේ ප්‍රාණාක්‍ෂර පස යෙදූකල පස් ආකාරයකින් ශබ්දය ව්‍යක්තව කියවේ—ඒ මෙසේයි-ක, කි, කු, කෙ, කො-අයන්න මෙලෙස කොටෙන් කියවෙනකලැ ලඝුයි-එය ඇදලා කියනකලැ-ආ-කියා දීර්ඝවේ එලෙස පසේම ලඝු ගුරු වශයෙන් වෙනසවූකල-අ-ආ-ඉ-ඊ-උ-ඌ-එ-ඒ-ඔ ඕ-කියා දසයක්වේ—එයින් ලඝුව ඇස[illegible]ටෙන කලක් පමණ කියවේ—ඒ එක මාත්‍රාවයි-ගුර-එබඳු මාත්‍රා [illegible] කල් කියවේ—ඒ දසයම ගාත්‍රාක්‍ෂරයකට එකතුකල[illegible] දසආකාර[illegible]යකින් කියවේ-ඒ මෙසේයි-ක කා කි කී කු කූ [illegible] කේ කො කෝ-යනු ආදිය සමගත් එසේමය-ඒ ප්‍රාණාක්‍ෂර දසයද ගාත්‍රාක්‍ෂර විස්සද පිළිවෙළින් දක්වත්.

අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ මේ දස පණකුරුනම්, අයන්නා ආද මේ දසය ප්‍රාණාක්‍ෂර නමි.

ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ අං මේ විසි ගතකුරුනම්, කයන්න ආදි මේ විස්ස ගතකුරු නමි.

***ආ, ඊල්, ඌල්, ඒල්, ඕනා, ඇති හුදුවද-සා, සී, සූ, සේ, සෝ, ඇති ගත්අරුණු කර උසුරුවනු හෙයින්ද ගුරුපසද-෨**

මේ, ක්, ආදි ගාත්‍රාක්ෂර එකුන්විස්සකට අ ආදි ප්‍රාණාක්ෂර දසය එකතුවේ-අං යනතැන බිඳුවට පෙරටුව ආදි ප්‍රාණාක්ෂරයක් සමග එය කියවේ-ඒ මෙසේයි-අං,-ඉං-ගාත්‍රාක්ෂරයකට ආරූඪවූ ප්‍රාණාක්ෂරයක් පෙරටුවූ කලද එසේමය—වං;-හං-ක්-ආදි ගාත්‍රාක්ෂරයන් ප්‍රාණාක්ෂර-නිසා ප්‍රාණ ලබා ශබ්ද ව්‍යක්තව කියවෙනහෙයින් ශරීර සමානයයි ගාත්‍රාක්ෂර යන නම් ඇතිබැව් දතයුතු-ගාත්‍රාක්ෂරයන්ට ප්‍රාණවනහෙයින් අ ආදි අකුරු ප්‍රාණාක්ෂර නම්.

දීර්ඝාක්ෂරයන් කියවෙන ශබ්දයන් දක්වත්.

෨ ආ, ආයුසට නම්වූ 'ආ' ශබ්දය; ඊල්, ඓලාවට නොහොත් උත් සිල්ලාවට නම්වූ 'ඊල්' ශබ්දය; ඌල්, † උල්පතට හෝ මූත්‍රයට නම්වූ "ඌල්" ශබ්දය; ඒල්,‡ පැසුනු මිගෙඩියට නම්වූ "ඒල්" ශබ්දය, ඕනා, ක්‍රියාවිශෙෂණවූ "ඕනා" ශබ්දය; ඇති, මේ ආදි තන්හි හුදුවද, තනිවද; සා, අතු ආදියට නම්වූ 'සා' ශබ්දය; සී, සිංහාදීන්ට නම්වූ 'සී' ශබ්දය; සූ, ව්‍යජනාදියට නම්වූ 'සූ' ශබ්දය; සේ, දක්ෂාදීන්ට නම්වූ 'සේ' ශබ්දය; සෝ, කණ් ආදියට නම්වූ 'සෝ' ශබ්දය; ඇති, මේ ආදි තන්හි; ගත්අරුණුකර, ගාත්‍රාක්ෂරාරූඪකොට; උසුරුවනුහෙයින්ද, කියවෙන හෙයින්ද; ගුරුපසද, දීර්ඝ ප්‍රාණාක්ෂර පසද.

---

* සමහර ආචාර්‍ය්‍යයෝ කෙනෙක්-ආ-ඊ-ඌ-ඒ-ඕ-යන දීර්ඝ ප්‍රාණාක්ෂර පසද අං යන තන්හි පෙණෙන බිඳුවර්ණයද ව්‍යාකරණයෙහි ගණනට නොගත්තුය. එබැවින් ව්‍යවහාරයෙහිද කාව්‍ය පාඨවලද ඒ අකුරු තිබෙන බැව් හඟවන්ට උදාහරණ දක්වූයේයයි පූරාණ සන්නයෙහි කියනලදි. අ, යනාදිය එලෙසම ලියා දීර්ඝ කටයුතු තන්හි එසේ කියන ව්‍යවහාරයක් තකා හෝ, අ අ දෙකම අවර්ණය යනාදීන් පසට ගැණ ප්‍රාණාක්ෂර පසයයි සලකා හෝ ඒ ආචාර්‍ය්‍යවරයන් විසින් එසේ කියනලදැයි සැලකියයුතුයි—ශුද්ධ සිංහල භාෂාවෙහි බිඳුව කීම ඉතා ස්වල්පයි.

† පූරාණ සන්න පොත්වල බොහෝසේ, ප්‍රස්‍රාවවාචීවූ "ඌල්"ශබ්දයයි ලියා තිබේ—දැන් බොහෝසේම උල්පතට නමයයි කියත්.

‡ පූරාණ සන්නයෙහි පක්වමධූක ඵලවාචකවූ ඒල් ශබ්දයයි ලියා තිබේ—එහි "පක්වමධූක" යන්න හැරදමා "ඵලවාචක" යන්න "ඵලා" වාචකයයි කියා ගෙණ, ඒ එන්සාලට නමැයි බොහෝසේ මේ කාලයෙහි කියති—ඵලාවට-එල්බිජු, එල්සාල්, එන්සාල් යනාදිය පූරාණ පොත්වල පෙණේ—මෙසේ පූරාණ සන්නයට වෙනස්ලෙස මේ කාලයෙහි බොහෝදෙනා විසින් සලකණ ලද්දාවූද පූරාණ සන්නයෙහි අකුරු වෙනස්ලෙස කියාගත් තැන්ද බොහෝයි.

**"තමාවදනය පොමින් නොයිකතැයි හැංගේ"**
**"නරනිඳුහු ඉංගෙන් සෙමෙනද නැසී පැසැහි"**
**මෙ ඇ කව්ලැකියෙහිදු "හංමැටි වංඇපල" ඇ ලෙව්ලැකි**
**යෙහිදු සපුරා උසුරුවනු හෙයින්ද "රඟබඟහර" ඇහි උනු**
**මතින් උසුරුවනු හෙයින්ද මෙහි බිඳුදරුසි, මෙ ඇහි-a**

---

a * "තමාවදනය" යනාදි පද්‍යයෙහි හැංගේ යන තන්හිද; "නර නිදුහු ඉංගෙන්" යනාදියෙහි ඉංගෙන් යන තන්හිද; මෙ ඇ, මෙ ආදිය; කව්ලැකියෙහිදු, කාව්‍යලක්‍ෂණයෙහිද; † හංමැටි වංඇපල ඇ, "හංමැටි වංඇපල යනාදිය; ලෙව්ලැකියෙහිදු, ලොකව්‍යවහාර ලක්‍ෂණ කට යුත්තෙහිද; සපුරා උසුරුවනු හෙයින්ද; (බින්දුව) සම්පූර්ණයෙන් කිය වෙන හෙයින්ද; රඟබඟහර ඇහි, ‡රඟබඟහර යනාදියෙහි; උනුමතින් අඩුවූ මාත්‍රයකින්; උසුරුවනු හෙයින්ද, උච්චාරණයකරණුලබන (කියවෙන) හෙයින්ද; මෙහි, මේ ව්‍යාකරණයෙහි; බිදුද, බින්දුවර්ණයද; රුසි, රුචිසි. රඟ, යනාදි තන්හි ගයන්නේ බැදුනේ බින්දුවේ අර්ධය යයි මෙහි කියනලදී-ගංරන් වංමුතු යනාදී සන්නිවිධියෙන්ද ඒ ප්‍රකාශවේ නමුත් සිංහල ඡන්දසෙහි **"අඩමත් මලකරවේ වගතුන් දනු අඩ පණ-ගග දඹු සඳඹඇ සද නිදසුන් මෙයට දන් නෙ"** කියා වර්‍ණනා චාරයාගේ අර්ධයසේ කියනලදී-හෙද අඩපණයයි පොතේ පෙනෙන නමුත් දඹු සඳ යනාදියෙහිද පෙණෙන්නේ අර්ධගාත්‍රයකි එහෙයින් අඩපණ යනු අඩවණ කියා හෝ අඩගත කියා හෝ කියයුතුදැයි විමසත්වා.

මෙහි දීර්ඝ ප්‍රාණාක්‍ෂරයන් තනිව යෙදෙන තැන් දක්වනු පිණිස-**ආ**-යනාදියද, ගාත්‍රාක්‍ෂරයන්ට ආරූඪව කියවෙන තැන් දක්වන පිණිස සකාරාරූඪව දීර්ඝ ප්‍රාණාක්‍ෂර ඇති-**සා**-ශබ්දාදියද සම්පූර්ණ බින්දුව යෙදෙන තැන් දක්වන පිණිස **"තමාවදනය පොමින් නොයිකතැයි හැංගේ"** යනාදියද, ගයන්නට බැඳුනු බින්දුවේ අර්ධය දක්වන පිණිස **"රඟබඟහර"** යනාදියද උදාහරණ කළබැව් දත යුතු, අ ආදි ප්‍රාණාක්‍ෂර දශය පමණක් දක්වනලද නුමුත් **"ඇ ඈ"** දෙක සමනවූකල දොළසක්වේ. ඇ ඈ දෙක අ ආ දෙකට මාත්‍රාවෑයි යයි සිද්ධාන්ත සංග්‍රහවෙහි පෙණේ.

---

* කව්වල බින්දුව තිබෙන බව දක්වන්ට අසන්දෘකවෙන් ගත් උදාහරණය, තමාවදනය, තමාගේ වචනය හෝ මුඛය; පොමින් පොහොසත් බැවින්; නො ඉකතැයි, නොඉක්මවන්යයි, හැංගේ, කල්පනාකළේය, මෙහි බින්දුව තිබේ. කාව්‍ය චූඩාමණි පොතෙන් ගත් උදාහරණය-නරනිදුහු, රජහුගේ; ඉංගෙන්, අභිප්‍රායෙන්; සෙමෙන්අද, සෙමින් අවුත්; පැසැහි, පාර්ශ්වයෙක්හි; නැසී, සැඟවී; මෙහිද එසේමයි

† හංමැටි, සතුරු සම්මැට්ට නම් භාණ්ඩජාතිය; ඇතම් කෙණෙක් මැටි ජාතියකැයි කියත්; වංඇල, වාසානම් භාණ්ඩ ජාතිය.

‡ රඟ, නැටීම; බඟහර, සුරාව; ශමගර පොතෙක "රඟ බඟ හර" යයි තිබේ එහි අර්ථ බඟ, බිඳීම; අඟර, අඞ්ගරාග (ඇඟගාන විලවුන්)

අ යන්නට වඩා දීර්ඝතාවක් ඇ යන්නේ ශබ්දයෙන් නැති බැවින් ඒ මාත්‍රාවෘද්ධියයි සිතීමට වඩා අන්‍යවූ ප්‍රාණාක්ෂරලෙස සිතීම හැකිවේ-නුමුත්, ප්‍රතිරාජ පරිවෙන ස්වාමීගේ මතය-අ, ආ, දෙකට මාත්‍රාවෘද්ධි මෙන් ඇ ඈ දෙක වෙයි යනුයි, ඒ ස්ථානවශයෙන්ද සිතියයුතු.

රසබසහර ආදියෙහි, ඕ යන්නේ අභිය බැඳීමයයි ඇතැම් ආචාර්ය යන්ගේ මතයි—නුමුත් ඕ යන්නක් මෙහි නොකියනලදී- මෙයි ප්‍රාණාක්ෂර දොළස හා ගාත්‍රාක්ෂර විස්සෙන් පිටත්වූ අකුරු සිංහල භාෂාවේ නැතහොත් බ, ස යනාදි මහාප්‍රාණාක්ෂරද ශ, ෂ යන අකුරුද ඍ ආදි ප්‍රාණාක්ෂරද සිංහල පොත්වල කෙලෙස පෙණේදයත්-සිංහල භාෂාවේ පොත්පත් ලියනුලබන්නේ බොහෝසේම මිශ්‍ර සිංහලභාෂාවෙන් වේ-මිශ්‍රවනකල්හි සිංහලට මාතෘභාෂාවූ මාගධ සංස්කෘත යන උභය භාෂාවෙන්ද, භ්‍රාතෘ භාෂාවූ,-සිඤු, ආන්ද්‍ර, ද්‍රාවිඩ යනාදි බොහෝ භාෂාවලින්ද වචන යෙදේ, ඒ වචන ව්‍යවහාරයට සිංහල ව්‍යාකරණයෙහි පෙණෙන අකුරු නොපොහොනා බැවින්ද, සංස්කෘත ව්‍යාකරණයට අයිති අකුරු පොහොනා බැවින්ද සංස්කෘතයට අයිති අකුරු බොහෝසේම මිශ්‍රසිංහල ව්‍යවහාරයෙහි යෙදෙයි-මිශ්‍ර සිංහල ගැළපී මෙහි යම් භාෂාවක වචනයක් ගළපනුලැබේද ඒ භාෂාවට අවිරුඩ අක්ෂරයෙන් යෙදියයුතුවේ-සිංහල කාව්‍ය පොත් අමිශ්‍රවූ ශුද්ධ සිංහල භාෂාවෙන් කළබැවි පෙණේ-එසේත් යොගරත්නාකරාදි වැදගත් පොත්හැර වෛද්‍යශාස්ත්‍රයට කරණලද අභිනව පොත් සිංහල ව්‍යාකරණයට සර්වප්‍රකාරයෙන් ඇතුළත්නොව මිශ්‍රවශයෙන් සිංහල ව්‍යාකරණයට අයිත්නුවූ අකුරු යෙදීමෙන් කළබැවි පෙණේ.

සිදත්සඟරාවට පසු කරණලද ප්‍රධාන කව්පොත්වල අමුතු ගාත්‍රාක්ෂර දෙකක් යොදාතිබෙන බව පෙණේ-එනම්-ච, ඦ යන දෙකයි.

* එසේම පුරාණ වැදගත් සන්න පොත්වලද සිංහල වචනවලද ව්‍යවහාරයෙහි බොහෝසේම-ච, ඦ දෙක පෙණේ—ඦ යන්නේ අර්ධ සංයොගයුක්ත—රජන් යනාදි වචන බොහෝ පුරාණ පොත්වල පෙණේ. සිංහල භාෂාවෙහි මහා ප්‍රාණාක්ෂර හා ශ, ෂ දෙකද-අර්ක, වර්ග යනාදීන් යෙදෙන රේඵයද අත්‍ර යනාදීන් යෙදෙන උත්තරරේඵ සංයොගයද, ක්‍ය යනාදි සංයොගයද නොවේ-ඍ, ඎ, ඓ, ඖ යන ප්‍රාණාක්ෂරයෝද නැත්තාහ-ඒ යොදා-ශලකිරිම, උත්‍ර-ඖරුදු යනාදීන් වරදවා ලියති, එසේම සංස්කෘතවචන සිංහලට ලියනතන්හි සංස්කෘතට

* විදාගම ස්වාමීන් විසින් රචනාකරණලද බුදුගුණාලඞ්කාර නම්වූ මාහැඟි කාව්‍යයෙහි එරජු ඉන් ලියවීනම් වෙති "පයඟ ාරු නාදේ ගජසෙන් කුම නාදේ" යනාදීන්-ච, ඦ, දෙක යෙදී තිබේ. පොලොන්නරුවේ සමන්ත සර්වීර යන් විසින් සන්නකරණලද ප්‍රාතිමොක්ෂ වණ්ණනාදියෙහි-පාචිත්තියං යන්න "පචිති" කියා සිංහලකරණලද්. ව්‍යවහාරයෙහිද අචුරු, යඦසඦ, දෙසඦඦමු යනාදීන්-ච, ඦ දෙක බොහෝසේ පෙණේ.

## පෙරපරවණින් ගලපනු සඳනම්.
## සඳෙව් මොහොර ඇගි-෧

අසිතිනුවූ සිංහලට අයිතිවූ අකුරුවලින් වරදවා ලියති-ඒ සැස්තු, සැකු, යනාදියයි-එසේ ලියනලද දෙසින් ඇතැම් තැන විපරීතාර්ථ වැටහීමද වේ-සංඥාවිධියෙන් මේ ආදී බොහෝවූ දතයුතු අර්ථ ඇත්තේය. න, ණ, ල, ළ, යන අක්ෂර චතුෂ්කයාගේ විශෙෂප්‍රකෘතිය සිදත් සඟරාවේ ප්‍රකාශනොකරණලදී.

### සන්ධියේ ආකාර.

෧ පෙරපරවණින්, පූර්වපරවර්ණයන්; (ඉදිරි පසුවූ අකුරු) ගලපනු, සටනාකිරීම; (එකතුකොට කීම) සඳනම්, සන්ධිනම් (වේ)* ඉදිරි පසු අකුරු එකතුකොට ගැළපීම සන්ධියකි.

### උදාහරණ.

සඳ-එව්, යන තන්හි, සඳෙව්-කියාද; මහ උර, යනතන්හි, මොහොර කියාද; ඇගි, යනාදී ආකාර ඇත්තේයි-මෙහි සඳ යන වචනයෙහි අග දයන්නේ තිබෙන අයන්න වෙන්කොට බලනකල සඳ්-අ-එව් කියා තිබේ-එසින් අයන්න මකාදැමූකලැ සඳ්-එව් කියාතිබේ. පරවූ එයන්න, ද්-යන්නට එකතුකළකල්හි "සඳෙව්" යනුවේ-සඳ, චන්ද්‍රයා; එව්, වාගේයි-සඳෙව් යන්න බලා මෙහි සන්ධිය මේයයි දැන-සඳඑව් කියා සන්ධිවර්ජිත † කොට චන්ද්‍රයාවැනි යන අර්ථය දතයුතුවේ

මහ-උර යන ශබ්දදෙක යොදා පූර්වශබ්දයේ අග හයන්නේ යෙදී තිබෙන අයන්න වෙන්කර බලනකලැ මෙසේයි-මහ්-අ-උර-මෙසින් පළමුකොට අයන්න නැතිකළකල්හි මහ්-උර-කියාතිබේ-හයන්න අල්කොට කීමේදී දුකසේ කියවේ-ඊට උයන්න එකතුකළොත් "මහුර" කියාවේ-එය සිංහල ව්‍යවහාරයට යහපත් නොවේ-එහෙයින් උයන්න ඔයන්නට ඉතා ආසන්න ශබ්ද ඇතිහෙයින් උයන්න මකා ඔයන්න කළකලැ මහ්-ඔර කියා තිබේ—ඒ ඔයන්න හයන්නට

* අකුරු බොහෝඇති එකවචනයම කියන ලියනකල්හි හෝ, වචන දෙකක් එකතැන යොදා කියන ලියන කල්හි හෝ, එකලඟට පැමිණෙන අකුරු ගැළපෙන ක්‍රමයට එකක් නැතිකොට හෝ එකක් අනිකකට මාරුකොට හෝ එක අකුරක් ලඟ අනිකක් එලා හෝ සැපසේ වහා කියවෙන පරිද්දෙන් හෝ ගැළපීම සන්ධියයි-ඔජස්නැති-යන අභිප්‍රාය ඇති-නිඹද-යන වචනය කියනකල-ඔයන්නට මුලින් රයන්නක් එලා කීම යහපත් ශබ්ද ඇත්තේය-ඒ සුවසේ කියහැක්කේද වේ-එසේ සන්ධිකොට "නිරෝද" කියත්. යන-එන-යන වචන දෙක එකට ගලපා කීමෙහි-යන කී තැන නයන්නේ අයන්න නැතිකොට එයන්න සමග ගලපා "යනෙන" කියති-එසේ ගැලපීම සන්ධියමයි.

† වර්ජිත, නැති යන අර්ථයි.

**මේය මෝය යන වහරම කාරුණුවූයේ ලිඟුනම්**
**දිය විදු ඇඟි - a**

එකතුකළකල්හි "මහොර" කියාවේ—සිංහල භාෂාවේ බොහෝ තැන ලඟ පසුව තිබෙන ගාත්‍රාක්ෂරයට එකතුවූ ප්‍රාණාක්ෂරයේ ස්වභාව ඉදිරියේ තිබෙන ගාත්‍රාක්ෂරයට ලැබෙන ස්වභාව ඡේක යන්ගේ යෙදුම්වල පෙණෙන හෙයින් මයන්න හා සම්බන්ධවූ අයන්න මකා ඔයන්න කළ කල්හි "මොහොර" කියාවේ—මොහොර යනු සන්ධි වර්ජිත කළවිට මහ–උර කියාවේ—මහ, ලොකු; උර, ලය, මහත් ලැ පැත්ත හෝ ප්‍රාකාරය නොහොත් මහත් ලයඇත්තා හැඟේ–තක්‍රයට නම්වූ මොහොර යන තැන මෙබඳු සන්ධියක් නැත්තේයි–සැළලිහිණි සන්දේශයෙහි, සුලකළ–අකුරු "සුලකළකුරු"යි සියන්–ඉහි, සියනිහි යනුද–පරවිසන්දේශයෙහි පබල—අකුරු "පබලකුරු"කියාද කාව්‍ය ශේඛරයෙහි රත්වන්–අඹර–"රත්වණඹර"යනාදී තැන්වලත් සන්ධි ගැළපීම දතයුතු. * — —

සන්ධ්‍යධිකාරයෙන් සන්ධිප්‍රභේද දතයුතුයි.

## ලිඞ්ගාකාරය.

a මේය, මේ පුරුෂතෙමේය; මෝය, මෝ ස්ත්‍රීතොමෝය; යන වහරව, කියන ව්‍යවහාරයට; කාරුණුවූයේ; කාරණවූයේ; ලිඟුනම්, ලිඞ්ග නම්(වේ)—ලිඞ්ගය යනු ලකුණය සලකුණු පිණිස පවත්නෙක යන අර්ථයි.

මූ, මැ, අරු, අරැ, ඌ, ඈ, යන වෙනස් ලක්ෂණයක් පෙන්නාදීම ලිඞ්ග විධියයි.

ලඟනැති පුරුෂයෙක් ගැණ කථාකරණකල ඌ, ඒතෙම, හෙතෙම යන වචනද–ලඟනැති ස්ත්‍රියක් ගැණ කථාකරණකල්හි ඈ, ඕතොම යන වචනද යොදත් ඒ ලිඞ්ග විධියයි. †

## උදාහරණ.

දිය, ජගත්තෙමේය; විදු, විද්‍යාතොමෝය; ඇඟි, යනාදී ආකාර ඇත්තේයි–මෙහි, ජගත් යනු ලොකයයි–ඒ පුරුෂලිඞ්ගික ශබ්දයකි–මෙසේ සියල්ල ගැණම කියනුලබන නාම වචන පුරුෂලිඞ්ගිකය, ස්ත්‍රී ලිඞ්ගිකයයි විවිධවේ–සංස්කෘත භාෂාවේ ජගත් ශබ්දය ඇවිදිනා සත්ව

* කථාව්‍යවහාරයෙහි සන්ධිගැළපීම ඉක්මන් කථාවෙහි බොහෝසේ යෙදේ.

† කුමාරයෙක් උපන්නේය, ඌ මල්ලේය—නොහොත් හෙතෙම මළේය–කුමාරියක් උපන්නීය, ඈ මලාය නොහොත් ඕතොමෝ මලායයි කියයුතුයි–කුමාරයෙක් උපන්නේය ඈ මලාය යනාදියක් කීම වරදයි.

**නමින් පරවැ බෙදනු ලබනුයේ විබත්නම්,**
**යෙයේ සෙබෙහි ඇගි 𑇡**

යන්ට නම් වනකල තුන්ලිඟුයි—සාමාන්‍යයෙන් ලොකය කියනකල නපුංසකලිඞ්ගයි—ස්ත්‍රී පුරුෂ දෙකොටසින් මිදුනාවූලෙස යමක් කී යන ශබ්දය නපුංසක ලිඞ්ගයයි කියත්—මාගධ සංස්කෘත භාෂාවල එලෙස ස්ත්‍රී, පුරුෂ, නපුංසකයයි ලිඞ්ග තුණකට ශබ්දයන්ගේ බෙදීම ඇති නමුත් සිංහල භාෂාවේ එසේනොව ස්ත්‍රී පුරුෂ ලිඞ්ග දෙකට බෙදීම ප්‍රතිරාජ පරිවෙණ ස්වාමීන් විසින් කියනලදී—එබැවින් ඒ භාෂාවල නපුංසකලිඞ්ග ශබ්දයන්ද සිංහලට බිඳී ආ කලැ පුරුෂලිඞ්ගික ලෙස ව්‍යවහාරකරති-දිය යනු—ජගත් ශබ්දයෙන් බිඳී ලොකයට නම්ව එනකල්හි සිංහල භාෂාවේ පුරුෂලිඞ්ගික ශබ්දයක් වේ.

විද්‍යුව—ස්ත්‍රීආකාරයට ගෙණ ස්ත්‍රීයක් මෙන් සලකා ස්ත්‍රීලිඞ්ගික ව්‍යවහාරයෙන් පාලි සංස්කෘත භාෂාවලද පෙණේ-එසින් බිඳී එම අර්ථයෙහි පවත්නා විදු ශබ්දයද ස්ත්‍රීලිඞ්ගිකයි-මෙසේ සිංහල ව්‍යවහාරයට නපුංසක ලිඞ්ග ශබ්ද නැතැයි ප්‍රතිරාජ පරිවෙණ ස්වාමීන් විසින් කියනලද්දේය-එසේත් තුන්ලිඟුලෙස ශබ්ද පෙණේ-එය මතු ලිඞ්ගාධිකාරයෙහි කියන්නෙමු.

## විභක්තියේ ආකාර.

𑇡 නමින්පරවැ, නාමයකෙරෙන් පරවැ; බෙදනු * ලබනුයේ, විභ, ගකරණුලබන්නේ; විබත්නම්, විභක්ති නම් වේ-එක නාමයක් නොයෙක් ක්‍රියා වචන සමඟ යෙදෙනකලැ නොයෙක් අන්දමින් වෙන්ස් වියයුතුයි—එසේ වෙනස්වීම වන්නේ ශබ්දයේ මුලින්නොව අගින්-එහෙයින් නාමයෙන් පරවැ බෙදනු ලැබීමයයි කියත්-ඒ මෙසේයි-එළු යනු එළුවාට නමක්වූකල "එළුවා මරයි"කීමෙහි එළු යන නාමයෙන් පරව-වා-කියා අමුත්තක්ද, "එළුවාට කොල දෙති" කී තැන "වාට"කියා අමුත්තක්ද"එළුවාගෙන් තුරන්වුනා"යන තැන-වාගෙන් කියා තවත් අමුත්තක්ද "එළුවාගේ ලොම් කපනවා"යන තැන් වාගේ කියා තවත් අමුත්තක්ද පෙණේ-මේ ආදියෙන් ඒ නාමයේ අග වෙනස්වීම විභක්ති විධියයි—ඒ නම් වශයෙන්ද ලක්ෂණ වශයෙන්ද යෙදුම් වශයෙන්ද විභක්ත්‍යධිකාරයෙහි පෙණේ.

* සමහර පුරාණ පොතක "බෙජනුලබනුයේ" කියා තිබේ භජ-භාජ යන ධාතු භාගකිරීමෙහි වෙන්කිරීමෙහි පාලි සංස්කෘත භාෂාවල පෙණෙන හෙයින් එසින් බිඳී-බජ කියා එන හෙයින් පුරාණ පාඨය එසේයයි හඟිමු-පුරාණ පොත්වල "පැදිජි"යනාදි වචන මේ කාලයෙහි "පැවිදි" යනාදින් කියනබැවි ද : යුතු.

**නේසදත් සියොවැ එකසද අයුරක්වනසේ ගලපනු සමස්නම්. මීපල් නිලුපුලැසි ඈගි-෧**

### උදාහරණ.

යෙහේ, සුවයක්තෙම; සෙබෙහි, සභාවෙහි; ඈගි, ආදී ආකාර ඇත්තේසි-යෙහේ-යනතැන "යහ" ශබ්දයයි-ඊට ප්‍රථමාවිභක්ති එකවචනවූ ඒයන්න අග යොදා යයන්නේ පිළිපෙරළි ආදිය කළකල්හි යෙහේ කියාවේ-සුවයක්තෙම යනු ඊට ප්‍රථමා ඒකවචනයේ අර්ථයි-සෙබෙහි-යනතන්හි "සබ" ශබ්දයයි-ඊට ආධාර විභක්ති එකවචනවූ "එහි" යන්න අගින් එකතුකොට සයන්නේ පිළිමාරුකිරීම් ආදිය කළකල්හි "සෙබෙහි"යනුවේ-සභාවෙහි යනු ඊට ආධාර විභක්ත්‍යෙක වචනයේ අර්ථයි.

### සමාසයේ ආකාර.

෧ **නේසදත්,** නොයෙක් ශබ්දයන්; සියොවැ, සඞ්ඝතකොට; (එකතුකොට) එකසද අයුරක්වනසේ, එකශබ්දයක ආකාරයක්වන පරිද්දෙන්; ගලපනු, ඝටනාකිරිම; (ගැළපීම) සමස්නම්, සමාසනම්වේ.

ශබ්ද හෙවත් වචන කිපයක් එකතුකොට එක ශබ්දයක් හෙවත් එක වචනයක් වනලෙස ගැළපීම සමාසයයි. *

### උදාහරණ.

**මීපල්,** මහිපාලයාය; (රජය) නිලුපුලැසි, නිල් මහනෙල් මල්වැනි ඇස් ඇත්තිය; ඈගි, ආදිආකාර ඇත්තේය-මිය පල්නේ මී පල්-මිය පල්නේ, පොළව රකින්නේ; මීපල්, එනම්වේ; නිල් උපුල්වැනි ඇස්ඇත්තී නිලුපුලැසී—නිල්උපුල් වැනි, නිල් මහනෙල් මල්වැනිවූ; ඇස්ඇත්ති, ඇස්ඇත්තාවූ ස්ත්‍රී; නිලුපුලැසි,එනම්වේ-මියකියා පොළව කියවෙන්නාවූ කර්මවිභක්තිය මී ශබ්දයෙන් උපන්නේය-ඒ විභක්තිය නැතිකලවිට මී ශබ්දය තිබේ-පල්නේ යන ශබ්දයේ නේ යන ප්‍රත්‍යය හැර පල්යන ශබ්දයෙන්ද පාලනයකරණ තැනැත්තා කියවේ "මීපල්" කීකල මී ශබ්දයට විභක්තියක් නැතිව පල් ශබ්දය සමග ගැළපේ-පල් ශබ්දයෙන් පරව යෙදෙන ප්‍රථමා විභක්තියට නියම ප්‍රත්‍යයාක්ෂරයක් නැතිව ස්වකීය රූපයෙන් ප්‍රථමාවිභක්ති එකවචනය වේ—මෙහි මී ශබ්දයට විභක්තියක් නැතිව එකම මීපල් ශබ්දයවීම

* **සමාසය**නම් පදසංක්ෂෙපයයි-මාගධ ව්‍යාකරණවල කියනලදී-ඒ වචනයෙන් අභිප්‍රාය සුවසේ හැඟේ·වෙන් වෙන් වචන වෙන වෙනම විභක්ති ඇතිව පවත්නා නුමුත් ශබ්ද කීපයක් එකතුවූකලැ එකවචනයක්වූ පසු එහි එක විභක්තියක් අග යෙදේ-මැද අමුතු වචනයක අභිප්‍රාය හැඟීමද සමාසයෙහි වේ.

**පියවි දෙවැදෑරුම් දු පියවි සද පියවි වී-**
**පදයොන් දු පියවිනම් විබත්‍යනට ඇසිරු සද පියවිනම්-a**
**වෙන වෙනදෙක නිපන් තසම තබවයි එතෙබේ-**
**කිසි අන් බසින් නුමුසු හෙලදිවැ පළ නිපන් නම්,**
**මගදසකු ඇ බණ සම්වුබස තසමනම්-**
**බිඳුනේ තබවනම් වී විමසාදනු එහිපියෝ··p**

පදසංක්‍ෂෙප කිරීමයි-නිල් උපුල් ඇස් යන ශබ්ද ස්වභාවයෙන් විභක්ති ප්‍රත්‍යය නැති (කර්මවිභක්ති) බහුවචනාර්ථයෙහි වේ ඒ සඬි ගළපා වැනි යන නිපාතයත් ලොප්කොට ඇත්ති යන ශබ්දයත් ලොප් කොට එක ශබ්දය කළකල්හි නිලුපුලැස් ශබ්දයවේ—ස්ත්‍රී කියවෙන හෙයින් ස්ත්‍රී අර්ථයෙහි 'ඉ' යන ප්‍රත්‍යය ශබ්දයේ අගට එකතු කළ කල්හි-"නිලුපුලැසි"ශබ්දයවේ-නිල් මහනෙල් වැනි ඇස් ඇත්තිය යන අර්ථය හැඟේ—එහි ඇතුළත් වැනි ඇති යන අර්ථදෙකක් ශබ්ද නැතිවේ-ඒ පදයන් සංක්‍ෂෙපකළබව එයින් හැඟේ-එබැවින් පදසංක්‍ෂෙපකිරීම සමාසයයි දතයුතු.

## ප්‍රකෘතියේ ප්‍රභෙද.

a පියවි, ප්‍රකෘතිතොමෝ; * දාපියවි, ධාතුප්‍රකෘතිය; සදපියවි ශබ්දප්‍රකෘතිය; වී, කියා; දෙවදෑරුම්, දෙපරිදිවන්නීය. පදයොන්, පදයන්ට උත්පත්ති කාරණවූයේ; දාපියවිනම්, ධාතුප්‍රකෘතිනම (වේ); විබත්‍යනට ඇසිරු, විභක්ත්‍යාදීන්ට ආශ්‍රයවූයේ; සදපියවිනම්, ශබ්ද ප්‍රකෘති නම්වේ. ධාතු ප්‍රකෘතියනම් ක්‍රියාපදාදි පද උපදවන උත්පත්තිස්ථානයවූ ධාතුවයි † දා යනු දීමේ වචන උපදවන මුල්වූ ස්ථානයයි—එයින් දෙමි දෙමු යනාදි පද උපදී—ශබ්ද ප්‍රකෘතියනම් විභක්ති ප්‍රත්‍යයන් විසින් ආශ්‍රයකරණලද නාම ශබ්දයයි—දෙවි යනු ශබ්දයයි-විභක්ති ආශ්‍රයකරණවිට දෙවියා-දෙවියාවිසින් දෙවියාට යනාදීන් විභක්තිවලින් යුක්තවේ.

## ඒ දෙකේ භෙද.

d එ දෙක, ඒ (ධාතුප්‍රකෘති ශබ්දප්‍රකෘති) දෙක; වෙන වෙන, වෙන් වෙන් වශයෙන්; නිපන්,නිෂ්පන්නය; තසම, තත්සමය; තබවයි, තද්භවය කියා; තෙබේ, භෙදතුණක් ඇතිවන්නේය. කිසිඅන්බසින්,කිසි අන්‍යභාෂාවකින්; නුමුසු, මිශ්‍රනුවූ; හෙලදිවැ, සිංහල ද්වීපයෙහි; පළ, ප්‍රසිද්ධවූයේ; නිපන්නම්, නිෂ්පන්නනම් වේ; මගදසකුඇ, මාගධ සං

* ප්‍රකෘතියනම් ස්වභාවෙන්සිටි මුල් ශබ්දයයි-එයින් ප්‍රභෙදව වචන උපදී-උත්පත්ත්‍ය මුල්ස්වභාව ආදි නොයෙක් අර්ථවල ප්‍රකෘති ශබ්දයවේ. † ක්‍රියා වචන දරණ හෙයින් ධාතු යන නම්වේ.

**(1) රුකුර නරඹ ඈ නිපන් දු පියවිනම්-**
**(2) යා දු කර ඈ තසම දු පියවිනම්**
**(3) දන නැගි සමර තුලුර ඈ තබ්බව දු පියවිනම්-**[a]

ස්කෘතාදිවූ; බණ, භණිතයට; (භාෂාවට) සමවූ බස, සමානවූ වචනය; තසමනම්, තත්සමනම් වේ; බිදුනේ, (එයින්) භින්නවූයේ; තබ්බවනම්වී, තද්භවනමැයි කියා; එහි පියෝ, එහිප්‍රයොග; විමසා, පරීක්‍ෂාකොට; දතු, විජානනයකරව; (දැනගණුව).

සටකියනලද ධාතු තුන්ආකාරයකින්ද නාමශබ්ද තුන් ආකාරයකින්ද පවති-ඒ කෙලෙසදැයි කියතහොත් නිෂ්පන්න, තත්සම, තද්භව, යන තුන් ආකාරයෙනි-එයින් කිසියම් අනිකුත් මාගධාදි භාෂාවකින් මිශ්‍රනැත්තාවූ මේ ලඞකාවේම පවත්නා ධාතුව හෝ නාම ශබ්දය හෝ නිෂ්පන්නයි*පාලි සංස්කෘතාදි භාෂාවල පෙණෙන ලෙස පවත්නා ධාතුව හෝ නාමය තත්සමයි † පාලි සංස්කෘතාදි භාෂාවලින් බිඳී ඊට සමානත් නොව එක කොටසකින් සමානව තිබ්බූවූ ආකාරඇති ධාතු ආදිය තද්භවයි ‡ මෙපරිද්දෙන් නිෂ්පන්නධාතු, තත්සමධාතු, තද්භවධාතු, නිෂ්පන්ననාම, තත්සමනාම, තද්භව නාම, කියා ප්‍රකෘති කොටස් සයක් දතයුතුයි-මෙහි මාගධ සංස්කෘතාදි භාෂායි කී හෙයින් මාගධ සංස්කෘත වඞ්ග, ආන්ද්‍ර, ද්‍රාවිඩවලිනුත් වෙනත් භාෂාවලිනුත් තත්සම තද්භව වශයෙන් ආ බව දතයුතු-එසේකල සිංහල නොයෙක් භාෂාවලින් මිශ්‍රභාෂාවක් වියයුතුයි-එසේ පවත්නේ එක භාෂාවක් දෙකක් නොව බොහෝ භාෂා අනිකුත් නොයෙක් භාෂාවලින් ආ වචන හා මිශ්‍ර නිසායි.

## උදාහරණ.

[a] රුකුරු, (කිරීමෙහිවූ) රුකුර යන ධාතුය; නරඹ, (බැලීමෙහිවූ) නරඹ යන ධාතුය; ඈ, යනාදිය; නිපන්දුපියව්නම්, නිෂ්පන්න ධාතු ප්‍රකෘතිනම්වේ-කෙළේ, කළෝ යනාදි අර්ථවල, රුකුළේ රුකුළෝ, යනාදි ක්‍රියාවචන රුකුර යන ධාතුවෙන් සිඞවෙත්-නරඹා, නරඹමි යනාදි ක්‍රියාවචන-බලා, බලමි යනාදි අර්ථවල නරඹ යන ධාතුවෙන් සිඞවේත්-මේ ධාතු ලඞකාවේම උපන.

යා, (ගමනාර්ථයෙහිවූ) යා යන ධාතුය; දු, (දීමෙහිවූ) දු යන ධාතුය; කර,(කිරීමෙහිවූ) කර යන ධාතුය; ඈ යනාදිය; තසමදුපියවිනම්, තත්සම ධාතු ප්‍රකෘතිනම් (වේ)-මෙහි ගමනෙහිද දීමෙහිද අර්ථ ඇත්තාවූ **යා-දු** යන ධාතුදෙකම පාලි සංස්කෘත භාෂා දෙක්හිමත් මෙ

---

* **නිෂ්පන්න,** සිඞය යන අර්ථයි. † **තත්සම,** ඒ හා සමාන යන අර්ථයි. ‡ **තද්භව,** එයින් උපන් එයින් භින්නවූ යන අර්ථයි.

**(1) කොළඹ කරළු ඈ නිපන්සද පියවිනම්–**
**(2) ගජ කර කිරණ ඈ තසම සද පියවිනම්–**
**(3) අත් රුක් සමන්බහඳුරු ඈඳුරු කන් ඇඹුල් ඈ තබවසද පියවිනම්–ෲ**

ලෙස මයි–නර යන ධාතුව පාලියෙහි පමණක් මෙසේයි–සංස්කෘත යෙහි **නෘ** යන ධාතුවයි–මාගධ භාෂාවට පමණක් සමහෙයින් තත්ස මයි කියනලදී-එක භාෂාවකින් තත්සමවන එකක් තව භාෂාවකින් තද්භවලෙස වීමද දතයුතු–**ශා** යනාදියෙන් **ශෙම්** යනාදී ක්‍රියා සිඩ වීම සුවසේම හැණේ.

දන, (ජයගැණීම් අර්ථයෙහිවූ) දනයන ධාතුය; නැගි, (ලඞ්ඝනයෙ හි ඉක්මවා පැනයාමෙහිවූ) නැගි යන ධාතුය; සමර; සිහිකිරීමෙ හිවූ) සමර යන ධාතුය; තුලුර, (වැළඳගැන්මෙහිවූ) තුලුර යන ධා තුය; ඈ යනාදිය තබවද්‍යපියවිනම්, තද්භවධාතු ප්‍රකෘතිනම්වේ–පාලි සංස්කෘත භාෂාදෙක්හි දිනීමෙහි ජි යන ධාතුවයි, පාලියෙහි ක්‍රියාව සැදෙනවිට **ජිනාති** කියාත්වේ. එහෙයින් **'දන'** යනු පාලි ධාතු වෙන් භින්නවූයේයි–ඒ භාෂාදෙක්හි, **ලඞ්** යනු පැනයාමෙහි අර්ථ ඇති ධාතුවයි–එයින් නැගි කියා බිඳේ–එම ධාතුව 'ලගි' කියාත් බි ඳේ-සිහිකිරීමෙහි, පාලියෙහි 'සර' යන ධාතුවයි-සංස්කෘතෙහි **"ස්මෘ** යන ධාතුවයි-පාලියෙහිද සර යන ධාතුවට කිසිතැනෙක්හි "සමර" යයි අදෙශවේ–එහෙයින් ප්‍රධාන වශයෙන් **සමර** යන ධාතුව සංස්කෘ තෙන් භින්නයයිද, අප්‍රධාන වශයෙන් පාලියෙනුත් භින්නයයිද සැල කියයුතුයි–**තුලුර** යන ධාතුව පාලියෙහි හෝ සංස්කෘතෙහි හෝ අස වල් ධාතුවෙන් භින්නයයි අපට නොහැණේ–සමහර සිදත්සඟරා පරණ පොත්වල **"දනනැගි සමරතුලුවරඈ තබවද්‍යපියවිනම්"** කියා තිබේ–ඒ සන්නයෙහිද **"වැලඟිමෙහි"** යන පදයක් පෙණේ– එහෙයින් තුලනාර්ථයෙහි **'තුල'** යන ධාතුය; වැළඟිමෙහි **වර** යන ධා තුයයි සිතියයුතුයි–එසේකල **'තුල'** යන ධාතුවෙන් තුලු කියා භින්න වියයි සිතියහැකි–වැලඟිමෙහිවූ **'වර'**යන ධාතුව පාලියෙහිත් එසේ මය–එමනිසා පාලියට තත්සම නමුත් සංස්කෘතයෙහි ඒ ධාතුව **'වෘ'** කියා තිබෙන හෙයින් වර යනු එයින් භින්නයයි සිතියහැකිවේ. ද්‍රවිඩ භාෂාවෙහි වැලඳගැන්මෙහි "තළුව"යන ක්‍රියා ශබ්දයක් පෙණේ. එයින් තුලුරයි බිඳුන බැව් සැලකියයුතුයි,

ශබ්ද ප්‍රකෘතියෙහි

ෲ කොළඹ, යාත්‍රාතීර්ථයක් කියන්නාවූ (යාත්‍රානරණ තොටුපලනාව නම්වූ) කොළඹ ශබ්දයද *; කරළු, නවවසුනු(අළුත්රෙදි)වාචිවූ "කර

* යාත්‍රාතීර්ථවාචී ; කොළඹ ශබ්දයයි පුරාණ සනනයෙහි කියනලදී.

එ" ශබ්දය; ඈ, ආදිය; නිපන්සද පියවිනම්, නිෂ්පන්න ශබ්ද ප්‍රකෘති නම්වේ-මෙහි **කොළඹ** යනු නැව් යාත්‍රාකරණ තොටුපලකට නමක් වශයෙන් මේ රටේම උපන් නමකි-එය දුන් කොළඹට කියනු මිස වෙන එබඳු තොටුපලකට නොකියති-එමනිසා එම තොටුපලට කරණලද නමක්යයි සිතෙන නමුත් තිඪාඪයි-පුරාණ පාලි පොත්වල "කලම්බුතිත්ථං" කියා කොළඹ තොටුපලට සඳහන්කර තිබේ-ඒ සිංහල නාමයෙන් ගන්නාලදැයි සිතියයුතුයි- අථත් රෙද්දට නම් වශයෙන් කියනලද **කරළු** ශබ්දයද ලඞකාවේම උපන් ශබ්දයකි—එසේ පාලි සංස්කෘතාදියට නිවිටුනුවූ **ලිඛිණ්** ආදි ශබ්දයෝ නිෂ්පන්න යයි දතයුතු—ගජ, හස්ති (ඇත්) වාචකවූ ගජශබ්දය; කර, හස්ත (අත්) වාචකවූ කර ශබ්දය; කිරණ, රශ්මි (රැස්) වාචකවූ කිරණ ශබ්දය; ඈ, ආදිය; තත්සමසදපියවිනම්, තත්සම ශබ්දප්‍රකෘතිනම් (වේ)—ගජ යනාදිය පාලි සංස්කෘත දෙක්හිද එසේමයි—ඊට සම හෙයින් තත්සම ශබ්දයි.

**අත්**; (අත්ථශබ්ද පර්‍යායවූ) අත් ශබ්දය; * රුක්, (රුක්ඛශබ්ද පර්‍යායවූ) රුක් ශබ්දය; සමන්බහදුරු, (සමන්තභද්‍ර ශබ්ද පර්‍යායවූ) සමන්බහදුරු ශබ්දය; ඇදුරු, අද්‍රි ශබ්ද පර්‍යායවූ ඇදුරු ශබ්දය; † කන්, (නෙත්‍ර පර්‍යායවූ) කන්ශබ්දය; ඇඹුල්, (කම්බල හෝ අම්බිල ශබ්ද පර්‍යායවූ) ඇඹුල් ශබ්දය; ‡ ඈ, ආදිය; තද්භවසද පියවිනම්, තද්භව ශබ්ද ප්‍රකෘතිනම් (වේ)-අත් යනු පාලි අත්ථ ශබ්දයෙන් භින්නයි-අර්‍ථයි-සංස්කෘත අර්‍ථ ශබ්දයෙන් බුන්කල **'අරුත්'** කියාවේ-**රුක්** යනුද පාලි රුක්ඛ ශබ්දයෙන් භින්නයි-**සමන්බහදුරු** යනු සංස්කෘත සමන්තභද්‍ර ශබ්දයෙන් භින්නයි-බුදුයි-**ඇදුරු** යනු සංස්කෘත අද්‍රි ශබ්දයෙන් භින්නයි-පර්‍වතයි **කන්** යනු ද්‍රාවිඩ කණ් ශබ්දයෙන් භින්නයි-නෙත්‍රයයි-**කන්** යනු කණ් ශබ්දයෙන් බිඳුන ශබ්දයමයයි

* පාලියේ **අත්ථ** යනශබ්දයෙන් අර්‍ථය හැඟේ-සිංහල **'අත්'** යන ශබ්දයෙනුත් එම අර්‍ථය හැඟේ-එහෙයින් අත්ථ ශබ්ද පර්‍යායයි කියනලදී-පර්‍යායනම් සාමානාර්‍ථ ශබ්දයයි-හස්ත ශබ්ද පර්‍යායයි සමහර පොතෙක පෙණේ-**'හත්ථ'** ශබ්දයෙන් බිඳෙන ශබ්දය **හත්** කියාවේ-නැවත හකාරයට අකාරයවී මෙත් **අත්** යනුවේ.

† **ඇදුරු** ශබ්දය ආචාර්‍ය ශබ්දයෙන් බිඳුනේයයි සමහරු සලකති-පර්‍වතයට නම්වූ අද්‍රි ශබ්දයෙන් බිඳුනබව පෙණේ-එසේ පුරාණ සන්නවල පෙණේ-ආචාර්‍ය ශබ්දයෙන් බිඳෙනකල "අජර" කියා බිඳේ-නැවත ආදෙය පිලිපෙරළිවලින් ඇදුරු කියාවේ.

‡ **විශ්‍රාමශාලා** වාචකයයි ඇතැම් පොත්වල පෙණේ-විශ්‍රාමශාලානම් අම්බලමයි-අම්බලමට ඇඹුල් යන නමක් හෝ ඊට ආසන්න මාගධ සංස්කෘත නාමයක් හෝ අප්‍රකටයි-අම්බලම් යන ද්‍රාවිඩ ශබ්දයෙන් බිඳියහැකිවේ-සමහර පුරාණ සන්න පොතක කම්බල ශබ්දයයිතිබේ.

පාලි අම්බිලශබ්දයෙන් බුන්කල ඇඹුල් රසට නම්–කම්බල ශබ්දයෙන් බුන්කල කම්බලයට නම්වේ, පාණ්ඩුකම්බල; ශෛලාසනයවද පඬුඇඹුල් සලසුනැයි කියත්. මෙසේ හෙදවන ශබ්ද තද්භවයි, මේ බිදීම වඞ්ගාදි භාෂාවලින්ද වේ. එනම්, වඞ්ගභාෂාවෙන් රුමාල්-උරමාලේ–හෝනා-ඕනෑ–තුක්කා–කුක්කා යනආදියයි. තෛලිඞ්ගික හෙවත් ආන්ද්‍රභාෂාවෙන් පනිවුඩ–පනිවිඩ යනආදියයි. දෙමළෙන් ශාවල්-සැවුල් කොඩෙ–කුඩෙ යනආදියයි. එසේ ඒ ආසන්න භාෂාවලින් තත්සම වචනද වේ–මෑතකාලයෙහි යුරෝපීය භාෂාවලින් බරාඳ, කරත්ත, යන ආදි වචන ඇවිත් තිබේ. නුමුත් ඒ වචන මෑත කාලයෙහි පුරුදුවූ හෙයින් සිදත්සඟරාව කළ ප්‍රතිරාජ පරිවෙණ ස්වාමින්ට අභිමත නොවී.

මාගධ සංස්කෘතාදියෙන් භින්නව එන ධාතු හා නාම ශබ්ද ඒ මුලින් තිබුනු අර්ථය පමණක් නොව ඊට ආසන්න අර්ථද ගණී–ඒ මෙසේයි, පාලියෙහි වඩ්ඪ–යන ධාතු වර්ධනය විමෙහි වේ. සැළලිහිණි සංදේශයෙහි "වඩිනමැනවි මහවෙලමැද වෙරළාන" කාව්‍යශේඛරයෙහි "ඔබවඩන මගතුර" යනආදි උදාහරණයි-ගරුවශයෙන් කියන තැන ගමනෙහි වඩ යන ධාතුවයි.

'සද' යන ධාතුව හිඳීමෙහි වේ-එයින් භින්නවූ 'හිඳි' යන ධාතුව සිංහලභාෂාවේ හිඳීමෙහි පමණක් නොව සාමාන්‍යයෙන් වාසයකිරීමෙහිද වේ.

කොකිල සංදේශයෙහි "උත් ආරිය සක්විතිරජ දූහැදුරට" යත්නෙහි උත්, වාසයකළාවූ යන අර්ථයි.

"පෙරඑකදිවිසෙහිද" යනආදියෙහි හිඳ යනුද වාසයකොට යන අර්ථයි.

දැළි, යනු රැවුලට නම්වනකල්හි "දාඨිකා" ශබ්දයෙන් බිඳුනේවේ. එය උඩුතොල රැවුලට පමණක්වේ—නුමුත් සාමාන්‍යයෙන් රැවුලටද නම්වේ.

සමහර වචන මෙකල ව්‍යවහාරයෙහිද තුබුනු අර්ථයට වෙනස්ව පවතී—ඒ මෙසේයි.

භණ, යන ධාතුව කථාවෙහි පවතී-එයින් බුන් "බණ" යන ධාතුවෙන් හැදුනු "බණී" යන ක්‍රියාව සාමාන්‍යයෙන් කීමේ පවත්නා නුමුත් මෙකල ව්‍යවහාරයෙහි පරුෂකීම වශයෙන් ගනිත්-එයින් උපන්නාවූ ක්‍රියානාමයක්වූ බණ යනු ධර්මදෙශනාවට ව්‍යවහාර කරත්.

සමහර තද්භව ශබ්දයක් මුලවූ ශබ්දාර්ථයට විරුද්ධාර්ථද ඇතිවේ, පාලියෙහි-සන්තිකං–යන නිපාතය ශීඝ්‍රනොවූ හෙවත් සෙමින් යන අර්ථ ඇතිවේ, එයින් බිඳුන හනික යන නිපාතයක් සිංහලභාෂාවේ ක්‍රියාවිශේෂණව තිබේ—එහි අර්ථ වහා යනුයි. ඒ මුල් ශබ්දයට විරුද්ධාර්ථ ඇත්තේයි.

**දසින් නමින් හොත කරුණුයේ පසනම්,
තිළි, කරණී, නියරි ඇඟි–[illegible]**

### ප්‍රත්‍යයවිධියේ ආකාර.

[illegible] දසින්හොත, ධාතුව කෙරෙන් හෝ; නමින්හොත, නාමය කෙරෙන් හෝ; කරුණුයේ, අර්ථාපෙක්‍ෂාවකට කාරණවූයේ; (අර්ථාපෙක්‍ෂා කොට උපදවන වර්ණය) පසනම්, ප්‍රත්‍යයනම් වේ.

ධාතුවකින් පරකොට හෝ නාමයකින් පරකොට හෝ යම් අර්ථභෙදයක් හඟවනපිණිස කාරණාවශයෙන් තබනුලබන්නේ ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි ප්‍රත්‍යයනම් වේ * එය එක අකුරක්හෝ අකුරු කීපයක් ඇති ශබ්දයකි.

### උදාහරණ.

තිළි, (ළ්) සතුටුවී; නොහොත් සතුටුවැ; කරණී, කටයුත්ත; නියරි, නුවරවැසියා; ඇඟි, ආදී ආකාර ඇත්තේය.

මෙහි ප්‍රත්‍යය මෙසේ හැඳිනිය යුතුයි–තුස, යන ධාතුව සතුටුවීමෙහි වේ; ඒ ධාතුව කෙරෙන් අතීතකාලයෙහි අන්‍යකාරක එකවචනාර්ථයෙහි කර්තෘකාරකයෙහි හෝ පූර්වක්‍රියාවෙහි හෝ ඊ යන ප්‍රත්‍යය වේ † තුයන්නේ පිලිපෙරළිද සයන්නට ළකාරාදෙශද කොට ළයන්න සබ්බන්ධ අයන්න මකා ඊයන්න ළයන්නට ආරූඪකළකල්හි 'තිළි' යනු සිඩවේ. මෙසින් 'තුස' යන ධාතුවට අගින් තැබූ ඊයන්න ප්‍රත්‍යයයි හැඳිනගතයුතුයි. කර, යනු කිරීමෙහි අර්ථඇත්තාවූ ධාතු ප්‍රකෘතියයි, එසින්පරවැ කර්මාර්ථයෙහි නී යන ප්‍රත්‍යයවේ ‡ රයන්නෙන් පරහෙයින් නීයන්නට ණීයන්න ආදේශකිරීම ඇතම් පණ්ඩිතයන්ගේ මතයි–එසේ කළකල්හි 'කරණී' යන ශබ්දය වේ–කටයුත්තය

* ප්‍රත්‍යය යන ශබ්දය, සහතිකයෙහි, ඥුවනෙහි, විශවාසයෙහි, අසිතිදෙයෙහි ශබ්දයෙහි, සිදුරෙහි, ආධාරයෙහි, නිශචයෙහි, මිහිරි දෙයෙහි, කාරණයෙහි. ව්‍යාකරණයෙහි කියනලද ප්‍රකෘතියක් නිමිත්තකොට කරණු ලබන ශබ්ද ප්‍රභෙදයෙහිද වැටේ-මෙහි අනතිම කියනලද අර්ථයෙහි ප්‍රත්‍යය ශබ්දය කියන ලදි-යට කියනලද ධාතුප්‍රකෘති ශබ්ද ප්‍රකෘති යන දෙකෙන් එකක් මුලට තබාගෙණ යම් අර්ථභෙදයක් අඟවන පිණිය අගින් යම් එක අකුරක් හෝ අකුරු කීපයක හෝ ශබ්දයක් ඒ ප්‍රකෘතියට එකතුකොට අමුතු වචනයක් කරත්නම් ඒ අගින් ගැලපූ ශබ්දය ප්‍රත්‍යයයි.

† මේ ප්‍රත්‍යය ක්‍රියාධිකාරයෙහි "ඒ ඉ ඊ උද අසු" යනආදී සූත්‍රයෙහිද "එක කතු කිරියනෙන්" යන අදී සූත්‍රයෙහිද පෙණේ-මේ පද සිඩවීමෙහි අසවල් සූත්‍රයෙන් මෙසේවෙයි යන අදිය මෙතන්හි කීම ප්‍රයෝජන මදවේ, ක්‍රියාධිකාර ප්‍රත්‍යයාර්ථාධිකාර දෙක්හි ඒ පදසිඩිය විස්තර කරන්නෙමු.

‡ මේ ප්‍රත්‍යය "දසින්නෙමෙන් හොත කරැ අරුතට නිසිපසන්" යන සූත්‍රාර්ථ පරිද්දෙන්වේ.

**නොදූව නුගුණදූවනිසා සකරුණෙන් දමුවවැ සිදු කිරියනම්,**
**දිනී වැජඹෙයි දෙන්නෙම් ඇගී-8**

යන අර්ථඇතිවේ-මෙහි නියනු ප්‍රත්‍යයයි-එය ධාතුව කෙරෙන් වී- නුවර යනු පුරයට නාමකි. ඒ නාමය කෙරෙන් විමේ අර්ථයෙහි නුව රෙහිවූයේ යන වාක්‍යයෙහි ඊ යන පත්‍යයවේ-නයත්තේ පිළිපෙරළී වකාරයට යකාරාදෙශ යනආදිය කළකල්හි 'නියරි' ශබ්දය සිඩවේ— නුවරෙහි යනතැන එහි යන විභක්තියද වූයේ යන්නද ලොප්වේ- නගරවාසියා යන අර්ථයි, නුවර යන ශබ්දයෙන් පූරයක් කියත්. ඊප්‍ර ත්‍යය යෙදීමෙන් 'නියරි' ශබ්දයවූකල එයින් නුවරවැසි කෙනෙක් කියත්-තිළි යනුද කරණී යනුද ධාතුව කෙරෙන් ප්‍රත්‍යයවූ තැනි- ඉන් එකකින් නාම ශබ්දයක් සිඩයි-නියරි යනු නාමය කෙරෙන් ප්‍රත්‍ය යවූතැනි-එහි පෙරතිබුන නාමයෙන් අන්‍යනාමයක් සිඩයි-පසුව සිඩවූ නාමය ප්‍රත්‍යයාර්ථ නාමයයි.

## ක්‍රියාවේආකාරය.

8 නොදූව්, ද්‍රව්‍යනූවූ; නුගුණ, ගුණනූවූ; දූවිනිසා, ද්‍රව්‍යාශ්‍රයකොට; සකරුණෙන්, කාරකසයෙන් හෙවත් කාරකසයේ හෙතුවෙන්; දමු වවැ, ධාතුමයවැ හෙවත් ධාතුවෙන් කරණලද්දක්වැ;සිදු, සිඩවූයේ; කිරියනම්,ක්‍රියානම් වේ-ක්‍රියාව පොළෝ ජලආදී ද්‍රව්‍යයකුත්නොවේ. රූපරසාදිවූ හෝ නීලපීතාදිවූ හෝ ගුණයකුත් නොවේ-එසේත් ක්‍රියා වක් ද්‍රව්‍යයකට එකතුව උපදී-කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර, යන කාරක සය හෙතුකොට ක්‍රියාව උපදී, හෙවත් සිඩවේ * ක්‍රියාව ධාතුමයයි-ධාතුමය නම් ධාතුවෙන් කරණලද්දකි-ධාතුවක්ම ක්‍රියාව නොවේයයි එයින් හඟවත්-දණ්ඩෙන්කරණලද බඩුවක් දණ්ඩ මයනම් වේ,එලුවෙහි දඬුමුවයි කියති-රත්නයෙන් කරණලද බඩුවක් රත්නමයනම්|වේ, එලුවෙහි රුවන්මුවයි කියති-එමෙන් ධාතුවෙන් කරණලද්දක් ධාතුමයනම් වේ-එලුවෙහි දාමුවැයි කියත්.

## උදාහරණ.

දිනී,(උෂ) ජයගනී නොහොත් උපන්නේය; වැජඹෙයි, (තෝ) විජෘම්භමාන (ප්‍රකාශ) වන්නෙහි, දෙන්නෙම්, (මම) ජීවත්වන්නෙ මි; (නොහොත් දානයකරන්නෙමි) ඇගී, ආදී ආකාර ඇත්තේය.

මෙයින්'දිනී'යනආදී පදතුන ධාතුවෙන් කරණලද ක්‍රියායි දතයුතු.

---

* කාරකසයේ හෙතුවෙන් ක්‍රියාව උපදිනබව ක්‍රියාකාරක පදසම්බන්ධා ඞ කාරයෙහි කියනලදී. එහෙයින් ඒ ක්‍රමය එතැනදීම විස්තර කටයුතුය යන අදහසින් මෙතැනදී විස්තර නොකරමු.

**දන**–යනු ඉපදීමෙහි, වැටෙත්නාවූ ධාතුවයි–එයින් පරකොට අතීතකාලයෙහි, අන්‍යකාරක එකවචනවූ කර්තෘකාරකයෙහි "ඒ ඉ ඊ උද" යනආදී සූත්‍රයෙන් දැක්වූ ඊ යන ප්‍රත්‍යය යොදා දයන්නේ පිලිපෙරළිකොට නයන්න සම්බන්ධ අයන්න මකා නයන්නට ඊයන ප්‍රත්‍යය ආරූඪකළකල්හි දිනියන ක්‍රියාපදය සිඩවේ.

උපනී යන අර්ථ ඇතිවේ—අන්‍යකාරකයෙහි හෙයින් කර්තෘ 'ඌ'යි ගතයුතුවේ.

මේ ක්‍රියාවට මුල්වූයේ ධාතුවයි–එයින් කරණලද්දාවූ නොහොත් උපන්නාවූ 'දිනි' යන පදය ක්‍රියාවයි.

**ජඹ** යනු ශරීරය නැමීමෙහි නොහොත් මුඛය විකාශකිරීමෙහි වැටෙත්නාවූ ධාතුවකි–ඊට පූර්වයෙන් **වි** යන උපසර්ගය ඇතිකල්හි ප්‍රකාශවීමෙහිද, සැපසේ විසීමෙහිද අර්ථ ඇතිවේ–**වි** යන උපසර්ගය මුල්කොට ජඹ යන ධාතුව තබාගෙණ වර්තමානකාලයෙහි **ත** ශබ්දකාරක එකවචනාර්ථයෙහි **එයි** යනු යොදා වියන්නේ පිලිලොප් ආදිය කොට ගැළපූකල **වැජඹෙයි** යන ක්‍රියාපදය සිඩවේ–මෙහි **ජඹ** යනු ධාතුවයි උපසර්ග සහිතවූ ඒ ධාතුවෙන් කරණලද නොහොත් උපන් **වැජඹෙයි** යන පදය ක්‍රියාවයි–ප්‍රකාශවන්නෙහි නොහොත් සැපසේ වාසය කෙරෙහි යන අර්ථ ඇත්වේ–**එයි** යි තශබ්දකාරකයට අයිති ප්‍රත්‍යය පෙණෙනහෙයින් **හෝ** යි කර්තෘ ගතයුතුයි.

**දි** යනු ජීවත්වීමෙහි වැටෙත්නාවූ ධාතුවයි–ඒ ධාතුව කෙරෙන් අනාගතකාලයෙහි මශබ්දකාරක ඒකවචනාර්ථයෙහි **එන්නෙමි** යන ප්‍රත්‍යය යොදා දියන්න සම්බන්ධ ඊකාරය මකා එයන්න දකාරයට ආරූඪකළකල්හි **දෙන්නෙමි** යන ක්‍රියාපදය සිඩවේ–ජීවත්වන්නෙමි යන අර්ථ ඇත්තේයි–**එන්නෙමි** යනු මශබ්දකාරකහෙයින් මම යි කර්තෘ ගතයුතුයි. මේ දීමෙහිවූ **දා** යන ධාතුවෙන් සිඩවීමද ශඞ්කාර හිතයි. එබැවින් දානයකරන්නෙමි යන අර්ථද වේ.

ක්‍රියාධිකාරයෙහි පෙණෙන අන්‍යකාරක, තශබ්දකාරක, මශබ්දකාරකතුනද, අතීත, වර්තමාන, අනාගත යන කාලතුණද, මෙහි කියනලද **දිනි, වැජඹෙයි, දෙන්නෙමි** යන ක්‍රියාපද තුණෙන් කියනලදී–**දිනි** යනු අන්‍යකාරක අතීතයි–**වැජඹෙයි** යනු තශබ්දකාරක වර්තමානයි–**දෙන්නෙමි** යනු මශබ්දකාරක අනාගතයි. * ව්‍යාකරණ ශාස්ත්‍රයට පැමිණි ක්‍රියා විධිය හා ක්‍රියාකාරක පදසම්බන්ධ විධියද අවබොධකිරීම මහත් ප්‍රයොජනයි–ව්‍යාකරණයේ අවබොධය දුෂ්කරවූ

* මෙයින් ද්‍රව්‍යගුණාදි නාමශබ්දනුවූ **කලෙමි, කරමි, කෙළේ, ගියෙමි, ගියේ** යන ආදීන් කිරීමක් හෝ **වීමි, වෙමි, බැබලී, බබලත්** යන ආදීන් වීමක් හෝ කියනුලබන වචන ක්‍රියාපදයි දැනගැන්ම සිඩකටයුතුයි

**වණන් අනුසුරුවීම් ලොප්නම්.**
**නත්වරද මහසුප් රදූ බා පා ඈගි a**
**වණක්හු ලොපා වණක්හු කිරීම් අදෙස්නම්.**

---

කොටස්ද ඒය–එහෙයින් ඒ විස්තරකරණුපිණිස ක්‍රියාධිකාරයද ක්‍රියාකාරක පදසම්බන්ධාධිකාරයද විස්තරවශයෙන් කරණලදී.

**ලොපවිධියේ ආකාර.**

a වණන්, වර්ණයන්; (අක්ෂරයන්) අනුසුරුවීම්, **උච්චාරණය නොකිරීම්; ලොප්නම්, ලොපනම්වේ.**

වචන සැපසේ කියන පිණිස ඒ වචනවල ස්වභාවයෙන් තිබුනු සමහර අකුරු නොකියාහැරීම ලොප්නම්වූ විධියයි දතයුතුයි. *

**උදාහරණ.**

නත්, අනත් යනතන්හි නත් කියාද; වරද, යුවරද යනතන්හි වරදකියාද; මහසුප්, මහකසුප් යනතන්හි මහසුප්කියාද; රදූ, රජ දූ යනතන්හි රදූ කියාද; බා, බාහු යනආදි තන්හි බා කියාද; පා පාද යන ආදි තන්හි පා කියාද; ඈගි, ආදි ආකාර ඇත්තේයි.

මෙහි ස්වභාවයෙන් **අනත්** කියා තිබුන ශබ්දයේද මුල්වූ **අ** යන්න හැර **නත්** කියත්–අනන්තයක් නැත්තේයි, නොහොත් අනන්තනම් නාගයායි–**නත** සිද කියත්. ස්වභාවයෙන් **යුවරද** යි තිබුනු ශබ්දයේ යුයන්න හැර **වරද** යි කියති–උපරාජයායි. **මහකසුප්** යන ශබ්දයේ මැද කයන්න හැරදමා **මහසුප්** යි කියත්–මහාකාශ්‍යපනම්වූ ස්ථවිරයෝයි. **රජදූ** යන ශබ්දයේ මැද ජයන්න හැරදමා **රදූ** යි කියත්–රජහුගේ දුවයි. **බාහු** යන ශබ්දයේ හුයන්න හැරදමා **බා** යී කියත්—හස්තයේ වැලම්ටෙන් උඩකොටසයි. **බාග** ශබ්දයේ අග ගයන්න මැකුකල්හිද එසේමයි. **පාද** යන ශබ්දයේ අග දයන්න හැරදමා **පා** යි කියත්–පාදයයි. **පාසස** යන්නේද **සස** යනු හැර **පා** යී කියත්–**පාසාද** යන්නේද **සාද** යනු හැර එසේ කිම හෝ ලිවීම හෝ ලොප විධියයි.

මෙහි **නත්, වරද** යන දෙතන්හි පූර්වවර්ණ ලොපයි–**මහසුප්, රදූ** යන දෙතන්හි මධ්‍යවර්ණ ලොපයි–**බා පා** යන දෙතන්හි අන්ත්‍යවර්ණ ලොපයි–(මේ සදරුත් යනආදි අඩහසූත්‍රයෙන් සිඩයයි දතයුතු).

b වණක්හු, වර්ණයක්; (අක්ෂරයක්) ලොපා, ලොප්කොට; (නැතිකොට) වණක්හුකිරීම්, (අන්‍යවූ) අක්ෂරයක් කිරීම්; **අදෙස්නම්, ආදෙශනම්වේ.**

තිබුනු අකුරක් නැතිකොට අමුතු අකුරක් ඒවෙනුවට තැබීම ආදෙශනම් වෙයි.

---

* ලිවීමෙහි තිබුනු අකුරු මකාදැමීමයි.

**සැරියුත් අසුණු වැහැප් ඇගි b**
**වණක්හු නිසා ඔහු නොලොපා වනුයේ අගම්නම්.**
**නිරලඹ රුවාරු ඇගි. c**

---

උදහරණ.

b **සැරියුත්, සැරිපුත්** යනතන්හි **සැරියුත්** කියාද; **අසුණු, අගුණු** යන තන්හි **අසුණු** කියාද; **වැහැප්, වසබ්** යන තන්හි **වැහැප්** කියාද; ඇගි, ආදි ආකාර ඇත්තේය.

මෙහි **සැරියුත්** යන ආදියෙන් ආදෙශය හැඳිනගතයුතුයි.

**සැරිපුත්** යන ශබ්දයේ පයන්න මකා ඒ වෙනුවට ය-යන්න කළ කල්හි **සැරියුත්** යනුවේ-ශාරිපුත්‍රනම් ස්ථවිරයන්වහන්සේය.

**අගුණු** යන ශබ්දයේ ගයන්න මකා ඒ වෙනුවට ය යන්න කළ කල්හි **අසුණු** යනුවේ-අගුණසි.* **වසබ්** යන ශබ්දයේ සකාරයට හකාරයද, බකාරයට පකාරයද ආදෙශ වශයෙන් කොට වයනු හයනු සම්බන්ධ අකාරයට මාත්‍රාවෘද්ධි † ද කළකල්හි **වැහැප්** යී සිඩවේ—වෘෂභයයි. ‡

**ආගම විධියේ ආකාරය.**

c වණක්හු නිසා, වර්ණයක් ආශ්‍රයකොට; ඔහු නොලොපා, ඒ අක්ෂරය ලොප්නොකොට; වනුයේ (අමුතුවෙන්) ඇතිවන්නේ; අගම්නම්, ආගම නම්වේ.

ස්වභාවයෙන් තිබෙන අකුරකට එකතුව ඒ තිබුනු අකුරත් නැති නොකොට ඇතිවන්නාවූ අකුරක් ආගම නම්වේ. §

උදහරණ.

නිරලඹ, නි අලඹ යනතන්හි නිරලඹ යනුද, රුවාරු, රූ අරු යන

---

* **සැරිපුත්-අගුණු** යන දෙතන්හිම ප-යනු ග-යනුවල පිලිවූ උයන්න තිබුනුසේමවේ.

† අ-යන්න ඈ-යන්න කිරීම ප්‍රතිරාජ පරිවෙණස්වාමිගේ මතය ලෙස මාත්‍රවෘද්ධි-පිලිපෙරලීසිද කියයුතුයි.

‡ මේ අදෙශ ව්‍යවහාරයෙහිදී සුවසේ කීම ප්‍රයොජනකොට ඇතිවේ-අදෙශද **සදරුණ්** යන අදි සූත්‍රයේ කීපරිද්දෙන්වේ-මේ ලොප අදෙශයන විධි දෙක තද්භව ප්‍රකෘතින් කෙරෙහි බොහෝසේ පෙණේ, එකම තද්භව ශබ්දයේ ලොපාදෙශවිධි දෙකම පෙණේ-බුඩදාස යන ශබ්දය බිඳීමෙහි බුඩ ශබ්දයෙන් බුදු කියාද, දාස ශබ්දයෙන් දස්කියාද, **බුදුදස්** ශබ්දයක්වැ සිඳේ. එහි බුදු යන තන්හි දුයන්න ලොප්කළ කල්හි **බුදස්** කියාවේ-බුදස් ශබ්දයේ දයන්න මකා ඒ වෙනුවට ජයන්න යෙදූකල බුජස් යනුවේ-බුඩදාස නම් රජ **බුජස් රජ** යි සිංහල භාෂාවෙහිවේ.

§ **සංස්කෘත ව්‍යාකරණකාරයෝ අගමවන අකුර මිත්‍රයෙක් සමානයිද ආදෙශවන අකුර සතුරෙක් සමානයිද කියත්.**

## පරවණ්හට පෙරරූ කරණු පෙරරූනම්.
විස්සම් ඇගී–෧

තන්හි **රූවාරූ** යනුද; ඇගි, ආදිඅකාර ඇත්තේයි–**නි** යනු නැත යන අර්ථයෙහි උපසර්ගයයි–**අලඹ** යනු ආලම්බනය හෙවත් එල්බීමයි මේ දෙක එකතුවූ **නිඅලඹ** කියනකල්හි අලඹ යන වචනයේ අකාර යපිට රයන්නක් වේ–ඒ අමුතුවෙන්වූ රයන්න ආගමයකි–එසේවූ කල්හි නිරලඹ කිවාවේ–එල්බීමක් නැත්තේය–**රූ අරූ** යන තන්හි උකාරයෙන් පරවූ අයන්න පිට වයන්නක් ආගමව එම අයන්නට මාත්‍රාවෘඩියක්වීමෙන් **ආ** වූකල්හි **රූවාරූ** යනුවේ—රූපාරූපයි. **මේ** ආගම විධිය ආගමසන්ධි ක්‍රමයෙහි බලා අවබොධකටයුතුයි.

### පූර්වරූපයේ ආකාර.

෧ පරවණ්හට, පරවූ වර්ණයට; (පසුව තිබෙන අකුරට) පෙරරූ කරණු, පූර්වරූපකිරීම; (මුලින් තිබෙන අකුරේ ආකාර කිරීම) පෙරරූ නම්, පූර්වරූපනම්වේ.

වචනයක එකට ගැලපෙන අකුරු දෙකකින් අග අකුර මුලින් තිබෙන අකුරලෙසම කර කීම පූර්වරූපනම්වේ.

### උදාහරණ.

**විස්සම්**, විස්කම් යන තන්හි විස්සම් යන; ඇගි, ආදි අකාර ඇත්තේයි–**විස්කම්** යන තන්හි පරවූ කයන්නට පූර්වවූ සයන්නේ ආකාරම හෙවත් එම සයන්නම ආදෙශකළකල්හි **විස්සම්** කියාවේ–විශ්ව කර්මයායි. මාගධ භාෂාවෙහි විස්ස යන ශබ්දයෙන් විස් කියාද කම්ම යන ශබ්දයෙන් කම් කියාද බිඳේ–එසේ බිඳුනුකල්හි නැවත **කම්** යන්නේ කයන්නට පූර්වවූ සයන්නම කෙරේ–එකල **විස්සම්** යනුවේ–මේ විමද **සදරූන්** යන ආදි සූත්‍රයෙහි කීපරිද්දෙන්වේ–මිනිස්–නු–යන තන්හි **මිනිස්සු**, **පන්කම්** යන තන්හි **පන්නම්** යන ආදියත් මෙසේයි–එහෙයින් පූර්වරූප විධියද * සන්ධික්‍රමයට අන්තර්ගතයි–එහෙයින් සන්ධ්‍යධිකාරයෙහි පූර්වරූපයෙහි විස්තර දතයුතු.

---

* මෙහි පරවර්ණයට පූර්වරූපකිරීම පූර්වරූපනමැයි කීපමණක්මුත් පූර්වවර්ණයට පරරූපකිරීම පරරූප වන ක්‍රමය නොකියන ලද්දේය–පරරූපවිධියද කාව්‍යවලද ලොකව්‍යවහාරයෙහිද පෙණේ–සැලලිහිණිසන්දෙශයෙහි "**පොහොසද්දන ඇතිතුනුරුවන බැතිපෙමා**" මෙහි පොහොසත් යන තකාරාන්ත ශබ්දයේ තකාරයට පරවූ දන ශබ්දයේද දකාරයම කළබව පෙණේ–පොහොසත් ශබ්දය ප්‍රකෘතියෙන් දකාරාන්තනොව තකාරාන්තබව ගුත්තිල **කෙදගින් ඉඳුරසුන් උණුකරන පෝසත්**" යන්නෙන් දතයුතු.

**වණ්හමද පදහමද දෙරූ දූනවුම් දෙරූනම්.**
**තුඹුකෙළේ ඒ ලොපල්ලා කුළුණෙන් ලතෙන්නා**
**තෙදියම එකනෙත්නා රණමැද දියකොන්නා**
**දිදී විඳ විඳ පල පල**–ෘ

## විත්වරූපවිධියේ ආකාර.

ෘ වණ්හටද, වර්ණයටද; පදහටද, පදයටද; දෙරූදූනවුම්, ද්වි රූප ඉපදවීම; (එකක් දෙකකිරීම) දෙරූනම්, ද්විරූපනම්වේ.

එක අකුර හෝ එක පදය හෝ දෙකකොට කීම ද්විරූපයයි දත යුතු.

### උදාහරණ.

ඒ ලොපල්ලා, ඒ ලොකපාලතෙම; තුඹුකෙළේ, සන්තුෂ්ටකෙළේ; මෙහි **ලොපල්ලා** යනු ලොපල් ශබ්දයෙන් සිඩවූ ප්‍රථමා විභක්තියේ එකවචනයයි.

ලොකපාල යන සංස්කෘතයටද පාලියටද සමානවූ ශබ්දයෙන් ලොපල් කියා සිංහලට බිඳේ–‘ලොපල්’ ශබ්දයකෙරෙන් පරවූ ප්‍රථමාවිභක්තියේ එකවචනවූ ‘ආ’ යන්නවූකල ද්විත්ව නොකොට පැමිණවූවොත් ‘ලොපලා’ කියාවේ–එහි එක ලයන්න දෙකක්කොට ආයන්න පැමිණවූකලැ **ලොපල්ලා** යනුවේ.

කුළුණෙන්, කරුණාවෙන්; ලතෙන්නා, හෘදය හෙවත් සිත නෙත් වූවනු–මෙහි **ලතෙන්නා** යනු කර්මවිභක්තියේ එකවචනයයි.

ලතෙත්–ශබ්දයකෙරෙන් කර්මවිභක්තියේ ඒකවචනවූ ‘ආ’ යන්න යොදා, න යන්න ද්විත්වනොකොට පැමිණවූවහොත් **ලතෙනා** කියාවේ. න යන්න දෙකකොට ආයන්න පැමිණවූකල්හි **ලතෙන්නා** කියාවේ. තෙදියට, ජගත්‍රයට; (තුන්ලොවට) එනනෙත්නා, එක ඇසක් වූවනු.

---

කව්සේකරයෙහි **“දුප්පත් මහලු බමුණෙක්”** මෙහි දුක්පත් යන්නෙහි කකාරයට පරවූ පත්ශබ්දයේ මුල්වූ වර්ණයේ රූපය කලකල්හි දුප්පත් යනුවේ-එහිම **“උන්ලිය නොසිද්දේ”** මෙහි **සිද්දේ** යන ස්ථානයෙහිද ‘සිත්දේ’ කියා තිබුන කල්හි තකාරයට පරවූ දකාරයේ රූපය කලබැව් දත යුතු–ජාතකපොත් ආදියේ පාඨවල **‘දුග්ගෙණ’ ‘දුග්ගත්’** යන ආදිය දුක් ගෙන දුක්ගත් යන ආදිතන්හි පරරූප පූර්වවර්ණයට කිරීමෙන් සිඩබව පෙණේ.

ව්‍යවහාර කථාවෙහි **‘දම්ම’ ‘දුන්ම’** යන ආදියයි.

සංස්කෘතභාෂාවෙහි **‘සත්ජන සජ්ජන’ ජගත්චක්ෂු ජගච්චක්ෂු** යන ආදියට සමාන හෙයින්ද, සිංහලව්‍යාකරණයෙහි මේ පරරූප විධියද අභිමතසිඬ විධියද, සදරූත් යන ආදි අඩගසූත්‍රයේ අර්ථයට ඇතුලත්වේ. මේ විධිය වෙන් වශයෙන් එකක්කොට ගත්කල්හි සිංහල ව්‍යාකරණයෙහි ව්‍යාකරණ විධි එක්විස්සක්වේ–මෙයින් පරරූපය ස්වල්ප තන්හිද, පූර්වරූපය බොහෝ තන්හිද ජෙකපාඨයන්හි පෙණේ.

**පාසායෝගී සකින් උසුරුවනුද රුයි.**
**සක්වලක් පාසා මහමෙර ඇගි.** ෧

මෙහිද "එකනෙත්තා" යනු කර්මවිභක්තියේ එකවචනයයි–ඩටකී පරිද්දෙන්ම තකාරයට ද්විත්වවීම දතයුතුයි.

රණමැද, යුඩමධ්‍යයෙහි; දියකොත්තා, ජයකොඩියක්වූවනු–මෙහිද, "දියකොත්"–ශබ්දයේ තකාරයට ද්විත්වවීමෙන් දියකොත්තායි සිඩවීම එක නෙත්තා කී තැන සේ දතයුතු.

ගුත්තිලයෙහි **තියුණු නුවනැත්තෝ රට රකිනා කැමැත්තෝ, කුළුණෙන් ලතෙත්තෝ උන්හ උන්වෙන රජ ඇමැත්තෝ"** යන ආදි තන්හි මෙසේ ද්විත්වය දතයුතු–සන්ධ්‍යධිකාරයෙහි මෙහි විස්තර පෙනේ.

දිදී, දැනයකරමින්; විඳැවිඳැ, වින්දනයකරමින්; * පලපල, පලායව පලායව–දී යන පූර්වක්‍රියාව හා විඳැ යන පූර්වක්‍රියාවද ද්විත්වකල කල්හි "දිදී විඳැ විඳැ" කියාවේ—'පල' යනු අනුකරණ ශබ්දයයි පුරාණ සන්නයෙහි කියනලදී–අනුකරණ ශබ්දයනම්, සමාන බව කියන ශබ්දයකි–නොහොත් අර්ථ ප්‍රකාශනොව ශබ්දය පමණක් ප්‍රකාශකරණ ශබ්දයකි–පලයනු–බැහැර පලායාමට නියොගකරණ විධි ක්‍රියාවෙහි ලොකයේ ව්‍යවහාරයි–එලවාවකද වේ–ප්‍රකට යන අර්ථයෙහිද–පළ යන ශබ්දයවේ–ප්‍රකට ප්‍රකට දෙය කීමෙහිද–**පළ පළ**යි කියහැකිවේ—එනම පල ශබ්දය දෙවරක් කීමයි–ලොපල්ලා යන ආදියෙහි අකුරට ද්විත්වවීමයි–දිදී යන ආදියෙහි පදද්විත්වයයි— මේ ද්විත්වයද සදරුත් යන ආදි සූත්‍රයෙහි කියේවේ.

**විශෙෂ දැක්වීම.**

෧. පාසායෝගී, පාසා යන නිපාතයාගේ යෙදීමෙහි; සකින්, වරක්; උසුරුවනුද, උච්චාරණ කිරීමද; (කිමද) රුයි, රුචියි.

ද්විත්වකොට කියයුතු කිසිතැනෙක 'පාසා' යන නිපාතය යෙදූනකලැ වරක් කීමත් අභිමතය යනු භාවයි.

**ඊට උදාහරණ.**

ප. සක්වලක් පාසා, චක්‍රවාටයෙක්හි චක්‍රවාටයෙක්හි; මහමෙර, මහාමෙරුපර්වතයයි–ඇගී, ආදි ආකාර ඇත්තේයයි.

---

* දී යනු පූර්වක්‍රියාවයි—එය දෙකකල කල්හි මිශ්‍රක්‍රියාවේ අර්ථය හැඟේ කුමක්හෙයින්ද—ක්‍රියාව අවසන්වූ බව හැඟෙනහෙයිනි–විඳැ යනුද එසේමය–දීර්ඝවූ අන්ත්‍යස්වරයක් ඇති පූර්වක්‍රියාවක් ද්විත්වවූකල්හි මුලින් යෙදෙන දීර්ඝය හ්‍රස්වවේ, එහෙයින් දිදී කියා සිඩයි–ගුත්තිලයෙහි, **"ගියේය පිටි මගාස, මගමගා ය"**–කාව්‍ය ශෙඛරයෙහි, **"සිත දුක්, කියකියා"** යන ආදි කාව්‍යවලින්ද **"කකා බිබී"**–යන ආදී ව්‍යවහාරවලින්ද දතයුතුයි.

**පිළිපෙරළි වණපෙරළි පදපෙරළි විබත්පෙරළි කිරියපෙ
රළි වී පෙරළි පස්වැදෑරුම්.
වසල් රික් කිසුම් ඉපැන් ඈ පිළිපෙරළි
කෙණෙර හුරිර සහන් මහණ ඈ වණපෙරළි.** a

සක්වළැක් සක්වළැක් පාසා නොකියා සක්වළක් පාසා කියාල්හිද– 'පාසා' යනු යෙදුනු හෙයින් සක්වලෙක්හි සක්වලෙක්හිසි හැඟෙන බව කියනලදී. *

## විපර්‍යාසයේ ප්‍රභෙද. †

a ප–පිළිපෙරළි, ප්‍රාණාක්ෂර විපර්‍යාසයද; වණපෙරළි, ගාත්‍රාක්ෂර විපර්‍යාසයද; ‡ පදපෙරළි, පදවිපර්‍යාසයද; විබත්පෙරළි, විභක්තිවිපර්‍යාසයද; කිරියපෙරළි වී, ක්‍රියාවිපර්‍යාසයදැයි කියා; පෙරළි, විපර්‍යාසතෙම; පස්වැදෑරුම්, පස්ආකාරවේ.

## උදාහරණ.

**වසල්**, 'විසල්' යන තන්හි "වසල්" යනුද; **රික්** "රුක්" යන තන්හි "රික්" යනුද; **කිසුම්**, 'කුසුම්' යන තන්හි "කිසුම්" යනුද; **ඉපැන්** 'උපන්' යන තන්හි "ඉපැන්" යනුද; ඈ, මේ ආදිය; පිළිපෙරළි, පිළි විපර්‍යාස හෙවත් ස්වරවිපර්‍යාසය නම්වේ — ස්වරපරිවර්තන නම් ආදෙශ භෙදයෙකැයි පුරාණ සන්නයෙහි කියනලදහෙසින් මේ ස්වරයන්ගේ පෙරළීම ආදෙශ විධියටත් ඇතුළත්වේ.

**කෙණෙර**, 'කරෙණු' යන තන්හි "කෙණෙර" යනුද; **හුරිර**, 'රුහිර' යන තන්හි "හුරිර" යනුද; **සහන්**, 'සයන්' යන තන්හි

* විප්සාවෙහි විවකිරිම පාලි සංස්කෘත ව්‍යාකරණවල කියනලදී-විප්සාව නම්-වෙන් වෙන්වූ වස්තු, ක්‍රියාවෙන් හෝ ගුණයෙන් හෝ ද්‍රව්‍යයෙන් හෝ එකට සම්බන්ධකොට කියනු කැමතිවීමයි—**ගම ගම ජලය සක්වළෙක්හි සක්වළෙක්හි, මහමෙර**—යන ආදිය විප්සාවෙහි ද්‍රව්‍යයෙන් වස්තු සම්බන්ධකොට කීමයි-ගමක් පාසා ජලය, සක්වළක් පාසා මහමෙර-කීකලද එම අර්ථයි-**පල**-යනු එලවාවක නම්-පල පල යනු ගෙඩියක් පාසායි කියහැකිවේ-ඉක්මන් ක්‍රියාවෙහි-ආම්‍රෙඩිත ප්‍රයොගයයි කියනලද එකාවච නය පිස්සෙක් දෙතුන්වර කියන්නාසේ කීමදවේ-ඒ අර්ථයෙහි නම්—පල පල-යනු-පලායව පලායව යන අර්ථවත්වේ.

† විපර්‍යාසයේ ලක්ෂණ හෙවත් ආකාර නොකියා මෙහි ප්‍රභෙද කියනලදී-**විපර්‍යාසය** යනු පෙරළා මාරුකිරීමයි හැඟෙන හෙයින් එහි ආකාර නොකී බව සැලකියයුතු.

‡ වර්ණශබ්දයෙන් අකාරාදි ස්වර හා කකාරාදි ව්‍යඤ්ජනාක්ෂරද කියත්—එසේත් සිදත් සඟරාවේ බොහෝ තන්හි වණ ශබ්දයෙන් ගාත්‍රාක්ෂරම කියනලද්-මෙතැන එසේයි—**පෙරපරවණන්** යන තන්හි ප්‍රාණගාත්‍ර යන අක්ෂර දෙකොටසම වණ ශබ්දයෙන් කියනලදී.

**රජදත් ඈ පදපෙරළි**
**ගතුගතුද දුදනෝ සහකට මැණ සපුත්මෙන්**
**පිරිරඹ නිරිඳු මලදු පරනට බියම රුකුළෝ.**
**ඈ විබත් පෙරළි.** ඉ

"යහත්" යනුද; මහණ, 'සමණ' යන තන්හි "මහණ" යනුද; ඈ, මේ ආදිය; වර්‍ණපෙරළි, වර්‍ණවිපය්‍ර්‍යාස නම්වේ.

ගාත්‍රවර්‍ණ පරිවර්‍තන නම් ඒ ඒ තන්හි විද්‍යමාන ගාත්‍රාක්‍ෂර දෙ දෙනෙකුගේ, ස්ථානපරිවර්‍තනයයි පුරාණ සන්නයෙහි කියනලද හෙ යින් එක වචනයක තිබෙන ගාත්‍රාක්‍ෂර දෙකකින් පූර්‍වයෙන් තිබුන එක තිබුනතැනට පසුව තිබුන එක ගෙණ පසුවූ එක තිබුන තැ නට පූර්‍වයෙහි තිබුනු එක යොදා කියත් නම් ඒ වර්‍ණවිපය්‍ර්‍යාසයයි දතයුතු.

**කෙණෙර**, යනු පාලියෙහි "කරෙණු" ශබ්දයෙන් බිඳී අ ශබ්ද යකි-'කරෙණු' කියා තිබුනකල්හි, රකාර ණකාර දෙක මාරුකර පූර්‍වාපරකළකල්හි එහිම කකාරයද ණකාරයද සම්බන්‍ධවූ ප්‍රාණාක්‍ෂර යන්ට පිළිපෙරළි වශයෙන්–අකාරයට එකාරයද–උකාරයට අකාර යද කළකල්හි—"කෙණෙර"—යනු සිඩවේ—ඇතින්නයි–සංස්කෘත භාෂාවෙහි–"කණෙරු" ශබ්දයක්ද වේ, ඒ ශබ්දයෙන් එන්නේනම්–පිළිපෙරළි පමණක්වේ *–රුහිර– ශබ්දයේ රකාර හකාර දෙක විප ය්‍ර්‍යාසවූ කල්හි '**හුරිර**' යනුවේ,–ලේයි–පාලි 'සයන' ශබ්දය සිංහලට සයන්–කියා බිඳී සකාරයට හකාරාදේශව හකාර යකාර දෙක විප ය්‍ර්‍යාසවූ කල්හි "**යහන්**" යනුවේ–ශයනයයි–පාලි–'සමණ' ශබ්ද යේ සකාරයට හකාරාදේශව හකාර මකාර දෙක විපය්‍ර්‍යාසවූ කල්හි "**මහණ**" යනුවේ—ශ්‍රමණයායි.

ඉ ප–රජදත් ඈ, දත් රජ යන තන්හි රජදත් යන ආදිය; පදපෙ රළි, පදවිපය්‍ර්‍යාස නම්වේ.

දතුන්ගේ රජ–දත්රජයි යෙදෙනකලැ පද දෙක ඉදිරි පසුවැ පෙ රළීමෙන් "**රජදත්**" යනුවේ, දත්පෙළේ මැද පිහිටි දත් දෙකට නම්–ප්‍රධාන දන්ත යන අර්‍ථයි–රාජදන්තයට–ශබ්දශාස්ත්‍රාම මහානිඝයෙ හි–"**ඌර්‍ධ්වපඞ්ක්තිශේඪ මධ්‍යවර්‍තිදන්තමයේ**"උඩපෙළ සිටි මැද

* **කෙණෙර** ශබ්දයට වර්‍ණවිපය්‍ර්‍යාසය කී හෙයින් එය බිඳී ආවේ පාලි යෙන්යි හැඟේ–එසේහෙයින් සිංහල භාෂාවට බොහෝ ශබ්දයන් පාලියෙන් බිඳී ආබවත් සංස්කෘතෙන් බිඳී අා ශබ්ද ඊට අඩුබවත් හැඟේ–පාලි සංස්කෘත භාෂා දෙකෙන් විප්‍රකාරයට බිඳීආවාවූ ශබ්ද දෙපරිද්දෙන් පෙණේ–පාලි–අත්‍ථශබ්දයෙන් බිඳුනු ශබ්දය '**අත්**' කියාද; සංස්කෘත අර්‍ථ ශබ්දයෙන් බිඳුනු ශබ්දය 'අරුත්' කියාදවේ–එකාර්‍ථයි–මේ ආදී ක්‍රමයෙහි.

**තමා වරදස නොදිස්නේ,**
**මොණරිඳු එකල්හි පුල්සලග නවාගණී–ඈ කිරිය පෙරළි.**
**සඳදනමින් සඳහෙති හොත පස්පෙරළි ඈ කරණු.** ෂ

පැවැති දත්දෙක කෙරෙහි වේ යන අර්ථයි–සංස්කෘතෙහිද **"දශනා නාං රාජා-රාජ දශනාඃ"** කියා විපර්යාසව් තිබේ.

ප–දුදනෝ, දුර්ජනයෝ; ගත්උගතුද, ග්‍රන්ථ උගත්තුනමුත්, සහ කටමැණ, කණ්ඨමාණික්‍ය (බෙල්ලේ මැණික්) සහිතවූ; සපුන් මෙන්, සපීයන්මෙන්; තිරිදු මලද, නරෙන්ද්‍ර නමැති මලයජ වෘක්ෂය; (රජනමැති සඳුන් රුක) පිරිරැඹැ, පරිරම්භණයකොට; * (වැලඳ ගෙණ) පරණට, අනුන්ට; බියම, භයක්ම; රුකුළෝ, කළෝ.

**රුකුළෝ** යනු රුකුර කිරීමෙහි යන ධාතුවෙන්වූ අතීත කාලික අන්‍යකාරක බහුවචන ක්‍රියායි–**දුදනෝ** යන්න හා සම්බන්ධයි.

ඈ විබත් පෙරළි, මේ ආදිය විභක්තිවිපර්යාසයි.

මෙහි දුදනෝයි ප්‍රථමා බහුවචනය රුකුළෝ යන ක්‍රියාව හා යෙදෙනහෙයින් ඊට උපමානවූ සප්ශබ්දයේද, සප්නු, කියා ප්‍රථමා බහු වචන වියයුතුයි—විභක්තිය පෙරළීමෙන්, **සපුන්** කියා කර්මවිභක්ති බහුවචනය ව්‍යක්තයන් විසින් යොදනලදී.

ෂ ප-තමාවරද, තමන්ගේ දෝෂය; අස නොදිස්නේ, ස්වල්පයකුත් නොදකින්නේය; යනුද-මොණරිඳු, මයූරරාජය; එකල්හි, ඒ කාලයෙහි; පුල්සලග, ඵුල්ලවූ සාලවෘක්ෂාග්‍රයෙහි; (මල්පිපි සල්ගස අග) නවාගණී, නිවාස ග්‍රහණයකර (නවාතැන් ගණු) යනුද; ඈ, ආදිය; කිරියපෙරළි, ක්‍රියාවිපර්යාස නම්වේ.

මෙහි **නොදිස්නේ** යන තන්හි "දිස්නේ" යන ක්‍රියාව දර්ශනාර්ථ ඇත්තාවූ **දස්** යන ධාතුව කෙරෙන් අනාගතකාලික අන්‍යකාරක එකවචනයෙහි—**නේ,** යෙදුකල්හිවේ—වර්තමානයෙන් කියයුත්ත අනාගතකාලයෙන් කී හෙයින් ක්‍රියාවිපර්යාසයයි.

**නවාගණී** යන තැන ගැණීමෙහිවූ **ගහ** යන ධාතුවෙන් වර්තමාන කාලික තශබ්දකාරක එකවචනයෙහි ඉ ප්‍රත්‍යය යෙදී හකාරයට ණකාරාදේශවීමෙන්වූ ක්‍රියාවයි. ඒ නියොගයෙහි විධික්‍රියාව යෙදිය යුතු තැන-වර්තමාන ක්‍රියාව යෙදූහෙයින් ක්‍රියාවිපර්යාසයි.

† සපීයන් සඳුන් ගස් වෙළාඉඳිම ස්වභාවක් හෙයින් උගත් දුර්ජනයෝ රජ නමැති සඳුන්ගස වෙළාගණ අනුන්ට භයකළෝයි යෙදීමට එය උපමාකරණ ලදී.–රාජාමාත්‍යවැ රටට සාපුරකරණ බැව් හඟවත්.

**වැඩිනම් මත්වැඩි.**
**ඇස් ඇල් ඇප් උවාරණ නවාම් මලවල සල සිඟිලේහි ඇඟි.෧෨**

---

ප-සඳදඟමින්, ශබ්දයන්ගේ ස්වභාවෙන් හෝ; සඳහෙනි හොත, ඡන්දෝහේතුවෙන් හෝ; පස්පෙරළි ඈ, පච්චිපය්‍යාසාදිය; කරණු, කරණුලැබේවා.

මේ පිළිපෙරළි ආදි විපය්‍යාස පස හා තවත් මෙබඳු ව්‍යාකරණවිධි ශබ්දයන්ගේ ව්‍යක්ත ව්‍යවහාරයෙහි පවත්නා ස්වභාවයෙන්ම හෝ ඡන්දශ්‍යාස්ත්‍රයට එකඟලෙස ව්‍යක්ත යොදනපිණිස හෝ යෙදිය යුතුයි-එසේ නොකොට සිතූන සිතූනසේ නොකටයුතුයි—මෙහි ඈ ශබ්දයෙන් කියූ මාත්‍රවෘඩි ආදියත් එසේමයයි සැලකියයුතු—මේ සියල්ල දක්ෂයන්ගේ යෙදුම්ලෙස වනහෙයින් **සදරුක්** යන ආදි අධිකසූත්‍රයේ අර්ථයට ඇතුළත්වේ—එහෙයින් ඒ සූත්‍රයෙන් සිඩසි සැලකියයුතු.

**වෘඩියේ ආකාර.**

෧෨ ප—වැඩිනම්, වෘඩියනම්; මත්වැඩි, මාත්‍රවෘඩියයි.

මාත්‍රනම් ප්‍රමාණයයි—ඇසිපියක් හෙලන නොහොත් ලඝු අකුරක් කියවෙන කාලය මාත්‍රයයි කියනලදී—එබඳු මාත්‍රයක් නොහොත් මාත්‍ර කීපයක් කියවෙන අකුරක් හෝ ශබ්දයක් හෝ ඊට වැඩිකොට කියනු ලැබේනම් ඒ මාත්‍රවෘඩියයි දතයුතු.

**උදාහරණ.**

**ඇස්,** 'අස්' යනතන්හි "ඇස්" යනුද; **ඇල්,** 'අල්' යන තන්හි "ඇල්" යනුද; **උවාරණ,** 'උවරණ' යන තන්හි, "උවාරණ" යනුද; **නවාම්,** 'නවම්' යන තන්හි "නවාම්" යනුද; "**මලවල සලසිඟිලේහි**" මලවල් සල් සිඟිලෙහි-සි කිවමනා තන්හි "මලවල සලසිඟිලේහි"යනුද, ඇඟි, මේ ආදි ආකාරයි.

මෙහි ආකාර දක්වූ උදාහරණවලින් **ඇස්, ඇල්, ඇප්,** යන තුණ අස්, අල්, අප්, යන තුණට මාත්‍රවෘඩිවීමෙන් වියයි කියනලදී-මාත්‍රවෘඩිනම්,—එක මාත්‍රයක් ඇත්තක් ඊට වැඩිම්මයි-මෙහි-අ්ස්-යනු-එකගුරකි-ඊට ඇත්තේ මාත්‍ර දෙකයි-**ඇස්**-යන්නේද එසේම මාත්‍ර දෙකයි-එබැවින් මෙහි මාත්‍රවෘඩියක් කළකල්හි ඈ යන්නක්වේ-එබැවින් ඇස්-ඇල්-ඇප්-යන තුන්තන්හිම ශබ්දයෙන් මාත්‍රවෘඩියක් නැත්තේයි-ඈ-ඈ දෙදෙන අමුතු ප්‍රාණාක්ෂර දෙකක්වීමෙන් ප්‍රාණාක්ෂර දොලස බව සැලකියයුතුයි-මේ රූපයෙන්වූ ප්‍රමාණ වෘඩියයි කිසේ හඟිමු-ඇස්-අක්ෂිය, ඇල්, ශීතලය-ඇප්-අපිය. උවරණ නවම් යන දෙතන්හිම අකාරයට ආකාරයවීමෙන් මාත්‍රාවෘඩියි, උවාරණ, උපකරණයි; නවාම්, අභිනව කර්‍මයයි.

**අඩුනම් මත්අඩු**
**දඟ සැඬ කඳ බඹු සෙගුණෙණ් නුවන නිසයුරා ඇඟි. a**

"මලවලසලසිහිලෙහි" යන්නේ සල්යන්නට අමුතු මාත්‍රයක්වූ අකාරයක් කිරීමෙන්ද 'ලෙ' යන්නේ එකාරයට මාත්‍රයක් වඩා 'ඒ' කාරය කිරීමෙන්ද මාත්‍රවෘඩිය කරණලදී.

ප–මල්අවල, පුෂ්පයෙන් ගැවසුනාවූ; සල, සාලවෘක්ෂයන්ගෙන්; සිහිලේහි, ශීතලවූ තන්හි යන අර්‍ථ හෝ; මල්වල්, මලයවනයාගේ; සල්සිහිලෙහි, ආසනනාවූ ශීතල ස්ථානයෙහි යන අර්‍ථහෝ වේ.

## හානිවිධියේ ලක්‍ෂණ.

a ප–අඩුනම්, හානිය නම්; මත්අඩු, මාත්‍රහානියයි.

ව්‍යාකරණ විධියෙහි අඩුවීම නොහොත් හානිය කියනලද්දේ මාත්‍රයක් අඩුකොට කිමසි—එය ඇතැම්තැන ශබ්දයන්ගේ ස්වභාවයෙන් මවේ–සමහරතැන ඡන්දසෙහි ඒ ඒ වෘත්තවලට ඇති මාත්‍රගණන් වැඩිනොකොට යොදන පිණිස අඩුකිරිමවේ.

## උදාහරණ.

**දඟ**, 'දංග' යනතන්හි "දඟ" යනුද; **සැඬ**, 'සැණ්ඩ' යනතන්හි "සැඬ" යනුද; **කඳ**, 'කන්ද' යනතන්හි "කඳ" යනුද; **බඹු**, 'බම්බු' යනතන්හි "බඹු" යනුද; **සෙගුණෙණ්**, 'සේගුණෙණ්' යනතන්හි "සෙගුණෙණ්" යනුද; **නුවනනිසයුරා**, 'නුවනනීසයුරා' යනතන්හි "නුවනනිසයුරා" යනුද; ඇඟි, ආදී ආකාර ඇතිවේ–පාලි සංස්කෘත භාෂා දෙක්හිමවූ '**ජඩසා**' ශබ්දයෙන් 'දංග' කියාතිබේ–බින්දුවේ අර්‍ථයක් ප්‍රකෘතියෙන් නැතිහෙයින් සම්පූර්ණ බින්දුව ඇතිවැ බිඳුනේයි සැලකියයුතුයි–එසේකල්හි **සඳරූඟ** යන ආදී සූත්‍රයෙන් බින්දුවට මාත්‍ර හානිකොට ගකාරය හා යුක්තකළ කල්හි 'දඟ' යනුවේ–කෙණ්ඩසි–ජඩකමාර්ගයෙහි * ද දඟ යන ශබ්දයවේ–එසේම 'චණ්ඩ'යන ශබ්දයෙන් 'සැණ්ඩ' කියා බිඳේ–ණකාරයාගේද අර්‍ථයක් ප්‍රකෘතියෙහිත් නැතිහෙයින් 'සැණ්ඩ' කියා බිඳෙයි සැලකියයුතුයි–යට—කීසේම–අර්‍ථයක්ව ඩයන්න හා යෙදීමෙන් 'සැඬ' යනුවේ–චණ්ඩයායි–මෙහි අර්‍ථ සංයොගයත් ලොප්වැ. ඇතැම්තැන—'සැඬ' යනුවේ—සංස්කෘත–ස්කන්ද, ශබ්දයෙන් හෝ ස්කන්ධ ශබ්දයෙන් හෝ පාලි–ඛන්ධ ශබ්දයෙන් හෝ ඛන්ද ශබ්දයෙන් හෝ—'කන්ද' කියා බිඳේ—යටකීසේ මාත්‍රහානිවී කඳ යනුවේ–සංස්කෘත ස්කන්ද ශබ්දයෙන් හෝ

* ජඩගමනව ඇවිදිනා ස්වභාව ඇත්තේයි-ජඞගම-ශබ්දයෙන් සිංහලට බිඳෙනකලැ 'දඟුම්' කියා බිඳේ-අනන්‍යවර්ණ ලොප් හා පිළිපෙරැළිවීමෙන් දඟ කියාදවේ

**පියවිනිසා හොත නොනිසා හොත කෙළේ නිපානම්.**
**ගුරුළුගෝමි සඳගෝමි රතැසිපා ගොස් ඇගි. ෧**

පාලි බන්‍ධ ශබ්දයෙන් හෝ බුන්කළ කඳකුමරුට නම්-සකන්‍ධ ශබ්දයෙන් හෝ බන්‍ධ ශබ්දයෙන් හෝ බුන්කලැ ව්‍යඤ්ජනාණ්ඩ සමූහාදී නානාර්ථ ඇතිවේ—පාලි 'බ්‍රහ්ම' ශබ්දයෙන් හෝ සංස්කෘත 'බ්‍රහ්මන්' ශබ්දයෙන් හෝ 'බම්බු' කියා බිඳී යටකී පරිද්දෙන් 'බමු' යනුවේ—බ්‍රහ්මයාටද, බ්‍රාහ්මණයාටද, වේදයටද නම්වේ—ශ්‍රෙෂ්ඨය යන අර්ථ ඇති ගුණ ශබ්දයක්ද වේ.

එම් දහ යන ආදී සතරම ශබ්ද ස්වභාවයෙන්ම එසේවේ—සේ ගුණෙන් යනු-බඳනාලද කව්හි ව්‍යඤ්ජනයට 'සේ' කීකල මාත්‍රයක් වැඩි හෙයින් එය අඩුකළ කල—**සෙ**, කියාවේ—'ජෙට්ඨ' ශබ්දයෙන් නොහොත් සේව්‍ය ශබ්දයෙන් සේ කියා බිඳේ-සෙ ගුණෙන්, දක්ෂවූ ගුණය කරණකොටගෙණ හෝ සේවනය කටයුතු ගුණය කරණකොට ගෙණ යන අර්ථයි—නදී ශබ්දයෙන් '**නි**' කියා බිඳේ—අනතුරුව යට කීසේ ව්‍යඤ්ජනයේ මාත්‍රයක වැඩිවීම වලකනු පිණිස 'නිසයුරා' යන තැන 'නිසයුරා' කියා මාත්‍රයක් අඩුකොට ගන්නාලැබේ-මාත්‍ර අවින් වැඩිනොවන පිණිසයි.

ප-නුවනැති**,** සැණනමැති නදීන්ට; සයුරා, සාගරයක්වූ යන අර්ථයි.

මෙසින් දහ යන ආදිය ශබ්දස්වභාවයෙන් මාත්‍රහානිවූ හෙයින් හැමතන්හිම එසේයි-සෙගුණෙන් යන ආදිය ඡන්‍දස පිරිමසනු සඳහා හ්‍රස්වකිරීම් වශයෙන් මාත්‍රහානි කරණලද හෙයින් එසේ නොකළ තන්හි සේගුණෙන් යන ආදිය වියයුතුයි.

## නිපාතනයේ ලක්‍ෂණ.

෧ ප-පියවිනිසාහොත, ප්‍රකෘතිය ආශ්‍රයකොට වේවයි; නොනිසා හොත, ආශ්‍රය නොකොටවේවයි; කෙළේ, කරණලද්දේ; නිපානම්, නිපාතන නම්වේ.

ධාතු ප්‍රකෘති ශබ්ද ප්‍රකෘති දෙකෙන් යමක් ආශ්‍රයකොට හෝ ආශ්‍රය නොකොට හෝ ව්‍යවහාරයෙන් කරණලද යමක් ඇත්නම් ඒ නිපාතන නම්වේ-(මෙය ලිඞ්ගාධිකාරයෙහි ලිඞ්ගවිමුක්ත නිපාතො පසග් කීමෙහි පෙණෙන අව්‍යයශබ්දවූ නිපාත කොඨාසය සඳහා කියනලද්දේ නොවේ—මේ නිපාතය නම් නියම පරිද්දෙන්ම නොව ශබ්දයකට යමක් වැඩිකොට බැඳීම් වශයෙන් හෝ ක්‍රමයට විරුද්ධ පදයක් සිද්ධකිරීම් වශයෙන් හෝ හෙළිමකි.)

## උදාහරණ.

**ගුරුළුගෝමි,** 'ගුරුළු' (යනතන්හි පූජ්‍යාර්ථයෙහි 'ගෝමි' යන් නාන් ශබ්ද ප්‍රකෘතිය හා මිශ්‍රකොට හෙලා) "ගුරුළුගෝමි' යනුද;

**සඳගෝමි,** 'සඳ' (යනතන්හි පූජ්‍යාර්ථයෙහි 'ගෝමි' යන්නක් ශබ්ද ප්‍රකෘතිය හා මිශ්‍රකොට හෙලා) "සඳගෝමි" යනුද; රතැසිපා, 'රතැසි' (යනතන්හි පූජ්‍යාර්ථයෙහි 'පා' යන්නක් ශබ්දප්‍රකෘතියට මිශ්‍රකොට හෙලා) "රතැසිපා" යනුද; **ගොස්,** (ධාතුප්‍රකෘතියට වෙනස් වැ ගමනයකොට යන අර්ථයෙහි) ගොස් යනුද; ඇගි, යන ආදි ආකාර ඇත්තේයි.

(ව්‍යාකරණ විධි විස්ස අතුරෙන් සතළොස්වෙනිකොට දක්වන ලද 'නිපා' යන විධිය ඇතම් ආධුනික සිංහල පණ්ඩිතයන් විසින් අව්‍යය ශබ්දවූ නිපාතයයි පිළිගත්තාලදී—එසේනොවේ—නිපාත උපසර්ග දෙකොටස ලිඞ්ගමුක්තවූ අව්‍යයශබ්දයි—එසින් නිපාත කොටස විංශතිප්‍රකාර ව්‍යාකරණයේ වෙනම එකවිධියක් වතහොත් උපසර්ග ශබ්ද කොටසද ඊට ඇතුළත්වියයුතු—ඊට උදාහරණ දක්වත හොත්-ද-න-ච-වැනි-වනාහි-ප-පර-යන ආදිය උදාහරණ කටයුතු දවේ—එසේ ප්‍රතිරාජපරිවෙණ ස්වාමීන් විසින් නිපාතොපසර්ගයන් අතුරෙන් යමක් උදාහරණ නොකරණලදී—එහෙයින් මේ අව්‍යය ශබ්දවූ නිපාත ශබ්ද සඳහා නොකියනලදී.

මේ ප්‍රකෘතියට අමුත්තක් මිශ්‍රකිරීමෙන් වැඩිකිරීමද ධාතුවෙන් ක්‍රමයෙන් වනපරිද්දෙන් නොව අමුතු පරිද්දකින් ක්‍රියා පදයක්වීමද සඳහා කියනලද්දේවේ-ඊට සාක්ෂි සිදත් සඟරාවට කරණලද පුරාණ සන්නයෙන්ද ඔප්පුවේ—ඒ මෙසේයි.

'පූජ්‍යාර්ථයෙහි * අඩගසූත්‍රයෙන් **ගෝමි** කියාද, **පා** කියාද 'නිපාතනය' කොට ගුරුළුගෝමි යන ආදිය සිඩකළ පරිදි දතයුතු—පූජ්‍යවූ ගරුඩනම් ආචාර්‍ය්‍යතෙම යන අර්ථයි' **රතැසිපා** යනුදු මෙම අර්ථයි'-මෙසින් ගුරුළු කී පමණින් හුදෙක් ගරුඩනාමය හැඟෙන නමුත් ගෝමි යන්නෙන් වැඩිව ගුරුළුගෝමිවූ කල්හි පූජ්‍යවූ ගරුඩාචාර්‍ය්‍ය යන අර්ථ හැඟෙනබවද-සඳයන්නෙන් හුදෙක් චන්ද්‍රනාමය හැඟෙන නුමුත් ගෝමි යන්න හා යෙදුනුකල්හි පූජ්‍යවූ චන්ද්‍රාචාර්‍ය්‍යයා හැඟෙන බවද රතැසි යන්නෙන් හුදෙක් රක්තාක්ෂි නාමය හැඟෙන නුමුත් පා යන්න වැඩිවීමෙන් පූජ්‍යවූ රක්තාක්ෂීන් ආචාර්‍ය්‍යයා හැඟෙන බවද කියනලදී-ගොස් යනු 'ගම' යන ධාතුවෙන් ක්‍රමයෙන් සිඩවන ක්‍රියාපදයක් හෝ 'ගා' යන ධාතුවෙන් සිඩවන පූර්ව ක්‍රියාපදයක් හෝ නොව ගමනාර්ථයෙහි පූර්වක්‍රියාවක්වේ—හෙද අමුතුවෙන් ගමුධාතුක ක්‍රියා [illegible] හෙලනලද පූර්වක්‍රියා පදයක්වේ-මෙසේහෙයින් මේ නිපා

* පිඩිත සූත්‍රය ගරුළුකටසූත්‍රය යන අර්ථයෙහි.

## දමොරා ඇ නියම්විදි. a

තයයි නොගෙණ 'නිපාතන'යි පිළිගතයුතු * මේ මාගේ මතයෙන් කියනලද බැවින් පණ්ඩිතයෝ කල්පනාකෙරෙත්වා, තවද උදාහරණ කරණලද 'ඝෂාස්' යනු සිධාන්තසඞ්ග්‍රහවට පුරාණකාලයේක නොව මෑතකාලයක වැටුනේයි සැලකිය යුතුයි—කුමක් හෙයින්ද යත්?—පුරාණ සන්නපොත්වල ඒ ගැණ කුමකුත් නොකියනලද හෙයිනි—පුරාණ ප්‍රධාන සන්නයෙහි 'කරණලද්දේ නිපාතන නම් වේ'—කියා පෙයාල කොට පා යන මේ ආදී ආකාර ඇත්තේයි—කියා තිබේ—මෙයින් රතැසිපා—යනු උදාහරණයේ අන්තයයි හැඟේ—යලිත් උදාහරණ පදාළී යිමෙහි රතැසිපා යනු මෙම ඈළිසි—කිපමණකින් අවසන්කරණලදී—එහෙයින් ප්‍රකෘත්‍යාශ්‍රය නොකළාවූ නිපාතනයට උදාහරණයක් නොපෙණෙන හෙයින් සන්නයෙන් පසුකාලයක කා විසින්දෝ 'ඝෂාස්' යන පදය එකතුකරණ ලද්දේයි සිතිය යුතුයි.

### නියම විධිය.

a ප—දමොරාඇ, දමොරා යනආදිය, නියම්විදී, නියම විධියයි.

හැමතන්හිම එකාකාරයෙන් පවත්නා විධිය නියමවිධියයි දම උදරෙහි යමෙකුගේද ඒ දමොර නම්වේ—විග්‍රහයයි—දම් ශබ්දයද උදර ශබ්දයද යන ශබ්දදෙක එකට ගැළපූ සමාසයෙහි දමුදර ශබ්දයවැ පැමිණි කල්හි—උදර ශබ්දයට අඩහසූත්‍රයෙන් 'ඔර' යන ආදෙශයකිරී

* සංස්කෘත ව්‍යාකරණයෙහි නිපාතන යයි ව්‍යාකරණ විධියක්වේ, මුග්ධබොධ ව්‍යාකරණයෙහි 72 **'මනීෂා'—මනීෂාද්‍යා නිපාතනෙන,** **1** මනීෂාඃ යනු සූත්‍රයි—මනීෂාදයඃ, මනීෂා ශබ්දාදීහු; නිපාතනෙන, නිපාතනය කරණු ලැබෙත් හෙවත් ගෙලනු ලැබෙත්—මෙහි මනීෂා යනු—මනස් ඊෂා යන්න සන්ධිවීමෙන් වන ක්‍රමයෙන් මනරීෂායි වියයුතු නමුදු නිපාතනයෙන් මනීෂා යනු සිඩයි—හලීෂා යන ආදියද නිපාතනයෙන් සිඩයි—පාණිනීය ව්‍යාකරණයට අයත් මහාසිඩාන්ත කෞමුදියට කරණලද සරලානම් ටීකාවෙහි **අඤ්ජලිඃ පතිතඃ** (ඇඳිල්ලෙන් වැටුනේ) යන විග්‍රහයෙහි 'පතඤ්ජලි' ශබ්දය සිඩවීම 'උත්තර නිපාතන' යෙනැයි කියනලදී—සාරස්වත ව්‍යාකරණයෙහි **"වාචස්පත්‍යාදයඃ සංඥාශබ්දා නිපාතනාත් සිධ්‍යඃ"**යි කියනලදී—'වාචඃ පතිඃ' යන තන්හි පකාරය පරකල්හි විසර්ගයට උපධ්මානීයාදෙශය කියනලද **"කුපෙවාඃ ≍ක≍පෞ වා"** යන සූත්‍රයෙන් යුක්තනමුත් **'වාචස්පතිඃ'** කියා විසර්ගයට සකාරාදෙශවීම යන ආදිය සංඥා ශබ්දහෙයින් 'නිපාතන' යෙන් වනු නිර්දෙශ බව කියනලදී—මෙද සූත්‍රක්‍රමයෙන් නොවූ අමුතු ගෙලීමක යන අභිප්‍රායයි—නිපාතන—නිපාත යන ශබ්ද දෙකේ ප්‍රත්‍යය වෙනස් නමුත් එකම ධාතුවෙන් සිඩහෙයින් නිපාතනයද ඇතම්තැන **'නිපාත'** ශබ්දයෙන් කියනලදී.

**කිසිසඳ විබත් ඇ අනියම්විදි. ය**
**සිසරැ නොහල සුදඅත් පඩුඇඹුල් ඇ අවිබත් අවියසඳ ඇ**

මෙත් දමොර * යන ශබ්දයවේ—පෙර විබත් එක බසැ ආ යෙදී මෙත් 'දමොරා' යනුවේ–එය හැම්තන්හිම එසේම යෙදෙන හෙයින් නියම්විධියයි කියත්-ව්‍යාකරණ විධියෙන් අත්පරිද්දෙකින් නොයෙදේයි දතයුතු-නියම්විධියේ ශබ්දද ව්‍යක්‍තයන්ගේ පාඨවලින් විමසියයුතු-'සුගඳ' යන තන්හි ගකාරයට වකාරාදෙශකොට සුවඳයයි කියත්—මෙද නියම විධියට ඇතුළත්සේ සැලකියයුතු.

**අනියමවිධිය**

ය ප–කිසිසඳ විබත් ඇ, කිසි සන්ධිවිභක්ති ආදියක්; අනියම්විදි, අනියම්විධිනම්.

සමහර සන්ධියක් සන්ධිවනබව කියනලද නුමුත් ඒ එසේම නියමයක් නොමැතිව සන්ධිවර්ජිතවත් යෙදේ-ඒ මෙසේයි–කානා ඊල් යනු **'කනිල්'** කියා සන්ධිවනබව මේ සිදත්සඟරාවේ කියනලදී—නුමුත් කාව්‍යශෙඛරයෙහි--

'ග න 'කා නා ඊලෙහි' කෙළි මි
ව න ව නා දෙව්ලිය උතු මි
වෙන වෙ නා අබරණ දිලු මි
මෙන ම නා දෙව්දුනු කැලු මි

මෙහි 'කනිලෙහි' නොකියා කානා ඊලෙහි'යි වෘත්තයට යොග්‍යලෙස කියනලද්දේ අනියම විධිය හෙයිනි—නියමවිධියනම් ඡන්දස් පිණිස හෝ වෙනස් නොකටයුතුයි.

විභක්තිද අනියමින් යෙදෙන හෙයින් අනික් විභක්තියෙක අර්ථයෙහි අනික් විභක්තියක්වේ–"**පැලලුප්නුවරට රජගහනුවර යන් යොත්නෙක්**" යනආදි තන්හි සිමාර්ථයෙහි සම්බන්ධ විභක්‍ත්‍යාදියවීම විභක්තින්ගේ අනියම විධිය හෙයිනි.

---

* බොහෝසේ '**දමොරාශ**'යි පොත්වල පෙණේ.

නුමුත් උදර ශබ්දයට ඔර යන ආදෙශයයි පුරාණ සන්නයෙහි කියනලද හෙයින් **'දමොරා'** යනු නිරවද්‍යපාඨයයි ගැනීම්-එය රුවන්මල් නිඝණ්ටුවෙත්ද ගැසේ—නාමාවලියෙහි.

"**ස්වබා නා සහන් නරසි දමෝද ර**"
"**සිරිදිය පියුම්නෙත් හරි දනව සත ර**"

මෙසේ කියනලදි-මෙය නියම විධිය වරදවා කියනලදැයි හැගේ-සංස්කෘත භාෂාවෙහිවූ **'දමෝදර'** ශබ්දය එසේම කිනහොත් සිංහලටද නිවරදයයි සිතියයුතු-රුවන්මල්-**දමොරා බලි සතුරු බලදෙව මල් කාලිඳු භිම් යි** කියනලදී.

අවිදුමන්විදි. 𑇡
ඉති විසිවැදෑරුම් විශරණවිදි නිමි.

## අවිද්‍යමාන විධිය.

𑇡 ප-සියරූ නොහල, (විභක්තීන් ආශ්‍රයකොට) ස්වකීය රූපය පහ නොකළ ශබ්දද; සුදඅත් පඩුඇඹිල් ඈ, සුදඅත් පඩු ඇඹිල් යනආදි ශබ්දද; අවිබත් අවිය සද ඈ, අවිභක්තික ශබ්ද අව්‍යයශබ්දාදීදද; අවිදුමන්විදි, අවිද්‍යමානවිධියයි.

මෙහි අවිද්‍යමාන විධියට විභක්ත්‍යාශ්‍රය කොට ස්වකීය රූපය පහ නොකළ ශබ්දයන්ගේ පැවැත්ම ප්‍රථමකොට කියනලදි-ඒ මෙසේයි-සැළලිහිණි සන්දෙශයෙහි-**"නිලුද ලද සිදුබුවා දිගුවරලෑනිලු-නිලුදවට 'බිඟුපෙල' අද නඹරනිලු"**-කියනලදී-මෙහි "බිඟුපෙල" යනු අවිද්‍යමානවිධියෙන් යෙදීමයි-ඒ කුමක් හෙයින්දයත්? මෙහි-අර්ථ-නඹරනිලු, පියුම්වල වාසයකරන්නාවූ; බිඟුපෙල, මීමැසිපඩක්තීහු; අද, අවුත්; වටනිලුද, සිසාරා නොගත්තුද?-මෙහි-"බිඟුපෙල"-යනු පෙරවිබත් බහුවචනය ආශ්‍රයකොට ඒ අර්ථ ඇතිවැ සිටී-එසේ-**"බිඟු පෙලෝ"** කියාවත් **බිඟු පෙලහු"** කියාවත් ප්‍රථමාවිභක්ති බහුවචන රූපයක් අවිද්‍යමානයි-මෙසින් වියයුතු විධිය නැත්ව ඒ අර්ථය හැඟෙනසේ තිබීම අවිද්‍යමාන විධියයි දතයුතු. **'සුදඅත්'** යනු අන්තඃපුරය කියන්නාවූ "සුඩාන්ත" ශබ්දයෙන් බිදුනේය-එහි ව්‍යාකරණ විධියෙන් අකාරයට හකාරාගමවී සුදහත් කියා හෝ ඌවර ලොප්කොට සුදත් කියා හෝ වියයුතු නමුත් එසේ නොවී තිබේ-ඒ අවිද්‍යමාන විධියයි-**"පඩුඇඹිල්"** යනු පාණ්ඩුකම්බල ශබ්දයෙන් බිදුනේයි-එහි ස්වර ලොප්කොට සන්ධිගැලපීමෙන් පඬැඹුල් වියයුතුයි-එසේ නොවීතිබීම අවිද්‍යමාන විධියයි-අවිභක්තිකශබ්දනම් විභක්ති නොගන්නා ප්‍රත්‍යය වශයෙන් යෙදෙන ශබ්දත් සමහර ක්‍රියාවිශෙෂණ ශබ්දත්ය-නිති යන ආදිය බොහෝසේම විභක්ති නොගෙණ පවතී—කිසිතැනෙක විභක්තිගණී.

ඒ මෙසේයි—කාව්‍යශෙඛරයෙහි.

"කා පළමු සති යේ
නැවතත් කමින් නිති යේ
එන බමුණු රූති යේ
මෙමට සියවසි සිය මැති යේ"

මෙහි නිතියේ කියා ආධාර විභක්ති ලක්ෂණය පෙණේ—තුමුත්

"නිති ගේ දොර හැම ද
කැලි කසල දැක නොම හි ද
උදෑසන සවස ද
පහන් දල්වව විමන නොවර ද"

**සවපදන් සිදුසේ සලකාණු.** a

---

**දා දුව ගුණ කිරිය සන්වි සදන් පස්බේ/**
**අනුරුත් අරුණු වෙසෙසින් විමසාදෙබේ හා දන්.** b
**බුන්අරුත්හි නිශසද දෙදෙනා නොබිඳෑ පවත්වන්නි දැනම.**

---

“මෙදෙව්ගණ නිති කෙරෙත් සුබසෙත”- පිරුවණ නිතිඅකුරු”

යන ආදි තන්හි එසේ විභක්ත්‍යර්ථ ඇති නමුත් කිසි විභක්තියක් නැතිවැ සිටී–ඒ අවිද්‍යමාන විධි වශයෙන්වූ අවිභක්තික ශබ්දයි–ශබ්ද අවිභක්තිකව සිටින ක්‍රමය සිදත්සඟරාවේ විභක්ත්‍යධිකාරාදියෙහි පැහැදිලිවැ පෙණේ–අව්‍යයශබ්දනම් නිපාත හා උපසර්ගයි–“හිගුම්” යනආදි නිපාතද–“ප” ආදි උපසර්ගද එකලෙසම පවතිමින් ඒ ඒ තන්හි යුතු පරිද්දෙන් විභක්තින්ගේ අර්ථ ගන්නාබැව්ද අවිද්‍යමාන විධියට අයිතිවේ–ඒ අව්‍යය ශබ්දයන්ගේ විස්තර ලිඞ්ගාධිකාරයෙහි දක්නාලැබේ.

a ඉති විසි වැදෑරුම් වියරණවිදි නිමි, මෙසේ විංශතිප්‍රකාරවූ ව්‍යාකරණවිධිය සමාප්තයි.

සව්පදන්, සියලු පදයන්; සිදුසේ, සිඬවූ පරිද්දෙන්; සලකණු, සලකනාකරණු.

---

**ශබ්දයන්ගේ භෙද පස හා භෙද දෙක.**

b දා, ජාතිය; දුව්, ද්‍රව්‍යය; ගුණ, ගුණය; කිරිය, ක්‍රියාය; සන්වි, සංඥය කියා; සදන්, ශබ්දයන්ගේ; පස්බේ, පස්ආකාර භෙදයද; අනුරුත්, අන්වර්ථය; අරුණු, ආරූඪය (යන;) වෙසෙසින්, විශෙෂයෙන්; දෙබේහා, භෙදදෙකද; විමසා, පරීක්‍ෂාකොට; දන්, අවබොධකර.

ශබ්දප්‍රකෘතියට අයිතිවූ ශබ්දය, ජාති ශබ්දය, ද්‍රව්‍ය ශබ්දය, ගුණ ශබ්දය, ක්‍රියාශබ්දය, සංඥශබ්දයයි පස් ආකාරයකට බෙදේ—යලිත් අන්වර්ථ ශබ්දය, ආරූඪශබ්දයයි ද්විප්‍රකාරයට බෙදේ—නොයෙක් ප්‍රභෙදඇත්තේ ඒ ප්‍රභෙද වෙනස්නොකොට සාමාන්‍යයෙන් ජාතියක් කියනශබ්දය ජාතියයි–ගල් දඬු ආදි ද්‍රව්‍යයකට නම්වූ ශබ්දය ද්‍රව්‍යයයි–සුදු කළු ආදි ගුණයක් කියන ශබ්දය ගුණයයි–යාම් ඊම් ආදි ක්‍රියාවක් කියන ශබ්දය ක්‍රියායි–යමෙකුට නමක් වශයෙන් ව්‍යවහාර කරණලද්දේ සංඥශබ්දයයි–දුවන්නාට ඒ අර්ථයෙන් ‘දුවා’ යන ශබ්දය වැනිවූ ශබ්ද අන්වර්ථයි–අර්ථකල්පනාවකට නැත්තාවූ හෝ හැඟෙන අර්ථයට විරුඬවූලෙස ව්‍යවහාරවන ශබ්දය ආරූඪවන ශබ්දයයි දතයුතු.

**සුර නර ගොන් ඈ. a**
**ගුණ ඈ නට අදරවූයේ දැව් නම්.**
**වැඹ කුඹු ඈ. b**
**දැව් ඇසිරැ පෙරළෙන සුලුවී ගුණනම්.**
**කළු හෙල නැබුළු ඈ. c**

## ජාති ශබ්දය.

a ප-බුත්අරුත්හි, වෙන්වෙන්වූ පදාර්ථයෙහි; නියසද දෙදෙනා, ඥානශබ්ද දෙදෙනා; නොබිඳැ, භෙදනොකොට; පවත්වන්නී, පැවැත්ම කරන්නී; දෑනම්, ජාතිනම්වේ.

### ඊට උදාහරණ.

සුර, දෙවිය; නර, මනුෂ්‍යය; ගොන්, වෘෂභය; ඈ, (මේ) ආදියයි.

මෙහි අභිප්‍රාය මෙසේ සැලකියයුතුයි.

සුර නම් දෙවජාතියයි, ඒ ජාතිය භූමමදෙව චාතුම්මහාරාජිකාදී නොයෙක් භෙද ඇතිවේ-එසේනුමුත් ඒභෙද පිණ්ඩ කල්පනාකිරීමේ භෙදයක්වත් වචනයේ භෙදයක්වත් නොකොට ඒ සියල්ලන්ට සමානවූ සුරයන වචනයෙන්වත් දෙවියන වචනයෙන්වත් සාමාන්‍යයෙන් කියන්නේ නම් ඒ **'සුර'**ශබ්දය හෝ **'දෙවි'**ශබ්දය හෝ ජාති ශබ්දයයි.

මනුෂ්‍යයන්ගේද, ගෞඩද්‍රවිඩාදිවූද බ්‍රාහ්මණක්ෂත්‍රියාදිවූද නොයෙක් භෙද වේ, එසේත් ඒ භෙදවශයෙන් කල්පනාවක් හෝ වචනයක් හෝ වෙනස්නොකොට සියලු මිනිසුන්ට සමාන **'නර' 'මිනිස්'** ආදි ශබ්දයකින් කියනකලැ-ඒ නරශබ්දාදියද ජාතිශබ්දයයි දතයුතු.

## ද්‍රව්‍ය ශබ්දය.

b ප-ගුණ ඈනට, ගුණාදීන්ට; අදරවූයේ, ආධාරවූයේ; දැව්නම්, ද්‍රව්‍ය නම් වේ.

### උදාහරණ.

වැඹ, ස්තම්භය; (කණුවය) කුඹු, කුම්භය; (කලගෙඩිය) ඈ-(මේ) ආදියයි-මෙහි අභිප්‍රාය.

උස්, මහත්, මිටි, කළු, සුදු ආදි ගුණයක් හෝ වැඩුම්, අඩුවීම්, කැඩුම්, කොටුම් ආදී ක්‍රියාවක් හෝ දරන්නාවූ යමක් ඇත්නම් ද්‍රව්‍යනම් වේ-ඒ වැම් කල ගල් ජල ආදියයි දතයුතුයි-(තර්කශාස්ත්‍රයෙහි-පෘථිවි, ජල, තෙජස්, වායු, ආකාශ, කාල, දික්, සත්ව, සිත්, යන මේ ද්‍රව්‍යයයි කියනලදී )

පොළෝ ආදි ද්‍රව්‍යයක් කියන ශබ්දය ද්‍රව්‍යශබ්දයයි දතයුතු.

## ගුණ ශබ්දය.

c ප-දැව්ඇසිරු, ද්‍රව්‍යාශ්‍රිතව; (ද්‍රව්‍යයකට එකතුවැ) පෙරළෙන **සුලුවී, පෙරළෙන්නාවූ ස්වභාව ඇතිවූයේ; ගුණනම්, ගුණනම්වේ.**

කිරිය ලකුණු වියනලදමැයි-එහි බේ මෙතැන්හි නොසැබැ
හැව් නි බැවින් කිරිය අදියර පවස්නමෝ. a
හව්කිරිය අරුත් කිරිය වි කිරිය සද*දෙවැදෑරුම්.
නමනු ගනු වසනු නැවුලි පිරියස්ලි බොඳුන් නැමඳුම් ඈහව්
කිරිය සද නව්. b

---

## උදාහරණ.

කලු, කෘෂ්ණය; හෙල, ශ්වේතය; නැබුලු, විශාලය; ඇ, (මේ)ආදියයි.

මෙහි අභිප්‍රාය-ද්‍රව්‍යයකට එකතුව වෙනස්වෙන ස්වභාව ඇත්තේ ගුණයයි-එනම් නිල් රත්වන් ආදි පාටක් ගුණයයි-එය ද්‍රව්‍යයකට-එකතුවී පවතී-කෙසේද? වස්ත්‍රයක් ද්‍රව්‍යයයි-ඊට එකතුවැ සුදු නිල් ආදි ගුණයක් පවතී-එය වෙනස්වෙන එකකි-උස් මිටි දුලුල් පටු ආදියද ගුණයි-(තර්කශාස්ත්‍රයෙහි ගන්ධ රසාදිය ගුණයයි කියනලදී)-එබැවින්, නිල්වත, සුවඳමල, උස්ගස, විසල්රට, මිහිරිපල, යන ආදි තන්හි ගුණ කියන්නාවූ-**'නිල්' 'සුවඳ' 'උස්' 'විසල්' 'මිහිරි'**-යන ආදි ශබ්ද ගුණ ශබ්දයයි දතයුතු.

## ක්‍රියාශබ්දය.

a ප-කිරිය ලකුණු, ක්‍රියාලක්ෂණ; වියනලදමැයි, කියනලද්දේමය. (එනම් **"නොදැව් නුගුණ දැව් නිසා"**යන ආදියෙන් යට කියනලද් දේය.) එහිබේ, එහි භේද; මෙතැන්හි, මේ ස්ථානයෙහි; නොසැබැ හැව් නි බැවින්, අසම්භාවනීය භාවයෙන්, (වර්ණනානොකොටයුතු බැවින්) කිරිය අදියර, ක්‍රියාධිකාරය නොහොත් ක්‍රියාධිකාරයෙහි; පවස්නමෝ, ප්‍රකාශකරන්නෙමු.

ක්‍රියාවලින් ශබ්දප්‍රකෘති වශයෙන් යෙදෙන භාවක්‍රියා ශබ්දත් අර්ථ ක්‍රියාශබ්දත් පමණක් මෙතන්හි ක්‍රියාශබ්දයයි දතයුතුයි—අතීතාදී ක්‍රියාපද හෝ විධික්‍රියාදිය හෝ මිට ඇතුළත්නොවේ-එබැවින් **"හව් කිරිය අරුත් කිරය වි"** යන ආදි පාඨය කියනලදි,

b හව්කිරිය, භාවක්‍රියාය; අරුත් කිරියවි, අර්ථක්‍රියාසි කියා; කිරිය සද, ක්‍රියාශබ්දය; දෙවැදෑරුම්' ද්විප්‍රකාරවේ-(මෙහි ක්‍රියාවේ වීම පමණක් ප්‍රකාශකරණ **යාම ඊම්** ආදි ශබ්ද භාවක්‍රියා ශබ්දයි ක්‍රියාව කරන්නෙක් හෝ ක්‍රියාව ලබන්නෙක් හෝ ප්‍රකාශකරණ **යන්නේ කෙරෙන්නේ** යන ආදි ශබ්ද අර්ථ ක්‍රියා ශබ්දයි.)

---

* **කිරියපද** දෙවැදෑරුම් යි ඇතැම් කෙනෙක් කියත්.

**දෙන්නේ සේනුයේ ඈ අරුත් කිරිය සදනම්. a**
**කළපණිත සත්නම්.**
**දෙව්දත් බඹදත් ඈ. b**
**"හැලි සිඟුවත් දුවන ගොන් දෙව්දත්නම්වි"**
**මෙ පස්සදත් එක පදරුත්හි විකපනසේ.**
**ඉති පස්බෙ. c**

### උදහරණ.

නටනු, නැටීමය; ගනු, ගායනාවය; වයනු, වැයීමය; තැවුලි, තැවීමය; පිරියස්ලි, සෙවීමය; බොදුන්, වැළඳීමය; නැමදුම්, වැඳීමය; ඈ (මේ) ආදිය; භව්කිරිය සදනම්, භාවක්‍රියාශබ්ද නම් (වේ)

a දෙන්නේ, දායකකරණ තැනැත්තාය; සේනුයේ, සුවපත්වන තැනැත්තාය; ඈ, (මේ) ආදිය; අරුත්කිරිය සදනම්, අර්‍ථක්‍රියා ශබ්ද නම් (වේ).

මෙහි **නටනු** යන්න නැටීමවූ ක්‍රියාවට නමක්වේ–ගනු යන ආදි යත් එසේමයි–ඒ ක්‍රියාවේ වීම පමණක් කියනහෙයින් භාවක්‍රියා ශබ්දයි–දෙන්නේ යන ආදිය දෙන්නේ දායකයා යන ආදි තන්හි දෙන තැනැත්තෙක් සම්බන්ධවූ ක්‍රියාර්‍ථය ප්‍රකාශකරණ ශබ්දහෙයින් අර්‍ථක්‍රියා ශබ්දයි–මේ නටනු යනආදි ශබ්ද සිඛවන පරිදි මෙහි කිකලැව්‍යාකූලවනහෙයින් ඒ ප්‍රත්‍යයාර්‍ථාධිකාරයෙහි දක්වන්නෙමු–මෙසේ ක්‍රියා ශබ්ද දතයුතු–(තර්කශාස්ත්‍රයෙහි–'**කෘත්,** පදාර්‍ථයට ක්‍රියාශබ්දය ඇතුළත්කරණ ලදී.)

### සංඥා ශබ්දය.

b කළපණිත, කරණලද ප්‍රඥප්තිතොමෝ; සත්නම්, සංඥානම්(වේ) 'සංඥා, නම්ඇඳිනීමපිණිස නියමකරණලද්දකි–ඒකරණලදප්‍රඥප්තියයි කියනලදී–මෙහි ප්‍රඥප්ති යන්නෙන් නියමකරණලද්දක් දතයුතු

### උ දා හ ර ණ.

දෙව්දත්, බඹදත්, යන ආදියයි.

දෙව්දත් යන්නේ අර්‍ථයනම්–දෙවියන් විසින් දෙනලද්දේ යනුයි–බඹදත් යන්නේ අර්‍ථයනම්-බ්‍රහ්මයා විසින් දෙනලද්දේ යනුයි–නුමුත් ඒ අර්‍ථ පරිද්දෙන් නොවැ යම් මනුෂ්‍යයෙකුට හෝ ගොන් ආදි තිරිසනෙකුට හෝ '**දෙව්දත්**' කියා නමක් නියමකරණලද්දේනම් ඔහුට ඒ නම කියත්-එබඳු ශබ්ද සංඥා ශබ්දයි–මෙසේ සියලුම ශබ්දප්‍රකෘතියට අයත් ශබ්දයන්ගේ පස් ආකාරය දතයුතු–මේ පචශබ්දයන් එක පදාර්‍ථයෙහි යෙදෙන අයුරු දක්වන පිණිස මේ පාඨය කියනලදී.

c ප-හැලි, ධවලවූ; සිඟුවත්, අංඇත්තාවූ; දුවන, ධාවනය කරන්නාවූ; ගොන්, වෘෂභතෙම; දෙව්දත්නම්වි, දෙවදත්තනම්(වෙයි)කියා:

**පැන්, කැසුබු, මියුලැසි, ඈ අරුත් ඇරැ බැ නිපන් බැවින් අනුරුත් සදනම්.** ෩

මේ, මේ (කියනලද්දේ); පස්සදන්, පචශබ්දයන්; එකපදරුත්හි, එක පදාර්ථයෙහි; විකපනසේ, කල්පනාකරණ ආකාරයි.

මෙහි, **හැලි** යනු ගුණශබ්දයයි; **සිඟු** යනු ද්‍රව්‍යශබ්දයයි; (ඊට වත් ප්‍රත්‍යයයුක්තයි.) **දුවනු** යනු ක්‍රියාශබ්දයි; **ගොන්** යනු ජාති ශබ්දයයි; **දෙව්දත්** යනු සංඥාශබ්දයයි-මේ ශබ්ද පසම එක ව්‍යඞ්ගවාච්‍ය පදාර්ථ යෙහි යොදා කල්පනා කරණලදී.

**මෙසේ ශබ්දයන්ගේ පචවිධභෙදයයි.**

**ශබ්දයන්ගේ ත්‍රිවිධභෙදය.**

෩ ප–පැන්, පියයුතුයන අර්ථයෙහි පැන් යනුද; කැසුබු, කැසින් බොන්නේ යන අර්ථයෙහි කැසුබු යනුද; මියුලැසි, මියුලන්ගේමෙන් ඇස් ඇත්තී යන අර්ථයෙහි මියුලැසි යනුද; ඈ' යනආදිය; අරුත් ඇරැබැ, අර්ථයක් ආරම්භකොට; නිපන් බැවින්, නිෂ්පන්නභාව යෙන්; අනුරුත් සදනම්, අන්වර්ථශබ්දනම්වේ.

මෙහි අභිප්‍රාය-පියයුතු යන අර්ථයෙහි **'පා'** පීමෙහි යන ධාතු වෙන් 'පැන්, යන නාමය සිඩහෙයින්ද එම අර්ථයෙන් බොන්නට යුතු දේටම ඒ නාමය ව්‍යවහාර කරණ හෙයින්ද අර්ථය අනුව යන නාමය අන්වර්ථනම්වේ.

එසේම කචිජයෙන් බොන්නේය යන අර්ථයෙහි කැස යන කචිජයට නම්වූ ශබ්දයකෙරෙන්* **පා** පීමෙහි යන ධාතුවෙන් කැසුබු යන නාමය සිඩවූ හෙයින්ද, එසේම කැසින් දිය බොන කැස්බාට ඒ නාමය ව්‍යව හාරකරණ හෙයින්ද යටකීසේම **'කැසුබු'** යනුද අන්වර්ථනාමයයි— මුවදෙනුන්ගේ ඇස් වැනි ඇස්ඇත්තී යන අර්ථය ආරම්භකොට **'මියුලැසි'** යන නාමය සිඩවූ හෙයින්ද එසේම මුවදෙනුන්ගේ මෙන් දික් ඇස් ඇති ස්ත්‍රියටමු ඒ නාමය ව්‍යවහාර කරණ හෙයින්ද, මියු ලැසි, යනුද අන්වර්ථ නාමයකි.

**"පියයුතු"** යන වාක්‍යයෙහි **'පා'** පීමෙහි යන ධාතුව කෙරෙන් "දසින් නෙමෙත් හොත" යනආදි උණාදිසූත්‍රයෙන් **'ඇන්'** යන ප්‍රත්‍යය කොට සන්ධි ගැළපූකල්හි **'පැන්'** යන නාමය සිඩවේ—එය ප්‍රත්‍යයාර්ථාධිකාරයෙන් දතයුතුවේ. "කැසින් බොන්නේ" යනවාක්‍ය යෙහි 'කැසින්' යන අපාදානවිභක්ත්‍යන්තනාමයෙන් පරවූ "පා"

---

*කචිජනම්, මුහුදු ඉවිරේ හෝ ගංඉවුරේ කිස්සයි-එහි බොන්නේය යන අර්ථයි-කැස කිසිල්ලටද නම්-කිසිල්ලෙන් කැස්බා පැන් බොයි කියාත් රටේ ව්‍යවහාරයි.

**සෙලු තෙල්බු මඟුල් ඈ අරුත් විලොම් බැවින් අරූඪසදනම.**
**ඉති දෙමබි.** ෧

---

පිවෙහි යන ධාතුහු කෙරෙන් "දසින් නෙමෙන් හොත" යන ආදි උපාධික සූත්‍රයෙන් **උ ප්‍රත්‍යය** කොට සදරුත් යනආදි අධිගසූත්‍රයෙන් විභක්ති ලොප්කොට පිළිපෙරළි කොට පකාරයට බකාරාදෙශකොට සන්ධිගැළපුකල්හි **කැසුබු** යන නාමය සිද්ධවීමද ප්‍රත්‍යයාර්ථාධිකාර යෙන් දතයුතු. මියුලන්ගේමෙන් ඇස් ඇත්ති යමක්ද ඕතොමෝ මියුලැසි කියා මියුලැසි ශබ්දය සිද්ධවීම සමාසාධිකාරයෙහි අන්‍යාර්ථ සමාසයෙන් දතයුතු. මෙසේ අර්ථයට අනුවැ පවත්නා ශබ්ද සියල් ලම අන්වර්ථශබ්දයයි දතයුතු.

ඇතම් අන්වර්ථ ශබ්දයක් නානාර්ථ ඇතිවනකලැ නොයෙක් අර්ථ වල නොයෙක්ලෙසින් පවතී-**දිනිඳු** යනු බුදුන්ටද සූර්යයාටද නම්වේ-එයින් බුදුන්ට නම්වනකලැ දිනනට ඉඳු, (ජිනයන්ට හෙවත් තපස් වින්ට ඉඳුවූයේ) දිනිඳු කියාද, හිරුට නම්වූතැන දිනට ඉඳු (දාවලට ඉඳුවූයේ) දිනිඳු කියාද, අර්ථ දතයුතු-මේ ආදි ක්‍රමයෙන් අන්වර්ථ ශබ්දද ප්‍රත්‍යයාර්ථාධිකාරාදියෙහි උපදෙශ ක්‍රමයෙන් දතයුතු.

෧ ප—සෙලු; සෙල් ඇත්තේ (වස්ත්‍ර හෝ ගල් ඇත්තේය.) යන අර්ථ යෙන් උපන් **සෙලු** යනුද; තෙල්බු, තෙල් බොන්නේ යන අර්ථයෙන් උපන් '**තෙල්බු**' යනුද; මඟුල්, ශුභයෙහිවූ '**මඟි**' යන ධාතුවෙන් උපන් '**මඟුල්**' යනුද; ඈ, යනආදිය; අරුත් විලොම් බැවින්, අර්ථයට විරුද්ධ බැවින්; අරූඪසදනම්, ආරූඪ ශබ්දනම්වේ.

මෙහි අභිප්‍රාය—සෙලු යන ශබ්දය සෙල්ශබ්දයට '**ඇති**' යන අර්ථ යෙහි '**උ**' යන ප්‍රත්‍යය වීමෙන් සිද්ධවූ ශබ්දයකි—සෙල් ඇත්තේ යත් නෙත් වස්ත්‍රඇත්තේ හෝ ගල් ඇත්තේ යන අර්ථය ඒ ශබ්දයේ ස්ව රූපයෙන් පෙණේ—පණ්ඩියාටද නග්නයාටද නම්වේ—පණ්ඩියාට හෝ නග්නයාට වස්ත්‍ර ඇත යන අර්ථයක් නොකියයුතුයි—වස්ත්‍ර නැතිහෙ යිනි, ගල් ඇත්තේ යන අර්ථයක්ද නොවැටහේ—එහෙයින් ඒ අර්ථ යට විරුද්ධලෙස ව්‍යවහාරයට නැගුනාවූ ශබ්දයකි—එබැවින් ඒ ආරූඪ ශබ්දයයි දතයුතුයි—තෙල්බු යනු තෙල් බොන්නේය, යන අර්ථයෙහි සිද්ධවූ නාමයකි-ඒ තෙල්දිනිට හෙවත් තෙල්සින්නාට නමකි-තෙල් දිනිතෙම තෙල් නොබොයි තෙල් ආලෙපවූකල මැරෙයි—එසේනමුත් තෙල් බොන්නේය යන අර්ථඇති ශබ්දය ඌට නම්කොට ව්‍යවහාර කරති—ඒත් අර්ථයට විරුද්ධවන හෙයින් එසේ ව්‍යවහාරයට නැගු ආරූඪ ශබ්දයයි දතයුතු

මඟුල් යනු ශුභාර්ථ ඇති 'මඟි' යන ධාතුවෙන් උපන් ශබ්දයකි— එය අශුභ ග්‍රහයෙක්වූ අඟහරුවාට ව්‍යවහාර කරණ කලැ අර්ථයට

**අදෙස් අගම්විදි පියවි සබඳ හකරන්,**
**වෙසෙසා හැඳිනැ යොදනු උගහා නොදහැ ඇදුරන්,** a

**සුදු හුදු, විසඳු විහිඳු, සිඳි හිඳි, සුදි හුදි, සැමද හැමද, සැඳින හැඳින, සොබී හොබී, සොබ හොබ, සිඹ හිඹ, පිරිසිඹු පිරිහිඹු, සුණමින් හුණමින්, ලසුනු ලුහුනු, පසණ පහණ, සල්හල්, සුල් හුල්, සැල් හැල්, මුසල් මොහොල්, සුසුල් සුහුල්, සිඹුල් හිඹුල්, සැදගිලි හැදගිලි, සැලි හැලි, සකාර හකාර, සිගුරු හිගුරු, සූරු හූරු, සු හු, සේ හේ, සෝ හෝ, සිම් හිම්, සැමි හැමි, සික්මුම් හික්මුම්, සැම හැම, සව් හව්, සාවා හාවා, සිවන් හිවන්, සිතු හිතු, සුළු හුළු, සගුළු හගුළු, සිටි හිටි, විසට වුහුට, සමහන්**

---

විරුද්ධලෙස ව්‍යවහාරයට නගනලද ආරූඪ ශබ්දයයි දතයුතු-ශුභාදීසට ව්‍යවහාරවන තන්හි එසේනොව අන්වර්ථවේ, එසේ අර්ථයට විරුද්ධ ලෙස මනුෂ්‍යයන්ට ව්‍යවහාරකරණ නම්ද ආරූඪ ශබ්දයයි දතයුතු- (පාණිනියාදි සංස්කෘත ව්‍යාකරණවල ධාතුප්‍රකෘතියක් ප්‍රත්‍යයක් නොසොයා ව්‍යවහාරයට නගනලද ධාත්වර්ථයක් නොසොයන්නාවූ ශබ්ද රූඪශබ්දයයි කියනලදී) දඬුවලින් සාදනලද ඇත් රූපයට "ඩිත්ථ" යන නාමය සංස්කෘත භාෂාවෙහි වේ-දඬුවලින් සාදනලද මුව රූපයට "ඩවිත්ථ" යන නාමය වේ. ඒ නම්වල ධාත්වර්ථ නොපෙණෙන හෙයින් රූඪනාමයයි කියත්.

**මෙසේ විවිධ භේදය වේ.**

---

ඉක්බිති අකාර හකාර දෙදෙනාගේ කලවන්වීමෙන් කිසි ශබ්දයන්ගේ නොසිලිටු කීමක් පැණෙන හෙයින් ඒ අකාර හකාර දෙදෙනාගේ භේදයද සකාර හකාරයන්ගේ භේදයද සංඥාවට ඇතුළත් හෙයින් එය දක්වන පිණිස අදෙස් අගම්විදි යන ආදි කව කියනලදී.

a ප-අදෙස්, ආදෙශවූද; අගම්විදි, ආගම විධිවූද; පියවිසබඳ, ප්‍රකෘති සම්බන්ධවූද; හකරන්, හකාරයන්; වෙසෙසා, වෙන්කොට; හැඳින, අවබොධකොට; ඇදුරන්, ආචාර්‍ය්‍යයන්ගේ; උගහා, උද්ග්‍රහණය; නොදහැ, නොහැර; යොදනු, යොජනය කරණු.

මෙහි භාවය—ආදෙශ හකාරය, ආගමවිධි හකාරය නොහොත් ආගම හකාරය, ප්‍රකෘති සම්බන්ධ හකාරය-නොහොත් ප්‍රකෘති හකාරය කියා හකාරය තුන්ආකාරයකින් සිංහල භාෂාවේ ඇතිවේ-ඒ තුණ වෙන් වෙන්කොට හැඳින ආචාර්‍ය්‍යයන්ගේ උද්ග්‍රහණයට විරුද්ධ නොවැ යෙදීම කටයුතුයි.

හමහන්, පසන් පහන්, සසුන් හසුන්, සින් හින්, සත් හත්, සිස් නා හිස්නා, සිස් හිස්, සස් හස්, සිකු හිකු, සැකි හැකි, සැති හැති, සිඟු හිඟු, සඟු හඟු,-ඈ සකුරට ආදෙස් හකරෙන් සිදුපා.ය

## ආදෙශ හකාරයට උදහරණ.

ය සුදු-යනු 'හුදු'-යනුවේ-ශුද්ධය යන අර්ථයි.

විසඳ-යනු, 'විහිඳ' යනුවේ-විසර්ජනය කොටැ යන අර්ථයි-(පරිත්‍යාගකොට ප්‍රකාශකොට, විහිදුවා, යන ආදි අර්ථයි.)

සිඳි-'හිඳි' යනුවේ-කපනලද, සිඳුවනලද, යන ආදි අර්ථයි.

සුදි-'හුදි' යනුවේ-පණ්ඩිත, සජ්ජන යහපත් බුද්ධි ඇත් යන අර්ථයි.

සැමදු-'හැමදු' යනුවේ-සම්මාර්ජනය(හැමදීම) කොටයන අර්ථයි.
සැඳිනැ-'හැඳිනැ' යනුවේ-සජානනය (හැඳිනීම) කොට යන අර්ථයි.

සොබි-'හොබි' යනුවේ-ශොභන (හොබනා)වේ යන අර්ථයි.
සොබ-'හොබ' යනුවේ-සොබ්භය (වළය) යන අර්ථයි.
සිඹැ-'හිඹැ' යනුවේ-චුම්බනයකොට (ඉඹලා) යන අර්ථයි.
පිරිසිඹු-'පිරිහිඹු' යනුවේ-හාත්පසින් චුම්බනය කරව, වෙහෙස ගණු යන ආදි අර්ථයි.

සුණමින්-'හුණමින්' යනුවේ—ශ්‍රවණය කරමින් (අසමින්) යන අර්ථයි.

ලසුනු-'ලුහුනු' යනුවේ-ලූනු යන අර්ථයි.
පසණ-'පහණ' යනුවේ-පාෂාණ (ගල) යන අර්ථයි.

සල්-'හල්' යනුවේ-සාලය-(රුක හෝ හල්ගස) යන අර්ථයි.

සුල්-'හුල්' යනුවේ-ශූල-(උල) යන අර්ථයි-සැල්-හැල් යනුවේ-ශාලි-(ඇල් ධාන්‍ය) යන අර්ථයි

මුසල්-'මොහොල්'යනුවේ-මුෂල-(මෝල) යන අර්ථයි-සුසුල්-සුහුල් යනුවේ-ස්වසෘ-(සහෝදරී) යන අර්ථයි.

සිඹුල්-'හිඹුල්'-සිම්බලි (ඉඹුල්) යන අර්ථයි-සැඳකිලි-හැඳකිලි-ශ්‍රද්ධා (ඇදහීම) යන අර්ථයි.

සැලි-'හැලි'-නිර්ඣර-(ගඟුල්හැලි) යන අර්ථයි-සකර-හකර ශර්කරා (හකුරු) යන අර්ථයි—සිඟුරු-හිඟුරු—ශෘඞ්ගවෙර (ඉඟුරු) යන අර්ථයි.

සූරු-හූරු-සූකර (ඌරු) යන අර්ථයි-සූ-හූ-සූත්‍ර-(නූල්)-යන අර්ථයි. සේ-හේ-සේතු-(ඒදඬු)-යන අර්ථයි-සෝ-හෝ-ප්‍රවාහ-(ජලපාර) යන අර්ථයි-සිම්-හිම්-සීමාව (ඉම)-යන අර්ථයි-සැමි-හැමි-ස්වාමියා-(හිමි) යන අර්ථයි—සික්මුම්-හික්මුම්-ශික්ෂාව (හික්මීම)යන අර්ථයි-සැම-හැම-සියලුම-(සකල) යන අර්ථයි.

**සිදුහත්, ඇස්දහර, සෑදෑහැ, සදහම්, රජදහන්, දහන්, ඉදුහු, සමහන්, මැදහත්, අදහස්, බහස්ම,—ඈ අගම් හකාරෙන් සිදුපා.** a

**හුරැ, හොරැ, හොළ, හල, හමල, හෑහි, හඩ, හුනු, හිවි, ඈ පියවිපා.**

---

**සව්**-හව්-සියලු—(සකල) යන අර්‍ථයි-**සාවා**—හාවා—ශශකයා—(හාවා) හෝ ශාපය යන අර්‍ථ-**සිවන්**-හිවන් * සිබ්බන-(මැහිම යන අර්‍ථයි)-**සිතු**-හිතු-චින්තය-(හිත) යන අර්‍ථයි-**සුළු** හුලු-සිත්‍ථ (බත් තුල) යන අර්‍ථයි-**සගුළු** හගුළු-සඞ්ඝාටය (දෙකක් ඈඳනලද එක අගුළ) යන අර්‍ථයි.

**සිවි**-හිවි යනුවේ-ශික්ථ-(මිඉවි) යන අර්‍ථයි-**විසම**-වුහුට යනුවේ-**විසඹ**-හරණලද යන අර්‍ථයි.

**සමහන්**-හමහත්යනුවේ-සණ්ඨාන-(සටහන-හලකුණ)යනඅර්‍ථයි.

**පසන්**-පහන් යනුවේ-ප්‍රසන්න යන අර්‍ථයි-**සසුන්**-හසුන්-යනුවේ ශාසන යනඅර්‍ථයි, **සින්**-හින්-නිෂණ්ණ(උන්නාවූ) යන අර්‍ථයි. **සන්**-හන්-ජනන (වසනලද) යන අර්‍ථයි-**සිස්නා**-හිස්නා-සිචනය-(දියවැගිරවීම) යනඅර්‍ථයි-**සිස්**-හිස්-ශීෂ-(හිස) යන අර්‍ථයි-**සස්**-හස්-ශස්‍ය-(ගොයම්) යන අර්‍ථයි-**සිකු**-හිකු-ශුෂ්ක (වියලි) යන අර්‍ථයි-**සැකි**-හැකි-ශක්‍ය (පිළිවන්) යන අර්‍ථයි-**සෑති**-හැති-සතවක (මල්කැන) යන අර්‍ථයි-**සිගු**-හිගු-ශෘඞ්ග-(අං) යන අර්‍ථයි-**සගු**-හගු-ශෘඞ්ග (අං) හෝ සඤ්ඥානනයකරව (අඳුනාගණු) යන අර්‍ථයි.

ඈ, (මේ) ආදිය; සකාරට, සකාරයට; අදෙශ්හකාරෙන්,ආදෙශ හකාරයෙන්; සිදුපා, සිඩවූ පාඨයි.

මේ සුදු යනආදි පාඨවල ප්‍රකෘතියෙන් සකාරයි-ඊට හකාරය ආදෙශවියයි දතයුතු.

### ආගමවිධි හකාරයට උදහරණ.

a **සිදුහත්**-'සිදුඅත්' යනු-සිදුහත් යනුවේ-සිඬාර්ථයි.
**ඇස්දහර**-ඇස්දර යනු-ඇස්දහර යනුවේ-අශ්‍රුධාරා-(කඳුලුයි)
**සෑදෑහැ**-සැදෑ යනු-සැදෑහැ යනුවේ-ශ්‍රද්ධා (ඇදහිමයි)
**සදහම්**-සදම් යනු-සදහම් යනුවේ-සඬර්මයි.
**රජදහන්**-රජදත් යනු-රජදහන් යනුවේ-රාජධානියයි.
**දහන්**-දන් යනු-දහන් යනුවේ-ධ්‍යානයයි.
**ඉදුහු**-ඉදු යනු-ඉදුහු යනුවේ-සෘඬියයි.
**සමහන්**-සටන් යනු-සටහන් යනුවේ-සණ්ඨානය (සලකුණයි.)
**මැදහත්**-මැදත් යනු-මැදහත් යනුවේ-මධ්‍යස්ථයි.
**අදහස්**-අදස් යනු-අදහස් යනුවේ-අධ්‍යශයයි
**බහස්ම**-බස්ම යනු-බහස්ම යනුවේ-භස්ම (අළුයි.)

පා-ඈ, මේ ආදිය; අගම් හකරෙන්, ආගම හකාරයෙන්; සිදුපා, සිඩවූ පාඨයි.

---

* **සිවන්** කියා බොහෝකල් පැවතෙන නුමුත් සිවන් යනු ශුඬයයි හඟිමු.

**අඳුන්, ඇඳෑ, එරෑණු, අරෑණු, අරා, අළු, අළුත්, අද, ඉදි, ඔද, එළු, උළු, ඔළු, ඇලි, අලු, ඇවිනි, අස්වස්, අල, එලෑඹි, අගි, ඉක්, අඟිඳෑ, ඈ පණකුරෑපා.** ඎ

**හැරැබ ඇරැබ, හමු අමු, හසර අසර, හසල අසල, හැකිලෑ ඇකිලෑ, හැදෑරුම් ඇදෑරුම්, ඈ සකරට අදෙස් හකරෙන් ද අ උපසගෙන්ද සම්වෑ සිදුපා.**

---

මෙහි භාවය-**සිඳුඅග්** යන්න සිඳුහත් යන ආදි ක්‍රමයෙන් මුලින් නැත්තාවූ හයන්නක් අමුතුවෙන් දැමූහෙයින් ඒ ආගම හකාරයෙන් සිඩවූ පාඨයයි දතයුතු-ආගම නම් අමුතුවෙන් හෙලනලද්දකි.

**හුරෑ**, පරිචිත, පක්ෂපාත, යන අර්ථයන්හි හුරු යනුද; **හොරෑ**, චෞරයා, යන අර්ථ ඇති හොරු යනුද; **හොළ**, මූක යන අර්ථයෙහි හොළ යනුද; **හල**, හරණලද යන අර්ථයෙහි හල යනුද; **හමල**, හැමුවාවූ යන අර්ථයෙහි හමල යනුද; **හැඟි**, අභිප්‍රාය යන අර්ථයෙහි හැඟි යනුද; **හඬ**, ශබ්දය යන අර්ථයෙහි හඬ යනුද; **හුනු**, වැටුනාවූ යන අර්ථයෙහි හුනු යනුද; **හිවි**, ළස් යන අර්ථයෙහි හිවි යනුද; ඈ (මේ) ආදිය; පියවිපා, ප්‍රකෘතිපාඨයි.

මේ **හුරෑ හොරෑ** යනආදියේ හකාරය සකාරයට ආදෙශවීමෙන් හෝ ස්වරයට ආගම වීමෙන් හෝ නොවෑ ශබ්දප්‍රකෘතියෙන්ම විය.

මෙසේ-ආදෙශහකාරය, ආගමවිධිහකාරය, ප්‍රකෘතිසම්බන්ධහකාර යයි කියනලද හකාරතුණේ ප්‍රභෙද හඟවා අනතුරුකොට හකාර යක් නොපැමිණෙන අකාරාදි ස්වර පිහිටි පාඨ දක්වනුවෝ **අඳුන්** යන ආදිය කීහු.

ඎ ප-**අඳුන්**, අජනය; **ඇඳෑ**, අජනයකොට; **එරෑණු**, අවතීර්ණය, (බැස්ස); **අරෑණු**, ආරූඪය;(නැගුණේය) **අරා**, ආරූඪවෑ, **අළු**, ආලොකය, **අළුත්**, අභිනවය; **අද**, මේ දවසය; **ඉදි**, ඍජු, (ඇදනැත්තේය) **ඔද**, ඔජසය-**එළු**, එඩක (එළුවාය) **උළු**, තාරකාය, **ඔළු**, හිසය, **ඇලි**, ආලි (අගලය);**අලු**, වෙමය (රෙදිවියන අලුව යන දණ්ඩය)* **ඇවිනි**, ඇවුනුමය; **අස්වස්**, ආශ්වාසය; **අල**, කන්දමූලය; **එලෑඹි**, ළඟට පැමිණියේය. **අගි**, අච්චි, (ගිනිසිලු)ය; **ඉක්**, අතික්‍රාන්තය; **අඟිඳ**, ආච්ඡෙදනයකොට, (කපා); ඈ, මේ ආදිය; පණකුරුපා, ප්‍රාණාක්ෂර පාඨයි.

මේ **අඳුන් අඳෑ** යනආදි ශබ්දවල අකාරාදි ස්වර සම්බන්ධවෑ හකාරාගමයක් නොවනබව කියනලදි—හකාරය හා **අ** යන උපසර්ගය යන දෙකට සමව යෙදෙනතැන් කියත්.

**හැරැබ**, සංරම්භය; **ඇරැබ**, ඇරම්භය; (මේ දෙකෙන්ම ආරම්භය හෝ උත්සාහය කියනුලැබේ.) **හමු**, සම්මුඛය; **අමු**, ආමුඛය, (මේ දෙකෙන්ද සම්මුඛය යන අර්ථය හැඟේ.) **හසර**, සචාරය; **අසර**, ආචාරය; **හසල**, සචරිතය; **අසල**, ආචරිතය; (හැසිරෙණලද) **හැකිලෑ**,

---

* **අලු**, යනු භස්මයයි ඇතම්කෙණෙක් කියත්—භස්මයට නම්වූ අලු ශබ්දයේ අකාරය සම්බන්ධව ඇතම් තැන හකාරාගමවේ—"**හලු කල රෑපු කැළේ**" යන ආදියෙන් දතයුතු—එහෙයින් මෙතැන අලු යනු රෙදිවියන්නන්ගේ අලුවයි දතයුතු

"රතන දිදි ඉහිල් වසනතුරෙන් රඥන්දම්
කියව කර හලලා පැහැබරදිගුනුවන් ලා"
"කලවන් බිගු මහත්වත හිරු හත් වත"
මේ ඈ සේපාහි වියබිසරදස්නෙන් අනියම් විදිද සලකානු.
ඉති හකාරවිනිස. ෆ

---

සඞ්කුචිතවැ; ඇකිලැ, ආකුචිතවැ; හැදෑරුම්, සජ්ඣායනාවය; ඇදෑරුම්, අජ්ඣායනාවය; (ඉගෙණගැම්මය) ඈ, (මේ) ආදිය; සකරට අදෙස් හකරෙන්ද, සකාරයට ආදෙශවූ හකාරයෙන්ද; අ උපසගෙන්ද, අ යන උපසර්ගයෙන්ද; සමවැ, සමානවැ; සිදුපා, සිඞවූපාඨයි.

මෙහි-හැරැබ, හමු, යන ආදි හකාරය යෙදෙන පදයෙහි, සැරැබ, සමු යන ආදින් තිබි හකාර ආදෙශවීමයි–ඇරැබ යනආදිය ආරම්භ යන ආදි ශබ්දවලින් බිඳුන ප්‍රාණාක්‍ෂර පාඨයි.

## ස්වරහකාර දෙදෙනාගේ අනියම් විධිය හඟවන පිණිස අසන්ද කව ආදියෙන් උදාහරණ කියත්.

ෆ ප-ඉහිල්, සිවිලවූ හෝ බුරුල්වූ; වසනතුරෙන්, වස්ත්‍රාභ්‍යන්තරයෙන්; රත්අත, රක්තවූ හස්තය; දිදි, දානයකරමින්; රඥන්දම්, මෙඛලාදාමය; හලලාකර, ආලොලනය කොට; පැහැබර, ප්‍රභාභාරයක් ඇත්තාවූ; දිගු, දීර්ඝවූ; නුවන්, නෙත්‍රයන්; ලා, හෙලා; කියව, කථනයකර.

ප-හිරු, සූර්‍ය්‍යයා; හත්වත, අස්තවූකලැ; බිඟු, භෘඞ්ගයාගේ; කලවන්, කාලවර්ණය; මහත්වත, මහත්වන්නේය.

මේ ඈ, මේ ආදිවූ; සේපාහි, ශේකයන්ගේ පාඨයෙහි; වියබිසරදස්නෙන්, ව්‍යභිචාරදර්ශනයෙන්; * අනියම්විදිද, (ස්වර හා හකාරයාගේ) අනියම විධියද; සලකානු, කල්පනාකරණු.

මෙහි හස්ත ශබ්දයෙන් හත් කියා බිඳුන ශබ්දය '**අත**' කියා 'රතත' යන තන්හි පෙණෙන හෙයින්ද–ආලොලන-ශබ්දයෙන් 'අලලා' කියා බිඳුන ශබ්දය '**හලලා**' කියා හකාරයක් යුක්තවූ හෙයින්ද—හිරුහත්වත යන තන්හි අස්තශබ්දයෙන් බිඳුන 'අත්' ශබ්දය '**හත්**' කියා පෙණෙන හෙයින්ද ස්වරහකාරයන්ගේ අන්‍යමින් යෙදීම සලකන්ට උපදෙශ තිබව දතයුතු.

සමහර කෙනෙක් ආදෙශහකාරය, ආගමවිධි හකාරය, ප්‍රකෘති හකාරය සම්බන්ධහකාරය කියා හකාරයේ භෙද සතරක්සි කියත්—මෙහි එසේ සම්බන්ධහකාරය කියා වෙන්වශයෙන් හකාරයක් නො පෙණේ-හකාරය හා ප්‍රාණාක්‍ෂරයන්ගේ අනියමවිධිය ආදෙශ හකාරය සම්බන්ධවද පෙණේ-**හැමද** යනු ඇමැද කියාද **හැඳිනැ** යනු ඇඳිනැ කියාද හකාරය හැර ප්‍රාණාක්‍ෂරොච්චාරණයද පෙණේ—එසේත් සකාරයට හකාරය ආදෙශවන නුමුත් ප්‍රකෘති හකාරයට සකාරය ආදෙශනොවේ-එසේද වුවත් ඇතැම්කෙනෙක් බහුශබ්ද

---

* ව්‍යභිචාරනම්, අනියම් හැසිරීමයි—මිථ්‍යාචාරයටද මේ නම්වේ.

**පෙරපරවණින් නිසි විදිනි ගළපනු සඳනම්**
**වණලොප් අදෙස් ඈ එහි ලැකියනුසරින් දන්නේ, a**
**විදුරවිසෙය්, දිගා, දිනිසුරු, කනිල්, බමරුඳුල, නොමරුල්;**
**සඳෙව්, සලේගි, පහරොත, හඬෝනා-ඈ පෙරසරලොපා**
**පරසර ගතට පැමිණුවූ බැවින් පෙරසර ලොප් සඳනම්. b**

---

යෙන් ආවාවූ බොහෝ යන ශබ්දය 'බොසෝ' කියාද-හෙතුශබ්ද යෙන් බිඳුන ගේ ශබ්දයෙන් වන 'හෙයින්' යන්න 'සෙයින්' කියාද ලියනබව පෙණේ-ඒ ජේකපාඨයන්ට ඇතුළත් නොවෙයි සිතමු.

හකාර විනිශ්චය මෙසේයි.

**සංඥාධිකාරය පළමුවෙනියි.**

---

**මේ පෙරපරවණින් යන ආදිය සන්ධි විධියට උපාධගසූත්‍රයි.**

a. ප-පෙරපරවණින්, පූර්වවූද පරවූද වර්ණයන්; නිසිවිදිනි, නිශ්‍රිත (ආශ්‍රයකළාවූ) විධියෙන්; ගළපනු, ගැළපීම; සඳනම්, සන්ධිනම්වේ; එහි, ඒ සන්ධිවිධානයෙහි; වණලොප් අදෙස් ඈ, වර්ණලොපවර්ණාදෙශාදිය; ලැකියනුසරින්, ලක්ෂ්‍යානුසාරයෙන්; දන්නේ, අවබොධ කරන්නේය.

භාවය-ඉදිරි පසුවූ අක්ෂරයන් එකතුවෙන විධියෙන් ගැළපීම සන්ධි නම්වූ ව්‍යාකරණ විධියයි-එහි ඇතුළත්වූ අක්ෂර ලොප්කිරීම් හෙවත් මැකීම්, ආදෙශකිරීම් හෙවත් තිබුන එක මකා අනිකක් කිරීම් ආදිය පුරාණයන්ගේ වාක්‍යවල තිබෙන ලක්ෂ්‍යයෙන් දතගතයුතුයි.

සන්ධි යනු-පාලි සංස්කෘත භාෂාවල **සං** යන උපසර්ගය පූර්වවූ 'ධා' යන ධාතුවෙන් උපන් ශබ්දයකි-ඒ ගැළපීමය යන අර්ථ ඇත්තේය-මේ සන්ධිවිධිය සියලුම භාෂා අතුරෙන් සංස්කෘත භාෂාවේ වැඩියි සිතියයුතුයි-එහි එක ළඟ අකුරු දෙකක් යෙදීමෙහිද ගළපා කියනු ලැබේ—ඒ මෙසේයි, 'ඉ' 'උ' යනු එකට කියනකලැ 'යු' කියාවේ-'උ' 'ඉ' දෙක ඒ පිළිවෙළින් යොදනකලැ 'වි' කියාවේ-පූර්වදිග්භාගයට අසිති සියලුම භාෂාවල මේ සන්ධිවිධිය බහුලව තිබෙන නුමුත් පශ්චිමදිග්භාගයට අසිතිවූ භාෂාවල එසේ නොවේ-පූර්ව දිග්භාගයට අසිතිවූ භාෂාවලින් සිංහල භාෂාව සන්ධිවිධිය බහුලනුවූ එකකි—මේ විධියෙහි වර්ණ යන නාමයෙන් ප්‍රාණාක්ෂර ගාත්‍රාක්ෂර දෙකොටසම කියත්.

b **විදුරවිසෙය්**-විදුරු-අවිසෙය් යනු-විදුරවිසෙය්ය-**දිගා**-දිගු ආ යනු දිගාය-**දිනිසුරු**-දින-ඉසුරු යනු-දිනිසුරුය-**කනිල්**-කනා-ඊල් යනු කනිල්ය-**බමරුඳුල**-බඹර-උඳුල යනු-බමරුඳුලය-**නොමරුල්** නොමර—ඌල් යනු—නොමරුල්ය, **සඳෙව්**—සඳ—ඒව් යනු—සඳෙව්ය; **සලේගි**—සල-ඒගි යනු-සලේගිය; **පහරොත**-පහර-ඔත යනු පහරොතය; **හඬෝනා**-හඬ-ඕනා යනු-හඬෝනාය; ඈ, මේ ආදිය; පෙරසරලොපා, පූර්වවූ ප්‍රාණාක්ෂරය ලොප්කොට; පරසර, පරවූ ප්‍රාණාක්ෂරය; ගතට පැමිණුවූ බැවින්, ගාත්‍රාක්ෂරයට සම්ප්‍රාපිතකළ බැවින්; පෙරසරලොප් සඳනම්, පූර්වස්වරලොප සන්ධිනම්වේ.

## ඌලේසුම්, සූස්මෙන්, තියුණු, වැමුසිපත, ඈ පරසරලොප් සඳනම්. 𑇡

මේ සන්ධිවිධිය මෙසේයි—විදුරු අවියේ යනු-විදුරවියේ කියා එක තුකොට ගළපා කියත්-එසේ කිරීමේ විධිය මෙසේයි.

විදුරු-අවියේ-කියනතැන මුල ශබ්දයේ අග අකුරද, අග ශබ්දයේ මුල අකුරද බලනු-මුල ශබ්දයේ අග අකුර උයන්න බව ශාත්‍රාක්ෂර යෙන් ප්‍රාණාක්ෂරය වෙන්කොට බලනකලැ පෙණේ-ඒ මෙසේ වේ-විදුර්-උ-අවියේ-මෙහි මූලශබ්දයේ අගකුර උයන්නද අග ශබ්දයේ මුලකුර අයන්නද වේ-ඒ දෙකම ප්‍රාණාක්ෂරයි-ප්‍රාණාක්ෂර දෙකක් හෝ වැඩියක් පෙළට කිම සැපසේ කිමක් නොවේ-එහෙයින්, මෙහි කියනලද මුල ශබ්දයේ අගකුරවූ උයන්න **පෙරපරවණන්** යන ආදි උපාධ්‍යසූත්‍රයෙන් ලොප්කටයුතුයි හෙවත් මැකියයුතුයි-එසේකලැ අගපදයේ මුල තිබෙන ප්‍රාණාක්ෂරයවූ අයන්න සවරනැතිවූ රයන්න පිටට පැමිණවිය යුතුයි-එකලැ '**විදුරවියේ**' යනුවේ-දිගු-ආ—යනු දිගා කියා සිදුකිරිම් ආදියද මෙසේමය-මෙසින් අක්ෂරයන්ගේ ගැළපිමම ඉගෙණගතයුතුයි-මෙහි මේ සන්ධිවීම් ආදියට උදාහරණ වශයෙන් දක්වා තිබෙන්නේ පුරාණ පොත්වල ව්‍යවහාරවූ වාක්‍යපදාදියයි-ඒ වචනාර්ථ දැනීමේ ස්වල්ප ප්‍රයෝජන සලකා ඒ අර්ථත් ප්‍රකාරයකින් දක්වමු—එ අප විසින් කියනුලබන අර්ථ හැර අනිකුදු අර්ථ ඇතිවිය හැකිවේ.

වචනාර්ථ-විදුරවියේ, වජ්‍රායුධ ඇත්තේයි-ඒනම් ශක්‍රයායි—දිගා, දීර්ඝායුසයි-දිනිසුරු, දිනට නොහොත් දාවලට අධිපතියායි-ඒනම් සූර්‍ය්‍යායි-කනිල්, රන්අලාව හෝ රන් උන්සිල්ලාවයි-බමරුදුල, මී මැස්සන්ගෙන් උසස්ව බැබලුනේය-එබදු මල්කැනකි-නොමරුල්, වැලිනැති උල්පතු හෝ නොමළමූත්‍රයි-මරුද මරද වැල්ලටද මරණයටද නම්-ඒ හෙයින් නොමර යනු වැලි නැති හෝ මරනැති යන අර්ථයි-ඌල් යනු උල්පතටද මූත්‍රයටද නම්-සදෙව්, සඳවැනි-යලේහි, කාලයෙහි-පහරෝත, ප්‍රහාරය වැටුනේය-හඬෝනා, හඬවැටුනාවූ.

### පූර්වස්වර ලොපසන්ධියි.

𑇡 ඌලේසුම්, උලේ-උසුම්-ඌලේසුම්ය; සූස්මෙන්, සු-අස්මෙන් * සූස්මෙන්ය; තියුණු, ති-අයුණු-තියුණුය-වැටුසිපත, වැටු අසිපත-වැටුසිපතය; ඈ, මේ ආදිය; පරසරලොප් සඳනම්, පරස්වරලොප සන්ධි නම්වේ.

* මෙය සු **උස්මෙන්** කියා ප්‍රකටයි—සු—උස්මෙන් කීකලැ පරස්වරලොප සන්ධියයි ඒකාන්තකරන්නට හෙතුවක් නැත්තේයි—පූර්ව ප්‍රාණාක්ෂරයත් පර ප්‍රාණාක්ෂරයත් උයන්නමය—එසේකලැ පූර්වස්වරග ලොප්කලත් සන්ධිය සිඩසිනාවද උස්ම යන නම උසුම ශබ්දයෙන් පාලියෙන් භින්නවියහැකි, එසේකලැ උණ්ණයයි කියයුතැයි—සූස්ම යනු ආකාශයට ව්‍යවහාරයි-ආකාශශබ්දයෙන් අස්ම කියා සිද්ධයහැකිවේ—පරීක්ෂාකටයුතුයි.

**පසැස්, ඈ සරලොප් නැතද සර ගතට පැමිණවු බැවින් සරසඳ නම්.** a

**මෙහෙසුරු, මොහොර, ලඹෝරා, ඈ-අ, ඉ, උන්, ලොපා එ, ඔ, ඕ, අදෙස් කළ බැවින් සරදෙස් සඳ නම්.** b

---

මෙහි උශ්ලේ-උසුම් කිකලැ පූර්වශබ්දයේ අග ස්වරය ඒ යන්නයි, අපර ශබ්දයේ මුල් ස්වරය උයන්නයි-එසේ කලැ අග තිබෙන ශබ්දයේ උයන්න මැකූ කලැ උශ්ලේසුම් කියාවේ, සූ අස්මෙන් යන ආදියද මෙසේමය.

වචනාර්ථ-උශ්ලේසුම්, මූත්‍රයේ හෝ උල්පතේ හෝ උෂ්ණතාව යන ආදියයි-සූඅස්මෙන්, යහපත් උඩට නගන ශරීරවාතයෙන්; තිඅයුණු, තුන්අගුණ; වැටු අසිපත, පවත්වනලද හෙවත් සිසාරණලද කඩුපත.

### පරස්වරලොප සන්ධියි.

a ප-පසැස් ඈ, පස් ඇස් යනු පසැස්කිම ආදිය; සරලොප් නැතද, ප්‍රාණ්‍යක්ෂරලොපයක් නැතිනමුත්; සර, ප්‍රාණාක්ෂරය; ගතට පැමිණවූ බැවින්, ගාත්‍රාක්ෂරයට පත්කළ බැවින්; සරසඳනම්, ස්වරසන්ධිනම්වේ.

**පස්-ඇස්,** යි තන්හි පස් යන ශබ්දයේ අග අකුර ස්වර නැති ගාත්‍රාක්ෂරයක්ම හෙයින් ඇස් යන පරශබ්දයේ මුල්වූ ස්වරය ඊට ආරූඪ කරණලදී-එකල්හි පසැස් කියාවේ;පසැස්නම් පස් ආකාරයකින් ඇස් ඇත්තාවූ තථාගතතෙමේය-නෙත්ඉඳුනිල්-නෙතිඳුනිල් යන ආදියද මෙසේවූ සන්ධියි.

### ස්වර සන්ධියි.

b මෙහෙසුරු, මහ-ඉසුරු-යනු, මෙහෙසුරුය; මොහොර, මහ-උර-යනු, මොහොරය; ලඹෝරා, ලඹ-උදරා-යනු, ලඹෝරාය; -ඈ, මේ ආදිය; අ, ඉ, උන්, ලොපා, අකාර ඉකාර උකාරයන් ලොප් කොට-එ, ඔ, ඕ, අදෙස්කළ බැවින්, එකාර ඔකාර ඕකාරයන් ආදෙශ කළ බැවින්; සරදෙස් සඳනම්, ස්වරාදෙශ සන්ධිනම් වේ.

මහ-ඉසුරු, මහ-උර, ලඹඋදරා, කියා පදච්ඡේද කොට තිබුන කල්හි පෙරකී පරිද්දෙන් **පෙරපරවණින්** යනආදි උපාධ්‍යසූත්‍රයෙන් හකාර බකාර සම්බන්ධ අකාර ලොප් කොට ඉකාර උකාරයන්ද ලොප් කොට එකාර ඔකාර ඕකාරයන් පිළිවෙළින් ආදෙශ කරන්නේයි.

මෙහෙසුරු මොහොර යන දෙතන්හි මකාර සම්බන්ධ අකාරයට ඒකාර ඔකාර වශයෙන් පිළිපෙරළිකිරීමද උදර ශබ්දයේ දකාරය ලොප්කිරීමද **සඳරුන්** යනආදි අධ්‍යසූත්‍රයෙන් කරන්නේයි.

වචනාර්ථ-මෙහෙසුරු, මහෙශ්වරයාය; මොහොර, මහත් (විශාල) වක්ෂස ඇත්තේය; ලඹෝරා, එල්බෙන බඩ ඇත්තේය; (එනම් ගණදෙවිය.)

### ස්වරාදෙශ සන්ධියි.

**අත්වරු, සිත්වරු, මහණුවම්, දඬුවම්, ගිනියම්, ඈ පරක කරනට වසන් හා—කප්පිල්, කැසුප්පොතු, ලප්නාරග, හෙප්තොාට, සුත්බත්, බුත්සරණ, ඈ—බදන් සර ලොපා පතන් හා අදෙස් කළ බැවින් ගතාදෙස් සඳනම. ෘ**

ෘ අත්–කරු–අත්වරුය; සිත්–කරු–සිත්වරුය; මහණු–කම්–මහණුවම්ය * දඬු–කම්–දඬුවම්ය; ගිනි–කම්–ගිනියම්ය; ඈ (මෙ) ආදිය; පරකකරනට, පරවූ කකාරයන්ට; වයන් හා, වකාර යකාරයන් හා; කබ–පිල්–කප්පිල්ය; කැස්බු පොතු–කැසුප්පොතුය; ලබු–නාරඟ–ලප්නාරඟය; හෙබ–තොට හෙප්තොටය; සුදු–බත්–සුත්බත්ය; බුදු–සරණ–බුත්සරණය; ඈ, (මෙ) ආදිය; බදන්, බකාර දකාරයන්ගේ; සරලොපා, ප්‍රාණාක්‍ෂර ලොප්කොට; පතන්හා, පකාර තකාරයන්ද; අදෙස්කළ බැවින්, ආදෙශකළ බැවින්; ගතාදෙස් සඳනම්, ගාත්‍රාදෙශ සන්ධිනම් වේ.

මෙහි අත්–කරු කියා තුබුන තන්හි **පෙරපරවණන්** යනආදි ලපා ඩිහසූත්‍රයෙන් කකාරයට වකාරය ආදෙශ කළ කල්හි අත්වරු කියා සන්ධිවේ. සිත්වරු යන ආදියත් එසේමය. ගිනි–කම් යන තන්හි කකාරයට යකාරයසි. †

වචනාර්ථ—අත්වරු, හස්තකර්මකාරසි; සිත්වරු, චිත්‍රකර්මකාරසි; මහණුවම්, ශ්‍රමණකර්මසි; දඬුවම්, දණ්ඩකර්මසි; ගිනියම්, අග්නිකර්මසි; කප්පිල්, මොනරුන්ගේ ඇස්පිලසි; ‡ කැසුප්පොතු, කච්ඡපයාගේ පොතුසි; ලප්නාරඟ, බීජපූර හෙවත් නස්නාරම්; හෙප්තොට, වළ ඇති තොටුපලසි; සුත්බත්, ධවලවූ බතය; බුත්සරණ, බුදුන් සරණසි.

**ගාත්‍රාදෙශ සන්ධියි.**

අත්–කම්–අත්තම්ය; වත්–කම්–වත්තම්ය; ගෙත්–කම්–ගෙත්තම්ය; පන්–කම්–පන්නම්ය; විස්–කම්–විස්සම්ය; ඈ, (මෙ) ආදියෙහි; පරකකරනට, පරවූ කකාරයන්ට; පෙරරූ ලද්දෙන්, පූර්වරූප ලත් හෙයින්; පෙරරූ සඳනම්, පූර්වරූපසන්ධි නම් වේ.

අත්–කම්–සි සිටි කල්හි, **පෙරපරවණන්** යනආදි සූත්‍රයෙන් කියන ලද පරිද්දෙන් පරවූ කකාරයට පූර්වයෙන් තිබෙන තකාරයේ රූපයම කළකල්හි අත්තම් යනුවේ.

* මහණ-කම්-මහණුවම්සිද කියත්—මෙය මහලුකම් කියාද පුරාණ පොත්වල පෙණේ.

† දඬුකම් යන තන්හි උකාරයෙන් පරවූ කකාරයට වකාරයම වීමත් ගිනිකම් යන තන්හි ඉකාරයෙන් පරවූ කකාරයට යකාරයම වීමත් ඕෂ්ඨජ උකාරයෙන් පරහෙයින් දන්තෞෂ්ඨජ වකාරයද තාලුජ ඉකාරයෙන් පර හෙයින් තාලුජවූ යකාරයද වීම අක්‍ෂර උපද්න ස්ථානසන්නහෙයිනැයි කල්පනාකටයුතුයි-අත්වරු යන ආදියෙහි එබඳු ආසන්නතාවක් නොපෙණේ.

‡ කප්පිල් යනු මේවර කරණලද කණුවසිද කියත්-නාමාවලියෙහි "කබ පිල්" කියා මොනරුන්ගේ ඇස්පිල්වලට නමක් කියනලදී—ඒසේ තිබෙයි නම් මේ සන්ධි අනියම්විනි හෙයිනි.

**අත්තම්, වත්තම්, ගෙත්තම්, පත්නම්, විස්සම්, ඈ පරක
කරනම පෙරරූ ලද්දෙන් පෙරරූ සඳනම්.**

**ගංරන්, වංමුතු, මුංබිසලි, නෙළුම්මල්, අම්මල්, ඈ ගබන්
ලොපා මත්වැඩු බැවින් ගතකුරු ලොප්සඳ නම්. a**

---

වත්තම් යනආදියත් එසේමය * සත්-තු සත්තු; පුත්-තු-පුත්තු; කොක්-කු-කොක්කු යන ආදි තැන්වලින් තකාරය හැර අන්‍යාක්ෂර වලටද එසේ පූර්වරූප සන්ධිවන බව දතයුතුයි.

වචනාර්ථ—අත්තම්, හස්තකර්මයි; වත්තම්, පොහොසත්කමයි; ගෙත්තම්, ගෙතිමයි; පත්නම්, පර්ණකර්මයි; විස්සම්, විශ්‍රාමකර්මයි.

## පූර්වරූපසන්ධියි.

a ගඟ-රන්-ගංරන්ය; වඟු-මුතු-වංමුතුය; මුඟු-බිසලි-මුංබිසලිය; නෙළුඹු-මල්-නෙළුම්මල්ය; අඹ-මල්-අම්මල්ය; ඈ, (මේ) ආදියෙහි; ගබන්ලොපා, ගකාර බකාර ලොප් කොට; මත්වැඩුබැවින්, මාත්‍රාවෘද්ධි කළ බැවින්; ගතකුරුලොප්සඳ නම්, ගාත්‍රාක්ෂරලොපසන්ධි නම් වේ.

ගඟ-රන් කියා සිටිකලැ ගඟ යන තැන අග ගයන්නේ බින්දුවෙන් අඩියක් බැඳීසිටී-එය නාසයට හුරුව ඇසේ-පෙරපරවණින් යනආදි සූත්‍රයෙන් කී පරිද්දෙන් ගයන්න ලොප්කළකල්හි ඒ අඩබින්දුව ඉතිරිවේ-එකල නැවත ඊට මාත්‍රාවෘද්ධි කොට සම්පූර්ණ බින්දුවක් කෙරේ-එසේ පූර්වයෙහිවූ ගයන්න බින්දුව සමග කියනකල්හි මාත්‍රා දෙකක් ඇත්තාවූ ගුරක්වේ-වඟුමුතු යනආදියද එසේමය-නෙළුඹු-මල් යන තන්හි බයන්නේ මකාරයෙන් අඩියක් තිබෙන හෙයින් එය ඉතිරි කොට ඒ ස්වරය සමග බකාරය ලොප් කොට නැවත එය සම්පූර්ණ අල්මයන්නක් කටයුතුයි-අඹමල් යන තන්හිත් එසේමයි.

වචනාර්ථ-ගංරන්, ගඞ්ගාසන්න වනය හෝ ගඟේ උපන් රන්; වංමුතු, කලාඳුරු; මුංබිසලි, මුංඇට පියලි; නෙළුම්මල්, පියුම්මල්; අම්මල්, අඹගසේ මල්.

## ගාත්‍රාක්ෂරලොප සන්ධියි.

---

* පූර්වවූ අකුරලෙස පරකුර සුවසේ කීම පිණිස ආදෙශ කොට කියනහෙයින් මේ පූර්වරූපසන්ධියි කියනලද්—මෙයින් උගන්වා තිබෙන්නේ අසමාන අකුරු දෙක එකතු වනකල සමාන කරණ බවයි—එයින් පූර්වාක්ෂරය ලෙස පරවූ අකුරට ආදෙශයක් කරණ හෙයින් පූර්වරූපසන්ධියයි කියනලදී—ඇතැම් තැන පරකුරලෙස පූර්වාක්ෂරයට ආදෙශ කටයුතුව පැමිණේ—එසේතැන පරරූපසන්ධියි කියයුතුව බව අර්ථවචනයෙන්ම හැඟේ—එය **දුප්පත්, ගොප්පන්, දම්ම** යන ආදියෙන් ප්‍රකාශයි—සංස්කෘත ව්‍යාකරණයෙහි—"තවර්ගස්‍ය ලකාරෙ පරෙ පරසවර්ණඃ ස්‍යාත්" යන ආදියෙන් ලකාරය පරකලැ තවර්ගයට පර සවර්ණ වශයෙන් ලයන්නම ආදෙශවන බැව් දක්වා—තත්ලයඃ "තල්ලයඃ" යන ආදි උදාහරණ පෙන්වා තිබෙන බැවින්ද ප්‍රකාශවේ—සිංහල භාෂාවෙහිද එසේවූ ව්‍යවහාර ලෙස දතයුතුයි—ව්‍යවහාරෙල්ලඞ්ඝනය නො කටයුතුයි.

**පිරියත්, මියුගුනු, සිපියෙව්, දුවග, රුවාරු, තුනුවග, පුන රුත්, නිරොද, ඈ-පෙරසර නොලොපා යවරන් අගම් කෙළෙන් අගම්සඳ නම්.** a

**වැල්ලවුරු, හෙලිල්ලඹු, තඹපල්ලෙන්, කුල්ලෙව්. ඈ පෙරසර ලොපා ගතට දෙරුදුනවූ බැවින් දෙරුසඳ නම්.** b

සඳඅදියර දෙවනු.

---

a පිරි–අත්–පිරියත්ය; මී-උගුනු-මියුගුනුය; සිපි–එව් සිපිවේයය; දු-අඟ-දුවඟය; රූ-අරූ–රුවාරූය; තුනු-අඟ–තුනුවඟය; පුන-උත්–පුනරුත්ය; නි-ඔද-නිරොදය; ඈ, (මේ) ආදියෙහි; පෙරසර නොලොපා, පූර්වූ ප්‍රාණාක්ෂර ලොප් නොකොට; යවරන් අගම් කොළෙන් යකාර වකාර රකාරයන් ආගම කළ හෙයින්; අගම් සඳනම්, ආගම සන්ධි නම්වේ.

**පිරි-අත්**–කියා තුබූකල්හි රිකාරයේතිබෙන ඉකාරය ලොප් නොකොටම ස්වර රහිත යකාරයක් පරස්වරයට පූර්වයෙන් හෙලා පිරියත් යන සන්ධිය සිඩ කටයුතුයි—මියුගුනු යන ආදියත් එසේමය- **රූ–අරූ** යන තන්හි පූර්වූ ඌකාරයට හ්‍රස්වකිරීමද පරවූ අකාරය දීර්ඝකිරීමද **සඳරුත්** යනආදි සූත්‍රයෙන් කටයුතු.

වචනාර්ථ—පිරියත්, කෙළවර; මියුගුනු, මහියඩගනය; (මී–පොළව; උගුනු, මළුව) සිපියෙව්, ශිල්පියෙක් මෙන්; දුවඟ, ධූතාඞ්ග හෝ අඟවය; රුවාරූ, රූපරූප; තුනුවඟ, සිහින් ශරීර ඇත්තී; පුනරුත්, කියුවක් නැවත කීම; නිරොද, ඔජස්රහිත.

මෙහි පිරිඅත් යන ආදියේ තාලුජ ඉකාරයෙන් පරවූ යකාරාගමද, **දු**-අඟ යනආදියේ ඔෂ්ඨජවූ උකාරයෙන් පරව වකාරාගමද පෙණේ- **පුනඋත්** යන තැන රකාරය ආගමවුනේ කිමක් ආශ්‍රය කිරීමෙන්ද යත්–සංස්කෘත භාෂාවේ **පුනර්** යන නිපාතයෙන් භින්න නිසා, පුන කියා සිංහල භාෂාවේ පෙණෙන නුමුත් මාතෘභාෂාවේ තිබුන රකාරය අමුතු ප්‍රාණාක්ෂරයක් ඇසුරුකල හෙයින් ආබව දතයුතු–**නි, උත්, නිරුත්** යන ආදියත්-එසේමය.

**ආගම සන්ධියි.**

b වැලි–අවුරු, වැල්ලවුරුය; හෙලිලි–අඹු, හෙලිල්ලඹුය; තඹපලු–එන්, තඹපල්ලෙන්ය; කුලු–එව්, කුල්ලේවිය; ඈ, (මේ) ආදි **තන්හි**; පෙරසර ලොපා, පූර්වස්වර ලොප් කොට; ගතට, ගාත්‍රාක්ෂරයට; දෙරුදුනවූ බැවින්; විකරූප ඉපදවූ බැමින්; දෙරුසඳනම්, විකරූප සන්ධිනම් වේ.

**වැලි-අවුරු,** කියා තුබුතන්හි අවුරු යන ශබ්දයේ ප්‍රාණාක්ෂරය පරකල්හි **පෙරපරවණන්** යනආදි සූත්‍රයෙන් කියූ ක්‍රමයෙන් පූර්වූ ලයන්නේ සිටි ඉකාරය ලොප්කොට ලකාරය දෙක කොට ප්‍රාණාක්ෂරය පෙරසේම ගාත්‍රාක්ෂරයට ආරූඪකල කල්හි **වැල්ලවුරු** යනුවේ–**හෙලිල්ලඹු** යන ආදියද එසෙමය.

**සකුසන් අනුසෙරෙන් ඇත ද සදනට ලිඟුබේ,**
**නොපැණේ වහර වෙසෙසෙක් පුම ඉතිරි ලිඟු දෙක විනා.** a
**පණන් හදන්යුත් පවසනුයෙ පුමලිඟු වේ**
**සහ යොන් සතුන් කියලු සද වේ ඉතිරි ලිඟු නම්** b

වවනාඇඹ–වැල්ලවුරු, වැල්ලෙන් කරණලද ආවරණය; හෙලිල් ලඹු, එලලුපාට ඇති ස්ත්‍රී; තඹපල්ලෙන්, තඹපාටවූ දලුවෙන්; කුල් ලෙව්, පසුරක් මෙන්.

## මිශ්‍රරූප සනයිසි.

## සංඥාධිකාරය දෙවෙනියි.

---

a ප–සදනට, (නාම) ශබ්දයන්ට; සකුසන් අනුසරෙන්, සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන්, ලිඟුබේ ඇතද, ලිඞ්ගභෙද විද්‍යමානවූවද; පුම ඉතිරි ලිඟුදෙක විනා, පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක හැර; වහරවෙසෙසෙක්, ව්‍යවහාර විශෙෂයෙක්; නොපැණේ, අදෘශ්‍යමාන වේ.

මෙහි භාවය–නාම වචනයන්ට සංස්කෘත ව්‍යාකරණයේ අනුසාරයෙන් ලිඞ්ගභෙදය (පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග නපුංසකලිඞ්ග වශයෙන්) ඇතත් පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක හැර ව්‍යවහාරයේ ප්‍රභෙදයක් නොපෙණෙයි–මෙයින් සංස්කෘත භාෂාවේ ව්‍යාකරණයට අනුව්‍යාමෙන් ලිඞ්ගත්‍රය වශයෙන් නාම ශබ්දයන්ට ප්‍රභෙද තිබෙතත් භාෂා ව්‍යවහාරයෙහි පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග යන දෙක පමණක් සලකණුබැව් කියනලදී.

මෙහි භාවය පුරාණ ව්‍යාඛ්‍යාවෙහිද මෙසේ කියනලදී–"මේ පුරිස් මෝකාය් මේ දනාසයි පුරුෂ ස්ත්‍රී දෙදෙනාට මේය මෝය යන ව්‍යවහාර භෙදයමුත් දන, පා, හම්, ආදි * නපුංසක ලිඞ්ගයන්ට ව්‍යවහාර භෙදයක් නැතිව පුල්ලිඞ්ග ව්‍යවහාරයම පැණෙන හෙයින් ඒ නපුංසකලිඞ්ගද පුල්ලිඞ්ගයෙහි අන්තර්ගත කොට මේ සියබස ලිඞ්ග වයෙක්ම පැණෙන්නේය යනු භාවයි."

b ප–හදන්යුත් පණන්, පුරුෂව්‍යඤ්ජනයෙන් යුක්තාවූ ප්‍රාණීන්; පවසනුයේ, ප්‍රකාශ කරන්නාවූ ශබ්දයතෙම; පුමලිඟු වේ, පුරුෂලිඞ්ගික වන්නේය; සහයොන් සතුන් කියලූ, යොනිසහිත සත්වයන් ප්‍රකාශ කළාවූ; සද, ශබ්දයතෙම; ඉතිරි ලිඟුනම් වේ, ස්ත්‍රීලිඞ්ගනම් වේ.

භාවය–පුරුෂනිමිත්ත ඇත්තාවූ සත්වයන් කියන වචනය පුමලිඟු නම්වෙයි; ස්ත්‍රීනිමිත්ත සහිත සත්වයන් කියූ නොහොත් කියන වචනය ස්ත්‍රීලිඞ්ගනම් වේ–මෙයින් පුරුෂ ස්ත්‍රී දෙකොටස කියන වචන පුල්ලිඞ්ග ශබ්ද ස්ත්‍රීලිඞ්ග ශබ්දයි දෙකොටසක් කාරණබව කියනලදී.

**ඉක්බිති ඒ ශබ්දයන් වෙන් වෙන් වශයෙන් දක්වත්.**

---

* දත පා ගම් ආදියි ඇතම් පොත්වල පෙණේ

බඹ, සුර, අසුර, නර, නා, ගුරුළු, පත්, රිය, ඈ පුම්ලිඟු
දෙවුදු, නැයිනි, ගුරුළුමෙනෙවි, අඹු, සුහුල්, ඈ ඉතිරිලිඟු a
දියදලඇදුරුමේ අඹරවිතුරුරණහදන්,
රෝ රා ගහ මරු දහන් අඟගුම් සඳ රස රුවන්.
පිරිකර පියබ මුනිපානිදුකටවස් මස්
කෝසරකරබණමුළුවන් සන්දිව්මැසිවියා
පස් සස් ගුණනගුල් සන්සෝබාඇඹුල් ඈ
පුම්ලිඟුසදන් පියසු බුහුසු සඳහු දතුවෝ b

a බඹ-බ්‍රහ්මය; සුර-දෙවය; අසුර-දානවය; නර-මනුෂ්‍යය; නා නාගය; ගුරුළු-ගරුඩය; පත්-පාබල සේනාය; රිය-රථය; * ඈ, (මේ) ආදිය; පුම්ලිඟු, පුරුෂලිඞ්ගිකයි.

දෙව්දු-දෙවදුහිතෘය; නැයිනි-නාගමානවිකාය; ගුරුළුමෙනෙවි-ගරුඩමානවිකාය; අඹු—අම්බිකාය; සුහුල්-නැන්දනිය, හෝ සහොදරිය; ඈ (මේ) ආදිය; ඉතිරිලිඟු, ස්ත්‍රිලිඞ්ගිකයි—

මෙහි බඹ සුර ආදි ශබ්දවලින් පුරුෂභාවයෙන්ම පුල්ලිඞ්ගික කොට කියනලද ශබ්දද, දෙව්දු යනආදියෙන් ස්ත්‍රී බැවින්ම ;ස්ත්‍රීලිඞ්ගික කොට කියනලද ශබ්දද කියා—ලිඞ්ගලක්ෂණයෙන් අප්‍රකාශවූ පදාර්ථයන් කියන ශබ්දයන් ව්‍යවහාර කරණ පරිදි කියත්.

b දිය-ලොකය; දල, ජලය යන මේ කියන ශබ්දද; දල-පත්‍ර, ජල, අඞ්, ශිනි, දාහ යනමේ දේ කියන ශබ්දද; ඇදුරු-පර්වත, ආධාර, † කියන ශබ්දද; නොහොත්, ඈ—ආදිවාචක ඈ ශබ්දය-දුරු, ජීරකවාචක දුරුශබ්දය; මේ-මේඝය, මෙදොධාතුය, මෙහණය; චම්මුතුය, ‡ අඹර-ආකාශය-වස්ත්‍රය; අවි-ආයුධය, ආපොධාතුය; තුරු-වෘක්ෂය, තූර්යය, පක්ෂිය, සන්තොෂය; රණ-යුඬය, නාදය, කුඬය; හදන්—ළිඟය, සලකුණ්ඩය; රෝ-රොග-රොෂය; රා-රාගය, වර්ණය; ගහ-ගෙය, ග්‍රහතාරකාය, අභිලාසය; මරු-වායු, ජලනැති බිමය, වැලිය, මාරය; ¶ දහන්—ධ්‍යානය, අඟ—අවයවය, කාරණය; ගුම්—පඳුරය, ඝොෂණය, ග්‍රීෂ්මය, ප්‍රහාරය; සඳ-චන්ද්‍රයාය, ඡන්දසය, සැකය, කැමැත්තය, සත්‍යය; රස-කටුකාදිරසය, කාව්‍යරසය, රසදියය; රුවන්—රත්නය; නොහොත්, රූ-රූපය; වන්, වර්ණය; පිරිකර-පරිෂ්කා

* රිය ශබ්දයෙන් රථසේනාව කියත්, යුඬ පිණිස රථ නැගි යන්නන් පුරුෂ බැවින් රිය ශබ්දයද පුරුෂ ව්‍යඤ්ජන සහිත සත්වයන් කියන ශබ්දයක්යි දතයුතු.

† ඇදුරු ශබ්දයෙන් ආචාර්යයන්ද කියත්—ආචාර්යවාචකතැන පුරුෂ ව්‍යඤ්ජනයෙන් යුක්තයන් වාචකහෙයින් ඒ අර්ථය මෙතැනට ප්‍රයොජන නොවේයි සැලකිය යුතු.

‡ මේ යනු එළුවාටද නම්වේ—ඒ පුරුෂව්‍යඤ්ජනයෙන් යුක්තයන් කියන ශබ්දයන්ට ගැණෙනු හැකි බැව් හැඟේ.

¶ මරු යනු, දෙවියන්ටද නම්—ඒ සුර ශබ්දය මෙන් පුල්ලිඞ්ගවේ. මාරයාට නම්වූ තැනද දෙවියෙක් කියනකල එසේමය—ඇතම්තැන මරණයටද-රොගයටද නම්වේ.

**විදුලිය වසාපෙල නිසාඅලදපැණපවස්**
**කිඩුබිම්මෙවුල් ඇනම ඉත්රිලිඟු වි දන්නේ**
**අරුත්කිරියසද ගුණ සදද වන ඉති අන**
**පුමසදද ඉති පවසන ර ඇ පස බුහුසු.** a

රය, ආභරණය; පියබ-ප්‍රගල්භය හෙවත් වත්මානමතිය; මුනි-චිත් තය; * පා, පාදය; රශ්මිය, පාපය, ක්ෂීරය, ව්‍යාඝ්‍රය, පාඨය, පාත්‍රය; නි-ස්වර්ණය, නිධානය; ඉඳු අධිපතිය, චන්ද්‍රය; † නොහොත් නිදු— සමුද්‍රය, කට-කාෂ්ඨය, කාණ්ඩය; වස්-වංශය, වර්ෂය, උනදඬුය, මස්- මාංසය, මාසය; රුවුලය; කේ-කෙස්ය, ක්ෂේත්‍රය, කෙතකිව්‍යාඝ්‍රය; සර-ගමන, ශබ්දය, පියුම, වෙගය, විල, ඊය; කර-හස්තය; කර්ෂය, රාජ්‍යයේ අය; ඇත්සොඬ, රශ්මිය; බණ-වචනය, ධර්මය, ඊය; මුළු- සමූහය, දූතය; දිවි- දිවයින, පහන, ජීවිතය; මැසි-මචය, නොසිවසි මය; විසා-කාමගුණය, දෙශය; පස්-පාංශුය, ප්‍රත්‍යය, පාශ්වය; සස්, සත්‍යය, ගොයම, ගුණධර්මය, අභ්‍යාසය, නූල්ය; නගුල්-නඟුල, වල් ගය; සත්-සත්වගුණය, ප්‍රාණිය; කූඩය; සෝ-ස්‍රොතස්ය, ශොකය; බා-භාග්‍යය, බාහුය; ඇඹුල්-කම්බලය, ඇඹුල්ය, හෙල්ලිය, විශ්‍රාම ශාලාවය; ඇ (මේ) ආදිනාමයන්, සදතු දතුවෝ, ශබ්දාර්ථ දත් තැ නැත්තෝ; බුහුසු, බොහෝසේ, පුමලිඟු සදන් පියසු, පුල්ලිඞ්ගික ශබ්දයයි ප්‍රකාශ කළෝ.

මේහි මේ නම්වලින් කියනලද ද්‍රව්‍යාදිවාචක වෙන ශබ්දයෝද පුරුෂලිඞ්ගිකයි හඟවත්-බොහෝසේ කිමෙන් ශරීරවාචක තුනු ශබ්ද දිය ස්ත්‍රීලිඞ්ගික වනබවත් හඟවති-එසේ ස්ත්‍රීලිඞ්ගික බවට ඇතම්තැ න ජගතිවාචක දිය ශබ්දයද යේ-මෙකී ශබ්දයන් අතුරෙන් කොට සක් සංස්කෘත භාෂාවෙහිද පුල්ලිඞ්ගිකයි-කොටසක් නපුංසකලිඞ්ගි කයි-ධ්‍යාන රත්නවාචක ශබ්දයෝ නපුංසක ලිඞ්ගිකමය, ඒ නපුංසක ලිඞ්ගික කොටස නපුංසකලිඞ්ගික ස්වභාවයෙන් හැඳින සිංහල භාෂා වේ පුල්ලිඞ්ගික ශබ්දසේ ව්‍යවහාරකරණ බැව් කියනලදී

**ඉක්බිති ස්ත්‍රීලිඞ්ගික ශබ්දයන් කියත්.**

a විදු-විද්‍යුත් විද්‍යුය; ‡ ලිය-ලතාය, යෂ්ටිය; § වසා-රොමරාජිය, වූරුණු තෙල; පෙල-පන්තිය, පීඩාය + නිසා-රාත්‍රිය, හරිද්‍රාය; නො හොත් නී-නීතිය, නදිය; සා-ශාඛාය; දෙ. ජ්‍යොතිෂය; ලද- ලජ්ජාය, ලබ්ධිය; පැණ-ප්‍රශ්නය; පවස්—පිපාසාය; කිඩු-ක්‍රීඩාය; බිම්-භූමිය; මෙවුල්-මෙඛලාය, ඇනම්, මේ ආදි නාමයන් ඉත්රිලිඟුව්, ස්ත්‍රීලිඞ්ගික යයි; දන්නේ, අවබොධ කරන්නේය.

* මුනි-යනු තපස්වීන්ටද නම්-ඒ යටකීසේ පුමලිඟු වේ.
† ශක්‍රාදීන්ටද නම්—නිදුයනුදු කුවෙරයාටද නම්වේ.
‡ විද්‍යුත් විදුලියයි; විජ්‍ජු, ඉගෙණගැන්මයි.
§ යෂ්ටි—සැරයටියයි, ලිය යනු ස්ත්‍රීන්ටද නම්.
\+ පීඩාවාචකතැන පෙළ කියාදවේ.

**තෙමන්නි මවන්නි, තුස්නි, මුස්නි, ඈ අරුත්කිරිය සදින්**
**ඊපස "තෙමන්නෝ මවන්නෝ" ඈ බුහුබසැ ඊපස ලොපා**
**බී විබත් පැමිණවුසේ.** a

මේ **විද්‍යුත්, ලතා** ආදිශබ්දයෝ සංස්කෘත භාෂාවෙහි ස්ත්‍රීලිඞ්ගි කයි-ඒ එසේම සිංහලභාෂාවේද ව්‍යවහාර කරණබව කියනලදී. *

## අර්ථක්‍රියා ශබ්දාදිය ස්ත්‍රීලිඞ්ගිකවන කල්හි පුල්ලිඞ්ගයෙන් පෙරළෙන පරිදි කියත්.

**ප**–අරුත්කිරියසද, අර්ථක්‍රියාශබ්දයද; ගුණසදද, ගුණශබ්දයද; ඉති අතවත, ස්ත්‍රීපදාර්ථයෙහිවීනම්; පුමසදද, පුරුෂලිඞ්ගික ශබ්දයද; ඉති පවසත, ස්ත්‍රීපදාර්ථය ප්‍රකාශකරත හොත්; බුහුස, බොහෝසේ; ඊ ඈ **පස, ඊ ආදි ප්‍රත්‍යය වේ—**

මෙහි භාවය–අර්ථක්‍රියාවක් ස්ත්‍රීලිඞ්ගික අර්ථයක් කියන්නේනම්ද ගුණශබ්දයක් ස්ත්‍රී අර්ථයක් කියන්නේනම්ද පුරුෂලිඞ්ගික ශබ්දයක් ස්ත්‍රී අර්ථයක් කියන්නේනම්ද–බොහෝසේ ඊ ආදි ප්‍රත්‍යය ශබ්දයේ අගට යෙදේ–ඊ ආදි ප්‍රත්‍යයයි කී හෙයින් ඉ-අ-උ-යන ප්‍රත්‍යයන්ද යෙදෙන බව හැඟේ.

ද්‍රවන යන ශබ්දයෙන් දිවීම කරණ කෙනෙක් හැඟේ, ඒ අර්ථක්‍රියා ශබ්දයකි-දිවීමකරන්නේ පුරුෂයෙක් නම් දුවන්නා—හෝ—දුවන්නේ හෝ–කියත්–එය ස්ත්‍රියක් කරන්නීනම් ස්ත්‍රීපදාර්ථයෙහිවේ, එකල දුවන්නී කියත්, ඊට–ඊ යන ප්‍රත්‍යය අග යොදත්–සුදුවූ මනුෂ්‍යයෙක් කියන පිණිස ව්‍යවහාරකරණවිට **"සුද්දා"** කියත්–ඒ පුරුෂයෙකි—සුදු ස්ත්‍රියක් කියනවිට ඒ ස්ත්‍රීපදාර්ථයෙහිවේ–එකලැ **"සුද්දී"** කියත් ඊමත් ඊ ප්‍රත්‍යයයි—**"කුමරා"** යනු පුල්ලිඞ්ගික ශබ්දයයි–ලදරුවායි–ස්ත්‍රීවශයෙන් ඒ ශබ්දය කියනකල කුමරිසි කියත්, ලදරිසි.

### උදාහරණ.

a **තෙමන්නී**, ප්‍රශංසා කරන්නීය; **මවන්නී**, මාපන කරන්නීය හෙවත් උපදවන්නීය; **තුස්නී**, සන්තොෂ වන්නීය; **මුස්නී**, මුදන්නීය, මුසපත්වන්නීය; **ඈ**† (මේ) ආදියෙහි; **අරුත්කිරිය සදින්**, අර්ථක්‍රියා ශබ්දය කෙරෙන්; **ඊපස**, ඊප්‍රත්‍යයයි—

මෙහි ක්‍රමය දක්වමු–පැසසීමෙහි **තෙම** යන ධාතුව කෙරෙන් වර්තමාන කාලයෙහි **අන** යන ප්‍රත්‍යයකොට ලිඟුවත්ද කොට නැවත ඊ යන ප්‍රත්‍යයකොට විභාදිය කළ කල්හි තෙමන්නේ යන අර්ථක්‍රියා ශබ්දයවේ. ඒ පුරුෂලිඞ්ගිකයි–මෙහි **"අරුත්කිරිය"** යනආදි උපාඞ්ගසූත්‍රයෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප්‍රත්‍යය කොට ස්වරලොපාදිය කළ කල්හි **තෙමන්නී** යන ස්ත්‍රීලිඞ්ගිශබ්දයවේ--එකල ස්ත්‍රීපදාර්ථයෙහි පවත්නා හෙයින් ස්තුති කරණ ස්ත්‍රියක් කියනුලැබේ—මවන්නී යන ආදියද මෙසේමය·

---

* බුහුස–කී හෙයින්-ප්‍රඥාවාචිවූ නැන මෙබලාදමවාචිවූ හිනුදම් යන ආදී ශබ්ද ස්ත්‍රීලිඞ්ගික නොවනබව දතයුතු.

† **ඈ, මේ ආදිය** කියාත් අරුත්වියකත් කටගැකී නුමුත් හේ අශොභනයි.

**'හෙලිල්ලි, කොමලි, ගොරි' * ඈ ගුණ සදින් ඊපස-**
**නිළි, නැසිනි, පැමි, සැතිරි, කුමරි, සෙහෙලි, මැහැලි, ඈ**
**ඉති අරුත් පුමසදින් ඊපස.** ඛ

ප-තෙමන්නෝ, ස්තුති කරන්නියෝය; මවන්නෝ, මාපනය කරන්නියෝය, නොහොත් ඉපදීම කරන්නියෝය; ඈ, (මේ) ආදීය; බුහුබසැ, බහුවචනයෙහි; ඊපස ලොපා, ඊප්‍රත්‍යය ලොප්කොට; ඕ විබත්, ඕ යන විභක්තිය; පැමිණවූසේ, පැමිණවූ පරිදිසි.

මෙහි ක්‍රමයනම්-තෙමන්නී යන ස්ත්‍රීලිඞ්ගික අර්ථක්‍රියා ශබ්ද ප්‍රථමා ඒකවචනයවූ කල ඒ බහුවචන කරණු කැමති කල්හි "බජනුයේ පෙරවිබත්" යනආදි උපාඞ්ග සූත්‍රයෙන් කියනලද පරිද්දෙන් ප්‍රථමා විභක්ති බහුවචනයෙහි ඕ යනු යොදා **'ඵපරපරවණන්'** යනආදි සූත්‍රයෙන් කියනලද පරිද්දෙන් ඊප්‍රත්‍යයවූ පූර්වස්වරය ලොප්කොට පැමිණවූ කල්හි "තෙමන්නෝ" යනුවේ-පුලලිඞ්ගයෙහිද ස්ත්‍රීලිඞ්ගයෙහිද මේ අර්ථක්‍රියා ශබ්දවල බහුවචන බොහෝසේම ඒකාකාර වේ-පාලි සංස්කෘත භාෂාවල කෘදන්ත ශබ්ද සිංහල භාෂාවෙහි අර්ථ ක්‍රියාශබ්දයි දතයුතුයි-ඒ භාෂාවල පුලලිඞ්ගික කෘදන්තශබ්දයක් ස්ත්‍රීලිඞ්ගික වනකල්හි ඊ අන්තවන නමුත් ඒකවචනාදී සියලු වචනවල ස්ත්‍රීලිඞ්ගික පුලලිඞ්ගික විශෙෂ පෙණේ; අපේ භාෂාවෙහි ලිඞ්ගවයෙහිම බහුවචනවල බොහෝසේ ඒකාකාරය පෙණේ-එසේත් විභක්තිවිධිය බොහෝසේ අනියම හෙයින් "තෙමන්නියෝ" යනආදීන් ලිඞ්ගවිශෙෂ පෙණෙන්නාවූ බහුවචනද වේ.

ඛ හෙලිල්ලි, හෙලලුවර්ණ ඇති ස්ත්‍රිය; කොමලි, මොලොක් ශරීර ඇති ස්ත්‍රිය; ගොරි, ශ්වෙතවර්ණවූ හෝ අරුණ වර්ණවූ හෝ ශරීර ඇති ස්ත්‍රිය; ඈ, (මේ) ආදිය; ගුණසදින්, ගුණශබ්දය කෙරෙන්; ඊපස, ඊප්‍රත්‍යයයි.

මෙහි ක්‍රමයනම්, මේ එලලු ආදි වර්ණවශයෙන් හෝ මෘදු තරුණාදි ගුණවශයෙන් හෝ කලින්කලැ පෙරළෙන ස්වභාවක් කියන ශබ්ද ගුණශබ්දයි-එබඳු ගුණශබ්දයන් නාමවශයෙන් යොදනකලැ-පුරුෂයෙක් කියනුලබන්නේ නම් හෙලලු ශබ්දයෙන් "හෙලලුවා" යනආදීන් කියයුතුයි-එසේත් හෙලලුවන් ස්ත්‍රියක් කියනකල එසේ නොකියත්-එකලැ ස්ත්‍රීපදාර්ථ බැවින් යටකියනලද පරිද්දෙන් "හෙලලු" ශබ්දයෙන් පරකොට- ස්ත්‍රීලිඞ්ගයෙහි ඊ යන ප්‍රත්‍යයවේ-එසේකොට පිළිපෙරළි විචරුපාදිය කළ කල්හි "හෙලිල්ලි" කියාවේ-කොමල ශබ්දයෙන් පරව ස්ත්‍රීඅර්ථයෙහි ඊප්‍රත්‍යයවීමෙන් කොමලී යනුද, ගොරශබ්දයෙන් ඊ ප්‍රත්‍යයවීමෙන් "ගොරි"යනුද සිද්ධවීම මෙසේයි.

* ගොරි යනු—ගෝරියි මෙකලැ බොහෝදෙනෙක් ව්‍යවහාර කෙරෙත්-එසේත් සංස්කෘත ගෞර ශබ්දයෙන් බිඳුනාවූ ගොරශබ්දයෙන් "ගොරා, ගොරි" යනආදිය සිංහල භාෂාවෙහි හ්‍රස්ව ඔකාරයෙන් යුක්තව බොහෝසේ පෙණේ—එබව සිදත්සඟරාවේ අලඞ්කාරාධිකාරයෙහි "කිවිසෙවෙන තොද වැලිනි යල තො ගොරා" යනආදියෙන් බැලියයුතුයි—හින්දිභාෂාවෙහි—"ගෝරා ගෝරි" කියා දික්ව පෙණේ.

**ඈසදින් "කැලි, වැසි, මියුලැසි, කළා, දුනු" ඈසිදු—a බුහුසුසදින් වහර නොලහනු රුසි. b**

තිළි, නාටිකාවය;* නැසිනී, නාගමානවිකාය; පැරි, ව්‍යක්ත ස්ත්‍රී හෝ ලඳරිය; සැතිරි, අභිත්‍රවූ ස්ත්‍රිය; යෙහෙලි, යහලුකම් ඇති ස්ත්‍රිය; මැහැලි, මහලුබවට පත්වූ ස්ත්‍රිය; ඈ, (මේ) ආදිය, ඉති අරුත්, ස්ත්‍රී පදාර්ථයෙහි; පුමසදින්, පුල්ලිංගික ශබ්දයෙන්; ඊපස, ඊප්‍රත්‍යයසි.

මෙහි ක්‍රමයනම්-නළ යන ශබ්දයෙන් නටන්නාවූ පුරුෂයෙක් කියත්, නටන්නාවූ ස්ත්‍රියක් හෝ නටන්නෙකුගේ අඹුවක් කිවමනා තන්හි, එය ස්ත්‍රීවාචක බව හඟවනු පිණිස ස්ත්‍රීලිංගයෙහි ඊ ප්‍රත්‍යය යටකියනලද පරිද්දෙන් කොට පිළිපෙරළි ආදිය කළ කල්හි **'නිළි'** යනුවේ-නාටිකාවයි-මේ ආදින් දතයුතු-පැටි-යනු-පටු-යන ශබ්දයෙන් වූකලැ ව්‍යක්තස්ත්‍රීසි-පොතකාර්ථවූ පැටි යන ඉකාරාන්ත ශබ්දය කෙරෙන් වූකලැ ලඳරිසි දතයුතුසි-†

a ප-ඈසදින් (**'ඊ ඈ පසබුහුසු'** කිතැන) ඈ යන ශබ්දයෙන් (ඊ ප්‍රත්‍යය හා වෙනත් ප්‍රත්‍යයසි හැඟෙන බැවින්) කැලි, කල්‍ය (දක්ෂ)වූ ස්ත්‍රීහෝ, කාලවර්ණ ඇති ස්ත්‍රිය-වැසි, වාසයකළ ස්ත්‍රිය; මියුලැසි, මංගාක්ෂිය (මුවාගේ මෙන් ඇස්ඇත්තිය;) කළා, කළාවූ ස්ත්‍රිය; දුනු උපන් හෝ දිනූ ස්ත්‍රිය; ඈ, මේ ආදිය; සිදූ, සිඬසි.

මෙහි භාවය ඊ ආදි ප්‍රත්‍යයසි කිහෙසින් ස්ත්‍ර්‍යර්ථයෙහි ඊ ප්‍රත්‍යය සහ වෙනත් ප්‍රත්‍යය ඇති බව කියනලදී—එබැවින් කැලියන ආදියෙන් ඊට උදාහරණ කියනලදි. කල්-යන්නෙන් හෝ කලු යන්නෙන් ස්ත්‍ර්‍යර්ථයෙහි-ඉ ප්‍රත්‍යය කිරීම් ආදියෙන් කැලි යන ආදියවේ-කර-යන ධාතුවෙන් 'කළ' යනු පුල්ලිඞ්ගාර්ථයෙහි සිඬවේ-ස්ත්‍ර්‍යර්ථයෙහි ආ යන ප්‍රත්‍යයවීමෙන් **කළා** යනුවේ—දන යන ධාතුවෙන් ස්ත්‍ර්‍යර්ථයෙහි උ ප්‍රත්‍යයවීමෙන් දුනු යනු සිඬසි-හස යනආදි තන්හි හංසි ආදි ස්ත්‍රීලිඞ්ගික ශබ්ද පෙණෙන හෙසින් අ යන ප්‍රත්‍යයක්ද ස්ත්‍රීලිඞ්ගයෙහි වනබැව් පෙණේ-මු මෑ-යනආදියෙන්-ඈ යන්නද ස්ත්‍රීලිඞ්ගාර්ථයෙහි පෙණේ. මේ ශබ්දයද ව්‍යවහාරයෙන් ප්‍රකට බැව් කියූ හෙසින් ඒ ව්‍යවහාරයෙහිද වන විශෙෂයද දතයුතුසි.

b ප-බුහුසුසදින්, සූත්‍රයෙහි බුහුසු යන ශබ්දයෙන් (බොහෝසේසි කී හෙසින්;) වහරනොලහනුරුස්, ව්‍යවහාරොල්ලඞ්ඝන නොකිරීම අභිමතසි. ‡

---

* සෙරිටද වචාකාරිටද නම්වේ.

† නස් ශබ්දය කෙරෙන් ඊප්‍රත්‍යයවූකලැ ඊප්‍රත්‍යයට පූර්වයෙහි ශබ්දාන්තයෙන් පරවැ ඉන් යන්නක් වැටිනිබෙනු පෙණේ—එය සදරුත් යන අද්‍යඞ්ගපුත්‍රයෙන් ස්ඬයි—හලන්ත ශබ්දයන් කෙරෙන් ඊ ප්‍රත්‍යයවූ කල්හි එසේ ඉන්යන්නක් අගමවන බව ශබ්ද ව්‍යවහාරයෙහි පෙණේ—ඈත්—කොක්—සප්-යක්-යනමේ ශබ්දයන් කෙරෙන් ඊප්‍රත්‍යයකොට ස්ත්‍රීපදාර්ථය කියනකල්හි **ඈතිනි-කොකිනී-සැපිනි—යකිනි**-යන ශබ්දවේ—ඇතැම්තැන ඊසාරූප කැමතිවීමෙන් ඇතින්නී යන අද්‍යන්ද කියත්.

‡ මේ ඊ ආදි ප්‍රත්‍යය බොහෝසේ වන බව කීහෙසින් නියමවිධිවශයෙන් නොගෙණ ශබ්දව්‍යවහාරයෙහි පෙණෙනසේ ගතයුතුයි භාවත්.

**තම එමෙද රමණී දිගු සව්තුරුණු මුදු ලොල්**
**හැළි ඇලැගුණ සදද දෙලිඟු සම වි දන්නේ** a
**අරුත් කිරිය සද තමරුත් වැනි ලිඟු බෙජේ**
**යනු එනු මැගුම් ඈ භව්කිරිය සද වේ පුමරුත්** b

a ත. යුෂ්මත්, හෙවත් තෝ ආදීන් පවසන ත ශබ්දයද; ම, අස්මත් හෙවත් මම් ආදීන් පවසන ම ශබ්දයද; එ, තත්, හෙවත් අනභිමුඛ පදාර්ථ කියන්නාවූ එ ශබ්දයද; මෙද, ඉදම් හෙවත් සම්මුඛවූ පදාර්ථ කියන්නාවූ මෙ ශබ්දයද; රමනී, සිත්කලුය; දිගු, දීඝය; සව්, සවිය නොහොත් සව්‍යය; * තුරුණු, තරුණය; මුදු, මෘදුය; ලොල්, ලොලය; (ආශාඇත්තේ හෝ චචලය) හැළි, ධවලය; ඇල්, ශිතය; ඈ, (මේ) ආදි; ගුණසදද; ගුණශබ්දද; දෙලිඟුසම්වි, ස්ත්‍රීපුරුෂ ලිඞ්ග දෙකට සමයයි; දන්නේ; අවබොධ කරන්නේය–

මේ ශබ්දයන් ස්ත්‍රී පුරුෂලිඞ්ග දෙකට සමාන බැවින් සමලිඟුයි උගන්වනලදී.

b ප–අරුත්කිරියසද, අර්ථක්‍රියාශබ්දයතෙම; තමරුත්වැනි, තමා විසින් වාච්‍යවූ පදාර්ථයට බඳුවූ; ලිඟුබෙජේ, ලිඞ්ගය ඇසුරුකෙරෙයි; යනු, යාමය; එනු, ඊමය; මැගුම්, සෙවීම හෝ බැලීමය; ඈ (මේ) ආදීවූ; භව්කිරියසද, භාවක්‍රියාවාචිවූ ශබ්දයතෙම; පුමරුත්වේ, පුල්ලිඞ්ගිකාර්ථ ඇතිවේ.

මෙහි අභිප්‍රායනම්–අර්ථක්‍රියාවෙන් ක්‍රියාකරණ කෙනෙක් හැඟේ–ඒ ක්‍රියාව කරන්නේ පුරුෂයෙක් නම් අර්ථක්‍රියාශබ්දද පුල්ලිඞ්ගිකයි ක්‍රියාව ස්ත්‍රියක් කරන්නී නම් ශබ්දයත් ස්ත්‍රීලිඞ්ගිකයි.

පුරුෂලිඞ්ගික කල්හි, **තෙමන්නා, තෙමන්නේ, මවන්නා, මවන්නේ,** යනආදීන් පුල්ලිඞ්ගයෙහි අර්ථක්‍රියාශබ්ද පවත්නා තුමුත්–ස්ත්‍රියගේ ඒ ක්‍රියා කියවෙන කලැ **තෙමන්නී, මවන්නී,** යනආදීන් ස්ත්‍රීලිඞ්ගික අර්ථක්‍රියාශබ්ද වනබව යටකියනලද පරිද්දෙන් දතයුතුයි. කාව්‍යශෙඛරයෙහි **"කෙඳිරි පරගානී, ඇතිසිත ඉඟිතොපානී"** යන ආදියෙන් අර්ථක්‍රියා ශබ්ද විශෙෂණ වනකල්හිද ලිඞ්ග විභාගය වෙනස්ලෙස පෙණෙන පරිදි දතයුතුයි.

**යාම, ඊම, බැලිම** යනආදි ක්‍රියාව පමණක් කියන්නාවූ භාවක්‍රියා ශබ්ද පුල්ලිඞ්ගිකාර්ථයි දතයුතු.

මාගධ සංස්කෘත භාෂාවල ඇතැම් භාවක්‍රියාශබ්ද පුල්ලිඞ්ගයෙහිද කිසිවක් නපුංසක ලිඞ්ගයෙහිද ව්‍යවහාරකරත්––සිද්ධාන්තසඞ්ග්‍රහ

* සව්‍යශබ්දයෙන් **වම්පස, විෂ්ණු** ආදීන් කියත්.

කිරිය වෙසෙසුන් සද නිතිනුබඳ රිසි සේ ඈ
විස්සල් ඉරා යොරයොර පුන තුමුටු සිනි සහ සා
සු ඉති යල රස රඹ ඉඟි නිහියැ නිපා සද
අනු උ පිරි ස ප නි දු ඈ උපසගද ලිඟුමුන් a

කර්තෲ විසින් සිංහල භාෂාවෙහි නපුංසක ලිඞ්ගිකශබ්දද පුල්ලිඞ්ගයෙහිම යොදා ඇති හෙයින් එපරිද්දෙන් සියලුම භාවක්‍රියාශබ්ද පුල්ලිඞ්ගිකයි කියනලදි -

## ලිඞ්ගවිශෙෂයක් නැත්තාවූ ශබ්ද කියත්.

a නිති, නිත්‍යය; අනුබඳ, නිරන්තරය-අනුබන්ධය, රිසිසේ, රුචිවූ පරිද්දෙන්, ඈ, (මේ) ආදිවූ; කිරියවෙසෙසුන්සද, ක්‍රියාවිශෙෂණ ශබ්දද; * විස්සල්, වහාය; ඉරා, ස්වල්පය; † යොරයොර, නැවත නැවතය; පුන, නැවතය; තුමුටු, ශීඝ්‍රය; සිනි, සෙමින; සහසා, වහාය; බලාත්කාරයෙන, සු, යහපත-ඉතාය; ඉති, මෙසේය; යල, නැවතය; රස, චිරකාලය ‡ රඹ, ආරම්භය; ඉඟි, සමගය; නිහිය, නිහිතය; ඈ, (අර්ථඇති මේ) ආදිවූ; නිපාසද, නිපාතශබ්දය; අනු උ පිරි ස ප නි දු ඈ, අනු උ පිරි ස ප නි දු යනආදිවූ; උපසගද, උපසර්ගද; ¶ ලිගුමුන්, ලිඞ්ගමුක්තාවේ; හෙවත් ලිඟුනැත්වේ.

මෙසින් නිති, අනුබඳ, රිසිසේ, යනආදි ක්‍රියාවිශෙෂණ ශබ්ද කොටසද විස්සල් යනආදි අව්‍යය නිපාත කොටසද අනු පිරි යනආදි උපසර්ගද ලිඞ්ගවිශෙෂයක් නැත්තාවූ අලිඞ්ගික ශබ්දසි උගත්වත්.

ක්‍රියා විශෙෂණ වන ශබ්ද නපුංසකලිඞ්ගයි එකවචනයයි-මාගධ ව්‍යාකරණාදියෙහි උගන්වා තිබේ-මේ ව්‍යාකරණය කළ කර්තෲ විසින් සිංහල භාෂාවෙහි නපුංසකලිඞ්ගික ව්‍යවහාරයක් නැතැයි කියනලද

* නිති යනආදිය ක්‍රියාවේ අර්ථවෙනසකට පමුණුවන බැවින් ක්‍රියාවිශෙෂණයි-වැඩදේ-කීකල්‍ සාමාන්‍යයෙන් වෘඞිදිම හැගේ-නිතිවැඩදේ-කීකල්‍ ඒ අභිවෘඞිදනය නිරන්තර බවද කියවේ—එහෙයින් නිති යනආදිය ක්‍රියාවිශෙෂණයි දතයුතු.

† ඉරා, යනු අධික යන අර්ථ ඇත්තේයි ඇතම් කෙණෙකු විසින් සලකණලදි-අසිරා යනු අධිකාර්ථයෙහිවේ–“අසිරාවන උවන් නවතන රිසින් එන” “අසිරාදහස්” යන ආදියෙන් දතයුතු.

‡ රස යන නිපාතයක් පූර්වාචාර්‍ය පාඨවලින් අප විසින් දකිනු නොලැබීය, එහෙයින් මේ, සර, නොහොත්, සැර, යන චිරකාලාර්ථවූ නිපාතයයි සිතියයුතුයි-ඒ වර්ණපෙරළියෙන් ‘රස’ කියා යෙදිම හැකිහෙයින් ‘රස’ කියා යොදනලද්දේද ‘සර’ යනු ලිවිමෙන් ‘රස’ කියා වැරදුනේද යන දෙකෙන් එකක් වියයුතුයි.

¶ ප යන අදි උපසර්ග විස්සේ අර්ථ මතු පිළිවෙළින් කියනුලැබේ.

**සුවසේ ඈ ගුණෙන් කිරියවෙසෙසින බැවින් කිරියවෙසෙසුන් සදනම් a**

*** සිගුම්, නිකුත්, ව, වැනිය, වනාහි, කලි, නම්, විනා, වෙන, පු, හු, ල, ලූ, ද, ම, න, කිම්, හොත, යම්සේ, එසේ, මෙසේ, සහ, අද, එදා, ඈ නිපාසදනම්. b**

---

හෙයින් ඒ ක්‍රියාවිශෙෂණ ශබ්දද අලිඞ්ගික කොටසට ඇතුළත්කොට කියනලදී–විභක්තිප්‍රත්‍යයාදියෙන් නැවත වන භෙදයක් ක්‍රියාවිශෙෂණ ශබ්දවල බොහෝසේ නැතිහෙයින් ඒ කිරියවෙසෙසුන් සද පුල්ලිඞ්ගික ශබ්ද කොටසටද ඇතුළත් නොකරණලදී.

a ප–සුවසේ ඈ, සුවසේ යන ආදිය; ගුණෙන්, ගුණය කරණකොටගෙණ; කිරියවෙසෙසන බැවින්, ක්‍රියාව වෙනස්කරණබැවින්; කිරියවෙසෙසුන් සදනම්, ක්‍රියාවිශෙෂණ ශබ්දනම්වේ.

මෙහි අභිප්‍රාය–**සුවසේ, දුකසේ,** යනආදිය ගුණයෙන් ක්‍රියාව වෙනස්කෙරේ–ඒ මෙසේයි–**ගියා** කීකල්හි සාමාන්‍යයෙන් ගමන ක්‍රියාව හැඟේ–**සුවසේ ගියා** කීකල්හි සැපගුණයකින් යුක්තව ගියායි ක්‍රියාවේ වෙනසක් හැඟේ—එසේම දුකසේ ගියායි කීකල්හි දුක්ඛගුණයකින් යුක්තවූ ක්‍රියාව හැඟේ–මෙසේ ක්‍රියාවේ වෙනස දෙන්වන ශබ්ද ක්‍රියාවිශෙෂණයයි දතයුතු–**නිති,** යනආදියත් මෙසේයි.

## නිපාත දක්වත්.

සිගුම්–ඈ; **සිගුම්** යන පදය පටන් **එදා** යන පදය අවසන්කොට ඇති පද ආදි වෙනත් පදයෝ; නිපාසදනම්, නිපාතශබ්ද නම්වෙත්.

**මේ නිපාත ශබ්දයන්ගේ ලිඞ්ග නියමය නැතැයි කියනලදී.**

**ලිඞ්ගවිභාගයට අන්තර්ගතවූ නිපාතයන්ගේ අර්ථ.**

b සිගුම්, ශීඝ්‍රාර්ථවූ 'සිගුම්' යනුද; † නිකුත්, නිෂ්ක්‍රමණාර්ථවූ

---

* මින් ප්‍රථමකොට–**විස්සල්, ඉරා**–යනආදියෙන් නිපාත ශබ්ද දක්වා නැවතත්.නිපාත කුමක් පිණිස කියද්ද—ප්‍රථමකොට ක්‍රියාවිශෙෂණ නිපාත උපසර්ග යන තුන්කොටස ලිඟු නැති ශබ්දයි—හඟවන පිණිස—එයින් ස්වල්පයක් සඳහන්කොට කියනලදී—නැවත ක්‍රියා විශෙෂණ වන ශබ්දයන්ගේ ආකාරද නිපාත ශබ්දරාශියක්ද නියමයෙන්ම විස්සක්වූ උපසර්ග අර්ථභෙද සමගද දක්වනලද්දැයි දතයුතු.

† පාලියෙහි–**සීඝං**–යනුද, සංස්කෘත භාෂාවේ ශීඝ්‍ර–ශීඝ්‍රාර්ථ ඇති ගුණ ශබ්දයි—එය නපුංසකලිඞ්ගික එකවචනවල ක්‍රියාවිශෙෂණ-වශයෙන් බොහෝසේ පවතී—එයින් **සිගුම්**–කියා සිඳීම හැකිවේ—එහෙයින් මෙහි පෙණෙන **'සිගුම්'** යන නිපාත ශබ්දය ශීඝ්‍රාර්ථයි සිතමු-ජෙනපාඨවලින් සෙවිය යුතු.

**ප, පහා, ඇති; පර, පැරද ඇති; අව, අවසේ ඇති; ස, සබඳ ඇති; අනු; අනුදන ඇති; නි, නිරොද නිරසක් ඇති; දු, දුලද ඇති; වි, විලස් ඇති; අ, අදරඇති; අදි, අදියර ඇති; සු, සු බැසි ඇති, උ, උලැගි ඇති; අබි, අබියෙස් ඇති; උප, උපේ උවසර ඇති; අප අපදන් පහවැ ඇති; පස්, පසක් රැකක්—**

'නිකුත්' * යනුද; ව, පද පූරණාදියෙහි වැටෙන්නාවූ 'ව' යනුද; † වැනිය, සමානාර්ථයෙහි 'වැනිය' යනුද; ‡ 'වනාහි' වෙන්කිරීමෙහිද, පදපූරණයෙහිද වැටෙන්නාවූ 'වනාහි' යනුද–කලි, අර්ථවෙන්කිරීමවූ අවධාරණයෙහිද වැටෙන්නාවූ 'කලි' යනුද § නම්, වෙන්කිරීම සිහිකිරීම විස්මය ආදි අර්ථ ඇත්තාවූ 'නම්' යනුද; විනා, වෙන්කිරීමෙහිවූ, 'විනා' යනුද, වෙන, අන්‍යාර්ථ ඇති 'වෙන' යනුද; පු, ක්‍රියාසමාප්ති ආදියෙහිවූ, 'පු' යනුද; ⁋ හු, පදපූරණයෙහිවූ 'හු' යනුද; + ලු,ලූ, ශ්‍රැතිසූචනයෙහි හෙවත් ඇසුවක් අනුමානයෙන් කිමෙහි

* අර්ථක්‍රියා ශබ්දයක්මෙන්ද ව්‍යවහාරයි.

† පුරාණ සිඩාන්ත සංග්‍රහව්‍යාඛ්‍යානයෙහි ව, යනු අස්මත් (මම) ශබ්ද පතන්‍යවූ නිපාතයෙකැයි කියනලදී–පාලි සංස්කෘත භාෂාවල වූ යන නිපාතය සමානාර්ථයෙහි පෙණේ-එ අර්ථ සිංහල භාෂාවෙහිවූ කල්හිද ඇතිවියහුතුයි.

‡ **වැනි** කී පමණින්ද සමානාර්ථයෙහි නිපාතයක්වේ, **හ**, යනුද පදපූරණාදියෙහි වෙන්වූ නිපාතයක්වේ.

§ පුරාණ සන්නයෙහි, **වැනිය, වනාහි, කලි,** යනු අනාර්ථයි–කියන ලදී. එ අනෑ යනු වෙන්කිරීමවූ අවධාරණය සලකා කියනලදැයි සිතියයුතු— **දූන්වූ කලි** යන අදිතන්හි **කලි**, යනු අවධාරණය හඟවා,

⁋ **කරපු, කියාපු** යනඅදි ව්‍යවහාරයෙන් පු යනු ක්‍රියාසමාප්තියෙහි වනබව හැඟේ; නුමුත් **පී, පූ,** අදි වචන විශෙෂයෙන් දෙකක් වන හෙයින් ඒ ක්‍රියාවක්සසිද කියත්.

+ මේ **හු** යන නිපාතය කුමන අර්ථයක් ඇත්තේදැයි අතිශයින් ප්‍රකාශ නොවනහෙයින් සිංහලාචාර්‍ය්‍යයෝ අනුමානකෙරෙත්—ඒ පද පූරණාර්ථ ඇති බව ඇතම් ජෙකපාඨයන් කරණකොටගෙණ සිතියයුතුවේ–ගිරාසන්දේශයෙහි–

"සිල් සෙනග හු යස සෙමෙර හු මෙත් සත හු"
"ගුණ බරණ හු දම් කිරුළ හු නැණ කග හු"
"බුත් නරඹ හු තම තෙදන හු සිරි පුර හු".
"සුර ඇදුර හු හැර කවර හු වණනම හු"

මෙහි **'මෙත්සත්'** ශබ්දයේ කර්මවිභක්ති එකවචනය 'මෙත්සත' කී පමණින් සිඩහෙයින්ද **'සුර ඇඳුරැ'** ශබ්දයේද කර්මෛකවචනය සුරඇදුර' කී පමණින් සිඩහෙයින්ද—මේ දෙතන්හි **'හු'** පදපූරණය පිණිස යොදනිබෙන බව හැඟේ-මේ අදියෙන් 'හු' යන නිපාතය පදපූරණයෙහි වනබව දතයුතු.

**පාසාඇ‍ගි; පිළි, පිළිලැබ ඇ‍ගි; අභි, ඉතිරි ඉබොහෝ ඉකුත් ඇ‍ගි; පි, පිහිකුළුඇ‍ගි; මේ විසි උපසග සඳනම්-a**

## ලිඟු අදියර තුන්වනු.

හි 'ල' යනුද 'ලු' යනුද; ද, සමුච්චයාර්ථයෙහි හෙවත් දෙකක් හෝ බොහොමයක් එකතුකිරීමෙහි 'ද' යනුද; ම, අවධාරණයෙහි, හෙවත් එකාන්තකොට නියමකිරීමෙහි 'ම' යනුද; න, ප්‍රතිෂේධයෙහි, හෙවත් නැතිබව කීමෙහි 'න' යනුද; කිම්; ප්‍රශ්නකිරීමෙහි 'කිම්' යනුද; හොත, අනියමයෙහි 'හොත' යනුද, යම්සේ; යථාභූතාර්ථයෙහි හෙවත් යම්ආකාරයකින් යන අර්ථයෙහි 'යම්සේ'යනුද; එසේ, තුල්‍යාර්ථයෙහි එසේ යනුද; මෙසේ, තුල්‍යාර්ථයෙහි 'හෙවත්' මෙසේ යන ඉත්ථම්භූතාර්ථයෙහි 'මෙසේ' යනුද; සහ, සංයෝගයෙහි 'සහ' යනුද; අද, ඉදම්කාලාර්ථයෙහි 'අද' යනුද; එදා, තත්කාලාර්ථයෙහි, 'එදා' යනුද; ඈ, යනආදිය; නිපාසදනම්, නිපාතශබ්දනම්වේ.

මේ අව්‍යයනිපාත ලිඞ්ගවිශෙෂයක් නැතිහෙයින් අලිඞ්ගිකයි.

a ප, ප යන උපසර්ගයතෙම; පහා ඇ‍ගි; පහායනආදියෙහිවේ;— (පරිත්‍යාගයෙහියි) ප්‍රකාරයෙන් යනආදි අර්ථ ඇත්තේයි-පර, පර යනු; පැරදූඇ‍හි, පැරදූ යනආදියෙහි වේ; (පරාජිතවැ) පරිහානි පරාජය යනආදි අර්ථ ඇත්තේයි.

අව, අව යනු, අවසේ ඇ‍ගි, අවසේ යන ආදියෙහි වේ; (අවවජායායි) වියොගාදි අර්ථ ඇත්තේයි.

**ස**, සයනු; සබඳඇ‍හි; සම්බන්ධාදියෙහිවේ; එකතුවීම් ආදි අර්ථ ඇත්තේයි.

**අනු**, අනු යනු; අනුදැනැ ඇ‍හි, අනුජානනයකොට, යන ආදියෙහි වේ; අනුගමනාදී අර්ථ ඇත්තේයි.

**නි**, නියනු; නිරොද, ඔජස් රහිතය; නිරසක්, ශබ්දකාරහිතය; ඇ‍හි, මේ ආදීතන්හිවේ; නිෂෙධාදී අර්ථ ඇත්තේයි-*

**දු**, දුයනු, දුලද ඇ‍හි, දුලද යනආදි තන්හිවේ; (දුලිබ්බි) අශොභන නින්දාදී අර්ථ ඇත්තේයි.

**වි**, වියනු; විලස් ඇ‍හි, විලාසාදියෙහිවේ; විශෙෂවිවිධාදි අර්ථ ඇත්තේයි.

**අ**, අයනු, අදර ඇ‍හි, ආදර යනආදිතන්හිවේ-අභිමුඛිභාවාදි අර්ථ ඇත්තේයි.

**අදි**, අදියනු, අදියර ඇ‍හි, අධිකාරාදියෙහි වේ, සම්බන්ධප්‍රධානාදී අර්ථයි.

---

* නිෂෙධනම්—නැත කීමයි.

**සු,** සුයනු; සුබැසි ඈ හි, සුභාෂිතාදියෙහිවේ, (යහපත් වචනය) ශොභනාදී අර්ථ ඇත්තේසි.

**උ,** උයනු, උලැඟි ඈ හි, උල්ලඞ්ඝිත යන ආදිතන්හිවේ-(උඩපැන් නාවූ නොහොත් උඩින් පැන්නාවූ) උද්ගමනාදී අර්ථඇත්තේසි-*

**අබි,** අබියනු; අබියෙස් ඈ හි, අභ්‍යාස යන ආදියෙහිවේ-(සම්මුඛයි) අභිමුඛිභාවාදී අර්ථ ඇත්තේසි.

**පිරි,** පිරියනු; පිරිබුත් ඈ හි; පරිභග්න යන ආදියෙහිවේ-(හාත් පසින් බිදුණේයි) හාත්පසින් යනආදි අර්ථ ඇත්තේසි.

**උප,** උපයනු, උපේ, උපෙක්‍ෂාය, (මධ්‍යස්ථතාය) උවසර, උපචා රය, (ලඟ හැසිරීමය) ඈ හි, යන ආදියෙහිවේ; උපගමනාදී අර්ථ ඇත් තේසි-†

**අප,** අපයනු; අපදන්, අපාදානය (වෙන්වීමට සීමාය) ‡ පහවැ, අපගතවැ; (තුරන්වී) ඈ හි යන ආදියෙහිවේ-අපගතාදී අර්ථ ඇත් තේසි.

**පස්,** පස්යනු; පසක්, ප්‍රත්‍යක්‍ෂය, (තමන් ඉන්ද්‍රියහමුවූ) රුකක් පා සා, ꟼ ව්‍යක්‍ෂයෙක්හි විෘක්‍ෂයෙක්හය, ඈ හි, යන ආදියෙහිවේ; ප්‍රත්‍ය ක්‍ෂාදී අර්ථඇත්තේසි.

**පිළි,** පිළියනු; පිළිලැබ ඈ හි, ප්‍රතිලාභාදියෙහිවේ; (එකට එක නොහොත් නැවත ලැබීමයි)ප්‍රතිගමන ප්‍රතිලොමාදී අර්ථඇත්තේය ×

**අති,** අතියනු; ඉතිරි, අතිරික්තය; ඉ බොහෝ, බහුලය; ඉකුත්, අතික්‍රාන්තය, ඈ හි, යනආදියෙහිවේ-අතික්‍රමණාදී අර්ථ ඇත්තේසි-

**පි,** පියන උපසර්ගයතෙම; පිහිකුළු ඈ හි, ප්‍රත්‍යර්ජනා ආදියෙහිවේ- ප්‍රතිලොමාදී අර්ථ ඇත්තේසි.

**මේ විසි, මේ විංශතිය, උපසර්ගසදනම්, උපසර්ග ශබ්දනම් වේ.**

**උපසර්ගය ක්‍රියාදී පදයක පූර්වයෙහි වේ.**

**ලිඞ්ගාධිකාරය තුන්වෙනියි.**

---

මේ ලිඞ්ගාධිකාරයෙහි වනාහි මහත් විශෙෂයෙක් ඇතිවේ-එනම්- මාගධ සංස්කෘතාදී භාෂාවල පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග නපුංසකලිඞ්ගයයි

---

* උද්ගමන නම් උඩට යාමයි.

† උපගමන නම් ලඟට පැමිණීමයි.

‡ වෙන්වීමට සීමාය යන අර්ථයෙන් අපාදානවිභක්තියට ඒ නමයෙදේ.

ꟼ **පාසා** යනු කීපයක් එකට සම්බන්ධකොට කියනු කැමතිවූ විජ්ජාර්ථයෙ හිවේ—ගමක්පාසා-කීමෙන් ගමක්ගාණේ-ගමෙක් ගමෙක්හි යන අර්ථවේ.

× **ප්‍රතිගමන** නම් ඉදිරියට යාමයි-**ප්‍රතිලොම**නම් පස්සට හැරියාමයි.

ලිඞ්ගත්‍රයක් කියනලද්දේය, මේ සිංහල ව්‍යාකරණයෙහි ප්‍රතිරාජපරිවෙණස්වාමීන් විසින් සිංහල භාෂාවෙහි ස්ත්‍රීපුරුෂ ලිඞ්ගදෙක මුත් අන්‍යවූ ලිඞ්ග ව්‍යවහාරයක් නැතැයි කියනලද්දේය–සිංහල භාෂාවේ පවත්නා ශබ්දයන් අතුරෙන් තද්සම තත්භව යන කොටස් දෙක මාගධ සංස්කෘතාදියෙහි ශබ්ද හා සමවූද ඉන් බිඳුනාවූද ශබ්දයි. එසේවූකලැ මාගධාදී භාෂාවල නපුංසකලිඞ්ගික ශබ්දයන්ට සමානවූ සිංහල ශබ්ද නපුංසකලිඞ්ගික නොවේද? මාගධාදියේ නපුංසකලිඞ්ගික ශබ්දවලින් බිඳුනු ශබ්ද සිංහල භාෂාවෙහිත් නපුංසකලිඞ්ගික නොවේදැයි සිතියයුතුයි. **"පණින් හදන්සුග්"** යන ආදි සූත්‍රයෙන් පුරුෂව්‍යඤ්ජනයෙන් යුක්ත සත්වයන් කියන ශබ්ද පුලලිඞ්ගිකබවද යෝනි සහිත සත්වයන් කියන ශබ්ද ස්ත්‍රීලිඞ්ගික බවද කියා නැවත **"දියදල ඇඳුරුමේ"** යන ආදි කොටසක් පුලලිඞ්ගික බවත් **විදු, ලිය,** යන ආදි කොටසක් ස්ත්‍රීලිඞ්ගික බවත් කියනලදී–මේ කියනලද ස්ත්‍රීලිඞ්ගික ශබ්දකොට්ඨාසයට මාගධ සංස්කෘත භාෂාවල ස්ත්‍රීලිඞ්ගයෙහි කියනලද ශබ්දම සඞ්ග්‍රහකරණලදී–තුමුත් සිංහල භාෂාවෙහි **ලිය** ආදි ශබ්ද ස්ත්‍රීලිඞ්ගිකයයි හැඳිනීම දුෂ්කරයි–මාගධාදියේ **ලතා** යන ආදියෙහි ප්‍රත්‍යය විභාගයෙන්ද ලිඞ්ගය හැඳිනීම සුකරවේ—රත්නාදි නපුංසකලිඞ්ගික ශබ්ද කොටසද පුලලිඞ්ගික කොට දක්වනලදී–පුරුෂ ස්ත්‍රී ස්වභාවයෙන් මුක්ත වෘක්ෂපර්වතාදින් අතුරෙන් මාගධ සංස්කෘතාදී භාෂාවල පුලලිඞ්ගික ව්‍යවහාර ඇති ශබ්ද කොටසද නපුංසකලිඞ්ගික ව්‍යවහාර ඇති කොටසද පුරුෂලිඞ්ගයෙහිම සඞ්ග්‍රහකරණලදී–ඒ නපුංසකලිඞ්ගික පුරුෂලිඞ්ගික ප්‍රභෙදය ශබ්දයන්ගේ රූපභෙදයෙන් සිංහල භාෂාවෙහි හැඳිනීම දුෂ්කරවේ–මාගධ සංස්කෘත භාෂාවල සුකරවේ–එහෙයින් මාගධ සංස්කෘතාදියට සම ශබ්දයක් ඒ භාෂාවල ලිඞ්ගවශයෙන් දැන සිංහල භාෂාවෙහිත් යෙදියයුතුවේ–ඒ භාෂාවලින් බිඳී ආවාවූ ශබ්දවලද මුලින් තිබුනු ලිඞ්ගය දැන සිංහල භාෂාවේ ව්‍යවහාර කටයුතුවේ–එසේ දැන පුරුෂලිඞ්ගික නපුංසකලිඞ්ගික දෙකොටසම සිංහල භාෂාවේ පුලලිඞ්ගිකයයි ව්‍යවහාර කටයුතුවේ–එසේවූ කල්හි; **රුවන්-සක්-මන**-ආදි ශබ්ද නපුංසකලිඞ්ගික වශයෙන් හැඳිනගෙණ පුරුෂලිඞ්ගිකයයි කියයුතුහෙයින් අවබොධයෙහි නපුංසක ලිඞ්ගයක් ඇතිවත් ව්‍යවහාරයෙහි එය නැතිකොට ඊටත් පුලලිඞ්ගනාමයම කියනසේ උගන්වනලදී–ඒනිසා සිදත් සඟරාවේ පෙණෙන ක්‍රමයෙන් සිංහල භාෂාවේ ලිඞ්ගවිභාගයෙහි ත්‍රිලිඞ්ගබුද්ධියද ද්විලිඞ්ගශබ්ද ව්‍යවහාරයද වියයුතුයි–එසේවූකලැ පුලලිඞ්ග ස්ත්‍රීලිඞ්ගවශයෙහි ශබ්දව්‍යවහාරය කරතත් නපුංසක ලිඞ්ගයත් සමග ලිඞ්ගත්‍රය අවබොධවන බව දතයුතුයි.

තවද **ඒ, මේ,** ආදි සර්වනාම ශබ්දයන් **තා**, ම, ශබ්ද හැර ලිඞ්ග විශෙෂය බලා ව්‍යවහාරකරණ හෙයින් ඒ සර්වනාම ශබ්දයන්ගේ ව්‍යවහාර විශෙෂද සෙවියයුතුයි.

**උඹ-ඇ**-කියා පුරුෂ ස්ත්‍රීදෙදෙන ගැණ කියත්-නමුත් ඒ දෙදෙනාගෙන් මුඛ්‍යවූ දෙයක් ගැණ එසේ නොකියති-ඒ ගැණ-**එය-ඒකා**-යන ආදීන් ව්‍යවහාර කරති-ඒ අවිස්පෂ්ටතාභාවය නිසා අප්‍රාණිවූ පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග ශබ්ද දෙක ගැණම යෙදීමසිද සිතත්.

එසේදවුවත් ඒ විශෙෂබුද්ධිය හටගන්නේ ලිඞ්ගවිශෙෂය කාරණකොටගෙණයි, ස්ත්‍රීපුරුෂ ලිඞ්ගවයේ විශෙෂ ව්‍යවහාරය වන්නේ පුරුෂ ස්වභාව ස්ත්‍රීස්වභාව වශයෙන්යයි මාගධ ව්‍යාකරණාදියෙහිද කියනලද්දේය-ඒ ලිඞ්ගවිශෙෂ දෙකින් මිදුනේ නපුංසකලිඞ්ගිකයයි කියනලද්දේය, මෙහිද **"පණින් හදන්යුත් පවසනුයේ පුමලිඟු වේ"** යන ආදියෙන් එලෙසම පුරුෂ ස්ත්‍රීලිඞ්ගදෙක දක්වනලද්දේය-එහෙයින් ඒ ලක්ෂණදෙකින් මිදුනේ නපුංසකයයි හැහෙයි—මාගධ සංස්කෘතාදියෙහි මංගලතාදි ශබ්දයන් පුරුෂ ස්ත්‍රීස්වභාවයෙන් යීමෙන් පුරුෂ ව්‍යඤ්ජනාදිය නැත්තාවූ ශබ්ද ඒ ව්‍යවහාරයට නැගුබව පෙණේ-යලිත් පාලිභාෂාවෙහි ශබ්දස්වභාවයෙන් ස්ත්‍රීවාචකවූ දාර ශබ්ද මාතුගාම ශබ්දාදිය පුරුෂලිඞ්ගිකකොට ව්‍යවහාරකරණුලැබේ-භාර්‍ය්‍යාවට නම්වූ **කලත්‍ර** ශබ්දය නපුංසකලිඞ්ගික වශයෙන් ව්‍යවහාරකරණුලැබේ-සංස්කෘත භාෂාවෙහිද දාරශබ්දය පුල්ලිඞ්ගිකවශයෙන්ද කලත්‍ර ශබ්දය නපුංසක ලිඞ්ගිකවශයෙන්ද කියනුලැබේ--එම අර්ථවූ **ජායා භරියා, භාර්‍ය්‍යා** යන ශබ්ද ස්ත්‍රීලිඞ්ගික වශයෙන් ව්‍යවහාරවේ-එසේත් ඒ ගැණ යොදන යුෂ්මත් අස්මත් ශබ්ද දෙක හැර අන්‍යවූ සර්වනාම ස්ත්‍රීලිඞ්ගවශයෙන් ව්‍යවහාරකෙරෙත්-එහෙයින් ශබ්ද ව්‍යවහාරයම ලිඞ්ගවිශෙෂයෙහි ප්‍රධානයි-එසේ සිංහල භාෂා ව්‍යවහාරය සොයනවිට ඉදිරියෙහිවූ පුරුෂයෙකුට **'මූ'** කියාද, ස්ත්‍රීයෙකුට **'මෑ'** කියාද, ස්ත්‍රීපුරුෂනොවූ යමකට **'මේකා'** කියා හෝ **'මෙය'** කියා හෝද කියනකලැ ඒ ඒ ලිඞ්ගවිශෙෂ බුද්ධියෙන් කියනුලබන්නේ නොවේද? එසේනම් ස්ත්‍රීපුරුෂ නොවූ යමකට කියන වෙනස ස්ත්‍රීපුරුෂ ලිඞ්ගවයෙන් අන්‍යයක් නොවේදැයි සිතියයුතු.

තවද ප්‍රථම ඒකවචනයෙහි **තෙම තොමෝ** යන දෙක පුරුෂ ලිඞ්ගයෙහිද ස්ත්‍රීලිඞ්ගයෙහිද විශෙෂවශයෙන් පවත්නේය-ඒදෙකින්ම ව්‍යවහාරවන හෙයින් ඉන් පිටත්වූ ලිඞ්ගවිශෙෂයක් නැත්තේයිද කියති-පූර්වාචාර්‍ය්‍යයෝ එසේ දෙකටම බෙදා ව්‍යවහාරකළෝදැයි පරික්‍ෂා කටයුතුයි.

බාලාවතාරයෙහි පුරාණ සන්නයක්වූ ගඩලාදෙණි සන්නයෙහි **"එසා" මෝතොමෝය; එසො, මේතෙම; එතං ඉති, මෙය යන; පසිද්ධි, ප්‍රසිද්ධිතොමෝ; ලොකස්ස, ලොකයාහට; හොති, 'වේද"** යන ආදිය කියනලදී-සිංහල භාෂාවෙහි **තොමෝ, තෙම,** යන දෙක ස්ත්‍රීපුරුෂලිඞ්ග දෙක්හි ප්‍රථමෛකවචනයෙහි යොදා ඉන් පිට ව්‍යවහාරයක් නොකොට මාගධාදියේ නපුංසකලිඞ්ගික ශබ්ද යන්ද පුල්ලිඞ්ගයෙහි යොදාම කියයුතුනම් මෙතන්හි **'එතං'** යන්න සිංහල කිරීමෙහිද මෙතෙම කියයුතුවේ, එසේ නොකොට ආචාර්‍ය්‍යයන් විසින් මෙතැනදී සිංහලභාෂාවෙහිද නපුංසකලිඞ්ගිකස්වභාවය පිළිවූවනලද්දේය--එම ආචාර්‍ය්‍යයන් විසින් **"ලිඞ්ගං ශිෂ්ටලොකාශ්‍ර**

**ශබ්දාන්"** යන සංස්කෘත පාඨයද දක්වා එහි පෙණෙන **"ලිඞ්ගශෙෂජකපජනයාගේ ආශ්‍රයභාවයෙන"** යන අර්ථවූසේ ව්‍යවහාරවූ පරිද්දෙන් ලිඞ්ගව්‍යවස්ථා දතයුතුබව කියනලදී--තවද සිදත්සඟරාවේ පෙරවිබත් එකබසට **ඒ, ආ,** යන ප්‍රත්‍යයන් යෙදෙනබව් කියනලදී-එසේම **'ඹටු'**-**'වටු'**-යන ආදි ශබ්දවලින් පරකොට **'ආ'** යෙදීමෙන් වකාරාගමදකොට **'ඹටුවා'** **'වටුවා'** යන ආදිය කියත්. නමුත් එසේම අනතඇති-**'පුටු'** යන ආදි ශබ්දයන් කෙරෙත් පරකොට එසේ යොදා **'පුටුවා'** යන ආදිය නොකිය්ති-එසේම බහුවචනයෙහි **ඹටුවෝ** යන ආදිය කියත්. නමුත් **'පුටුවෝ'** යන ආදිය නොකියති-එසේ කියත් නම් ඒ පරිහාසයට කරුණක්වේ-ඒ අවිඥාණක පුල්ලිඞ්ගයෙහි සව්භාවයයි ඇතම් කෙණෙක් කල්පනා කෙරෙත්-එසේ සිඩාන්තසඞ්ග්‍රහකාතෘ විසින් අනුශාසනා කරණලද්දේනම් එසේ අවිඥාණක වස්තුවාචක ශබ්දවල ප්‍රථමෛක වචනයෙහි අයන්නය් යෙදීම හෝ බහුවචනයෙහි විබත් ලොප්වීම් ආදියය් හෝ කියයුතුවේ-ඒ නොකියනලද්දේ ඒ කාලයෙහි බොහෝසේ පොත් ලිවීමෙහි නපුංසකලිඞ්ග ව්‍යවහාරයය් නැතිවූසේම පෙරවිබත් එක බසට **අ** යන්න යෙදීම් ආදියත් බහුලතුවූහෙයිනැයි හැඟේ-අවිඥාණක ශබ්දවලට ප්‍රථමාවිභක්තියේ **'ආ'** **'ඒ'** යන ආදිය නොයෙදෙනසේ කර්මවිභක්ති බහුවචනයෙහි **'උන්'** යන ආදියත් ව්‍යවහාරයෙහි නොයෙදේ. **පුටුවන් ගෙණෙව් කටුවන් අරින්'** යනආදි වශයෙන් ව්‍යවහාරයක් නොමැතිසී-එසේත් කාව්‍යබන්ධනයෙහි ඒ අවිඥාණක ශබ්දවලටද ඒ විබත් අකුරු යොදනබව පෙණේ.

**''පිපිමල් සැතිපගුරණ''**-**'රතහෝ පලුපඳුරණ'** යන ආදියෙන් එය දතයුතුවේ-එසේහෙයින් **අටුවා, පුටුවා, මලුවා, දළුවා, දතා,** ආදි වශයෙන් නොකියා **අටුව, පුටුව, මලුව, දලුව, දත,** යන ආදින් කියනුලබන්නේ ලිඞ්ගවිශෙෂ බුඩියෙනැයි හැඟේ-තවද ගුණනාම සම්බන්ධවූ ස්ත්‍රීපුරුෂ ලිඞ්ග දෙක්හි **මැහැල්ල** හෝ **මැහැල්ලි මහල්ලාද** කියත් නුමුත් පරණ වස්ත්‍රයක් සඳහා **කඩමාල්ල** කියනු මිස **"කඩමාල්ලා"**යි නොකියත්-එත් ලිඞ්ග විශෙෂ බුඩියෙනැයි වැටහෙයි-එසේත් පුරාණ ජාතකපොත් ආදියෙහි **ධර්මයෝ නුමු ධර්මයෝ අමඳන** යන ආදින් පුරුෂාකාරවූ ව්‍යවහාරය බහුලහෙයින් ප්‍රතිරාජ පරිවෙණස්වාමීන් විසින් සිංහල භාෂාවෙහි පුම්ඉතිරි ලිඟුදෙක විනා අන්‍යවූ ලිඞ්ගව්‍යවාහර විශෙෂයක් නැතැයි කියනලද්දේය-හෙද-

**''සකුසත් අනුසරෙන් ඇතද සදනට ලිඟුබේ**
**නොපැණේ වහර වෙසෙසෙක් පුම්ඉතිරිලිඟු දෙකවිනා''යි**

කියනලදී, මෙහි අර්ථ යටදක්වනලදී-සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන් ශබ්දයන්ට ලිඞ්ගවිශෙෂ ඇත්තේ නමුත් පුරුෂ ස්ත්‍රීලිඞ්ග වය හැර ව්‍යවහාර විශෙෂයක් නැත්තේයි කියනලදී.

**සදහු දෙවැදෑරුම් සරඅත් හලත් වෙසෙසින්**
**බුහුසු සියලු විබතේ එදෙක සියරූ නොපියා ඝ**
**දම්රජ, දන්වා, මුනි, සෑයි, මරරුපු, බ්‍ර, ගේ, ගෝ, සිදුහත්,**
**ඈ පුමලිඟු—**

මෙහි සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන් ශබ්දයන්ට ලිඞ්ගභෙද ඇත්තේ නමුත් කිමෙව්–සිංහල ශබ්දයන්ටයි-ඒසේ ලිඞ්ගභෙද ඇතත් ව්‍යවහාර විශෙෂයක් නොපැණෙයි කියනලද්දේ ඒ කාලයෙහි පොත් ලිවීමේ ව්‍යවහාරයට නැත යනුයි. මේ සිංහල භාෂාවත් කලින්කල වෙනස්වෙමින් පවත්නා භාෂාවක්බවට පණ්ඩිතයන්ගේ සැකක් නැතිවනු පමණක්නොව ස්වභාෂාලඞ්කාරයෙන්ද එය ප්‍රකාශවේ-මාගධ සංස්කෘතභාෂාවල නපුංසකලිඞ්ගික ශබ්දවලින් බිඳී තද්භව වශයෙන් සිංහල භාෂාවට එන ශබ්ද පළමුකොට නපුංසක ලිඞ්ගික බව දන නැවත පුල්ලිඞ්ගිකාකාරයෙන් ව්‍යවහාරකරණ පිණිසද නපුංසකලිඞ්ගික ශබ්දාවබොධයක් වියයුතුවේ—එහෙයින්ද එසේ ලැබෙන ශබ්දයන්ගේ නපුංසකලිඞ්ගික ස්වභාව පණ්ඩිත ව්‍යවහාරයෙහි පෙණෙන පරිද්දෙන් දතයුතුවේ— **ලෝවැඩ රුසින්දෙව් වදනද ලිඟු නියම්වේ-මෙහිදු එම නියම්නෙනි විකපන්න ඒ පඩුවෙනි**—රුවන්මල්-මෙසිතුත් සිඩසටයුතු. ධර්‍මයතෙම පුෂ්කරණීතොමෝ යනාදිය මාතෘභාෂා ශබ්දගෙණ ව්‍යවහාරකිරීමයි.

---

විභක්ත්‍යධිකාරය.

මෙහි විභක්තින්ගේ විභාග දක්වනලදී.

විභක්තිනම් බෙදීමයි–ඒ බෙදීම නාමයන් යෙදීමෙහි නාමයේ අග අර්ථ ප්‍රකටවනලෙස අකුරු වෙනස්කිරීමෙන් වනබව **"නමින්පරවැ බෙදනුලබනුයේ විබත්නම්"**යන්න විස්තරකිරීමෙහි කියනලදී.

ඝ ප-සදහු, ශබ්දයෝ; සරඅත්, ස්වරාන්තය-හලත්, හලන්තය; (යන) වෙසෙසින්, විශෙෂයෙන්; දෙවැදූරුම්, ද්විප්‍රකාරවන්නාහ; එදෙක, ඒ (ස්වරාන්ත හලන්ත යන) දෙක; සියලු විබතේ, සකල විභක්තියෙහි; බුහුසු, බොහෝසෙයින්; සියරූ, ස්වකීය රූපය; නොපියා, නොහැර.

මෙහි භාවය-(නාම) ශබ්ද ප්‍රාණාක්ෂර කෙළවර කොට ඇත්තේය; ගාත්‍රාක්ෂර කෙළවරකොට ඇත්තේයයි ද්විප්‍රකාරවේ-—ඒ ද්විප්‍රකාර ශබ්දම සියලු විභක්තිවල ප්‍රකෘතියෙන් තිබුනු ආකාරය වෙනස්නොවී බොහෝසේ පවතියි, * ස්වරාන්තනම් ප්‍රාණාක්ෂරයක් අගට ඇති ශබ්දයකි–**'මුනි'** ශබ්දයේ අග නියන්තේ තිබෙන ඉස්පිල්ල ඉයන්නයි–එය නිසා ඒ ස්වරාන්තයයි දතයුතු-**දම්රජ**–යන ආදියේ අයනු ආදී පණකුරු පෙණේ-හලන්ත නම් අල්අකුරක් අන්තකොට ඇති සිදුහත් ආදී ශබ්දයි.

---

* **දම්රජ** යන ශබ්දය එසේම තිබියදී පෙරවිබත් ආදී නව විභක්තියේ වීම ඒ ඒ ආධි යෙදුන යෙදුනලෙස පවතී—එසේ පැවැත්ම අවිරූපමාන විධියයි—ඒ පවත්නාපිළිවෙළ විභක්ත්‍යධිකාරාවසානයෙහි ප්‍රකාශකරන්නෙමු.

**නිස, වසා, සිරි, ගී, විදු, දූ, ලේ, දෙ, කත්, ඈ ඉතිරිලිඟු-a**
**බජනුයේ පෙරවිබත් නොවෙසෙසිපදත වුතුවත**
**එකබසැ ඒ ආ වනුයේ සල ඕ හු වේ බුහුබසැ.**

a දම්රජ, ධර්මරාජය; (අකාරාන්තයි) දන්වා, දානවනම් අසුරයා හෝ සාමාන්‍යයෙන් අසුරයාය (ආකාරාන්තයි); මුනි, තපස්වී හෝ සර්වඥය; (ඉකාරාන්තයි) සෑසී, ශාක්‍යසිංහය; (ඊකාරාන්තයි) මරරුපු, මාරශත්‍රු එනම් සර්වඥය; (උකාරාන්තයි) බූ, භූතය (ඌකාරාන්තයි) ගේ, හේතුය (ඒකාරාන්තයි); යෝ, යොධ හෝ යොගය; (ඕකාරාන්තයි) සිදුහත්, සිද්ධාර්ථය (හලන්තයි) ඈ පුවලිඟු, (මේ) ආදිය පුල්ලිඞ්ගයි.

නිස, රාත්‍රිය; වසා, ගඩනාව හෝ වසානම් රෙමරාජිය; සිරි, ශ්‍රීකාන්තාය; ගී, ගිතිකාය; විදු, විද්‍යු හෝ විදුලිය; දූ, දුහිතෘය; ලේ, රේඛාය; දෙ, ජ්‍යෝතිය; කත්, කාන්තාය-ඈ, (මේ) ආදිය; ඉතිරිලිඟු, ස්ත්‍රීලිඞ්ගයයි.

**නිස**-යන ආදියෙන් පිළිවෙළින්ම අකාරාදිස්වර අන්තකොටද **කත්** යනු හල් අන්තකොටද දක්වනලදී-හ්‍රස්වවූ එකාරාන්ත ඔකාරාන්ත ශබ්ද ප්‍රකෘතියෙන් ලිඞ්ගදෙක්හිම නැතිහෙයින් ඒ නොකියනලදී—යම් යම් ශබ්ද එකාරාන්තව හෝ ඔකාරාන්තවැ හෝ යම් යම් පාඨවල පෙණේද ඒ ප්‍රකෘතියෙන් නොව හ්‍රස්වකිරීමෙනැයි දතයුතු.

ප්‍රථමාවිභක්තිය.

ප-නොවෙසෙසිපදත, (කර්මාදියෙන්) අවිශිෂ්ට පදාර්ථයද, වුතුවත, උක්තාර්ථයද, පෙරවිබත්, ප්‍රථමාවිභක්තිය; බජනුයේ, සෙවනය කෙරේ. * එකබසැ, එකවචනයෙහි; ඒ ආ වනුයේ, ඒ විභක්තිද ආ

*. නොවෙසෙසිපදත, (කර්මාදියෙන්) අවිශිෂ්ට පදාර්ථය, වුතුවත, උක්තවූයේනම්, පෙරවිබත් බජනුයේ, ප්‍රථමාවිභක්තිය සෙවනය කෙරෙයි කියාත් අර්ථ කියත්—එසේ කීකල්හි කර්මකර්තෘ ආදි විශෙෂයක් නැත්තාවූ පදාර්ථය ක්‍රියාද්‍යයේ ප්‍රත්‍යයන් විසින් උක්තවූ කල්හි පමණක් ප්‍රථමාවිභක්තිය වෙයි කියනලද බැව් ගැනේ—සංස්කෘත ව්‍යාකරණයෙහිවූකලැ මුග්ධබොධ ව්‍යාකරණයෙහි, **"ලාර්ථසම්බුද්ධ්‍යුක්තාර්ථෙ ඞ්‍රි"**—යන සූත්‍රයෙන් ලිඞ්ගාර්ථයෙහිද සම්බොධනාර්ථයෙහිද ප්‍රත්‍යයන් විසින් උක්තාර්ථයෙහිද ප්‍රථමාවිභක්තිවෙයි කියනලදී-පාණිනීය ව්‍යාකරණයෙහි **"ප්‍රාතිපදිකාර්ථලිඞ්ගපරිමාණවචනමාත්‍රෙ ප්‍රථමා"**-යන සූත්‍රයෙන් ප්‍රාතිපදිකාර්ථමාත්‍ර ලිඞ්ගමාත්‍රාදියෙහි කියනලදී, පාලි ව්‍යාකරණයෙහිද **'ලිඞ්ගත්ථෙ පඨමා'** යන ආදීන් ලිඞ්ගාර්ථයෙහිද ප්‍රථමාවිභක්තිය කියනලදී-එහෙයින් ක්‍රියාදියෙන් උක්තනූවූවත් කර්මාදියෙන් අවිශිෂ්ට පදාර්ථයෙහිද ප්‍රථමාව වනබව කියයුතු—එබැවින් නාමාර්ථයක් කියයුතු තන්හි ප්‍රථමා විභක්ති යෙදීම සුදුසුයි—උක්තාර්ථයෙහි යෙදීම උක්තානුක්තාධිකාරයෙන් දතයුතුයි.

**ඒ-බෙලෙල් බලාම් කෙරේ**
**ආ-හරා අරා කෙලෙස්කුළු**
**ඕ-බමණෝ කුලදම් රකිත්-**
**හු-තවසරහු දම් දෙසත්** a
**"නිදලියෝ පෙහෙසුන් තෙපලත්, පඬුවෝ දනුම් වඩත්"**
**මේ ඇගි විබතට පෙරවැ යවගම් රුසි**-b

විභක්තිද වන්නේය; යල, නැවත, බුහුබසැ, බහුවචනයෙහි; ඕහුවේ, ඕ විභක්ති හු විභක්ති වෙයි.

ක්‍රියාවක් කරන්නාහුගේ ක්‍රියාවට යටත්වෙන කර්මයක් හෝ ක්‍රියාවට උපකාරිවන කරණ ආදියක් හෝ නොව ශබ්දයක අර්ථයක් පමණක් කිම පිණිස ප්‍රථමාවිභක්තිය යොදත්—යලිත් ක්‍රියාවකින් කර්තෘ කර්මයන් කියවෙනකල්හි ඒ උක්ත කර්තෘ උක්ත කර්මවලටද ප්‍රථමාවිභක්තිය යොදත් * ඒ ප්‍රථමාවිභක්තියට සලකුණු වශයෙන් ශබ්දයේ අගට ඒකවචනයෙහි-ඒ-ආ-යන දෙකද—බහුවචනයෙහි-ඕ-හු-යන දෙකද වේ. †

උදාහරණ.

a ඒ-ඒයන්නවේ; බෙළේ, භටතෙම; නොහොත් යොධතෙම; බළාම්, භටකර්මය; නොහොත් යුධය; කෙරේ, කරන්නේය.

ආ-ආයන්නවේ; හරා, ඊශ්වරතෙම; කෙලෙස්කුළු, කෛලාශපර්වත කූටයට; අරා, ආරූඪවේ.

බළ-ශබ්දයකෙරෙන් පරකොට, බජනුයේ පෙරවිබත් යන ආදි සූත්‍රයෙන් ප්‍රථමෙක වචන ඒ විභක්තිය කොට-පෙර පර-යන ආදි සූත්‍රයෙන් ළකාරයේ අකාරය ලොප්කොට පමුණුවා සඳරුත් යන ආදි සූත්‍රයෙන් බකාරයේ පිළිපෙරළි කළ කල්හි බෙළේ යනුවේ-හර ශබ්දයා කෙරෙන්-එසේම, ආ විභක්තියකොට පූර්වස්වර ලොප් කොට පැමිණවූකලැ හරා යනුවේ.

ඕ-ඕ විභක්තියවේ-බමණෝ, බ්‍රාහ්මණයෝ; කුලදම්, කුලධර්මය; රකිත්, රක්ෂා කෙරෙත්.

හු-හුවිභක්තිවේ; තවසරහු, තපසේ හැසිරෙන්නෝ; දම්දෙසත්, ධර්මය දේශනා කෙරෙත්.

බමණ-ශබ්දය කෙරෙන් ඕයන්නද, තවසර ශබ්දය කෙරෙන් හු යන්නද යෙදූකලැ-බමණෝ-තවසරහු-යන පද සිඬිවීමද සුවසේ හැණේ.

නිදලියෝ, කරුණා නැත්තෝ; පෙහෙසුන්, කේලාම්; තෙපලත්,

* ක්‍රියාව විසින් උක්තවීම ප්‍රධාන හෙයින් මෙසේ කියනලදි.

† ප්‍රථමාවිභක්තෞක වචනයෙහි-අ-යන්නක් බොහෝසේ යෙදෙනබව මතු ව්‍යවහාරානුසාරයෙන් විභක්ති දක්වීමෙහි කියන්නෙමු.

**පුම ඉතිරිලිඟුදෙක පටන් අරුත් විසකත්හි-'තෙම' තො මෝ, තුමූ, සනු රුසි—a**

ඉති පළමුවන විබත්.

**සුතුකතුකිරිය හා පදරුත් බෙජේ කම්නම්**
**එකතැ අ උ ආ හු ට උන් නානන් නටන් බුහුබසැ-b**
**අ-රජදම් නිසෙන් මිය පුස්නේ-**

---

කියත්; පඬුවෝ, පණ්ඩිතයෝ; දනුම්, දනගැණීම; වඩත්, වර්ණනය කරත්; මේ ඇහි, මේආදී තන්හි; විබතට පෙරවැ, විභක්තියට පූර්වැ, යවගම්, යකාර වකාර ආගමකිරීම; රුසි, අභිමතයි-

මෙහි **'නිඳලි'** යන ඉකාරාන්ත ශබ්දයෙන්ද, පඬු යන උකාරාන්ත ශබ්දයෙන්ද පරකොට-ප්‍රථමා බහුවචන ඕ ප්‍රත්‍යය යොදා; ඉකාරයෙන් පරකොට ය යන්නක්ද, උකාරයෙන් පරකොට වයන්නක්ද ආගම වශයෙන් අමුතුවෙන් ගෙලුකළැ—**නිඳලියෝ** යනුද-**පඬුවෝ** යනුද වේ—මෙසේ ඉකාරයෙන් පරවැ, **ය** යන්නද, උකාරයෙන් පරව **ව** යන්නද ආගමවූ තැන්, **'පියිවියෝ' 'රැවියෝ' 'ඇසුරුවෝ' සුරු වෝ'** යන ආදියෙන් දතයුතුයි—

ප-පුම ඉතිරිලිඟු දෙක, පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක්හි; පටන් අරුත් විය කත්හි, ප්‍රථමාභිව්‍යාඛ්‍යානයෙහි; තෙම, තෙම යනුද; තොමෝ, තොමෝ යනුද; තුමූ යනු, තුමූ යනුද; රුසි, අභිමතයි—

**එකවචනයෙහි, පුරුෂතෙම-ස්ත්‍රීතොමෝ;බහුවචනයෙහි,පුරුෂයෝතුමූ, ස්ත්‍රීහුතුමූ,** සි කියයුතුයි.

**මෙසේ ප්‍රථමා විභක්තියවෙ.**

**කර්මවිභක්තිය.**

b ප-කතුකිරිය හා, කර්තෘක්‍රියාව සමග; යුතු, යුක්තවූ; පදරුත්, පදාර්ථයතෙම; කම්නම්, කර්ම යන නාමය; බෙජේ, සෙවනය කෙරේ; එකතැ, එකවචනයෙහි, අ උ ආ හු ට, අ-උ-ආ-හු-ට-(යනමේ විභක්ති ප්‍රත්‍යය පස වෙන් වෙන් වශයෙන්) වේ; බුහුබසැ; බහුවචනයෙහි; උන් න ආනන්නට අන්, උන්-න-ආන-න්-නට-අන්-(යන මේ සය වෙන් වෙන් වශයෙන්) වේ.

මෙහි භාවය-කර්තෘහු කරන්නාවූ ක්‍රියාවක් සමග යුක්තවූ පදාර්ථය කර්මය යන නාමයට පැමිණේ-එසේ කර්තෘහුගේ ක්‍රියාවට යටත්වන පදාර්ථයෙහි කර්මවිභක්තිය වේ-ඒ කර්මවිභක්තියෙහි වන ප්‍රත්‍යය නම්-එක වචනයෙහි-අ-යන ආදි පසයි-බහු වචනයෙහි-**උන්** ආදි සයයි-ක්‍රියාවකට යටත්වැ ඒ ක්‍රියාව උපුලන එකක්ම කර්මයනම් වේ-මාගධ භාෂාවෙහි කර්මවිභක්තියට **'උපයොග'** යන නමක්වේ.

**උ-සිදුහත් කුමරු සුදවැසියෝ පළමු පිළිගත්හු**
**ආ-රවුලා මැරී රමරජ**
**හු-සුරහු රෙණෙහි විමසනු**
**ට-රජගෙට පිවිසි මැති ගෙණෙණ්** a
**උන්-මහණුන් නමදනේ**

---

එහි අර්ථයනම් සම්පයෙහි යෙදෙන්නේය යනුයි-කුමක් සම්පයෙහි යෙදේද ක්‍රියාව සම්පයෙහි යෙදේ—ඇසෑම්තැන කර්තෘ සම්පයෙහි යෙදේ-කර්තෘ කරණාදියට වඩා කර්මීය ක්‍රියාවට ආසන්නවන ස්වභාවක් පෙණේ.

## උදාහරණ.

a අ-අයන්නවේ-රජ, රජතෙම; දම්නියෙන්, ධර්මනීතියෙන්; මිය, පෑවිචිය; පුස්නේ, පොෂණය කෙරේ-

මෙහි-ක්‍රියාව ලබන මිය යන කර්මය යුක්තයි-මී ශබ්දය කෙරෙන් කර්ම විභක්ති එකවචනවූ-අයන්න යොදා ඊකාරයෙන් පරකොට යකාරය ආගමකිරීමෙන් මීයන්නේ ඊකාරයට ඉකාරය කළකල්හි මිය යනු සිඩ වේ.

උ-උයන්නවේ; සිදුහත්කුමරු, සිඩාර්ථකුමාරයා; සුදවැසියෝ, ශුද්ධාවාසිකයෝ; පළමු, ප්‍රථමකොට; පිළිගත්හු, පිළිගත්තෝය.

මෙහි කුමර ශබ්දය කෙරෙන් උයන්න යෙදීමෙන් කුමරු කියාවේ

ආ-ආයන්නවේ; රමරජ, රාමරජතෙම; රවුලා මැරී, රාවණයා මැරුයේය.

'රවුල්' ශබ්දය කෙරෙන්-'ආ' යන්න යෙදීමෙන් රවුලා යනුවේ-මේ ශබ්දය 'රවුලු' ශබ්දයද වේ-එකලැ උකාරාන්තයි-සිංහලභාෂාවේ බොහෝ තැන හලන්තශබ්ද උකාරාන්තවද විකල්පයෙන් සිටීම පෙණේ-කත්-කතු-පුත්-පුතු-යන ආදියෙන් ඒ දතයුතුයි.

හු-හුයන්නවේ; සුරහු, ශූරයා; රෙණෙහි, යුඩයෙහි; විමසනු, පරීක්ෂාකරණු-

සුර ශබ්දය කෙරෙන්-හුයන්න යෙදීමෙන් සිඩිය ප්‍රකටයි.

ට-ටයන්නවේ; මැතිගෙණෙණ්, මන්ත්‍රිගණතෙම; රජගෙට, රාජමන්දිරයට; පිවිසි, ප්‍රවිෂ්ටවී-

මෙහි රජගේ ශබ්දයෙන් පරකොට ටයන්න යෙදීමෙන් රජගෙට යනු සිඩවේ.

a මේ කර්මවිභක්ති එකවචනයෙහි 'ට' යනු යෙදීම-ගමනාර්ථාදියට කර්මවන තැනකමුත් සැමතන්හි නොවේ-**ගමට යේ, ගෙට ඇතුල්වේ** යන ආදි තන්හි දතයුතු-ඒ සම්ප්‍රදානයසිද සිතියයුතු.

උන්, (බහුවචනයෙහි) උන් යන්නවේ; මහණුන්, ශ්‍රමණයන්; නමදනේ, වඳින්නේය.

මහණ ශබ්දය කෙරෙන්—'උන්' යනු යෙදීමෙනි.

**න-පිළිමල්න දනන්නෑ-**
**ආන නරඹන්නෑ මොනරාණ නස්නා**
**ණ්-දනන් මහලුපා දෙලේ යොදු වෑකෙරෙව සරූපා**
**නව-රූක්නව තෑගෙත් සාමුවෝ-**
**අණ්-දරුවන් බලන්නහු ල සෑනහේ** a

**"සේනන්බුහුමනන්නේ" ඈ හුණාබැවින් නන් විබතින් සිදුපා,**
**"තිලෝගුරු 'නෙමස්' මූරූනව අබිදම් දෙසී මේ ඈ අසන් සෝහිද; "දෙව්දන් 'මවව' මෑනවි" ඈ-ඉතිබූ අරූත්හිද, 'ඉසිවතුන්' විනා මේගත් කහට නොවිසිද, මේ ඈ-විනා සෝහිද"කම්විබත් රූසි.** b

**න,** නයන්නවේ; පිළිමල්න, ප්‍රතිමල්ලයන්, හෙවත් විරුද්ධයන්; දනන්නෑ, ජයගන්න-

පිළිමල් ශබ්දයා කෙරෙන්-**'න'** යන්න යෙදීමෙනි.

**ආන**-ආන යන්නවේ; නස්නා, නටන්නාවූ; මොනරාණ, මයූර යන්; නරඹන්නෑ, නිරීක්‍ෂණය කරන්න-

මොනර ශබ්දය කෙරෙන් **'ආන'** යනු යෙදීමෙනි.

**ණ්**-ත්යන්නවේ; මහලු පාදනන්, වෘඬබාල ජනයන්; වෑකෙරෙව්, වාශිඤුරයන් මෙන් (වෑයන් දැලිපිහියන් මෙන්); සරූපාදෙළේ, අනුරූපවූ බුරයෙහි; (සුදුසුවූ කටයුත්තෙහි) යොදු, යුක්ත කරව්—

දන ශබ්දය කෙරෙන් **ණ්** යන්න යෙදීමෙනි.

**නව**-නටයන්නවේ-සාමුවෝ, ශාඛාමෘගයෝ; (රිලවු) රූක්නව, වෘක්‍ෂයන්ට; නෑගෙත්, ආරූඪවෙත්-

කම්බහුවචනයෙහි නට යනුද ගමනාර්‍ථාදියෙහි වේ-රූක් ශබ්දය කෙරෙන් **නව** යනු යෙදීමෙනි.

**අණ්**-අන්යන්නවේ; දරුවන් බලන්නහු; දාරකයන් බලන්නාගේ; **ල,** හෘදය; සෑනහේ, ශාන්තවේ-

දරු ශබ්දය කෙරෙන් **'අණ්'** යනු යෙදීමෙනි.

b ප-සේනන්, සේකයන්ට; බහුමනන්නේ, බුහුමාන කරන්නේය; ඈ, (මේ) ආදිය; හුණාබැවින්, ශ්‍රූයමාණභාවයෙන්; නන්විබතින්, නන් යන විභක්තියෙන්; සිදුපා, සිඬවූ පාඨසී.

මෙහි අභිප්‍රාය-**"සුතුකතුකිරිය හා"** යනආදි සූත්‍රයෙහි-එකත **'අළු ආහුම-'උන්නානන් නටන් බුහුබසෑ'**-කියා දැක්වූ විභක්ති ප්‍රත්‍යයන් බෙදාගන්නාකලෑ-කම්විභක්ති ඒකවචනයෙහි **'අ-ළු-ආහු-ම'** යන පසක්ද-බහුවචනයෙහි-**උණ්-න-ආන-ණ්-නව-අණ්**-යන සයක්ද වෙන්වේ-**නන්,**-යන්නක් නොපෙණේ—හුමුත්-**'සේනන් බුහුමනන්නේ'** කිතැන **'සේනන්'**-යන්නෙහිද වෙනත් එබඳු

'එලඹැ බුදුන්කරා'යි මේ ඇඟි වෙත් අරුත් සඳින්වේ a
ඉති කම්විබත්.

---

**මෙහෙයුම් ලද නොලද කිරිය කරණුයේ කතු නම්**
**වදබසෙහි සොඳ සමසේ වනටවිනා කම්විබත්. b**

---

**තන්හිද-නත්** යන්නක් කර්‍මබහුවචනාර්ථයෙහි පෙණේ—එකත අ ල ආ හුම **උන්නානන් නමන්** යන සූත්‍රය කියනකල අසන්නාහට-**'නන්'** යන්නක් ඇසේ-ද්‍රවිඩ ව්‍යාකරණවල අක්‍ෂරයුක්ත්‍ය පමණක් නොවැ ඇසෙන ශබ්දය පරිද්දෙන් පදසිද්ධිය වන බැවි. කියනහෙසින් මේ සිංහල ව්‍යාකරණයෙහිද එසේවියසි පුරාණ ව්‍යාඛ්‍යානයෙහි කියනලදී.

**තිලෝගුරු**, ත්‍රෛලොක්‍යාචාර්‍ය්‍යවූ සර්‍වඥතෙම; **තෙමස්**, තුන්මසක් මුලුල්ලෙහි, **මුරුනට**, දෙව්යන්ට; **අබිදම්දෙසි**, අභිධර්‍මය දෙශනාකළේය; **මේ ඇ**, මේ ආදිය; **අසත්යෝහිද**, අත්‍යන්ත යොගයෙහිද; (අත්‍යන්තයොගනම් නිතර යෙදීමයි—මෙහි තුන්මස නිතරම අභිධර්‍ම දෙශනාවකළ බව හඟවත් )

**දෙව්**, දෙවදත්තතෙම; **මවට**, මාතෘහට; (මෑනියන්දූට) **මෑනවි**, යහපත්වි; **ඇ**, (මේ) ආදිය; **ඉතිබූ අරුත්හිද**, ඉත්ථම්භූතාර්ථයෙහිද; (ඉත්ථම්භූතාර්ථ නම් මෙසේවිය කියා වෙනස්වීමක් දක්වන අර්ථයයි—මෑනියන් කෙරෙහි යහපත්විය යනු ඉත්ථම්භූතාර්ථයි) **ඉසිවතුන් විනා**, ඍෂිවතුන් හැර; **මේ ගත්**, මේ ග්‍රන්ථයතෙම; **කහට**, කවරෙකුට; **නොරිසිද**, අභිමත නොවේද (රුචි නොවේද) **මේ ඇ**, මේ ආදිය; **විනායෝහිද**, විනා යන නිපාතය හා යෙදීමෙහිද (මෙතන්හි—ඉසිවතුන් විනා කිතැන විනා යන්න සමග යෙදීමයි.) **කම්විබත්**, කර්‍මවිභක්තිය; **රුසි**, රුචිසි.

**'තෙමස්'** යනු ශබ්දස්වරූපයෙන් සිටි කර්‍මවිභක්ති එකවචනය--අත්‍යන්තයොගයෙහිවී-**'මවට'** යන කර්‍මෛකවචනය-ඉත්ථම්භූතාර්ථයෙහිවී-මවට යනු සම්ප්‍රදානවිභක්තිය සේද පෙණේ—**'ඉසිවතුන්'** යන කර්‍මවිභක්ති බහුවචනය-විනායොගයෙහි වී-

a **බුදුන්කරා**, සර්‍වඥයන්ගේ ලඟට; **එලඹැසි**, පැමිණැසි; **මේ ඇඟි**, මේ ආදීතන්හි; **වෙත් අරුත්සඳින්**, සමීපාර්ථශබ්දයෙන්; **වේ**,(සිද්ධ)වේ.

මෙහි 'බුදුන්' යනු ගෞරව වශයෙන් සම්බන්ධවිභක්ති බහුවචනයයි, සමීපාර්ථවූ කර ශබ්දය කෙරෙන් කර්‍මවිභක්ති එකවචනය යෙදීමෙන් කරා යන කර්‍මවිභක්ති එකවචනයවේ.

බුදුන් කරා, සර්‍වඥයන්ගේ ලඟට යන අර්ථයි.

**මෙසේ කර්‍මවිභක්තියවේ.**

---

අ-සරණතඹර වරලස සෙවෙලවල කරඋ අරියන
'රදුව' පෙරකළවමන් කුසනිරිඳුනොසමෙළේ
උ-රජුඅනුදත්තේ කුලදම්
ආ-මුනිඳු වැලඳු පාදු
හු-පින් සිපිහු කළ අත්නම් ෴

## කර්තෘ විභක්තිය.

෴ ප-මෙමෙහෙයුම්, ප්‍රේරණයක් (නියෝගයක්;) ලද නොලද, ලබාද නොලබාද; කිරියකරණුයේ, ක්‍රියාව කරන්නා; කතුනම්, කර්තෘනම් වේ; දෙබසෙහි, (එකවචන බහුවචන යන) වචන දෙක්හි; ටනට විනා, 'ට-නට' දෙක හැර; කම්විබත්, කර්මවිභක්තිය; සමසේ, සම කොට; යොදු, යුක්ත කරව්—

මෙහි අභිප්‍රාය අනුන් විසින් නියෝගකිරීමක් ලබා හෝ නොලබා හෝ ක්‍රියාවක් කරණ තැනැත්තා කර්තෘ නම්වේ. *

ඒ කර්තෘ කියවෙන්නාවූ කර්තෘ විභක්තියේ එකවචන බහුවචන දෙක්හි කර්මවිභක්තියට කියනලද ප්‍රත්‍යය වශයෙන් එහි සියලු අකුරුවලින්—එකවචන **'ට'** යන්නද—බහුවචන **'නට'** යන්නද හැර අනික් සියල්ලම යොදව්-එහෙයින් කර්තෘ එකවචනයෙහි-**අ-උ-ආ-හු**-යන සතරද, බහුවචනයෙහි **'උන්-න-ආන-න්-අන්**-පහද යෙදියයුතුයි.

෴ ප-අ-අයන්නවේ—සරණතඹර, පාද නැමැති පද්මය; වරලස සෙවෙල, කෙශකලාප නැමැති ශෛවාලයෙන්; අවලකරඋ, ආකුල කොට; අරියන, ආරාධනයකරන්නාවූ; රදුව, රජදුව විසින්; කළ, කරණලද; අවමන්, අවමානය; කුසනිරිඳු, කුසරජතෙම; නොස මෙළේ, සිහිනොකෙළේය.

මේ කවේ **රදුව** යනු කර්තෘවිභක්ති එකවචනයයි-රදු, ශබ්දය කෙරෙන්-අ විභක්තියි—ව කාරාගමයි.

**උ**-උයන්නවේ, රජු, රජහු විසින්; අනුදත්තේ, අනුදන්නාලද්දේ; කුලදම්, කුලධර්මයයි.

රජ ශබ්දයා කෙරෙන් **උ** විභක්තියි.

**ආ**-ආයන්නවේ—'මුනිඳු, මුනීන්ද්‍රයා විසින්; වැලඳූ, වළඳනලද නොහොත් ප්‍රයොජනය ගන්නාලද, පාදු, පාත්‍රධාතුවයි.

මුනිඳු ශබ්දය කෙරෙන් **ආ** විභක්තියි.

**හු**-හුයනුවේ; පින් සිපිහු; යහපත් ශිල්පකාරයා විසින්-කළ, කරණලද; අත්නම්, හස්තකර්මයයි.

* නියොග ලද්දාවූ කර්තෘ මෙහි උදාහරණ අතර අප්‍රකටයි. නියොග ලද්දාවූ කර්තෘ—**සූදෙට අනාවැසි ලවා මේ පිසවා** යන ආදියෙහි ප්‍රකටයි-එම අනුක්තවූ නියොගලත් කර්තෘ වශයෙන්ද යෙදියහැකිවේ.

**උන්-කමන්නෑ දදුන්කල වරද**
**න-මීපල්න ගත්වෙස් රුස්නේ**
**ආන-නරාණ කලකමට ඉඳුරෝ දෙස්**
**න්-'කිවින්' නුදුටුයේ කෙවුවම්**
**අන්-'අඟනන්' වුහුටු නුවන්නරද දිරිය ඇඳුරු දෑදුරුපකලේ**
**අරුත්වියකන්හි විසින් විබතින් පරව රුසි**
**තෙනෙත්හු විසින් කම්දම්**
**"සුගතිඳු හා කකිසම" "වාරේවර වණන් හා සමර සමර කෙරෙසි"**
**මේ ඈහි හා සබදෙහි කතුවිබත් රුසි.**

**ඉති කතුවිබත්.**

---

සිපි ශබ්දයා කෙරෙන් හු විභක්තිසි.

**උන්**-උන්යන්නවේ, දදුන්, අඥානයන් විසින්; කළ වරද, කරණ ලද්දාවූ වරද; -කම්න්න, ඉවසන්න-

දද ශබ්දයෙන්—උන්, යනු යෙදේ.

**න**-නයන්නවේ; මීපල්න, රජුන් විසින්; ගත්වෙස්, ගන්නාලද වෙශයතෙම; රුස්නේ, රුචිවේ-

මීපල් ශබ්දයකෙරෙන් (කතෘ බහුවචන) **න** යනු යෙදේ.

**ආන**-'ආනයන්නවේ; නරාණ, මිනිසුන් විසින්; කළකමට, කරණලද කර්මයට; ඉඳුරෝ, ඉන්‍ද්‍රියයෝ; දෙස්, සාක්‍ෂිසි-

නර ශබ්දය කෙරෙන් **ආන** යන්න යෙදේ.

**න්**-න්යන්නවේ; කිවින්, කවීන් විසින්; නුදුටුයේ, නොදක්නාලද්දේ; කෙවුවම්-කවර උපමාද ?

කිවි ශබ්දයා කෙරෙන්-**න්** යන්න යෙදේ.

**අන්**-අන්යන්නවේ; අඟනන්, ස්ත්‍රීන් විසින්; වුහුටු, හරණලද; නුවන් නරද, නෙත්‍ර නැමති නාරාචයතෙම; දිරිය ඇදුරු, ධෛර්‍ය නැමති පර්වතය; දෑදුරුකෙළේ, ජර්ජරකෙළේය (සිදුරු කෙළේය;)

අඟන ශබ්දය කෙරෙන් **අන්** යන්න යෙදේ.

**ප**—අරුත් වියකන්හි, (මේ කතෘවිභක්තියේ) අර්ථ කීමෙහි; **විසින්**, විසින් යන නිපාතයක්; විබතින් පරව, විභක්තියෙන් වෙන් වැ; රුසි, අභිමතසි.

කතෘ විභක්තියේ අර්ථකීමෙහි විභක්තියෙන් වෙන්ව විසින් යන් නක් යෙදියයුතුය යනු භාවයි.

**ඊට උදාහරණ.**

තෙනෙත්හු විසින්, ඊශ්වරයා විසින්; කම්, අනඟතෙම; දම්, දවන ලද්දේය.

**කිරිය සැපයීමෙහි ඉවහල් කතු කරණ නම්**
**ඉන් එන් නෙන් ඉයුතු වියුතු දෙබසෙහි සම් නිදු**
**ඉන්- වතින් ගුරුන් අරියනු b**

මෙහි 'හු' යන විභක්තියෙන් පරවූ විසින් යන්න දතයුතු.

**කර්තෘ අර්ථයෙන් පිටත් අර්ථයක කර්තෘ විභක්තිය කියත්.**

සුගතිඳු හා, සුගතෙන්ද්‍රයා හා (බුදුන් හා); සැහිසම, කවරෙක් සම වේද; වාරේවර, වර්ෂාකාලයෙහි; වනන් හා, විරහින් හා; * සමර, අනවබනතෙම; සමරකෙරෙයි, යුද්ධකෙරෙයි.

මේ ඇති, මේ ආදීතන්හි; හා සබඳෙහි, හා (යන නිපාතයාගේ) සම්බන්ධයෙහි; කතුවිබත්, කර්තෘ විභක්තිතොමෝ; රුසී, අභිමතයි.

සුගතිඳු හා-වනන් හා-යන දෙතන්හිම ලක්ෂණයෙන් කර්තෘනෝ නම් නො වියහැකිවේ-එතකුදුවුවත් මාගධ සංස්කෘත භාෂාවල සහ යන නිපාතය යෙදීමෙහි කර්තෘ විභක්තියම යෙදෙන හෙයින් මෙහිද කර්තෘ විභක්තියම වියයුතුයි.

**කර්තෘ විභක්තිය මෙසේයි.**

---

**කරණ විභක්තිය.**

ඝ ප-කතු, කර්තෘහුගේ; කිරියසැපයීමෙහි, ක්‍රියාසම්පාදනය කිරීමෙහි; ඉවහල්, අතිශයින් උපකාරීවූයේ; කරණ නම්, කරණ කාරක නම්වේ; ඉන්, ඉන් විභක්තිද; එන්, එන් විභක්තිද; නෙන්, නෙන් විභක්තිද; ඉයුතු, ඉයන්නෙන් යුක්තද; වියුතු, වියුක්තදවේ; නිද, නිවිභක්තිදවේ; දෙබසෙහි සම, එකවචන බහුවචන යන වචනවලයෙහි සමානවේ.

මෙහි අභිප්‍රාය-කර්තෘ කරණ ක්‍රියාවට අතිශයින්ම උපකාරවූ යමක් කියන වචනය කරණ විභක්තිනම්වෙ-එනම්-ගස කපන තැනැත්තෙක් ඒ කැපීමේ කර්තෘයි, ඔහුගේ ඒ ක්‍රියාවට පොරව අතිශයින්ම උපකාරීවේ. එහෙයින් ඒ පොරව කියන වචනය කරණවිභක්තිය වියයුතුයි-මේ විභක්තිය වන පිණිස ශබ්දයේ අගට යොදන ප්‍රත්‍යය නම්—ඉන්—එන්— නෙන්—යන මේද ඉයන්න සමගදවේ-ඉයුක්තවූ කල-ඉනි-එනි-නෙනි-කියාවේ-නියන්නද තනිව යෙදේ-මේ විභක්තියේ එක වචන බහුවචන දෙකම එකාකාරයි.

**උදාහරණ.**

ඉන්, ඉන් විභක්තියවේ; වතින්, ව්‍රතය කරණකොටගෙණ; නො නොත් ව්‍රතයන් කරණකොටගෙණ; ගුරුන්, ආචාර්‍ය්‍යයන්; අරියනු, ආරාධනාකරණු (සතුටුකරණු.)

---

* විරහිනම් වෙන්වීමක් ඇත්තේයි. ස්ත්‍රීන්ගෙන් වෙන්වූ පුරුෂයෝ විරහිනම් වෙත්—පුරුෂයන්ගෙන් වෙන්වූ ස්ත්‍රීහු විරහිණිනම් වෙත්—වන යන ශබ්දයෙන් වෙන්වූ ස්ත්‍රී පුරුෂ දෙකොටසම කියත්.

**එන්-ගුණෙන් දනාසගන්නේ**
**නෙන්-මෙත්නෙන් වෙර පරයනු**
**ඉනි-සිතිනි වේ දුසිරි සුසිරි**
**එනි-නියෙනි පළටවනු**
**නෙනි-තැත්නෙනි බව පියව්**
**නි-නමව් හියමගනි * නිවන්වන්-**
**"සැරදේනුවන් මිණිපඩුරෙන්" ඇ** a
**උප ලකුණු අරුත්හිද මේ විබත්රුසි**-b

**ඉති කරණවිබත්.**

වත් ශබ්දය කෙරෙන්—'ඉන්' යෙදීමෙන්—

**එන්**, 'එන්' විභක්තියවේ; ගුණෙන් ගුණය කරණකොටගෙණ; දනාසගන්නේ, ජනයා චිත්තාරාධනා කරන්නේය. (සිත් සතුටුකරන්නේය) ගුණ ශබ්දයාකෙරෙන් 'එන්' යෙදීමෙනි.

**නෙන්**-නෙන් විභක්තිවේ; මෙත්නෙන්, මෛත්‍රිය කරණකොටගෙණ; වෙර, වෛරය; පරයනු, පරදවනු.

**ඉනි**, ඉනිවිභක්තියවේ; දුසිරි සුසිරි, දුශ්චරිතයද සුචරිතයද; සිතිනිවේ, චින්තාය කරණකොටගෙණවේ-

සිත් ශබ්දයකෙරෙන් ඉනි යන්න යෙදීමෙනි.

**එනි**, එනි විභක්තිවේ; නියෙනි, ඥාණය කරණකොටගෙණ; පළටවනු, ප්‍රකාශවනු—

නිශබ්දයා කෙරෙන් එනි යන්න වීමෙනි—

**නෙන**, නෙනි විභක්තිවේ; තැත්නෙනි, උත්සාහය කරණකොටගෙණ, බව පියව්, සංසාරය දුරුකරව්.—

තැත් ශබ්දය කෙරෙන් නෙනි යන්න යෙදීමෙනි.

**නි**, නිවිභක්තිවේ; හියමගනි, නිශිතමාර්ගය කරණකොටගෙණ; නොහොත් අතිශයින් හිතවූ මාර්ගය කරණකොටගෙණ; නිවන්වන්, නිර්වාණයට පැමිණියා; නමව්, වඳිව්—

මගශබ්දය කෙරෙන්-නියනු යෙදීමෙනි.

a **ප**-නුවන්, නෙත්‍රනමැති; මිණිපඩුරෙන්, මණිප්‍රාභෘතයෙන් යුක්තවූ; සැරදේ, චිරකාලයක් ජීවත්වේ; මේ ඇ, මේ ආදිවූ; උපලකුණු අරුත්හිද, උපලක්ෂණාර්ථයෙහිද; මේ විබත්, මේ කරණවිභක්තිය,

* මගනි, යනු පොත්වල පෙණේ—ප්‍රත්‍යයවූ පරිද්දෙන් 'මගිනි' විය යුතුයි.

දන් ඇලබනුයේ පිණ්ස නිසිගා සපදන්
හමෙකතැ අනම බුහුබසැ මනැතම සෙදුක මි විබත් ෧
හම-ජරඩම්න්න මිය ඹුවෙන් සිපා රැහැඋරා නිරොද තුනුකෙ
හම මරහම නොදෙනතෙක් තුන්දොරින් සුසිරි පිරුවසෙහේ
අම-උකමලියට දලැදිලි දෙනු පිය සමාමිගි
උම-පෙරෙරවිරජුම ආසිදේ ෨

රුසි, රුචිසි. උප ලක්ෂණනම්-ලකසිටියාවූ හෝ සවකීය සම්බන්ධවූ ලක්ෂණයක් දැනගැණීමය, මෙහි නෙත්‍ර නමැති මැණික්පඬුර සව කීයසි-එය උතුම්කොට දැක්විම උපලක්ෂණාව වශයෙන් කියනලදී.

### කරණ විභක්තිය මෙසේයි.

෧ ප-දන්අෑ, දැනාදිය; ලබනුයේ, ලබන්නේද; පිණ්සනිසිගා, පිණ්ස යන පදයට නිශ්‍රයවූයේද; සපදන්, සම්ප්‍රදානනම්වේ; එකතැ, එක වචනාර්ථයෙහි; හම, හමවිභක්තිද; බුහුබසැ, බහුවචනයෙහි; අනම, අනමවිභක්තිද; (වේ) මනැත, මකාරයක් නැතහොත්; මෙයදු, මකාරයකුයෙදූ, කම්විබත්, කම්විභක්තියද වේ.

මෙහි අභිප්‍රාය-දෙනලද දෙයක් ලබන තැනැත්තා ප්‍රකාශකරණ පදය සම්ප්‍රදානයයි-ආදි ශබ්දයෙන් රුචිකිරිම දැරිම ලබන්නේද සම්ප්‍රදානයයි දතයුතු-පිණ්ස යන පදයට එකතුවූයේද සම්ප්‍රදාන නම්-මෙහි විභක්තිප්‍රත්‍යය නම්-එක වචනයෙහි-හම යනුද බහුවචනයෙහි අනම යනුද වේ. තවත් කම්විභක්තියට කියනලද අ උ-යනාදියෙන් යමකට මයන්නක් නැත්නම් මයන්නක් යොදාගත්කල සම්ප්‍රදානයට යොග්‍යවේ-මෙසේවූ කල්හි සම්ප්‍රදාන විභක්තියේ එක වචනයට, හම-අම-උම-ආම-හුම-ම යන සයද-බහු වචනයට-උන්ම-නම-ආනම-න්ම-අන්ම-අනම-යන සයද විභක්තිප්‍රත්‍යය වශයෙන් යෙදේ.

### උදාහරණ.

෨ හම, හමයන්නවේ; ජරඩම්න්න, ජරානමැති යකින්නිය විසින්; මියමුවෙන්, ව්‍යාඝ්‍රනමැති මුඛය කරණකොටගෙණ; සිපා, චුම්බණය කොට; (විකා) රැහැ, රසය; (ඔජස) උරා, චූෂණයකොට (බීලා); නිරොද, ඔජස්රහිත කළාවූ; තුනුකෙහම, ශරිරනමැති වර්තය (සපය); මරහම, මෘත්‍යුහම, (හෙවත් මරණයට) නොදෙනතෙක්, දානය නොකරණතුරැ; තුන්දොරින්, ද්වාරත්‍රයෙන් (කය වචනය සිත යන තුන් දොරින්) සුසිරි, සුචරිතය; පිරුවයෙහේ, පූරණයකළොත් යහපති-

මරශබ්දය කෙරෙන් හම යෙදීමෙනි.

**ආට-සදියාට දන දෙනු**
**හුට-වෙලඳහුට බඩුදේ**
**ට-මෙගෙට සෙත් වඩම්**
**උන්ට-මහතුන්ට කරව් පිණ්පා**
**නට-දුබිලෝ පරණට පිටු දෙත්**
**ආනට-තළා කෙළියෙහි නරග දෙබෙරා බට පබවත වත තඹරානට නිගාදින් ෛ**
**න්ට-මහත්මෝ පරගනන්ට උර රුපුන්ට පිටුද නොදෙත් ෛ**

---

අට-අට යන්නෙව්; උකටලියට, උත්කණ්ඨාවට; (කලකිරුණු සත්‍රියට) පිය සමාම්හි, ප්‍රියසමාගමයෙහි, (ස්වාමියා හා සමාගම්වීමෙහි) දලැඳිලි, ජලාජලිය (දියපෑත); දෙනු, දෙනයකරණු—

උට, උටයන්නෙව්; පෙරෙව්, පුරොහිත (බමුණු) තෙම; රජුට, නරෙන්‍ද්‍රයාට, ආසිදේ, ආශිර්වාද දෙනයකෙරේ.

රජ ශබ්දයකෙරෙන් 'උට' යෙදීමෙනි.

ෛ ආට, ආටයන්නෙව්—යදියාට, යාචකයාට; (සිඟන්නාට) දන, ධනය; දෙනු, දෙනයකරණු—

යදි ශබ්දයකෙරෙන් 'ආට' යෙදීමෙනි.

හුට, හුටයන්නෙව්; වෙළඳහුට, වාණිජයාට; බඩුදේ, භාණ්ඩ දෙනය කෙරේ.

වෙළඳ ශබ්දයකෙරෙන් හුට යෙදීමෙනි.

ට, ටයන්නෙව්; මෙගෙට, මේ ගෘහයට; සෙත්වඩම්, ශාන්ති වර්ධනය කෙරෙමි—

ගේ ශබ්දයකෙරෙන් 'ට' යෙදීමෙනි.

**බ හු ව ච න.**

උන්ට, උන්ටයන්නෙව්; මහතුන්ට, මහාත්මයන්ට; පිණ්පාකරව්, නමස්කාර කරව්—

මහත් ශබ්දයකෙරෙන් 'උන්ට' යෙදීමෙනි.

නට, නටයන්නෙව්; දුබිලෝ, දුර්වලයෝ; පරණට, සතුරන්ට; පිටුදෙත්, පිටදෙන්නෝය—

පර ශබ්දයකෙරෙන් 'නට' යෙදීමෙනි.

ආනට, ආනටයන්නෙව්; තළාකෙළියෙහි, විල්කෙළියෙහි; තරඟ දෙබෙරා, රළදෙකටබෙදා; බට, බැස්සාවූ; පබවතවත, ප්‍රභාවතී ගේ මුහුන; තඹරානට, පද්මයන්ට; නිගාදින්, නිග්‍රහ දුනී—

තඹර ශබ්දයකෙරෙන්—'ආනට' යෙදීමෙනි.

න්ට-න්ටයන්නෙව්; මහත්මෝ, මහාත්මයෝ; පරඝනන්ට; අනුන්ගේ සත්‍රීන්ට; උර, වක්ෂසද; (ලැපැත්තද) රුපුන්ට, සතුරන්ට; පිටුද,

**අන්ට—මෙහෙලියන්ට නිසෙනි හැඟි නොපවසනු**
**අනට—සරසවිය පුදනුවනට නිය දේ**
**පිණ්ස නිසි තැනට අට-සටනට නික්මිනි-මගුලට සැරසිනි**
**"බුජනම් මැවිනි දෙන්නටද කොටන්නටද"**
**මෙ අරුත්හි වස්යනුද රුසි-බුදුවන්න වස් ඇඟි a**

ඉති සපදන්විබත්.

---

**පදඅත් පැවැත්මට හිම්වූයේ අවදිනම්**
**කරණ විබත්ද ගෙන්යුත් ටනට විනා කම්විබත් b**

---

පෘඡඨියද; (පිටද) නොදෙත්, දානය නොකරත්-

අඟනශබ්දයකෙරෙන්ද, රූපුශබ්දය කෙරෙන්ද -'න්ට' යෙදීමෙනි.

a අන්ට, අන්ට යන්නමේ; මෙහෙලියන්ට, ස්ත්‍රීන්ට; නිසෙනි, නිශ්ශෂයෙන්; (සියල්ලවශයෙන්) හැඟි, අභිප්‍රාය; නොපවසනු, ප්‍රකාශ නොකරණු-

මෙහි ලියශබ්දය කෙරෙන් 'අන්ට' යෙදීමෙනි.

අනට, අනට යන්නමේ; සරසවිය, සරස්වතිතොමෝ; පුදනුවනට, පූජාකරන්නන්ට; නියදේ, ඥානයදේ-

පුදනු ශබ්දයකෙරෙන්-'අනට' යෙදීමෙනි.

පිණ්ස නිසිතැනට, පිණ්ස යන වචනයට ආශ්‍රිතවූ තන්හි; අට, අටයන්නමේ; සටනට, යුධයපිණ්ස; නික්මිනි, නික්මුනේය; මගුලට; මඞ්ගලය පිණ්ස; සැරසිනි, සජ්ජතවී.

බුජනම්, බාහුවනම්; දෙන්නටද, දානයකරන්නටද; කොටන්නටද, (සතුරන්) කොටන පිණ්සද; මැවිනි, නිර්මිතවී.

ප-මෙම් අරුත්හි, මේ අර්ථයෙහි; වස්යනුද, වස්සන ප්‍රත්‍යයත්ද; රුසි, අභිමතය.

බුදුවන්නවස්, බුදුවන පිණ්සය; ඇඟි, (මෙ) ආදි ආකාරසි-දෙන්නට කොටන්නට යන තැන්වල—ධාතුවකෙරෙන්වූ ප්‍රත්‍යයෙන් පරවැ සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යය යෙදෙන හෙයින් ඒ භාවක්‍රියා ශබ්දයන් කෙරෙන් විභක්ති යෙදීමයයි දතයුතු.

**සම්ප්‍රදාන විභක්තිය මෙසේයි.**

---

අවධි විභක්තිය.

b ප-පදඅත් පැවැත්මට, පදාර්ථයන්ගේ ප්‍රවර්තනයට; හිම්වූයේ, සීමාවූයේ; අවදිනම්, අවධිකාරක නම්වේ; කරණවිබත්ද, කරණ විභක්තියද; ගෙන්යුත්, ගෙන්යන්නකින් යුක්තවූ; ටනටවිනා, ට විභක්ති නටවිභක්ති රහිතවූ; කම්විබත්, කර්මවිභක්තිද වන්නේයි.

මෙහි අභිප්‍රාය-පදයකින් කියනලද අර්ථවූයමක් පැවැත්මට ඉමක්වූ

ඉන්—කතක් මහසතු සෙලින්හෙලි
එන් දෙව්දත් දූහැනෙන් පිරිහිනි
නෙන්-රුක්නෙන් හිනි විලිමුවා
අගෙන්-හිරියගෙන් තොරි නිවට
උගෙන්-සොරුගෙන් බියවේ a

වස්තුව කියන වචනය අවධි කාරක නම්වේ-යම් නාමයක් අවධිකාරකබවට පැමිණීමට නාමයේ අගවිභක්ති වශයෙන් යොදන ප්‍රත්‍යයාක්ෂරනම්-කරණ විභක්තියට කියනලද—ඉන්-එන්-නෙන්, යන තුණද-කර්මවිභක්තියට කියනලද ප්‍රත්‍යයන් අතුරෙන්-ම-නට යන දෙකහැර-සෙසු ප්‍රත්‍යයවන අ-උ ආ-හු-යන එකවචනයෙහිවූ සතරද-උන්-න-අන-න්-යන බහුවචනයෙහිවූ සතරද—'ගෙන්' යන්නක් යුක්තවැ වේ.

ගෙන් යන්නෙන් යුක්තවූකලැ-අගෙන්-උගෙන්-ආගෙන්-හුගෙන් කියා එකවචනද—උන්ගෙන්—නගෙන්-අනගෙන්-න්ගෙන් කියා බහුවචනද යෙදෙනබව දතයුතුයි.

## උදාහරණ.

a ඉන්, ඉන්යන්නවේ; කතක්, කාන්තාවක් (ස්ත්‍රියක්) තොමෝ; මහසමතු, මහාසත්වයා (බෝධිසත්වයා;) සෙලින්, පර්වතයෙන්; හෙලි, පතිතකළා.

සෙල්ශබ්දය කෙරෙන් ඉන් යෙදීමෙනි-

මෙහි පැවැති පදාර්ථය මහාසත්වයායි-ඔහුගේ පැවැත්මට ඉමනම් පර්වතයයි-

එන්, එන්යන්නවේ;-දෙව්දත්, දෙවදත්තතෙම; දූහැනෙන්, ධ්‍යානයෙන්; පිරිහිනි, පරිහීණවී-

දූහැන ශබ්දය කෙරෙන් එන් යෙදීමෙනි-

නෙන්, නෙන්යන්නවේ; විලිමුවා, වලීමුඛ (රිලා) තෙම; රුක්නෙන්, වෘක්ෂයෙන්; හිනි, පතිතවී-(වැටුණේය-)

රුක්ශබ්දය කෙරෙන් නෙන් යෙදීමෙනි-

මේ තුණ කරණවිභක්තියෙහිවූ ප්‍රත්‍යයයෝයි-කරණයෙහි ඉකාරයකින් යුක්තවද වන හුමුත් මෙහි එසේවන බවක් නොකියනලදී—මේ තුණ මෙහි ඒකවචනයෙහි කියනලද හුමුත් බහුවචනයෙහිද වියහැකිවේ.

කර්මවිභක්ති ප්‍රත්‍යයන්ට ගෙන් යුක්තවන තැන්-

## එකවචන.

අගෙන්, අගෙන් යන්නවේ-නිවට, නිර්ලජ්ජතෙම හෝ නිගණ්ඨතෙම; හිරියගෙන්, ලජ්ජාවෙන්; තොරි, තොරයි? හෙවත් වෙන්වේ.

හිරිශබ්දය කෙරෙන් අගෙන් යෙදීමෙනි-යකාරය ආගමයි.

උගෙන්, උගෙන් යන්නවේ; සොරුගෙන්, චෞරයාගෙන්; බියවේ, භීතියවේ

ආගෙන්—නොහැහවුරු පරාගෙන් ගතු
හුගෙන්—සවණක් කඳුඹුමුනිඳු හුගෙන් දිලෙව
මේ ඈ යොදනු a
මේ අරුත්හි තොක් දක්වා යනුදරුසි
දියතොක්සෙවනබඳනා-පැලලුප්නුවරදක්වා වහරේවටිඇගි
'වරින්වර රිවිහු කෙරෙන් සිසිදුරුවෙයි'
මේ ඈ වෙත් අරුත් සඳින්වේ
"නරන් කෙරෙන් කැත්උකට-රුවනතුරෙන් මහඟුරතමැණ
සන්තන්ගෙන්දුවා සෙදහල්" මේ ඈ නිදරුණරුතැ අවදි
විබත් රුසි b

---

සොරශබ්දය කෙරෙන් උගෙන් යෙදීමෙනි-

a ආගෙන්, ආගෙන් යන්නවේ; පරාගෙන්, අන්‍යයාගෙන්; ගතු, ගන්නාලද දෙය; නොහැහවුරු, සර්වර නොවේ-

පරශබ්දය කෙරෙන්-ආගෙන් යෙදීමෙනි-

හුගෙන්, හුගෙන් යන්නවේ; සවණක්කඳුඹු, ෂඩ්වර්ණ රශ්මි; (වර්ණ සයක් ඇත්තාවූ රැස්) මුනිඳුහුගෙන්, මුනීන්ද්‍රයා කෙරෙන්; දිලෙව්, ධාවනය කෙරේ-

මුනිඳු ශබ්දය කෙරෙන් හුගෙන් යෙදීමෙනි-මෙහි කඳුඹු යන පදාර්ථයාගේ පැවැත්මට මුනිඳු සීමාවේ.

මේ ඈ යොදනු, මේ ආදිය යුක්ත කරණු.

දසුන්ගෙන්-යනාදිතන්හි—උන්ගෙන් යනාදිය යෙදෙනබව දත යුතුසි.

අවධි අර්ථයෙහිවන නිපාතයකියත්—

b මේ අරුත්හි, මේ (සීමා) අර්ථයෙහි; තොක්දක්වා යනුද; තොක් යන්නද, දක්වා යන්නද; රුසි, අභිමතයි-

දියතොක්, ජගත් ප්‍රමාණ, (ලොකය ඇතිතාක්); සෙවන, ඡායාව; බඳනා, බඩකරන්නාවූ-පැලලුප්නුවර දක්වා, පාටලිපුත්‍රනම් නගරය දක්වා; වහරේවටී, වෘෂ්ටිව වසී; ඈගි, (මෙබඳු) ආකාර ඇත්තේසි.

මෙහි ලොව කෙළවර දක්වා ගන්නාලද සීමාඇති හෙයින් දිය තොක් යනු අවධිවිභක්තියවේ-පාටලිපුත්‍රනගරය ඉම්කොට වෘෂ්ටිව වැසීම කියනලද හෙයින් පැලලුප්නුවර දක්වා යනුද අවධි අර්ථ ඇත්තේසි.

වරින්වර, වාරයෙන් වාරය හෙවත් දිනෙන්දින; රිවිහු කෙරෙන්, සූර්‍ය්‍යයාගේ සමීපයෙන්; සිසි, චන්ද්‍රතෙම; දුරුවෙයි, දූරිභූතවේයයි; මේ ඈ, මේ ආදිය; වෙත් අරුත්සඳින්වේ, සමීපාර්ථශබ්දයෙන්වේ,

රිවිහු යනු-සම්බන්ධ විභක්තියයි-සමීපාර්ථවූ යාර යන ශබ්දය කෙරෙන් එන් විභක්තිය යෙදුනකල්හි කෙරෙන් යන්නවේ.

නරන් කෙරෙන්, මිනිසුන් අතුරෙන්; කැත්, ක්ෂත්‍රියතෙම; උකට,

**දැගුණ කිරිය ලකුණෙන් සමුදසින් එක්දෙසක්හු වෙන්කිරීම් නිදරුණනම්**
**'බමුණු බරණැසැ සිට එයි' මේ ඈ හිම්වුවද පදතුරු සඟ ගින් අන්විබත්ගණි** a

ඉති අවදි විබත්.

---

උත්කෘෂ්ටයි-(උසි); රුවනතුරෙන්, රත්නයන් අතුරෙන්; රතමැණ, රක්තමාණික්‍යය; (රතු කැටය) මහගු, මහාර්ඝයි-(මහඅගය ඇත්තේයි) යන්නන්ගෙන්, ගමනයකරන්නන් අතුරෙන්; දුවා, ධාවකතෙම; (දුවන අය) සෙදහල්, අතිශයින් ශීඝ්‍රයි-මේ ඈ, මේ ආදිවූ, නිදරුණ රුතැ, නිර්ධාරණාර්ථයෙහි; අවදිවිබත්, අවධිවිභක්තිය; රුසි, රුචියි.

නිර්ධාරණනම් සමූහයක් අතුරෙන් යමක් තෝරාගැණීමයි–ඒ බැව් කියනලදී.

a ප–දැගුණ කිරිය ලකුණෙන්, ජාතිගුණ ක්‍රියාලක්‍ෂණය යන මෙයින්; සමුදසින්, සමූහය කෙරෙන්; එක්දෙසක්හු, එකදෙශයක්හුගේ; වෙන්කිරීම්, තෝරකිරීම; නිදරුණනම්, නිර්ධාරණනම්වේ–

ජාතිය දක්වා ජාතියකින් ශ්‍රෙෂ්ඨයා වෙන්කිරීම් ආදියවේ-මෙහි මිනිසුන් අතුරෙන් ක්‍ෂත්‍රියතෙම ජාතියෙන් වෙන්කරණලදී-රක්තමාණික්‍යය රක්තවර්ණ ගුණයෙන් රත්න අතුරෙන් වෙන්කරණලදී-ධාවකයා ක්‍රියාලකුණ කරණකොටගෙණ ගමන්කරන්නන් අතුරෙන් වෙන්කරණලදී.

පාලි සංස්කෘත භාෂාදෙක්හි නිර්ධාරණයෙහි ෂෂ්ඨී සප්තමි–(සම්බන්ධ-ආධාර) විභක්ති දෙක කියනලදී—මෙහි වනාහි අවධි විභක්ති යම කියනලදී.

පාලියෙහි-නරානං ඛත්තියො සූරතමො නරෙසුවා මිනිසුන් අතුරෙන් ක්‍ෂත්‍රියතෙම අතිසයින් සූරයි.

නරානං කියා ෂෂ්ඨිය හෝ නරෙසු කියා සප්තම්ය හෝවේ.

සංස්කෘතහි–නෘණාං නෘෂුවා-බ්‍රාහ්මණඃ ශ්‍රෙෂ්ඨඃ

මනුෂ්‍යයන් අතුරෙන් බ්‍රාහ්මණතෙම ශ්‍රෙෂ්ඨයි.

නෘණාං කියා ෂෂ්ඨිය හෝ නෘෂු කියා සප්තම්ය හෝ වේ

එතකුදුවූවත් සිංහල භාෂාවෙහි නිර්ධාරණයෙහි සම්බන්ධවිභක්තිය හෝ ආධාරවිභක්තිය හෝ ප්‍රකාශවැ නොපැණේ-

'බමුණු' බ්‍රාහ්මණතෙම; බරණැසසිට, බාරාණසියෙහි සිට; එයි, එන්නේ කියා.

ප–මේ ඈ, මේ ආදිය; හිම්වුවද, සීමාවූ නමුත්; පදතුරු සඟගින්, පදාන්තර සංසර්ගයෙන්; (අන්‍යපද එකතුවීමෙන්) අන්විබත්, අන්‍ය විභක්තියක්; ගණි, ගන්නේය.

## සබඳ වෙසෙසන වන උනුන් පිළිබඳවන්නෙන්
## සපදන්කම් විබත් සව් ගෙයුතු වියුතුද සමවේ 𑇡

බ්‍රාහ්මණයා බරණැසැ සිට එයි කී කල්හි බ්‍රාහ්මණයාගේ ආගමනයට බරණැස සීමායි–එය අන්‍යවූ පදයක් නැතිවැ බමුණු බරණැසින් එයි කීවහොත් එසේ අවධිවිභක්තියවේ–මෙහි–සිට යන ක්‍රියාපදයක් යෙදූහෙයින් බරණැස සිටීමට ආධාරවේ–එසේහෙයින්–අවධි විභක්ති නොවේ–

### අවධි විභක්ති මෙසේයි.

---

### සම්බන්ධ විභක්තිය.

𑇡 ප–උනුන් පිළිබඳ වන්නෙන්, අන්‍යොන්‍ය ප්‍රතිබද්ධ වස්තුවෙන්, වෙසෙසනවන, විශෙෂණය කරණුවැනුව; සබඳ, සම්බන්ධනම්වේ; සව්, සියලු; සපදන්විබත්, සම්ප්‍රදාන විභක්තියද–(සව්) කම්විබත්, සියලු කර්මවිභක්තියද; ගෙයුතු, ගෙයන්නක් යුක්තවද; වියුතුද, වියුක්තවද; සමවේ, තුල්‍යවේ.

මෙහි අභිප්‍රාය–ඔවුනොවුන් පිළිබඳවීමෙන් කාටත් සාධාරණවූ වස්තුවක් අසවලාගේයයි නියමකොට වෙනස්කරණ යම් මනුෂ්‍යාදි සත්වයෙක් හෝ යම් ද්‍රව්‍යයක් හෝ කියන විභක්තිය සම්බන්ධ විභක්ති නම් මීට ලකුණුවශයෙන් නාමයෙන් පරවැ යෙදෙන ප්‍රත්‍යයනම්–සම්ප්‍රදාන විභක්තියෙහි දක්වනලද–හට, අට, යනාදි සියල්ල එසේම යෙදේ–කර්මවිභක්තියෙහි කියනලද–අ–උ–ආ යනාදි සියල්ල කිසි තැනක එසේමද කිසිතැනක ගෙයන්නකින් යුක්තවද යෙදේ–මේ කියනලද ගෙයන්න ව්‍යවහාරයෙහි කිසිතැනක හ්‍රස්වවද කිසිතැනක දීර්ඝවද පෙණේ–මෙහි ඔවුනොවුන්ට පිළිබඳ වස්තුවෙන් වෙනස් කරණ වස්තුවයයි කීමෙන් අවබොධය දුෂ්කරසේ පෙණේ–එතකුදු වුවත් එයින් ගණවනලද්දේ අයිතිබවක් ඇත්තක් පමණකි–ඒ මෙසේයි–ධනය ඔවුනොවුන් පිළිබඳය–එසේම රාජාදිහුද ධනය පිළිබඳය–ධනයක් රජහට හෝ බ්‍රාහ්මණාදි අන්‍යයන්ට හෝ අයිතිවියහැකිය—එසේම රාජාදිවූ කාගේ නමුත් ධනයක් ඇත්තේවේ යම් ධනයක් කාගේදැයි පරීක්ෂාවෙහිලා–රජහුගේ ධනයයි කීකල්හි රජ ධනය වෙනස්කරන්නෙක්වැ ධනයට විශෙෂණවේ–බ්‍රාහ්මණාදීන් කෙරෙන් ධනය වෙන්කෙරේ–එසේම රශ්මියක්–හිරුගේ හෝ චන්ද්‍රයාගේ හෝ තාරකාවන්ගේ හෝ වියහැකිවේ–සඳුගේ රැසයයි වෙන්කිරීමෙහි–රශ්මිය සූර්‍ය්‍යාදීන් කෙරෙන් වෙන්කොට දක්වන හෙයින් සඳ රශ්මියට විශෙෂණවේ–මාගධාදි අන්‍යව්‍යාකරණවල මෙකුට අයිතිනම් ඒ අයිතිබව ඇත්තායයි ස්වාමි විභක්තිය සංක්ෂෙපයෙන්ම දක්වා තිබේ–මේ සූත්‍රයෙන් දක්වනලද්දේත් එපමණකි.

හට-කද්‍යෝකිමි තමහට කිසකබා අඹරෝරට නැගේ
අට-තිලොවට ගුරු
උට-මුනිඹිරුට විනේ තඹරගු සුපක්නු
ආට-කුළුණැතියාට කෙපරගු-a
මේ ඇ සොදනු
අගේ-ගිරිදුවගේ හිමි නිල්ගෙලේ-
උගේ-සඳුගේ පිත් සොමි
ආගේ-තුනුවගාගේ පසසරා සරාසඳ මදමරු වසත් වන ඇ

---

සම්ප්‍රදාන විභක්තිය සම්බන්ධ විභක්තියට සමානව එන ප්‍රත්‍යය-යෙදෙන උදාහරණ.

a හට, හටයන්නවේ; කද්‍යෝකිමි, ඛද්‍යෝතස්වාමිතෙම; (කණාමැදිරියා) තමහට කිසකබා, තමාගේ කෘත්‍යය (කටයුත්ත) තබා; අඹරෝරට, අම්බරොදරයට; (අහස්කුසට) නැගේ, ලඞ්ඝනයකෙරේ; (නගී)-

තම-ශබ්දයකෙරෙන් 'හට' යෙදීමෙති.

අට, අටයන්නවේ; තිලොවට, ත්‍රෛලොක්‍යයාගේ (තුන්ලොවේ) ගුරු, ආචාර්‍ය්‍යයි-

තිලෝශබ්දයා කෙරෙන් 'අට' යෙදීමෙති-

උට, උටයන්නවේ; මුනිඹිරුට, සර්වඥ නැමැති සූර්‍ය්‍යයාට; විනේතඹරගු, විනෙය ජනනැමැති තාමරසයෝ; (හික්මවනුහැකි ජන නැමැති පියුම්) සුපක්නු, සුපක්‍ෂයෝයි-(අවිරුඬයෝයි)

මුනිඹිර ශබ්දය කෙරෙන් 'උට' යෙදීමෙති.

ආට, ආටයන්නවේ; කුළුණැතියාට, කරුණාවන්තයාගේ; කෙපරගු, අන්‍යයෝ (සතුරෝ) කවිරුද ?

කුළුණැති ශබ්දය කෙරෙන්-'ආට' යෙදීමෙති-යකාරය ආගමයි-

ප-මේ ඇ, මේ ආදිය; සොදනු, යුක්තකරණු.

මේ ආදියයි කිහෙයින්-එකවචනයෙහි-තවත් හුට-ට-යන දෙකද-බහුවචනයෙහි--උන්ට-නට-ආනට-න්ට-අනට--යන පසද යෙදිය යුතුයි.

කර්මවිභක්ති ප්‍රත්‍යයන්හා ගෙයන්න යෙදුනතැන් දක්වන

උදාහරණ.

අගේ, අගේ යන්නවේ; ගිරිදුවගේ, ගිරිදුහිතෘවගේ; (උමාවගේ) හිමි, ස්වාමිතෙම; නිල්ගෙලේ, නීලග්‍රීවස්‍යයි (ඊශ්වරයායි)-

ගිරිදුශබ්දය කෙරෙන්-'අගේ යෙදීමෙති-වකාරය ආගමයි.

උගේ-උගේ යන්නවේ; සඳුගේ, චන්ද්‍රයාගේ; පිත්, පුත්‍රතෙම; සොමි, සෞම්‍යයායි-(බුධයි)

සඳශබ්දය කෙරෙන් 'උගේ' යෙදීමෙති-

**හුගේ-සෑසිහුගේ කහවෙස් දැරීමෙහි තිවට හත්සළ පිළිගත් a**
**ගෙවියුත් අ සිරිවමිය පියතම උව්දු**
**ගෙවියුත් උ-මුනිවිරුගුණ අපිරියත්**
**ගෙවියුත් ආ-හුණමින්ගුම් දුම්යොනා මියුරු රඟගත්**
**ගෙවියුත් හු-රජහු අණනොලඟු b**
**මේ ඈ යොදනු**

---

ආගේ, ආගේ යන්නවේ; සරාසඳ, ශරත්කාලයෙහි චන්ද්‍රයාය; මඳ මරු, මන්දමාරුතය; (මදපවනය) වසත්වන, වසන්තකාලයෙහි (මල් පිපෙන කාලයෙහි) වනය; ඈ, ආදිය; තුනුවගාගේ, අනඞ්ගයාගේ; (කාමයාගේ) පසසරා, පඤ්චාරිය; (පඤ්චයෙහි හැසිරෙණ සේනාවය)

තුනුවග ශබ්දය කෙරෙන් 'ආගේ' යෙදීමෙනි.

a හුගේ, හුගේ යන්නවේ; සෑසිහුගේ, ශාක්‍ය සිංහයාගේ; (ගෞතම සර්වඥයාගේ) කහවෙස්දැරීමෙහි, කෂාය වස්ත්‍ර ධාරණයෙහි; (කසට වත් දැරීමේදී) තිවට, බ්‍රහ්මතෙම; හත්සළ, අඳිනලද ශාටකය (සළුව) පිළිගත්, ප්‍රතිග්‍රහණය කෙළේසි–

සෑසි ශබ්දය කෙරෙන් 'හුගේ' යෙදීමෙනි

බහුවචනයෙහි–'උන්ගේ' යනාදියවේ

ගෙයන්නක් යුක්ත නොව නාමිවිභක්තික ප්‍රත්‍යයන්ම සම්බන්ධ විභක්තියෙහි යෙදෙන පරිදි දක්වන උදාහරණි!

b ගෙවියුත්, අ, ගෙයන්නෙන් වියුක්තවූ (වෙන්වූ) අයන්නවේ

සිරිවමිය, ශ්‍රීකාන්තාවගේ; පියතම, වල්ලභතෙම; උව්දු, උපෙන්ද්‍රයාසි (විෂ්ණුසි)

සිරිවමි ශබ්දය කෙරෙන් 'අ' යෙදීමෙනි-යකාරය ආගමයි

ගෙවියුත්, උ-ගෙයන්නෙන් වෙන්වූ උයන්නවේ–

මුනිවිරු, සර්වඥවරයාගේ; ගුණ, ගුණය; අපිරියත්, අපර්‍යන්තයි (කොණක් නැත්තේයි)

මුනිවිර ශබ්දයා කෙරෙන් හෝ මුනිවිරු ශබ්දයා කෙරෙන් හෝ 'උ' යන්න යෙදීමෙනි

ගෙවියුත්, ආ-ගෙයන්නෙන් වෙන්වූ ආයන්නවේ.

මියුරු, මයුරතෙම; දුම්යොනා, ධූමයොනිහුගේ; (මෙඝයාගේ) ගුම්, ඝොෂණය; හුණමින්, ශ්‍රවණයකරමින්; රඟගත්, නෘත්‍යය (නැටීම) ගත්තේයි–

දුම්යොන් ශබ්දය කෙරෙන් 'ආ' යෙදීමෙනි

ගෙවියුත් හු, ගෙයන්නෙන් වෙන්වූ හු යන්නවේ;

රජහු, නරෙන්ද්‍රයාගේ; අණ නොලඟු, ආඥාව උල්ලඞ්ඝනය නොකර; (අණට උඩින්නොපනු)

රජ ශබ්දය කෙරෙන් 'හු' යෙදීමෙනි-

"සියපානට වඩා සේගමනපා සපුමෙන්" "පැලලුප්නුවරට රජගහ නුවර සත්යොත්නෙක්" "මහබෝමැඩට ඉසාන කොන්හි රුවන් සක්මන"
මේ ඇහි අවදි අරුත්හි සබඳ විබත්රූසි a

ඉති සබඳ විබත්.

---

මේ ඇ යොදනු, මේ ආදිය යුක්ත කරණු

බහුවචනයෙහිද-උන්න-ආන-යනාදියද යෙදියයුතු-

a සියපානට වඩා, ශතපදීන්ට වඩා; (සියක් කකුල්ඇති හෙයින් සියපානම්වූ පත්තෑයන්ට වඩා) සේගමන්, ශීඝ්‍රවූ (දක්‍ෂවූ) ගමන් ඇති; අපා, අපාදවූ; (කකුල්නැත්තාවූ) සපුමෙන්, සර්පයන් මෙන්* පැලලුප් නුවරට, පාටලිපුත්‍රනම් නුවරෙන්; රජගහනුවර, රාජගෘහ නම් නුවර; සත්යොත්නෙක්, සප්තයොජනයෙකි; නොහොත් සප්ත යොජනයෙක්හිවේ-මහබෝ මැඩට, මහාබොධිමණ්ඩය කෙරෙන්; ඉසානකොන්හි, ඓශාන කොණයෙහි; රුවන් සක්මන, රත්නචඞ්ක්‍රමණයයි-(රත්නමය දණ්ඩහි සක්මන්කළ ඉඩමයි) මේ ඇහි, මේ ආදියෙහි; අවදිඅරුත්හි, අවධිවිභක්තියේ අර්ථයෙහි; සබඳවිබත්, සම්බන්ධ විභක්තිය; රුසි, අභිමතයි.

යමෙකුට වඩා යමෙක් උත්තමය යනාදියක් කියනකල්හි අසවලාගෙන් අසවලා උත්කෘෂ්ටතරය යනාදිය කියයුතු හෙයින් ශතපදීන්ට වැඩියෙන් සර්පයන්ගේ ගමනේ දක්ෂභාවය කීමෙහිද සීමාර්ථය පෙණෙන තැනකින් තැනකට දුරද අසවල් ස්ථානයෙන් අසවල් ස්ථානය මෙනම් දිග පිහිටියේය යනාදිය කීමෙහිද-සීමාර්ථයම පෙණේ-ඒහෙයින්-මේ ස්ථානයන්හි අවධි විභක්තියේ අර්ථයෙහි සම්බන්ධ විභක්තිය යෙදූබව කියනලදී.

මේ සම්බන්ධ විභක්තියේද වෙනත් ප්‍රභේද පෙණෙන නමුත් ඒ ප්‍රභේදද විභක්ත්‍යධිකාරාවසානයෙහි දක්වන්නෙමු.

**සම්බන්ධ විභක්තිය මෙසේයි.**

---

* සපු යනු සර්පයායි ඇතම් කෙනෙක් ඒකවචනකොට කියත නමුත් මෙහි බහුවචනමයයි සැලකියයුතු—සප්සබ්දයයි.

කත්‍රු කම් බැරිකිරිය දරණුයෙ අදර නම් වේ
එකබසැ එහි ඒහි ඇවේ බුහු අත් බසැ අන්හි වෙ a
එහි කුලෙහි නොලැගි මුනිපිත්
ඒ-එපුරේ නිරිදෙක් වි
හි-සින්හි තබව් ඇදුරු උගහා
ඇ-මුනිබසැ කරව් හැදහිලි b
අන්හි-පහනැතඹරන්හි බමන බමර මුළු තඹ පිරිසෙස්

### ආධාර විභක්තිය.

a ප–කතෘකම්බැරි, කර්තෘ කර්ම්ම දෙකට භාරවූ; කිරිය, ක්‍රියාව; දරණුයේ, උසුලන්නේ; අදර නම්වේ, ආධාරනම් වන්නේය; එකබසැ, එකවචනයෙහි; එහි ඒහි ඇවේ, 'එහි' විභක්ති-'ඒ' විභක්ති 'හි' විභක්ති-'ඇ' විභක්ති යන මේ ප්‍රත්‍යය වන්නේය; බුහුඅත්බසැ, බහුවචන වචනයෙහි; අන්හිවේ, 'අන්හි' විභක්තිය වන්නේය–

මෙහි අභිප්‍රාය-යම් ක්‍රියාවක් පවත්නේ කර්තෘහට භාරවහෝ කර්ම්මයට භාරව හෝය, ඒ දෙකෙන් කොයි එකකට හෝ භාරව පවත්නා ක්‍රියාවක් දරන්නේ ආධාරනම් වේ ඒ ආධාරයකියන වචනය විෂව භාර කරණ විභක්තිය ආධාර විභක්තිනම්වේ, ඊට සලකුණු වශයෙන් නාමයෙන් පරවැ යෙදෙන ප්‍රත්‍යයනම්–

එකවචනයෙහි-එහි-ඒ-හි-ඇ—යන සතරයි—බහු වචනයෙහි—අන්හි-යන එකකි-මෙහි එකවචනයට කියනලද 'ඇ' යන්න ඇතම් තැන 'ඈ' කියා හ්‍රස්වද වේ–

සංස්කෘතාදියෙහි—'ධාරකම්ාධාරඃ'-දරන්නේ ආධාර නම්වෙයි-යනාදින් සමක් උසුලන එක ආධාරනම් වෙයි කියනලදි—සිංහල ව්‍යාකරණයේහි කියනලද මේ සූත්‍රයේ අභිප්‍රාය විශෙෂයෙන්ම පැහැදිලිසි–

ආධාර විභක්තියේ ඉසිලීම ක්‍රියාව පිළිබඳයි—"බුදුන් කෙරෙහි පහදී" යනආදි තන්හි ක්‍රියාව හැර දරන්ට අනිත් යමක් නැති හෙයින් ක්‍රියාව උසුලනබව දතයුතුයි.

### උදාහරණ.

b එහි, එහි යන්නවේ; මුනිපිත්, බුඩපුත්‍රතෙම; කුලෙහි, කුලයෙහි; නොලැගි, ලග්නනොවි (නොඇලුනේයි)

කුලශබ්දය කෙරෙන් 'එහි' යෙදිමෙනි–

මෙහි ඇලීම දරන්නේ කුලයයි–

ඒ, ඒයන්නවේ-එපුරේ, ඒ නගරයෙහි; නිරිඳෙක්, නරෙන්ද්‍රයෙක්; (රජෙක්) වී, වූයේය—

පුර ශබ්දය කෙරෙන් 'ඒ' යෙදීමෙනි-මෙහි නරෙන්ද්‍රයාගේ වීමට පුරය ආධාරයි–

සරණ තිමිර බලල් වලා a
“යෝනන් කෙරෙහි කහිගුණ එකයුරු”
මේ ඈ වෙත් අරුත් සදින්වෙ
“මදුරදුන් රන් සාදි වෙසතුරු තනන්දිනි” ඈගි-
පෙරකිරිය කරන්නහුට අදර අරුතැ කම් විබත්හා
එමකිරියට දිපසහා රූසි b

හි, හි යන්නවේ; ඇදුරුළගහා, ආචාර්‍ය්‍යයන්ගේ ශිෂ්‍යාපණය; (ගුරුවරුන්ගේ ඉගැන්වීම) සිත්හි, චිත්තයෙහි; තබව්, සංස්ථාපනයකරව්-

සිත්ශබ්දය කෙරෙන් 'හි' යන්න යෙදීමෙනි-

මෙහි තැබීමට සිත ආධාරයි-

ඈ, ඈයන්නවේ; මුනිබසැ, බුධවචනයෙහි; හැදහිලිකරව්, ශ්‍රධාව කරව් (ඇදහීමපවත්වව්)

මුනිබස් ශබ්දය කෙරෙන් 'ඈ' යෙදීමෙනි-

මෙහි ඇදහිලිකිරීමට බුධවචනය ආධාරයි-

## බහුවචනයට උදාහරණ.

a අන්හි, අන්හි යන්නවේ; පහනැ, ප්‍රභාතයෙහි; (අලුයම්වේලේ) තඹරන්හි, තාමරසයන්හි; (පියුම්වලැ) බමන, භ්‍රමණයකරන්නාවූ; (කරකැවෙන්නාවූ) බමරමුළු, භෘඞ්ග සමූහතෙම; (මීමැසි සමූහයා) තමඹ, අන්ධකාරනැමැති මව; පිරියෙස්, පර්‍ය්‍යේෂණයකොටැ; (සොයා) සරණ, සංචාරණය කරන්නාවූ; (ඇවිදින්නාවූ) තිමිර බලල්වලා, අඳුරු පැටවුන්මෙනි-

තඹර ශබ්දය කෙරෙන් අන්හි යෙදීමෙනි-

මෙහි භ්‍රමණ ක්‍රියාවට පියුම් ආධාරයි ·

b යෝනන් කෙරෙහි, යුවතීන් කෙරෙහි; (තරුණියන්ලඟැ) කහි ගුණ, කවරනම් ගුණයක්; එකයුරු, එකාකාරද.

මේ ඈ, මේ ආදිය; වෙත් අරුත් සදින්වේ, සම්ප්‍රාප්තිශබ්දයෙන්වේ-

මෙහි-'යෝනන්' යනු සම්බන්ධවිභක්ති බහුවචනයයි-ඉන් පරවැ සම්ප්‍රාප්තිවූ කර ශබ්දයවේ-ඒ කරශබ්දයෙන් පරවැ ආධාර එක වචනවූ ඒහි යන්න යෙදීමෙන් කෙරෙහි යනුවේ-

සම්බන්ධ බහුවචනයෙන් පරවැ කරශබ්දය යෙදුන හෙයින් වචනාර්ථය බොහෝවේ-

මදුරදුන්රන්සාදි, මිදුරාජ දුහිතෘන් හෙවත් මද්‍රදෙවීන් වල්ගිය කල්හි; වෙසතුරු, විශ්වන්තර (රජ)තෙම; තනන්දිනිසි, දරුවන් දුන්නේසි; ඈගි, (මේ) ආදියෙහි; පෙරකිරිය කරන්නහුට, පූර්වවූ ක්‍රියාව කරන්නාට; අදර අරුතැ, ආධාරාර්ථයෙහි; කම්විබත්හා, කර්මවිභක්ති සහා; එමකිරියට, එම ක්‍රියාවට; දිපසහා, දි ප්‍රත්‍යයද; රූසි, අභිමතයි-

" බලාවැල දළසුනු විදුදිව්දහර ලඹකෙස්
මහමේ රකුසු හමුවන පියනම් මතුරු දප වනැ"
මේ ඇ කල් අරුත් කිරිය විසාහි අදර අරුතැකම් විබත්රුසි ෘ
ඉති අදර විබත්.

---

මෙහි අභිප්‍රාය 'මදුරදුත්' යනාදි වාක්‍යයෙන්-මදුරජදුවූ දේවිය වනයට ගියකාලයෙහි විශ්වන්තර රජතෙම දරුවන් දුන්නේයයි අර්ථප්‍රකාශවේ—

මෙහි ක්‍රියා දෙකක්වේ-එනම්:-මද්‍රිදේවියගේ වනයට යාමහා වෙස්සතුරුරජහුගේ දරුවන් දීමයි-එයින් පූර්වවූ ක්‍රියාව මද්‍රිදේවිය වනයට යාමයි මෙබඳු ක්‍රියාදෙක පතළකරණ වාක්‍යයන්හි—පූර්වවූ ක්‍රියාව කරන්නා කර්මවිභක්තියෙන් කියත්-මෙහි ගෞරව වශයෙන් මද්‍රුදුන් කියා කර්මබහුවචනය යොදනලදි-

එය ක්‍රියාවක් පවත්නා කාලයක් ප්‍රකාශකිරීමෙහි යෙදෙන හෙයින් ආධාර විභක්තියේ අර්ථයෙහි පවතී-

ඒ පූර්වවූ ක්‍රියාවට ධාතුවෙන් පරවැ දියන ප්‍රත්‍යයයි-මෙහි 'යා' යන ධාතුව කෙරෙන්-'දි' යන ප්‍රත්‍යයවී-

'ඉරබසිඳැදි ගියේ' යනාදි තන්හි මෙසේ යෙදේ

ෘ බලාවැල, බලාකාවලිනැමති; (කොක් පෙළනැමති) දළසුනු, දංෂ්ට්‍රාවෙන් (දළවලින්) යුක්තාවූ; විදුදිව්, විද්‍යුත් නැමති ජිහ්වාවෙන් යුක්තාවූ; (විදුලිය නැමැති දිවඇත්තාවූ) දහර, වර්‍ෂාධාරා නැමැති; ලඹකෙස්, ලම්බකෙශ (එල්බෙනකෙස්) ඇත්තාවූ; මහමේ රකුසු, මහාමෙඝ නැමැති රකුසා; හමුවන, සම්මුඛවූ කල්හි; වනැ, විරහිය; පියනම්, ප්‍රියාවගේ (භාය්‍යාවගේ) නාමය නැමැති; මතුරු, මන්ත්‍රය; දප, ජපකරව.

මෙහි මහා මෙඝය රකුසාට උපමා කරණලදි-

ප්‍රියාවගේ නාමය මන්ත්‍රයට උපමා කරණලදි-

පියශබ්දය-ස්ත්‍රීලිඞ්ගකවූ කලැ භාය්‍යා වාචකයි-

ප-මේ ඇ, මේ ආදිවූ; කල්අරුත්කිරිය විසාහි, කාලාර්ථක්‍රියා විෂයෙහි; අදරඅරුතැ, ආධාරාර්ථයෙහි; කම්විබත්, කර්මවිභක්තිය; රුසි, අභිමතයි—

මෙහි හමුවන යන ක්‍රියාව හමුවූකල්හියයි කාලයක් හඟවන හෙයින් කාලාර්ථයෙහිවේ-ඒ කාලයෙහි ක්‍රියාවක් ප්‍රකාශකරණ හෙයින් ඒ ක්‍රියාව කරන්නා ආධාරාර්ථයෙහි පවතී-එහෙයින්-ඒ ආධාරාර්ථයෙහි කර්මවිභක්තියවේ-

මෙහි හමුවන්නාවූ මහාමෙඝ නැමැති රාක්‍ෂසයා කියන 'මහමේ රකුසු' ශබ්දය ආධාරාර්ථයෙහිවූ කර්මවිභක්තියෙන් පිහිටියේයි-

ආධාර විභක්තිය මෙසේවේ.

එවිසූ අලප්නම් ඇමතුම් තමා අමුකරැ
ඇ අ ආ එකතැබුහුබසැ ඉන් එන්නෙන් ඉසුතුද නි 𑇡
ඇ-පුතැ තෙමිය සිරෙනි ඉතිපුවල තෙප්නල දහව් කිමපල
කළ හු
අ-සැරදේ මහරජ
ආ-හෙ සඳ වතන් නුපුලුස-𑇢
ඉන්-සවණ්ස් සැනහෙව් සදහමින්-
එන්-සජනෙන් මිඟව් පරලෙව්

## ආලපන විභක්තිය.

𑇡 ප-තමා අමුකරැ, තමාට ආමුඛකොට; ඇමතුම්, ආමන්ත්‍රණය කිරීම; අලප්නම් එවිසූ, ඒ ආලපන නමැයි කියූ; එකතැ, එක වචන යෙහි; ඇ අ ආ, ඇ විභක්ති-අ විභක්ති-ආ විභක්තිවේ; බුහුබසැ, බහුවචනයෙහි; ඉන් එන්නෙන්, ඉන් විභක්ති-එන් විභක්ති-නෙන් විභක්ති (වේ); ඉසුතුද, ඉයන්නෙන් යුක්තවද (වේ); නි, නි විභක්තිදවේ-

මෙහි අභිප්‍රාය-අනභිමුඛවූ යමෙක් තමාට අභිමුඛකිරීම ආලපන නම්වේ-එසේ ආමන්ත්‍රණයට යොදන නාමයට ආලපන විභක්තිය වේ-ඊට ලකුණුවශයෙන් ශබ්දයේ අගට ප්‍රත්‍යය වශයෙන් යෙදෙන අක්ෂරනම්-ඒකවචනයෙහි ඇ-අ-ආ-යන තුණයි-බහුවචනයෙහි—ඉන්-එන්-නෙන්-යන තුණයි-කිසිතැනක-ඉ යන්නක් යුක්ත කිරීමෙන් ඉස්පිලි සහිතවැ-ඉනි-එනි-නෙනි-කියාදවේ-නියන්නක්දවේ එසේකලැ බහුවචනයෙහි-ඉන්-එන්-නෙන්-ඉනි-එනි-නෙනි-නි—කියා සතක්වේ-නියන්න කිසිතැනක දික්වදවේ-

## උදාහරණ.

𑇢 ඇ-ඇ යන්නවේ; පුතැ, පුත්‍රය; තෙමියසිරෙනි, තෙමියකුමාරයෙනි; ඉතිපුවල, මෙසේ පෙරළුවූ (ප්‍රකාරයෙන් වැඩුනාවූ) තෙප්, තොපි; නලදහව්, වචාදෘයක භාවය; කිම පලකළහු, කුමට පල කළහු; (කුමක් පිණිස ප්‍රකාශකළහුද)-

පුත්ශබ්දය කෙරෙන් 'ඇ' යෙදීමෙනි-

මෙහි, 'පුතැ' යන තන්හි, ඒකවචනවූ 'ඇ' යන්න යෙදුනේයි-ඊට සමානාධිකරණවූ 'තෙමියසිර' ශබ්දයකෙරෙන්—බහුවචනවූ 'එනි' යන්න යෙදීමෙන්-'තෙමියසිරෙනි' කියා තිබේ-මෙසේ යෙදීම විරුඩයයි ඇතම් [illegible]නක් සිතති-එසේදවුවත්-ඒකවචනයම ගරු වශයෙන් බහුවච[illegible]ට යොදනතන්හි එසේ සමානාධිකරණශබ්ද දෙකෙන් [illegible]නයෙන් යොදූ අනික බහුවචනයෙන් යෙදීම පෙනේ-

[illegible], මහරජ, මහාරාජය; සැරදේ, චිරකාලයක් (බොහෝකලක්) ජීවත් වෙත්වා-

මහරජ ශබ්දය කෙරෙන්-'අ' වූ තැනි-

**නෙත්-සත්නෙත් දුලද නොබජව්**
**ඉයුතු-නෙතිනි නරඹව් මුනිරූ-**
**මහණෙනි බවුත් නොපිරිරව්**
**වත්නෙනි නොවව් ඉසුරුමත්-**
**නි-බිහුනි මිලොලින් කල්ඉක් නඹරෝරේ දගනොවා-**
**නි-නිසවත්නි නණි වණසා-a**

ඉති අලප් විබත්.

---

**නොවියුමෙයි විබත් අකරක් ඇත බහුසෙදුම්**
**අත්නැපසද යුතුබස් * ලැකිසනු සරින් දන්නේ-b**

---

ආ, ආයන්නවේ; හෙසඳා, කොල චන්‍ද්‍රය; වනත්, විරහිත්; තුපුලුස, පලුඇටනොකර.

සඳ ශබ්දය කෙරෙන් 'ආ' වූ තැනි-

බහුවචන.

ඉන්, ඉන්යන්නවේ; සවණින්, කාණීණයෙනි; සඳහමින්, සධම්මයෙන්; සැනහෙව්, ප්‍රීතිමත්වව්; (ප්‍රීතිඇතිවව්);

සවන් ශබ්දය කෙරෙන් 'ඉන්' වූ තැනි-

එන්-'එන්' යන්නවේ; සජනෙන්, 'යහපත් ජනයෙනි; පරලෙව්, පරලොකය; මගව්, පරීක්‍ෂා කරව්-

සජන-ශබ්දය කෙරෙන්—'එන්' යෙදීමෙනි

a නෙත්, නෙත්යන්නවේ; සත්නෙත්, සත්‍වයෙනි; දුලද, දුලීබ් සිය (නපුරු ඇදහිම) නොබජව්, භජනය නොකරව්-

සත් ශබ්දය කෙරෙන් 'නෙත්' යෙදීමෙනි-

ඉයුතු—ඉකාරයෙන් යුක්තවූ තැන්-

නෙතිනි, නෙත්‍රයෙනි; මුනිරූ, සර්වඥයන්වහන්සේගේ රූපය; නරඹව්, බලව්-

නෙත් ශබ්දය කෙරෙන් 'ඉනි' යන්න වූ තැනි-

මහණෙනි, ශ්‍රමණයෙනි; බවුන්, භාවනාවන්; නොපිරිරව්, පහනොකරව්—

මහණ ශබ්දය කෙරෙන් 'එනි' වූ තැනි-

වත්නෙනි, ප්‍රභූජනයෙනි; (පොහොසතුනි); ඉසුරුමත් නොවව්, ඓශ්වර්‍ය්‍යයෙන් මත්නොවව්-

වත් ශබ්දය කෙරෙන් 'නෙනි' වූ තැනි-

නි, නියන්නවේ; බිහුනි, භාඩහයෙනි; මිලොලින්, මවුලොලයෙන්;

---

* සමහර පුරාණ පොත්වල 'අනපසද යුතු බස්' කියා තිබේ—අන ප්‍රත්‍යයෙන් යුක්තවූ වචනයයි කියත්.

**ඉත්රි පුම ලිඟු දෙක එ මේ ඇ සද විබත් බස්**
**නමසද දෙකද නිතැනින් වහරෙනි ලොව පළටව්-a**

කල්ඉක්, කාලාතික්‍රමණයකොට; තඹරෝරේ, තාමරසොදරයෙහි; (පියුම් ඇතුළේ) දහනොවා, බඩනොවව්-

ඕඟු ශබ්දය කෙරෙන් නියන්න යෙදුනු තැනි-

නි, නියන්නෙව්; නියවත්නි, ඍණවන්නයෙනි; නණ, නෘෂ්ණාව; වනසා, විනාසකරව්-

නියවත් ශබ්දය කෙරෙන්-නී යෙදුනු තැනි-

නියන විභක්තිය දීර්ඝ හ්‍රස්ව වශයෙන් දෙයාකාරයෙන් යෙදේ-

## ආලපන විභක්තිය මෙසේයි.

---

b ප-මෙහි, මේ විභක්ත්‍යධිකාරයෙහි; නොවියූ, නොකියන ලද් දෑවූ; විබත් අකරක් ඇත, විභක්ත්‍යක්ෂරයක් ඇත්තේද-නොහොත් මෙහි විබත්, මේ විභක්ති (විධි) යෙහි; නොවියූ, නොකියනලද්දෑවූ; අකරක්, අක්ෂරයක්; ඇත, ඇත්තේද; ඔහු යෙදුම්, ඔහුගේ යොජන සද; අන්නෑපසද යුතු-අන්-න යනාදි ප්‍රත්‍යය යුක්තාවූද; බස්, වචන යන්; ලැකියනුසරින්, ලක්ෂණානුසාරයෙන්; දන්නේ, අවබොධකරන් නේය.

මේ විභක්ත්‍යධිකාරයෙහි, නොකියනලද්දෑවූ විභක්තියක් ප්‍රකාශ කරණ අක්ෂරයක් ඇත්නම් ඔහුගේ යෙදීමද-අන්-න යනාදි ප්‍රත්‍ය යන්ගෙන්-නොහොත් අන ප්‍රත්‍යයෙන් යුක්ත වචනයන්ද පොත්වල පෙණෙන ලක්ෂ්‍යයන්ගේ අනුසාරයෙන් දතයුතුය යන අභිප්‍රායයි-

a ප-ඒ මේ ඇ සද, ඒ-මේ යනාදි ශබ්දයින්ගේ; ඉත්රි පුමලිඟු දෙක, ස්ත්‍රී පුරුෂ ලිඟවයෙහි; විබත්බස්, විභක්තිවචනද; නමසද දෙකද, න ශබ්ද ම ශබ්ද දෙක්හිද; විබත්බස්, විභක්තිවචනද; වහ රෙනි, ව්‍යවහාරයෙන්; ලොවැ, ලොකයෙහි; පළටවෙ, ප්‍රකාශවේ-

ඒ ය-මේ ය-අර ය-තෙල ය යනාදි ශබ්දයන් ස්ත්‍රී පුරුෂ ලිඞ්ගව යෙහි විභක්තිවචන වශයෙන් වෙන්වීමද-තෝ-මම යනආදියට මුල් න ම ශබ්ද දෙකේ-විභක්ති වචනද ව්‍යාකරණ පොතෙන් නොව ලොකව්‍යවහාරයෙන් ප්‍රකාශවේ යන අභිප්‍රායයි-

මේ ව්‍යාකරණයෙහි නොකියනලද විභක්ති ප්‍රකාශකරණ අකුරු කෙසේ දතයුතුද-

මේ ව්‍යාකරණයෙහි සම්ප්‍රදාන බහුවචනයට උදාහරණ දැක්වීමෙ හි-"තලාකෙළියෙහි තරඟ දෙබෙරා බට පබවත වත තඹරා නට නිගාදින්" යන වාක්‍යය පෙණේ-මෙහි 'දින් යන ක්‍රියායෙන්-වත යනු උක්ත කර්‍ම හෙයින් ඒ ප්‍රථමා එකවචනයි-'වත්' ශබ්දය කෙ රෙන්-අකාරය ප්‍රථමා එකවචනයෙහිව්.

### සුභාෂාලඞ්කාරයෙහි.

" සඳුවා මුව තඹර වෙනෙ නද සිව් මුවා වා
සරසවිය හස සව් සුදු කිවිසිත් පුල් මදෙවු විල් "

යන්නෙහි 'සරසවිය' යනු ප්‍රථමා එකවචනයයි-මෙහි-'සරසවි' ශබ්ද යකෙරෙන්-ප්‍රථමා එකවචනයෙහි 'අයන්න යෙදේ-යකාරය ආගමයි

### කාව්‍යශෙඛරයෙහි.

" සතත සකසක අ ත
සුර ගුරු ගණිඳු බරනෙ ත "

යන මෙහි 'සතත්' ශබ්දයෙන් 'සතත' කියාද 'සකඅත්' ශබ්දයෙන් 'සකඅත' කියාද බරනෙත් ශබ්දයෙන් 'බරනෙත' කියාද ප්‍රථමා එක වචනයෙහි අයන්න පෙණේ—ගුත්තිලකාව්‍යයෙහි "සියලු බුදුගුණ මය දනත්තුටුවන දෙයමය" මෙහි 'දෙය' යන තැනද ප්‍රථමා එක වචනයෙහි අයන්න පෙණේ—මේ ආදි කාව්‍යවලැ නොයෙක් තැන ප්‍රථමා එකවචනයෙහි අකාරය පෙණේ-චූර්ණි කාපාඨවලද එසේම පෙණේ-

ප්‍රදීපිකාවෙහි "සිල්නම් බිය මුහුදු තරණ මහනැව රුතවරණ වණ වැටිය යනාදි පාඨවලින් දතයුතු—

බහුවචනයෙහි-ඕ-හු-යන දෙක කියනලදි එසින්-හුයන්න කිසි තැන-හකාරය හැර උකාරය පමණක්වද යෙදේ-සත්තු-පුත්තු-යොක්කු යනාදි තන්හි-ප්‍රථමා බහුවචනයෙහි උකාරයමේ.

### සම්ප්‍රදාන විභක්තියේ-

එකවචනයට 'හට' යනුද බහුවචනයට 'අනට' යනුද කියා-කර්‍ම විභක්තියේ ප්‍රත්‍යයන්ට ටයින්නක් නැත්තේනම් එබඳු තැන ටයන් නක් යෙදූකලැ සම්ප්‍රදාන බවද එම සම්ප්‍රදාන විභක්තිය සම්බන්ධ විභක්තිය වනබවද කියනලදි-එසේ 'හට' යන ප්‍රත්‍යය සම්ප්‍රදාන විභක්තියේද සම්බන්ධ විභක්තියේද එකවචනයෙහිම යෙදෙනබව සිදත්සඟරාවේ පෙණේ-එතකුදුලවත් ව්‍යක්ත ව්‍යවහාරයෙහි සම්ප්‍ර දාන සම්බන්ධ විභක්ති දෙක්හිම බහුවචනයෙහි 'න්'-'අන්' 'උන්' තුණෙන් පරවැ 'හට' යෙදීම පෙණේ-එසේ 'න්හට' 'අන්හට' 'උන් හට' යන ප්‍රත්‍යය තුණක් සම්බන්ධ සම්ප්‍රදාන බහුවචනවැ තිබේ.

### පූරාණ නාමවලියේ—150

" රදූ නමුදුවේ සෙසුකැත් ලියන්හට "
154 " දුනහුත දියනිනම්වේ දූවරුන්හට "
" ගුරු බපපියනම් වේ දනු පියන්හට "

මේතැන්වල සම්බන්ධ බහුවචනයෙහි 'අන්හට'—'උන්හට' යන ප්‍රත්‍යය පෙණෙයි-

ගුත්තිල කාව්‍යයෙහි—

104 " සුරත ඔහු යුදය ට
සුරත ලෙලදෙත කගප ට
සුරත මිස යුගදි ට
සුරත නම් කොඳ රුපඹුව න්හ ට "

109 " දියෙහි යන දණ්ඩ ට
පිහිටක් වෙනත් පෙරසි ට
දුදනන් හට පිහි ට
නොවව් යනාබස සැබැකෙලෙ මට "

මේ තැන්වලද 'අන්හට' 'න්හට' යන ප්‍රත්‍යය දෙක බහුවචනයෙහි යෙදී තිබේ-මෙසේ ජේකපාඨවලැ පෙණෙන ව්‍යවහාර ගතයුතුයි- ආධාර විභක්ති එකවචනයට කියනලද-ඒ යන්නද සම්බන්ධ විභක්ති එකවචනයේහිද පෙණේ-සම්බන්ධාධාර විභක්ති දෙයේ අර්ථද ඉතා ආසන්න හෙයින් ඒ විභක්ත්‍යර්ථ භෙදය ලෙසද සිතියයුතුයි. එය කාව්‍යශෙඛරයෙහි—"මුවකමලේ සුවඳට බඹරු පිරිවැරු" යනාදියෙන් දතයුතුයි— ආධාර එකවචනවූ 'ඇ' යන්න දූත් බොහෝසේම 'අ' යන්නසේ ව්‍යවහාරවේ.

ආලපන විභක්තියේ එකවචනයෙහි ඇ * අ-ආ යන ප්‍රත්‍යයෝද බහුවචනයේහි-ඉත්-එන්-නෙන්-ඉනි-එනි-නෙනි-නී-නි යන ප්‍රත්‍යයෝද සිදත්සඟරාවේ කියනලද්දෝය-එත කුදුළුවත් ව්‍යවහාරයේහි වනාහි එකවචයේහි ඒ-ඕ දෙකක් බොහෝසේම පෙණේ-එනම්:- 'කෙල්ලේ' 'කොල්ලෝ', 'මිතුරේ' 'ගුරො' යාලුවේ' යනාදි 'තන්හිය. ඊට හේතුනම් පාලි සංස්කෘත භාෂාවලී ව්‍යාකරණයන්හි ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්දයන්ගේ ආලපන එකවචනය-කඤ්ඤෙ,කන්‍යෙ-කුමාරිකෙ-යනාදින් එකාරාන්තවැ පෙණේ-පාලි භාෂාවෙහි කිසි තැනක-අභිධම්මවිදු 'ඉසෙ' කියාද 'මහාමුනෙ' කියාද ඉකාරාන්ත පුල්ලිඞ්ග ශබ්දයාගේ ආලපන එකවචනයද එකාරාන්තවැ පෙණේ-සංස්කෘත භාෂාවේ බහුලවශයෙන්ම; හරි, අග්නි, මුනි, ආදි ශබ්දවල ආලපන එකවචනය හරෙ, අග්නෙ, මුනෙ, යනාදින් එකාරාන්තවැ යෙදේ-ගුරු, ප්‍රභූ ආදි උකාරාන්ත ශබ්දයන්ගේ ආලපන එකවචනය 'ගුරො ප්‍රභො' යනාදින් ඔකාරාන්තවැ යෙදේ-එසේ හෙයින් ඒ මාතෘභාෂාවලැ පෙණෙන ස්වරූපය ගෙණ කථාකිරීමෙහි-ඒ-ඕ දෙක ආලපන එකවචනයෙහි යෙදුනබව කල්පනාකටයුතු-ආලපන බහුවචනයෙහිවූ නෙනි යනු කිසිතැනක 'නනි' කියා යෙදේ—කිසිතැන අනනි කියාද කිසිතැන අනෙනි කියාදවේ—එය ජාතකපොතේද,

* මේ ඇ යන්නද දූත් බොහෝසේ අ යන්න වශයෙන් ව්‍යවහාරවේ.

මිලින්දප්‍රශ්නයේද, බොහෝතැන මහරජානනි, යනාදි පාඨවලින් පෙණේ–කිසියම් තැනෙක්හි–මහරජානෙනියයි ලියත් නමුත් මහ රජානනි කියා ලියනලද තැන්ම බහුලවැ පෙණෙන හෙයින් ආනනි යන්නම බාහුල්‍යවෘත්තියට ඇතුළත්වේ–මෙහි–ආන යන්න ගරු වශයෙන් යොදන ප්‍රත්‍යයක්වැ–නි යනු ආලපන බහුවචන ප්‍රත්‍යය වශයෙන් යෙදූකලැ සිඩයි–අප්‍රාණිවාචක ශබ්දයන්ගේ, බහුවචනයට වල්යන්නක් යෙදේ–වල්, යන්නෙන් මතු ඒකවචන ප්‍රත්‍යය යෙදූ කලැ බහුවචනාර්ථය ප්‍රකාශවේ–

ඒ මෙසේයි–ගේ–ගෙවල්–ගෙවලට–ගෙවලින්–ගෙවල්හි–ගම්වලට–ගම්වලින්–ගම්වලැ–යනාදි වශයෙනි, මෙය කාව්‍යවලද පෙණේ–

**සැළලිහිණි සන්දේශයෙහි–**

47 වදිමින් සවස නල හැසිරෙන "දිගතුවලැ"

මෙහි "දිගතුවලැ" යනු දිශා නැමැති ශාඛාවන්හිය යන අර්ථයි, එහෙයින් දිගතු ශබ්දය කෙරෙන් වල් යන්න යෙදී ඉන්පරවැ ආධාර ඒකවචන ඇ යන්න යෙදුනබව පෙණේ–

**කාව්‍යශේඛරයේ**

10–161 " නියංගම් ගම්ව ල
ඇවිද සිහමින් රටව ල"

මෙහි ගම්වල, රටවල, යන දෙතන්හිද ඒසේමයි–මේ වල් යන්න සිදත්සඟරාවේ නොකියනලදි–කුමකින් ආයේදැයි සිතියයුතුයි–ද්‍රවිඩ භාෂාව සිංහලභාෂාවට ආසන්නයි–ද්‍රවිඩව්‍යාකරණයෙහි විභක්ති බහු වචන කිර්මෙහි හැමතැනම කල්යන්නක් යෙදේ–නාමයේ අෂ්ට විභක්තියෙහිම ඒකවචනයට කල්යෙදූකලැ බහුවචනයි ඒ මෙසේයි.

තන් තෛ–පිතා.

| | ඒක. | බහු. |
|---|---|---|
| 1 | තන් තෛ– | තන් තෛකල් |
| 2 | තන් තෛයෙ– | තන් තෛකලෛ |
| 3 | තන් තෛයාල්* | තන් තෛකලාල් |
| 4 | තන් තෛක්කු– | තන් තෛකළුක්කු |
| 5 | තන් තෛයිල්* | තන් තෛකලිල් |
| 6 | තන් තෛයිණ්දු– | තන් තෛකලිණ්දු |
| 7 | තන් තෛයිණ්ඩත්තිල්– | තන් තෛකලිණ්ඩත්තිල් |
| 8 | තන් තෛයේ– | තන් තෛකලේ |

මෙසේ ද්‍රවිඩව්‍යාකරණයෙහි ශබ්දයෙන් පරකොට ඒකවචනවූ විභක්ති ප්‍රත්‍යයන් හා කල් යන්න යෙදීමෙන් බහුවචන වනබව පෙණේ–

සිංහලභාෂාවෙහි වනාහි අප්‍රාණීවාචක ශබ්දවලින් පමණක් බහුවචන කිරීමෙහි වල් යන්න යෙදීමෙන් බහුවචනවේ-ප්‍රාණීවාචක ශබ්ද කෙරෙන්ද ක්‍රියාවචනවලද නොයෙදේ-

අප්‍රාණීවාචක ශබ්දයන් කෙරෙන් යෙදෙන හෙයින් කර්තෘ සම්බන්ධ විභක්ති දෙක්හි වල් යන්න යෙදීම අප්‍රකාශයි.

ඒ මෙසේයි.

| | | | | |
|---|---|---|---|---|
| පෙර විබත්- | ... | ගේ | ... | ගෙවල් |
| කම් - | ... | ගේ<br>ගෙය | ... | ගෙවල් |
| කරණ- | ... | ගෙයින් | ... | ගෙවලින් |
| සපදන්- | ... | ගෙට | ... | ගෙවලට |
| අවදි- | ... | ගෙයින් | ... | ගෙවලින් |
| අදර- | ... | ගෙහි<br>ගෙයි | ... | ගෙවල්හි<br>ගෙවලැ |

ඇතම්විට-ගෙවල්වලින් ගෙවල්වලට කියාත් ව්‍යවහාරවේ-එකලැ වල් වල් කියා දෙකක් පෙණේ-ඒ විධිය මනොහර නොවේ.

ගෙවලුන්-ගෙවලුන් විසින්-ගෙවලුන්ගේ-කියා කර්තෘ සම්බන්ධ විභක්ති දෙකේ බහුවචන යොදනු හැකිනුමුත් ඒ අප්‍රකටයි-අප්‍රාණීවාචක ශබ්දයන් ප්‍රාණීවාචකලෙස කියනු කැමැත්තක් ඇතහොත් එසේ යෙදිය යුතුවේ.

විභක්ති ප්‍රත්‍යයක් සම්බන්ධනොවැ ශබ්ද ස්වරූපයෙන්ම පෙරවිබත් කම්විබත් දෙකෙහි බහුවචන පෙණෙන්නාවූ ශබ්දයන් කෙරෙන් ඒ විබත් දෙක්හි වල් යන්න නොයෙදේ.

ඒ මෙසේයි.

| | | | | |
|---|---|---|---|---|
| පෙ- | ... | පුටුව | ... | පුටු |
| ක- | ... | — | ... | — |
| කර- | ... | පුටුවෙන්<br>පුටුවින් | ... | පුටුවලින් |
| සප- | ... | පුටුවට | ... | පුටුවලට |
| අව- | ... | පුටුවෙන් | ... | පුටුවලින් |
| අදර- | ... | පුටුවේ | ... | පුටුවලැ |

---

| | | | | |
|---|---|---|---|---|
| පෙ- | ... | පොත | ... | පොත් |
| ක- | | — | | — |
| කර- | ... | පොතින්<br>පොතෙන් | ... | පොත්වලින් |
| සප- | ... | පොතට | ... | පොත්වලට |
| අව- | ... | පොතෙන්<br>පොතින් | ... | පොත්වලින් |
| අද- | ... | පොතේ | ... | පොත්වලැ |

| | | | | |
|---|---|---|---|---|
| පෙ- | ... | ගම | ... | ගම් |
| ක- | ... | ගම<br>ගමට | ... | ගම්<br>ගම්වලට |
| කර- | ...* | ගමින්<br>ගමෙන් | ... | ගම්වලින් |
| සප- | ... | ගමට | ... | ගම්වලට |
| අව- | ... | ගමින්<br>ගමෙන් | ... | ගම්වලින් |
| අද- | ... | ගමැ<br>ගමේ | ... | ගම්වලැ |

මෙසේ යෙදෙන වල්යන්න ද්‍රවිඩව්‍යාකරණයෙන් සිංහලට ආබව කල්පනා කටයුතුයි-සිධාන්තසංග්‍රහ ව්‍යාඛ්‍යානයෙහි "සේනත් බුහුම නන්නේ" යනාදි පාඨයට කළ සන්නය කෙළවරැ ඒ ඇසුනාවූ 'නත්' යන්න විභක්ති ප්‍රත්‍යයක් වශයෙන් ද්‍රවිඩව්‍යාකරණානුසාරයෙන් ගත්බව කියනලදී-එහෙයින් ද්‍රවිඩව්‍යාකරණ ක්‍රම සිංහල ව්‍යාකරණයටද යෙදෙනබැව් දතයුතුයි-ද්‍රවිඩභාෂාවේ යෙදෙන 'කළ්' යන්න මෙහි 'වල්' කියා යෙදීම මහණුවම් අඬුවම් යනාදී තන්හි කකාරයට වකාරය වීම පෙණෙන හෙයින් වකාරාදෙශ වීමෙනැයි සැලකියයුතුයි

තවද ඇතම් සර්වනාමාදිනාම බහුවචන කිරීමෙහි 'ලා' යන්නක් වේ-එය ඇතැම්තැන විධික්‍රියාව බහුවචන කිරීමෙහිද යෙදේ-ඒ උඹලා කරපල්ලා යනාදී තන්හිවේ-එය සිංහලභාෂාවේ-කාලා-බිලා යනාදි පූර්වක්‍රියාවෙහි ප්‍රත්‍යයක් වශයෙන්ද ප්‍රාප්ත්‍යර්ථයෙහි ල-යන ධාතුවෙන්වූ පූර්වක්‍රියාවෙහිද පෙණේ—එම සහාර්ථවශයෙන්ද බහුවචන ප්‍රත්‍යයක් වශයෙන්ද යෙදීනබව පෙණේ-

පාලි සංස්කෘත භාෂාවලැ ගැණීම අර්ථකොට ඇති ලා යන ධාතුව මෙහි සහාර්ථවශයෙන් පූර්වක්‍රියායෙහිද බහුවචනාර්ථයෙහිද යෙදෙනබව කල්පනා කටයුතුයි-මෙහි කියනලද විභක්තිප්‍රත්‍යය ශබ්ද විශේෂවශයෙන් නමුත් සැම ශබ්දයන් කෙරෙන් සමසේ නොවේ-

තවද, ගෞරවයෙහි එක්කෙනෙකු සඳහා බහුවචන ව්‍යවහාර කිරීම පඬිතයෝ රජ්ජුරුවෝ යනාදීන් එක්කෙනෙකු සඳහා බහුවචන යොදතිබෙන ජාතකපාඨාදියෙන් පෙණේ—එසේම බහුවචන ප්‍රත්‍යයෙන් පූර්වයෙහි ආන-යන්නක්ද නු-යන්නක්ද ගරුවශයෙන් යොදත් ඒත් ප්‍රත්‍යය වශයෙන් වේ-ඒ ගිරාණෝ-බෝසතාණෝ-පුතනුවෝ තෙරනුවෝ යනාදි තන්හි පෙණේ.

**විභක්ත්‍යධිකාරය නිමි.**

---

* ගමට යම් යනාදීන් ගමනාර්ථ ක්‍රියාවක් ඇති තැනයි.

දෙනෙ දන මෙසිදත පතිරජ පි     රු ව න
සැකෙවිනි පලකල දැනුමට ස     රු ව න
දද බැවිනිවරවූ මහගතු ක     රු ව න
සෙබෙහි වැජඹෙත සජනෙනි වැ     රු ව න a

විභක්ත්‍යධිකාරයේ අවසාන කව,

a ප-පතිරජ පිරුවන, ප්‍රතරාජ පරිවෙණයන් විසින් හෙවත් ප්‍රතිරාජ පරිවෙණ ස්වාමිවූ ස්ථවිරයන්වහන්සේ විසින්; සැකෙවිනි, සංක්‍ෂෙපයෙන්; පලකල, ප්‍රකාශකළාවූ; දැනුමට, විජානනය පිණිස; සරුවන, සාරවූ; මෙසිදත, මේ සිද්ධාන්තසංග්‍රහය; දෙනෙ, ජනතෙම; දන, විජානනයකොට; දදබැවින්, මුග්ධභාවයෙන්; ඉවරවූ, පහවූ; සජනෙනි, සත්පුරුෂයෙනි; මහගතුකරුවන, මහාග්‍රන්ථකාරකයන්ගේ; සෙබෙහි, සභායෙහි; රුවනවූ, රත්නයක්වූ; වැජඹෙත, විජෘම්භණයට නොහොත් වැජඹෙතහොත්; වති, පොහොසති-

ප්‍රතිරාජ පරිවෙණස්වාමීන් විසින් විභක්ත්‍යධිකාර සමාප්තියට කියනලද මේ කවෙහි පිළිවෙළින් විභක්ති නවයම තිබේ-

දෙනේ යනු ප්‍රථමාවිභක්ති එකවචනයයි-සිදත, යනු කර්මවිභක්ති එකවචනයයි, පතිරජපිරුවන යනු කර්තෘවිභක්ති එක වචනයයි, සැකෙවිනි යනු කරණවිභක්ති එකවචනයයි, දැනුමට යනු සම්ප්‍රදාන විභක්ති එකවචනයයි, දදබැවිනි යනු අවධිවිභක්ති එකවචනයයි, මහගතුකරුවන යනු සම්බන්ධවිභක්ති බහුවචනයයි, සෙබෙ යනු ආධාරවිභක්ති එකවචනයයි, සජනෙනි යනු ආලපනවිභක්ති බහුවචනයයි-මෙය විභක්තිනවය යෙදෙන අයුරු දක්වන පිණිස කියනලදී.

**විභක්ත්‍යධිකාරය නිමි.**

සුර–පුම්ලිඟු, අකාරාන්තයි.

| | එකබස. | | බහුබස. |
|---|---|---|---|
| පෙර– | සුරා | ... | සුරෝ<br>සුරහු |
| කම්.– | සුරහු<br>සුරා<br>සුර | ... | සුරන් |
| කතු– | සුරහු<br>සුරා | ... | සුරන් |
| කරණ– | සුරහුගෙන්<br>සුරාගෙන්* | ... | සුරන්ගෙන් |
| සප– | සුරහට<br>සුරාට | ... | සුරන්ට<br>සුරන්හට<br>සුරණට† |
| අව– | සුරහුගෙන්<br>සුරාගෙන් | ... | සුරන්ගෙන් |
| සබ– | සුරහුගේ<br>සුරාගේ | ... | සුරන්ගේ |
| අද– | සුරහු කෙරෙහි<br>සුරා කෙරෙහි | ... | සුරන් කෙරෙහි |
| අල– | සුර<br>සුරෝ | ... | සුරෙනි |

පුරඳර, පිය, ගරුඬ, විද්‍යාධර, දසබල

මේ ආදීහුද සුරශබ්දය මෙනි.

දෙබර–පුම්ලිඟු–අකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | දෙබරා | ... | දෙබරු‡ |
| කම්– | දෙබරා | ... | දෙබරුන් × |

* අවධිවිභක්තියෙහි යෙදෙන "ගෙන්" යනු ප්‍රාණීන් කියන ශබ්දයන් කෙරෙන් කරණවිභක්ති අර්ථයෙහිද යෙදේ—හිරුසන්දේශයෙහි, "සිව්පැවිතන් හෙරණුන්ගෙන් විය සොබන" ගුත්තිලකාව්‍යයෙහි "ගිහිණි නොයෙකලිය කිඳුරන්ගෙන් ලකුළු" යනාදියෙන් එය පෙණේ. එබැවින් එසේ යොදනලදී.

† කාව්‍යවල සුරණට යනුද යෙදේ.

‡ මේ ශබ්දවල බුහුබස්හි අගට උකාරයක් යේදේ, උරඟ හොර ආදී ශබ්දවල එකවචනවලද උකාරයක් යෙදේ—එහෙයින් මේ ශබ්ද ඇතම්තැන උකාරාන්ත ශබ්දලෙස ව්‍යවහාරවන බව දතයුතුයි.

× 'දෙබරන්' යනාදියද කාව්‍යභාෂාවෙහි යෙදියහැකි—ලෝක ව්‍යවහාරය බලා මෙසේ ලීමු.

| | | |
|---|---|---|
| කතෘ– | දෙබරා | දෙබරුන් |
| කර– | දෙබරාගෙන් | දෙබරුන්ගෙන් |
| සප– | දෙබරාට | දෙබරුන්ට |
| අව | දෙබරාගෙන් | දෙබරුන්ගෙත් |
| සබ– | දෙබරාගේ | දෙබරුන්ගේ |
| අද– | දෙබරා කෙරෙහි | දෙබරුන් කෙරෙහි |
| අල– | දෙබරෝ | දෙබරුනි<br>දෙබරුනේ |

බමර, මොනර, දෙමළ, උරඟ, හොර, තුරඟ *

මේ ආදි ශබ්දද දෙබරශබ්දය මෙනි.

ලෙහෙන–පුම්ලිඟු–අකාරාන්තයි.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | ලෙහෙනා ... | ලෙහෙන්නු † |
| කම්– | ලෙහෙනා ... | ලෙහෙනුන්<br>ලෙහෙන්නුන් |
| කතෘ– | ලෙහෙනා ... | ලෙහෙනුන් |
| කර– | ලෙහෙනාගෙන් ... | ලෙහෙන්නුන්ගෙන්<br>ලෙහෙනුන්ගෙන් |
| සප– | ලෙහෙනාට ... | ලෙහෙන්නුන්ට<br>ලෙහෙනුන්ට |
| අව– | ලෙහෙනාගෙන් ... | ලෙහෙන්නුන්ගෙන්<br>ලෙහෙනුන්ගෙන් |
| සබ– | ලෙහෙනාගේ ... | ලෙහෙන්නුන්ගේ<br>ලෙහෙනුන්ගේ |
| අද– | ලෙහෙනාකෙරෙහි | ලෙහෙනුන්කෙරෙහි<br>ලෙහෙන්නුන්කෙරෙහි |
| අල– | ලෙහෙන<br>ලෙහෙනෝ ... | ලෙහෙන්නුනි—<br>ලෙහෙන්නුනේ<br>ලෙහෙන්නුනේ— |

කාගවේණ, ගෝන,

මේ ආදි ශබ්දද ලෙහෙන ශබ්දය සමානයි.

සමනල–පුම්ලිඟු–අකාරාන්තයි.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | සමනලයා ‡ | සමනලයෝ |

* බහුබස්හි මේ ශබ්දාන්ත සම්බන්ධ ගකාරයේ බැඳි බිඳු අඩියට විකල්පයෙන් මාත්‍රාවෘද්ධියද වේ.

† මේ ශබ්දයේ බහුවචන යෙදීමෙහි විකල්පයෙන් විතවේ.

‡ මේ ශබ්දයේ සියලු විභක්ති ප්‍රත්‍යයන්ගේ ප්‍රාණාක්‍ෂරවලට ශබ්දයෙන් පරව යකාරාගමවේ.

| | | | |
|---|---|---|---|
| කම්– | සමනලයා | ... | සමනලයන් |
| කතෘ– | සමනලයා | ... | සමනලයන් |
| කර– | සමනලයාගෙන් | ... | සමනලයන්ගෙන් |
| සප– | සමනලයාට | ... | සමනලයන්ට |
| අව– | සමනලයාගෙන් | ... | සමනලයන්ගෙන් |
| සබ– | සමනලයාගේ | ... | සමනලයන්ගේ |
| අද– | සමනලයාකෙරෙහි | | සමනලයන්කෙරෙහි |
| අල– | සමනලයෝ<br>සමනලය | ... | සමනලයෙනි |

බල, වල, වානර, අසුර, *
මේ ශබ්දද සමනල ශබ්දය සමානයි.

වෙළඳ–පුම්ලිඟු–අකාරාන්තයි.

| | එක. | | බහු |
|---|---|---|---|
| පෙර– | වෙළඳා<br>වෙළෙන්දා | ... | වෙළඳු<br>වෙළඳහු<br>වෙළෙන්දෝ |
| කම්– | වෙළඳා<br>වෙළඳහු<br>වෙළඳු<br>වෙළෙන්දා | ... | වෙළඳුන්<br>වෙළඳන්<br>වෙළෙන්දන් |
| කතෘ– | වෙළඳා<br>වෙළඳහු<br>වෙළඳු | ... | වෙළඳුන්<br>වෙළඳන්<br>වෙළෙන්දන් |
| කර– | වෙළඳාගෙන්<br>වෙළඳහුගෙන්<br>වෙළඳුගෙන් | ... | වෙළඳුන්ගෙන්<br>වෙළඳන්ගෙන්<br>වෙළෙන්දන්ගෙන් |
| සප– | වෙළඳාට<br>වෙළඳහුට<br>වෙළඳුට<br>වෙළෙන්දාට | ... | වෙළඳුන්ට<br>වෙළඳන්ට<br>වෙළෙන්දන්ට |
| අව– | වෙළඳාගෙන්<br>වෙළඳහුගෙන්<br>වෙළඳුගෙන් | ... | වෙළඳුන්ගෙන්<br>වෙළඳන්ගෙන්<br>වෙළෙන්දන්ගෙන් |
| සබ– | වෙළඳාගේ<br>වෙළඳහුගේ<br>වෙළඳුගේ | ... | වෙළඳුන්ගේ<br>වෙළඳන්ගේ<br>වෙළෙන්දුන්ගේ |
| අද– | වෙළඳාකෙරෙහි<br>වෙළඳහුකෙරෙහි<br>වෙළඳුකෙරෙහි | ... | වෙළඳුන්කෙරෙහි<br>වෙළඳන්කෙරෙහි |

* අසුර ශබ්දයෙහි පක්ෂයක් සුර ශබ්දය මෙන් අසුරා අසුරෝ කියාදවේ.

| | එක. | | බහු. |
|---|---|---|---|
| අල- | වෙළඳ<br>වෙළඳෙ | ... | වෙළඳුනේ<br>වෙළඳුනි |

ගඳඹ-ශබ්දයද මෙසේයි *

යන-අකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | යන්නා † | ... | යන්නෝ |
| කම්- | යන්නා<br>යන්නහු | ... | යන්නන්<br>යනවුන්<br>යන්නවුන් |
| කතු- | යන්නා<br>යන්නහු | ... | යන්නන්<br>යනවුන්<br>යන්නවුන් |
| කර- | යන්නාගෙන්<br>යන්නහුගෙන් | ... | යන්නන්ගෙන්<br>යනවුන්ගෙන්<br>යන්නවුන්ගෙන් |
| සප- | යන්නාට<br>යන්නහුට | ... | යන්නන්ට<br>යනවුන්ට<br>යන්නවුන්හට ‡ |
| අව- | යන්නාගෙන්<br>යන්නහුගෙන් | ... | යන්නන්ගෙන්<br>යනවුන්ගෙන්<br>යන්නවුන්ගෙන් |
| සබ- | යන්නාගේ<br>යන්නහුගේ | ... | යන්නන්ගේ<br>යනවුන්ගේ<br>යන්නවුන්ගේ |
| අද- | යන්නාකෙරෙහි<br>යන්නහුකෙරෙහි | | යන්නන්කෙරෙහි<br>යනවුන්කෙරෙහි |
| අල | යන්න<br>යන්නෝ | ... | යන්නෙනි |

දෙන, කන, බොන

මේ ආදි අක්‍රියා ශබ්දයෝද යන ශබ්දයමෙනි.

රිලා-පුම්ලිඟු-ආකාරාන්තයි.

---

* "වෙළෙන්ද" යනාදි මාත්‍රාවෘද්ධි වරනැගෙණ පක්ෂය හැර සෙසු සියල්ල වෙළඳ ශබ්දයට සමානයි.

† යන එන ආදි නකාරයෙන් යුක්ත ස්වරාන්ත ශබ්ද සියල්ල විභක්ති ප්‍රත්‍යයන් පරකල්හි ද්විත්වවේ—සමහර අකාරාන්ත අක්‍රියා ශබ්ද උකාරාන්තවද තිබේ—මේ "යන" ශබ්දයද උකාරාන්තවද ව්‍යවහාරයි, උකාරාන්තවූකල්හි සෙසු උකාරාන්ත ශබ්ද පරිද්දෙන් වරනැගේ—කුසදායෙහි "යනුවන්හටදී තනතුරු" යනාදියෙන් එය දතයුතුයි.

‡ යන්නාහට-යනාදියද පුරාණ ව්‍යවහාරයෙහි පෙණේ.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | රිලවා * | ... | රිලවු |
| කම්– | රිලවා | ... | රිලවුන් |
| කතු– | රිලවා | ... | රිලවුන් |
| කර– | රිලවාගෙන් | ... | රිලවුන්ගෙන් |
| සප– | රිලවාට | ... | රිලවුන්ට |
| අව– | රිලවාගෙන් | ... | රිලවුන්ගෙන් |
| සබ– | රිලවාගේ | ... | රිලවුන්ගේ |
| අද– | රිලවාකෙරෙහි | ... | රිලවුන්කෙරෙහි |
| අල– | { රිලවා<br>{ රිලවෝ | ... | { රිලවුනේ<br>{ රිලවුනි |

ගිරා ශබ්දයද මෙසේයි.

දත් වැ—පුම්ලිඟු—ඇකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | දත්වැයා | ... | දත්වැයෝ |
| කම්– | දත්වැයා | ... | { දත්වැයන්<br>{ දත්වැයින් |
| කතු– | දත්වැයා | ... | { දත්වැයන්<br>{ දත්වැයින් |
| කර– | දත්වැයාගෙන් | ... | දත්වැයන්ගෙන් |
| සප– | දත්වැයාට | ... | { දත්වැයන්ට<br>{ දත්වැයින්ට |
| අව– | දත්වැයාගෙන් | ... | දත්වැයන්ගෙන් |
| සබ– | දත්වැයාගේ | ... | { දත්වැයින්ගේ<br>{ දත්වැයන්ගේ |
| අද– | දත්වැයාකෙරෙහි | ... | දත්වැයන් කෙරෙහි |
| අල– | දත්වැයෝ | ... | දත්වැයිනේ |

පත්තෑ කන්වෑ ශබ්දද මෙසේයි.

උරුලෑ–පුම්ලිඟු–ඇකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | උරුලෑවා | ... | උරුලෑවෝ |
| කම්– | උරුලෑවා | ... | { උරුලෑවුන්<br>{ උරුලෑයින් |
| කතු– | උරුලෑවා | ... | { උරුලෑවුන්<br>{ උරුලෑයින් |
| කර– | උරුලෑවාගෙන් | ... | { උරුලෑවුන්ගෙන්<br>{ උරුලෑයින්ගෙන් |

* මේ ශබ්දය සියලු විභක්ති ප්‍රත්‍යයන් පරකල්හි හ්‍රස්වවේ.

14

| | | | |
|---|---|---|---|
| සප- | උරුලෑවාට<br>උරුලෑවට | ... | උරුලෑවුන්ට<br>උරුලෑසින්ට |
| අව- | උරුලෑවාගෙන්<br>උරුලෑවගෙන් | ... | උරුලෑවුන්ගෙන්<br>උරුලෑසින්ගෙන් |
| සබ- | උරුලෑවාගේ | ... | උරුලෑවුන්ගේ<br>උරුලෑසින්ගේ |
| අද- | උරුලෑවාකෙරෙහි | ... | උරුලෑවුන්කෙරෙහි<br>උරුලෑසින්කෙරෙහි |
| ආල- | උරුලෑවෝ | ... | උරුලෑවුනේ<br>උරුලෑවුනි |

කබල්ලෑ—කැස්බෑ—යනාදී ශබ්දද මෙසේයි.

ගොවි පුම්ලිඟු-ඉකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | ගොවියා | ... | ගොවියෝ<br>ගොවිහු |
| කම්- | ගොවියා<br>ගොවිහු | ... | ගොවින්<br>ගොවියන් |
| කත්- | ගොවියා<br>ගොවිහු | ... | ගොවියන්<br>ගොවින් |
| කර- | ගොවියාගෙන්<br>ගොවිහුගෙන් | ... | ගොවින්ගෙන්<br>ගොවියන්ගෙන් |
| සප- | ගොවියාට | ... | ගොවියන්ට<br>ගොවින්ට |
| අව- | ගොවියාගෙන් | ... | ගොවින්ගෙන්<br>ගොවියන්ගෙන් |
| සබ- | ගොවියාගේ | ... | ගොවියන්ගේ<br>ගොවින්ගේ |
| අද- | ගොවියාකෙරෙහි | ... | ගොවියන්කෙරෙහි<br>ගොවින්කෙරෙහි |
| අල- | ගොවිය<br>ගොවියෝ | ... | ගොවියනේ<br>ගොවියෙනි |

පරවි, තොටි, සෙනෙවි, රැටි, මගි, මැඩි, දුගි, හිමි, දැවි, දෙවි, අකාලෙඹි, කවඩි
යනාදී ශබ්දද ගොවි ශබ්දය සමානයි.

ඇමති-පුම්ලිඟු-ඉකාරාන්තයි.

| | එක. | | බහු |
|---|---|---|---|
| පෙර- | ඇමතියා<br>ඇමැත්තා | ... | ඇමතියෝ<br>ඇමැත්තෝ |
| කම්- | ඇමතියා<br>ඇමැත්තා | ... | ඇමතියන්<br>ඇමැත්තන් |

| | එක. | | බහු. |
|---|---|---|---|
| කතෘ- | ඇමතියා<br>ඇමැත්තා | ... | ඇමතියන්<br>ඇමැත්තන් |
| කර- | ඇමතියාගෙන්<br>ඇමැත්තාගෙන් | ... | ඇමතියන්ගෙන්<br>ඇමැත්තන්ගෙන් |
| සප- | ඇමතියාට<br>ඇමැත්තාට | ... | ඇමතියන්ට<br>ඇමැත්තන්ට |
| අව- | ඇමතියාගෙන්<br>ඇමැත්තාගෙන් | ... | ඇමතියන්ගෙන්<br>ඇමැත්තන්ගෙන් |
| සබ- | ඇමතියාගේ<br>ඇමැත්තාගේ | ... | ඇමතියන්ගේ<br>ඇමැත්තන්ගේ |
| අද- | ඇමතියාකෙරෙහි<br>ඇමත්තාකෙරෙහි | | ඇමතියන්කෙරෙහි<br>ඇමැත්තන් කෙරෙහි |
| අල- | ඇමතිය<br>ඇමතියෝ<br>ඇමැත්තෝ | ... | ඇමැතියෙනි<br>ඇමැත්තෙනි |

බලැති—දිපැති—යනාදී ශබ්දද මෙසේයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | වැද්දා | ... | වැද්දෝ |
| කම්- | වැද්දා | ... | වැද්දන් |
| කතෘ- | වැද්දා | ... | වැද්දන් |
| කර- | වැද්දාගෙන් | ... | වැද්දන්ගෙන් |
| සප- | වැද්දාට | ... | වැද්දන්ට |
| අව | වැද්දාගෙන් | ... | වැද්දන්ගෙන් |
| සබ- | වැද්දාගේ | ... | වැද්දන්ගේ |
| අද- | වැද්දා කෙරෙහි | ... | වැද්දන් කෙරෙහි |
| අල- | වැද්ද<br>වැද්දෝ | ... | වැද්දෙනි |

ඉසි, කැදැති, බෙලි, සාල්මැසි, ඉබි*

යනාදී ශබ්දද වැදිශබ්දයමෙනි.

ඇදුරු-පුමලිඟු-උකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | ඇදුරා | ... | ඇදුරෝ |
| කම්- | ඇදුරා | ... | ඇදුරන් |
| කතෘ- | ඇදුරා | ... | ඇදුරන් |
| කර- | ඇදුරාගෙන් | ... | ඇදුරන්ගෙන් |
| සප- | ඇදුරාට | ... | ඇදුරන්ට |

* ඉබි "ශබ්දය උකාරාන්තවද ඇතැම්තැන ව්‍යවහාරයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| අව– | ඇදුරාගෙන් | ... | ඇදුරන්ගෙන් |
| සබ– | ඇදුරාගේ | ... | ඇදුරන්ගේ |
| අද– | ඇදුරාකෙරෙහි | ... | ඇදුරන්කෙරෙහි |
| අල– | ඇදුර<br>ඇදුරෙරෝ | ... | ඇදුරෙනි<br>ඇදුරනේ |

| | | | |
|---|---|---|---|
| කෙසරු | දිවයුරු... | බමුණු | කිඳුරු |
| ගුරු | පිඹුරු ... | සිකුරු | නිරිඳු |
| ගුරුළු | ඌරු ... | බකමූහුනු | |
| මිතුරු | කුකුළු... | වඳුරු | |

යනාදි ශබ්දයෝද ඇදුරු ශබ්දය මෙනි.

ඔටු–පුම්ලිඟු—උකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | ඔටුවා | ... | ඔටුවෝ |
| කම්– | ඔටුවා | ... | ඔටුවන් |
| කතු– | ඔටුවා | ... | ඔටුවන් |
| කර– | ඔටුවාගෙන් | ... | ඔටුවන්ගෙන් |
| සප– | ඔටුවාට | ... | ඔටුවන්ට |
| අව– | ඔටුවාගෙන් | ... | ඔටුවන්ගෙන් |
| සබ– | ඔටුවාගේ | ... | ඔටුවන්ගේ |
| අද– | ඔටුවාකෙරෙහි | | ඔටුවන්කෙරෙහි |
| අල– | ඔටුවෝ | ... | ඔටුවෙනි<br>ඔටුවනේ |

| | | |
|---|---|---|
| අඟහරු | කාකුළු | මීසදිටු |
| වටු | කොටලු | එසදිටු |
| දරු | දෙටු | එළු |
| ඕලු | පඩු | මරු |

යනාදි ශබ්දද ඔටුශබ්දය මෙනි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | මහල්ලා | ... | මහල්ලෝ |
| කම්– | මහල්ලා | ... | මහල්ලන් |
| කතු– | මහල්ලා | ... | මහල්ලන් |
| කර– | මහල්ලාගෙන් | .. | මහල්ලන්ගෙන් |
| සප– | මහල්ලට<br>මහල්ලාට | ... | මහල්ලන්ට |
| අව– | මහල්ලාගෙන්<br>මහල්ලගෙන් | | මහල්ලන්ගෙන් |

| | | |
|---|---|---|
| සබ– | මහල්ලාගේ ... | මහල්ලන්ගේ |
| අද– | මහල්ලා කෙරෙහි ... | මහල්ලන් කෙරෙහි |
| අල– | මහල්ලෝ ... | මහල්ලනේ, මහල්ලෙනි |

උකුසු ශබ්දාදියද මෙසේයි.

කොක්–කකාරාන්ත පුම්ලිඞ්ග.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | කොකා | කොක්කු |
| කම්– | කොකා | කොකුන්, කොක්කුන් |
| කතු– | කොකා | කොකුන්, කොක්කුන් |
| කර– | කොකාගෙන් | කොකුන්ගෙන්, කොක්කුන්ගෙන් |
| සප– | කොකාට | කොකුන්ට, කොක්කුන්ට |
| අව– | කොකාගෙන් | කොකුන්ගෙන්, කොක්කුන්ගෙන් |
| සබ– | කොකාගේ | කොකුන්ගේ, කොක්කුන්ගේ |
| අද– | කොකා කෙරෙහි | කොකුන්කෙරෙහි, කොක්කුන්කෙරෙහි |
| අල– | කොකෝ | කොකුනේ, කොක්කුනේ |

යක් ශබ්දාදියද මෙසේයි.

සත්–තකාරාන්ත–පුම්ලිඞ්ග.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | සතා | සත්තු |
| කම්– | සතා | සතුන්, සත්තුන් |
| කතු– | සතා | සතුන්, සත්තුන් |
| කර– | සතාගෙන් | සතුන්ගෙන්, සත්තුන්ගෙන් |
| සප– | සතාට | සතුන්ට, සත්තුන්ට |
| අව– | සතාගෙන් | සතුන්ගෙන්, සත්තුන්ගෙන් |
| සබ– | සතාගේ | සතුන්ගේ, සත්තුන්ගේ |
| අද– | සතාකෙරෙහි | සතුන්කෙරෙහි, සත්තුන්කෙරෙහි |
| අල– | සතෝ | සතුනේ, සතුනි, සතුතුනි, සත්තුනේ |

පුත්, පොහොසත්, ඇත්, යනාදි ශබ්දද 'සත්' ශබ්දයමෙනි.

උගත්–තකාරාන්ත–පුම්ලිඞ්ග.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | උගතා | උගත්තෝ, උගත්තු |
| කම්– | උගතා | උගතුන්, උගත්තුන් |
| කතු– | උගතා | උගතුන්, උගත්තුන් |
| කර– | උගතාගෙන් | උගතුන්ගෙන්, උගත්තුන්ගෙන් |
| සප– | උගතාට | උගතුන්ට, උගත්තුන්ට |

| | | |
|---|---|---|
| අව– | උගතාගෙන් | උගතුන්ගෙන්, උගත්තුන්ගෙන් |
| සබ– | උගතාගේ | උගතුන්ගේ, උගත්තුන්ගේ |
| අද– | උගතාකෙරෙහි | උගතුන්කෙරෙහි, උගත්තුන්කෙරෙහි |
| අල– | උගතෝ | උගතුනි, උගත්තුනි / උගතුනේ, උගත්තුනේ |

ගොන්—නකාරාන්ත පුම්ලිඞ්ග.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | ගොනා | ... ගොන්නු |
| කම් | ගොනා | ... ගොනුන්, ගොන්නුන් |
| කතු– | ගොනා | ... ගොනුන්, ගොන්නුන් |
| කර– | ගොනාගෙන් | ... ගොනුන්ගෙන්, ගොන්නුන්ගෙන් |
| සප– | ගොනාට | ... ගොනුන්ට, ගොන්නුන්ට |
| අව– | ගොනාගෙන් | ... ගොනුන්ගෙන්, ගොන්නුන්ගෙන් |
| සබ– | ගොනාගේ | ... ගොනුන්ගේ, ගොන්නුන්ගේ |
| අද– | ගොනාකෙරෙහි | ... ගොනුන්කෙරෙහි |
| අල– | ගොනෝ, ගොනා | ගොනුනි, ගොන්නුනි / ගොන්නුනේ, ගොනුනේ |

කොවුල්–ලකාරාන්ත–පුම්ලිඞ්ග.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | කොවුලා | ... | කොවුලෝ |
| කම්– | කොවුලා | ... | කොවුලන් |
| කතු– | කොවුලා | ... | කොවුලන් |
| කර– | කොවුලගෙන් / කොවුලාගෙන් | ... | කොවුලන්ගෙන් |
| සප– | කොවුලට, කොවුලාට | | කොවුලන්ට |
| අව– | කොවුලාගෙන් / කොවුලගෙන් | .... | කොවුලන්ගෙන් |
| සබ– | කොවුලගේ, කොවුලාගේ | | කොවුලන්ගේ |
| අද– | කොවුලාකෙරෙහි | ... | කොවුලන්කෙරෙහි |
| අල– | කොවුලෝ, කොවුලා... | | කොවුලනේ |

මවුල් යනාදී ශබ්ද මෙසේයි.

බලල් ශබ්දය ලකාරාන්ත–පුම්ලිඞ්ග.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | බලලා | ... | බලල්ලු |
| කම්– | බලලා | ... | බලලුන්, බලල්ලුන් |
| කතු– | බලලා | ... | බලලුන්, බලල්ලුන් |
| කර– | බලලාගෙන්, බලලගෙන් | | බලල්ලුන්ගෙන්, බලලුන්ගෙන් |

| | | |
|---|---|---|
| සප– | බලලට, බලලාට | බලල්ලුන්ට, බලලුන්ට |
| අව– | බලලාගෙන්, බලලගෙන් | බලලුන්ගෙන්, බලල්ලුන්ගෙන් |
| සබ– | බලලගේ, බලලාගේ | බලලුන්ගේ, බලල්ලුන්ගේ |
| අද– | බලලාකෙරෙහි | බලලුන් කෙරෙහි<br>බලල්ලුන් කෙරෙහි |
| අල– | බලලා, බලලෝ | බලලුනේ, බලල්ලුනේ |

පුල්, කිරල්, ලෙහෙල්, වහල්, යනාදි ශබ්දද බලල්ශබ්දයමෙනි.

රකුස් ශබ්දය සකාරාන්ත පුම්ලිඞ්.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | රකුසා* | ... | රකුසෝ |
| කම්– | රකුසා, රකුසු | ... | රකුසන් |
| කතෘ– | රකුසා | ... | රකුසන් |
| කර– | රකුසාගෙන්, රකුසගෙන් | | රකුසන්ගෙන් |
| සප– | රකුසට, රකුසාට | ... | රකුසන්ට |
| අව– | රකුසගෙන්, රකුසාගෙන් | | රකුසන්ගෙන් |
| සබ– | රකුසගේ, රකුසාගේ | | රකුසන්ගේ |
| අද– | රකුසාකෙරෙහි | ... | රකුසන්කෙරෙහි |
| අල– | රකුසෝ, රකුසා | ... | රකුසනේ, රකුසෙනි |

මිනිස්, වලස් යනාදි ශබ්දද මෙසේයි.

ලිය–අකාරාන්ත–ඉතිරිලිඞ්.

| | එක. | | බහු |
|---|---|---|---|
| පෙර– | ලිය | ... | ලියෝ |
| කම්– | ලිය | ... | ලියන් |
| කතෘ– | ලිය | ... | ලියන් |
| කර– | ලියගෙන් | ... | ලියන්ගෙන් |
| සප– | ලියට, ලියහට | ... | ලියන්ට |
| අව– | ලියගෙන් | ... | ලියන්ගෙන් |
| සබ– | ලියගේ | .... | ලියන්ගේ |
| අද– | ලියකෙරෙහි | ... | ලියන්කෙරෙහි |
| අල– | ලියේ | ... | ලියෙනි |

පිය, අඟන යනාදි ශබ්දද මෙසේයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | ලඳ | ... | ලන්දු |
| කම්– | ලඳ | ... | ලඳුන් |
| කතෘ– | ලඳ | ... | ලඳුන් |

* කිසිතැන උකාරාන්ත රකුසු ශබ්දයක්ද පෙණේ.

| | | | |
|---|---|---|---|
| කර– | ලදගෙන් | ... | ලදුන්ගෙන් |
| සප– | ලදට | ... | ලදුන්ට |
| අව– | ලදගෙන් | ... | ලදුන්ගෙන් |
| සබ– | ලදගේ | ... | ලදුන්ගේ |
| අද– | ලදකෙරෙහි | ... | ලදුන්කෙරෙහි |
| අල– | ලදේ | ... | ලදුනේ, ලදුනි |

සෙබඩ යනාදි ශබ්දද මෙලෙසයි.

අම්මා–ආකාරාන්ත–ඉතිරිලිඟු.

| | එක. | | බුහු. |
|---|---|---|---|
| පෙර– | අම්මා | ... | අම්මාවරු, අම්මාලා |
| කම්– | අම්මා | ... | අම්මාවරුන්, අම්මාලා |
| කතු– | අම්මා | ... | අම්මාවරුන්, අම්මාලා |
| කර– | අම්මාගෙන් | ... | අම්මාවරුන්ගෙන්, අම්මාලාගෙන් |
| සප– | අම්මාට | ... | අම්මලාට, අම්මාවරුන්ට |
| අව– | අම්මාගෙන් | ... | අම්මාවරුන්ගෙන්, අම්මලාගෙන් |
| සබ– | අම්මාගේ | ... | අම්මාවරුන්ගේ, අම්මලාගේ |
| අද– | අම්මාකෙරෙහි | ... | අම්මාවරුන්කෙරෙහි<br>අම්මාලාකෙරෙහි |
| අල– | අම්මා, අම්ම, අම් මේ | ... | අම්මාවරුනි |

නැන්දා, නැනා, අක්කා, † නගා යනාදියද මෙසේයි.

විසාකා–ආකාරාන්ත–ඉතිරිලිඟු.

| | එක. | | බුහු. |
|---|---|---|---|
| පෙර– | විසාකාව | ... | විසාකාවෝ |
| කම්– | විසාකාව | ... | විසාකාවන්, විසාකාවුන් |
| කතු– | විසාකාව | ... | විසාකාවුන්, විසාකාවන් |
| කර– | විසාකාවන්ගෙන් | ... | විසාකාවුන්ගෙන්, විසාකාවන්ගෙන් |
| සප– | විසාකාවට | ... | විසාකාවුන්ට, විසාකාවන්ට |
| අව– | විසාකාවගෙන් | ... | විසාකාවුන්ගෙන්, විසාකාවන්ගෙන් |
| සබ– | විසාකාවගේ | ... | විසාකාවන්ගේ, විසාකාවුන්ගේ |
| අද– | විසාකාවකෙරෙහි | ... | විසාකාවුන්කෙරෙහි<br>විසාකාවන්කෙරෙහි |
| අල– | විසාකාවෝ | ... | විසාකාවෙනි, විසාකාවුනි |

උමා, සිරිමා, මාතා, යනාදි ශබ්දද මෙසේයි.

* මේ යෙදී තිබෙන—වර—ල—යන ශබ්ද ප්‍රත්‍යය දෙදෙනාම ගෞරව පිනිසද වේ.

† සංස්කෘතභාෂාවේ අක්කා ශබ්දයෙන්ද මැනියන් කියත්.

මියුලැසි-ඉකාරාන්ත-ඉත්ථිලිඞ්ග.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | මියුලැසි | ... | මියුලැසියෝ |
| කම්- | මියුලැස, මියුලැසි | ... | මියුලැසියන්, මියුලැසින් |
| කතු- | මියුලැස, මියුලැසි | ... | මියුලැසියන්, මියුලැසින් |
| කර- | මියුලැසෙන්<br>මියුලැසිගෙන් | ... | මියුලැසින්ගෙන්<br>මියුලැසියන්ගෙන් |
| සප- | මියුලැසට, මියුලැසියට | ... | මියුලැසියන්ට, මියුලැසින්ට |
| අව- | මියුලැසිගෙන්<br>මියුලැසියගෙන් | ... | මියුලැසින්ගෙන්<br>මියුලැසියන්ගෙන් |
| සබ- | මියුලැසගේ<br>මියුලැසියගේ | ... | මියුලැසින්ගේ<br>මියුලැසියන්ගේ |
| අද- | මියුලැස කෙරෙහි | ... | මියුලැසියන් කෙරෙහි<br>මියුලැසින් කෙරෙහි |
| අල- | මියුලැස, මියුලැසිය | ... | මියුලැසියෙනි |

නිලුපුලැසි, දිගැසි, යනාදි ශබ්ද මෙසේයි.

බැමිණී-ඉත්ථිලිඞ්ග-ඊකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | බැමිණී, බැමිණි | ... | බැමිණියෝ |
| කම්- | බැමිණිය, බැමිණි | ... | බැමිණියන් |
| කතු- | බැමිණිය, බැමිණි | ... | බැමිණියන් |
| සප- | බැමිණියට, බැමිණිට | ... | බැමිණියන්ට |
| අව- | බැමිණිගෙන්, බැමිණියගෙන් | | බැමිණියන්ගෙන් |
| සබ- | බැමිණිගේ, බැමිණියගේ | | බැමිණියන්ගේ |
| අද- | බැමිණිය කෙරෙහි<br>බැමිණි කෙරෙහි | ... | බැමිණියන් කෙරෙහි |
| අල- | බැමිණී, බැමිණි | ... | බැමිණියෙනි |

වැඳිරි, මොනරි, කුමරී, වැස්සි යනාදි ශබ්ද බැමිණීශබ්දය මෙනි.

අඹු ශබ්දය ඉත්ථිලිඞ්ග-උකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර- | අඹුව, අඹු | ... | අඹුවෝ |
| කම් | අඹුව, අඹු | ... | අඹුවන් |
| කතු- | අඹුව, අඹු | ... | අඹුවන් |
| සප- | අඹුවට, අඹුට | ... | අඹුවන්ට |
| අව- | අඹුවගෙන්, අඹුගෙන් | ... | අඹුවන්ගෙන් |
| සබ- | අඹුවගේ, අඹුගේ | ... | අඹුවන්ගේ |
| අද- | අඹුව කෙරෙහි, අඹු කෙරෙහි | | අඹුවන් කෙරෙහි |
| අල- | අඹුව, අඹු, අඹුවේ | ... | අඹුවෙනි |

දෙන් ශබ්දය ඉතිරිලිඟු–නකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | දෙන්, දෙන | ... | දෙන්නු |
| කම්– | දෙන්, දෙන | ... | දෙනුන්, දෙන්නුන් |
| කතු– | දෙන්, දෙන | ... | දෙනුන්, දෙන්නුන් |
| සප– | දෙනට | ... | දෙනුන්ට, දෙන්නුන්ට |
| අව– | දෙනගෙන් | ... | දෙනුන්ගෙන්, දෙන්නුන්ගෙන් |
| සබ– | දෙනගේ | ... | දෙනුන්ගේ, දෙන්නුන්ගේ |
| අද– | දෙන කෙරෙහි | ... | දෙනුන්කෙරෙහි<br>දෙන්නුන්කෙරෙහි |
| අල– | දෙන | ... | දෙනුනි, දෙන්නුනි |

ඇඳ ශබ්දය අචෙතන අකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | ඇඳ | ... | ඇඳවල්, ඇඳන් |
| කම්– | ඇඳ | ... | ඇඳවල්, ඇඳන් |
| කර– | ඇඳෙන්, ඇඳින් * | ... | ඇඳවලින්, ඇඳන්වලින් |
| සප– | ඇඳට | ... | ඇඳවලට |
| අව– | ඇඳෙන්, ඇඳින් | ... | ඇඳවලින් |
| සබ– | ඇඳේ | ... | ඇඳවලැ |
| අද– | ඇඳේ, ඇඳෙහි | ... | ඇඳවලැ |
| අල– | ඇඳ | ... | ඇඳවල් |

කඳ ශබ්දයද මෙසේයි.

කට, ගොඩ යනාදීයේ කටන් යනාදිය බහුවචනයෙහි නැති.

මාලිගා ශබ්දය අචෙතන ආකාරාන්තයි.

| | එක. | | බහු. |
|---|---|---|---|
| පෙර– | මාලිගාව | ... | මාලිගා, මාලිගාවල් |
| කම්– | මාලිගාව | ... | මාලිගා, මාලිගාවල් |
| කර– | මාලිගාවෙන් | ... | මාලිගාවලින් |
| සප– | මාලිගාවට | ... | මාලිගාවලට |
| අව– | මාලිගාවෙන් | ... | මාලිගාවලින් |
| සබ– | මාලිගාවෙහි | ... | මාලිගාවලැ |
| අද– | මාලිගාවේ, මාලිගාවෙහි | ... | මාලිගාවලැ |
| අල– | මාලිගාව | ... | මාලිගා, මාලිගාවල් |

අමරා, පෞලා යනාදි ශබ්ද මාලිගා ශබ්දය මෙනි.

* අප්‍රාණි ශබ්දවල කර්තෘවිභක්තියද සම්බන්ධ විභක්තියද අප්‍රකටයි. එසේ නුමුත් ප්‍රාණස්වභාවාරෝපණයකොට කණියන් විසින් කණියාගේ යනාදිත් කියති-සම්බන්ධ විභක්ත්‍යර්ථයට අධාරවිභක්තියම යෙදේ—ඒ මෙසේයි--අතේ ඇඟිල්ල යනාදී වශයෙනි.

තරාදි ශබ්දය අචෙතන ඉකාරාන්තයි.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර- | තරාදිය | තරාදි |
| කම්- | තරාදිය | තරාදි |
| කර- | තරාදියෙන් | තරාදිවලින් |
| සප- | තරාදියට | තරාදිවලට |
| අව- | තරාදියෙන් | තරාදිවලින් |
| සබ- | තරාදියේ | තරාදිවල |
| අද- | තරාදියේ<br>තරාදියෙහි | තරාදිවලෑ |
| අල- | තරාදිය | තරාදි |

ඇතිලි, වට්ටි, පෙට්ටි, විදි, කුරුණෑ, යනාදි ශබ්ද තරාදි ශබ්දමෙනි.

රෙදි ශබ්දය අචෙතන ඉකාරාන්තයි.

| | එක | බහු. |
|---|---|---|
| පෙර- | රෙද්ද | රෙදි |
| කම්- | රෙද්ද | රෙදි |
| කර- | රෙද්දෙන් | රෙදිවලින් |
| සප- | රෙද්දට | රෙදිවලට |
| අව- | රෙද්දෙන් | රෙදිවලින් |
| සබ- | රෙද්දේ | රෙදිවල |
| අද- | රෙද්දේ<br>රෙද්දෙහි | රෙදිවලෑ |
| අල- | රෙද්ද | රෙදි |

කොකි, කැති, බැදි, තැලි, ලෑලි යනාදිශබ්ද රෙදිශබ්දයමෙනි.

කොටු ශබ්දය අචෙතන උකාරාන්තයි.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර- | කොටුව | කොටු |
| කම්- | කොටුව | කොටු |
| කර- | කොටුවෙන් | කොටුවලින් |
| සප- | කොටුවට | කොටුවලට |
| අව- | කොටුවෙන් | කොටුවලින් |
| සබ- | කොටුවේ | කොටුවල |
| අද- | කොටුවේ | කොටුවලෑ |
| අල- | කොටුව | කොටු |

ඔලු, කොප්පු, ගඩු, අටු, පප්පු, තිරු, බඩු යනාදි ශබ්ද කොටු ශබ්දයමෙනි.

දුනු ශබ්දය.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර- | දුන්න | දුනු |
| කම්- | දුන්න | දුනු |
| කර- | දුන්නෙන් | දුනුවලින් |
| සප- | දුන්නට | දුනුවලට |
| අව- | දුන්නෙන් | දුනුවලින් |
| සබ- | දුන්නේ | දුනුවල |
| අද- | දුන්නේ | දුනුවලෑ |
| අල- | දුන්න | දුනු |

අතු, පොලු, මලු, හකු, බඳු, ඔටුනු යනාදි ශබ්ද දුනු ශබ්දයමෙනි.

කඳුශබ්දය අචෙන උකාරාන්තයි:

| | එක. | බහු. |
|---|---|---|
| පෙර- | කන්ද | කඳු |
| කම්- | කන්ද | කඳු |
| කර- | කන්දෙන් | කඳුවලින් |
| සප- | කන්දට | කඳුවලට |
| අව- | කන්දෙන් | කඳුවලින් |
| සබ- | කන්දේ | කඳුවල |
| අද- | කන්දේ | කඳුවලෑ |
| අල- | කන්ද | කඳු |

ඉස් ශබ්දය අචෙතන හලන්තයි.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර- | ඉස | ඉස් |
| කම්- | ඉස | ඉස් |
| කර- | ඉසෙන්, ඉසින් | ඉස්වලින් |
| සප- | ඉසට | ඉස්වලට |
| අව- | ඉසෙන්, ඉසින් | ඉස්වලින් |
| සබ- | ඉසේ | ඉස්වල |
| අද- | ඉසේ, ඉසෙහි | ඉස්වලෑ |
| අල- | ඉස | ඉස් |

ගම්, ගමන්, නැව්, උල්, ලිප්, ගස්, ගල්, කන් යනාදි ශබ්ද ඉස් ශබ්දය මෙනි.

## සර්වනාම ශබ්ද.

ඒ ශබ්දය පුමලිඟු වෙති.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | හේතෙම, හෙතෙම, ඒතෙම, ඌ | ඌලා, ඔව්හු, ඔහු, උහු |
| කම්– | ඌ, උහු, ඔහු | ඌලා, උන්, ඔවුන් |
| කතු– | ඌ, උහු, ඔහු | ඌලා, උන්, ඔවුන් |
| සප– | ඌට, උහුට, ඔහුට | ඌලාට, උන්ට, ඔවුන්ට |
| අව– | ඌගෙන්, උගෙන්, උහුගෙන් | ඌලාගෙන්, උන්ගෙන් / ඔවුන්ගෙන් |
| සබ– | උගේ, ඔහුගේ, උහුගේ | ඌලාගේ, උන්ගේ, ඔවුන්ගේ |
| අද– | ඌකෙරෙහි, උහුකෙරෙහි / ඔහුකෙරෙහි | ඌලාකෙරෙහි, උන්කෙරෙහි, ඔවුන්කෙරෙහි |

ඉතිරිලිඟු. — තශබ්ද.

| | එක. | බහු. | එක. | බහු. |
|---|---|---|---|---|
| පෙර– | ඇ, ඇය | ඔව්හු | තෝ | තොපි, තෙපි, තෙප් |
| කම්– | ඇ, ඇය | උන්, ඔවුන් | තා | තොප |
| කතු– | ඇ, ඇය | උන්, ඔවුන් | තා | තොප |
| සප– | ඇට | උන්ට, ඔවුන්ට, | තට | තොපට |
| අව– | ඇගෙන් / ඇගෙන් | උන්ගෙන් / ඔවුන්ගෙන් | තාගෙන් / තගෙන් | තොපගෙන් / තොපෙන් |
| සබ– | ඇගේ / ඇගේ | උන්ගේ / ඔවුන්ගේ | තගේ / තාගේ | තොපගේ / තොපේ |
| අද– | ඈකෙරෙහි / ඇයකෙරෙහි | උන්කෙරෙහි / ඔවුන්කෙරෙහි | තාකෙරෙහි | තොපකෙරෙහි |

ඉතිරිලිඟු. — මශබ්ද.

| | එක. | බහු. | එක. | බහු. |
|---|---|---|---|---|
| පෙර– | තී | තීලා | මම, මම | අපි, ඇප් |
| කම්– | තී | තීලා | මා | අප |
| කතු– | තී | තීලා | මා | අප |
| සප– | තිට, තිට | තීලාට | මට | අපට |
| අව– | තීගෙන් / තීගෙන් | තීලාගෙන් | මගෙන් / මාගෙන් | අපගෙන් / අපෙන් |
| සබ– | තීගේ / තීගේ | තීලාගේ | මගේ / මාගේ | අපගේ, අපේ |
| අද– | තීකෙරෙහි | තීලාකෙරෙහි | මාකෙරෙහි | අපකෙරෙහි |

අචේතන.

| | එක. | බහු. |
|---|---|---|
| පෙර– | එය | ඒවා |
| කම්– | එය | ඒවා |
| කර– | එයින්, ඉන් | ඒවායින් |
| සප– | එයිට, ඊට | ඒවාට |
| අව– | එයින්, ඉන් | ඒවායින් |
| සබ– | එහි | ඒවායේ |
| අද– | එහි | ඒවායේ, ඒවායෙහි |

මේආදී ක්‍රමයෙන් විබත් වරනැගිලි දතයුතු.

**කියලොත එක අරුත සබඳවැ සදන් නනරුත්**
**එවියු සමස්විදිනම් එහි බේ දූන් පවස්මෝ-a**
**අවියසමස් විබත්සමස් වෙසෙසුන්සමස් අන් අරුත්සමස්**
**ද අරුත්සමස් සි සමස් පස්වැදෑරුම්-b**
**පෙරකඩැ උසුරුවන යව් කු ප න ඈ අවියන්,**
**පරපද සබඳ ලද හොත් අවියසමස් එවියු-c**

---

a ප-නන් අරුත්සදන්, නානාර්ථඇති ශබ්දයන්; සබඳවැ, සම්බන්ධව; එකඅරුත්, එකාර්ථයක්; කියලොත, කියාලූකල්හි; ඒසමස්විදි නම් වියු, ඒ සමාස විධියයි කියූ; එහිබේ, එහි භෙදය; දූන් පවස්මෝ, දූන් ප්‍රකාශකරමු.

b අවියසමස්, අව්‍යය සමාසය; විබත්සමස්, විභක්ති සමාසය; වෙසෙසුන්සමස්, විශෙෂණ සමාසය; අන්අරුත්සමස්, අන්‍යාර්ථසමාසය; දඅරුත් සමස්සි, ද්වන්ද්වාර්ථ සමාසයයි; සමස්, සමාසයතෙම; පස්වැදෑරුම්, පවප්‍රකාරවේ.

**පාණිනීය ව්‍යාකරණයෙහි-"සමර්ථඃ පදවිධිඃ".**

පදවිධිඃ, පදසම්බන්ධිවූ විධියතෙම; සමර්ථඃ, සංසෘෂ්ටාර්ථයි,-හෙවත් සංගතාර්ථයි කියනලදී;

පදසම්බන්ධී යො විධිඃ-ස සමර්ථ පදාශ්‍රිතො වෙදිතව්‍යඃ-පදසම්බන්ධී, පදසම්බන්ධ ඇත්තාවූ; යඃවිධිඃ, යම්විධියක්වේද; සඃ, ෙහතෙම; සමර්ථපදාශ්‍රිතඃ, සංසෘෂ්ටවූ පදාශ්‍රිතයයි; වෙදිතව්‍යඃ, දතයුතුයි.

මෙහි සංසෘෂ්ටාර්ථනම් කලවන්වූ එකට ගැළපුනාවූ යන අර්ථ ඇත්තේයි-ඒ සමාස සඳහා කියනලදී. *

සමාස යන්නේ ධාත්වර්ථ සංක්‍ෂෙපය යනුයි—ඇතම් ආචාර්‍ය්‍යවරයන් විසින්-"සමාසො පදසඞ්ඛෙපො"යි-සමාසයනම් පදසංක්‍ෂෙපයයි කියනලදී-ලුහුඬුවශයෙන් තේරුම්ගතයුතු පදසංක්‍ෂෙපකිරීම සමාසය යනුයි-ඒ පදයන් යහපත් භාවයෙන් යුක්තවනසේ සංක්‍ෂෙපකිරීමයි-රජුගේ පිරිස් යන්න පදසංක්‍ෂෙපකොට "රජපිරිස්"යයි කියත්.

c පෙරකඩැ, පූර්වාංශයෙහි; උසුරුවන, කියනුලබන්නාවූ; යව්කුපන ඈ, යව් කු පන යනමේ ආදිවූ; අවියන්, අව්‍යයශබ්දයන්; පරපද, පරපදයන්හා; සබඳ ලදහොත්, සම්බන්ධය ලදහොත්; ඒ අවියසමස්වියූ, ඒ අව්‍යය සමාසයයි; කීමෝ †

---

* සංස්කෘත මාගධි ව්‍යාකරණ ක්‍රමයෙන්-අවියසමස්-අව්‍යයී භාව සමාසය, විබත්සමස් තත්පුරුෂසමාසය; වෙසෙසුන්සමස්, කර්මධාරය සමාසය; අන්අරුත් සමස්. බහුව්‍රීහිසමාසය; දඅරුත්සමස්, ද්වන්ද්ව සමාසයයි දතයුතු-සංස්කෘතමාගධි ව්‍යාකරණයන්හි ද්විගුසමාසයත් සමග සමාසය ෂට්ප්‍රකාරයි-සිංහලව්‍යාකරණයෙහි වූකලි-ද්විගුසමාසය විශෙෂණ සමාසයටම ඇතුලත්වේ.

† අව්‍යයසමාසයට ලක්‍ෂණනම්-සමාසයේ පූර්වභාගයෙහි කියවෙන යව් කු ප න ආදී නිපාතයන්ද ප ආදි උපසර්ගද පරවූ පදයන් සමග සම්බන්ධවීමයි, යව් දිව් යන්නෙහි-යව් යන නිපාතය දිව් ශබ්දයට පූර්වභාගයෙහි යෙදී ඒ හා සම්බන්ධවූ හෙයින් අව්‍යය සමාසයි.

"සක්කැබිලි සිංයොඅගිනි එක්පසක් යව්දිව" ඈගි දිවහිමි
යව්දිව, a
යව්අමත් බමණන් අමත,
"තුනුහොලවටහල යතලබ සංතොස්සිග්හල" ඈගි යම්යම්
ලබ=යතලබ විදිය නො ඉක්ම=යතවිදි, පැසුලුබල=අනුබල.
මේ ඈ යව් ඈ සමස්නම්-b
ගැරහුම්ලද පුරිස්=කුපුරිස්.
නිඳිලදලද=දුලද. මනා ගඳ=සුවඳ. මේ ඈ කු ඈ සමස්නම්.c

a ප—"සක්කැබිලිසිංයොඅගිනි එක්පසක් යව්දිව්" ඈගි, මේ ආදි අසක්දෘකව්හි; දිව්හිමි, ජීවිතසීමාව දක්වා යන අර්ථයෙහි; යව්දිව්, යව් දිව් යනුවේ.

b ප—යව් අමත්, අමත්‍රප්‍රමාණයෙන්; බමණන්, බ්‍රාහමණයන්; අමත, කැඳව—"තුණුහොල වටහල යතලබ සංතොස්සිග්හල" ඈගි, මේ ආදි අසක්දෘකව්හි—යම් යම් ලබ, යම් යම් ලාභයෙක යන අර්ථයෙහි; යතලබ, යතලබ යනුවේ—විදියනොසික්ම, විධානය නො ඉක්ම, යන අර්ථයෙහි; යතවිදි යතවිදි නම්වේ—පැසුලුබල. පශ්චාත් බලය; අනුබල, අනුබලනම්වේ—මේ ඈ, මේ ආදිය; යව්ඈසමස්නම්, යවාදි සමාස නම්වේ. *

c ප—ගැරහුම්ලද, ගර්හාලද්දාවූ; පුරිස්, පුරුෂතෙම; කුපුරිස්, කුපුරිස්නම්වේ—නිඳිලද, නිද්‍රාලද්දාවූ; ලද, ලබ්ධිතොමෝ; දුලද, එනම්වේ—මනාගඳ, යහපත්වූ ගන්ධය; සුවඳ, ඒනම්වෙ—මේ ඈ, මේ ආදිය; කු ඈ සමස්නම්, කු ආදි සමාසනම්වේ.

සංස්කෘත—යාවජ්ජීවම්—පාලි—යාවජීවං—අව්‍යය සමාසය නිත්‍යසමාස යසි—එහෙයින් දිව්හිමි කියා අන්‍යපදයන්ගේ වාක්‍යය යොදා කියන ලදි—යම් පමණ හිම්ද යන අර්ථයෙහි යව් යන නිපාතය යොදා—පර භාගයෙහි ද්විශබ්දය යොදා කරණලද සමාසයසි—සක්කැබිලි යනාදිය අසක්දෘකව්හි පද්‍යයකින් ගෙණ දක්වනලදි.

* භාජන ප්‍රමාණයෙන් බ්‍රාහ්මණයන් ආමන්ත්‍රණය කරව—යන මෙහි යව් නිපාතය පූර්වවූ අමත්ශබ්දය පරපදය සමගවූ සමාසයයි, මේත් නිත්‍යසමාස හෙයින් අමතපමණින් කිසා අන්‍යවූ වාක්‍යයකින් සමාසාර්ථය දක්වියයුතුයි-අමත්‍රශබ්දයෙන් බ්‍රාහ්මණයන්ගේ භෝජනපාත්‍ර කියනලදී-මේ සමාසශබ්දය කෙරෙන්ද විභක්තිප්‍රත්‍යය ලොප්වේ—යතලබ යනුද, නිත්‍යසමාසයයි. එත කුදුවූවත් ඒ ශබ්දයන් පරව කරණ අවදී විබත්පස යෙදීමෙන් විභක්තිස්වරූප ගන්නාහෙයින්—යතලබින් යනාදියවේ-යතවිදි ශබ්දයද එසේයි, මේ යව් ආදි නිපාත පූර්වවූ අව්‍යය සමාස ක්‍රියාවිශේෂණ වශයෙන් යෙදේ, එහෙයින් ඒ යව් ආදි සමාස ගණය වෙන්කරණලදී.

**උකටින් හොබනේ=පබ. වෙනැවන=උපවන. මේඈ පඈ සමස්නම්-a**
**සුර නොවන්නේ=අසුර. නොදෙනලද්දේ=අසින්. කුසල් නොවන්නේ=අකුසල්. මේ ඈ න අරුත්හි කෙළෙන් න අරුත්සමස්නම්-b**
**මෙහි පෙරකුරු පණකුරුවුව ඔහුවෙත න අගම් "එකෙක් නොවන්නේ=අනේ. අදර නොවන්නේ=අනදර. මේ ඈ විම සනු"**

ඉති අව්‍ය සමස්.

---

සත්කැබලිසියෝ, සඩ්ඩඛණ්ඩනම් කුෂඨය සහිතවූ; අඟින්, ශරීර යෙන්; එක්පසක්, එකපාර්ශ්වයක්; යව්දිව්, ජීවිතාන්තය දක්වා—යන අර්ථ හැගේ—තුනුහොලවට, ශරීරදුඃඛයාගේ ප්‍රවෘත්තිය; හළ, හැරියේය; යතලබ, යථාලාභයෙන්; සතොස්සිත්, සන්තොෂචිත්තය; හළ, හැරියේසි–සංස්කෘතාදියෙහි–යාවජ්ජීවං යනාදියකොරෙත් විභක්ති ලොප්වීමෙන් අන්‍යවිභක්ති ස්වරූපයක් නොගත්තාසේම මෙහිදු දිවිහිම්යනු නැවත අන්‍යවිභක්ති රූපයක් නොගණී—දිව්හිම් යන්නෙන් පරවූ විබත් ලොප්වේ–එබැවින් යව්දිවින් යව්දිවට යනාදියක් යෙදුව හොත් වරදයි—මේ අව්‍යමානවිධියයි දතයුතු.

ගැරහුම්ලද පුරිස් යනතන්හි–කුයන නිපාතයේ අර්ථ ගැරහුම් ලද යන්නෙන් කියනලදි–කුත්සිත පුරුෂයි, දුයන්නේ අර්ථ නිදිලද යන්නෙන් කියනලදි—දුලද, දුලීබිධිය දෙහෝ නොහොත් නපුරු ඇඳහිමයි–මනා යන්නෙන් සු යන උපසර්ගයේ අර්ථය කියනලදි–මේ කුපුරිස් ආදි ගණය නාමශබ්ද වශයෙන් පවති-පාලි ආදියෙහි කර්මධාරයවේ.

a ප–උකටින්, උත්කෘෂ්ටත්‍වෙන්; හොබනේ, ශොභමානවන්නේ; පබ, පබනම් වේ; වෙනැවන, සමීපයෙහි වනය; උපවන, උපවන නම්වේ–මේ ඈ, මේ ආදිය; පඈ සමස්නම්—පාදිසමාස නම්වේ.

b ප–සුර නොවන්නේ, දෙවිනොවන්නේ; අසුර, අසුර නම්වේ; නොදෙනලද්දේ, දානය නොකරණලද්දේ; අසින්, අසින් නම්වේ; කුසල්නොවන්නේ, කුශලය නොවන්නේ; අකුසල්, එනම්වේ–මේඈ, මේ ආදිය; න අරුත්හි කෙළෙන්, නකාරාර්ථයෙහි කළහෙයින්; න අරුත් සමස්නම්, නකාරාර්ථ සමාසනම්වේ.

මෙහි, මේ නකාරාර්ථ සමාසයෙහි; පෙරකුරු, පූර්වාක්ෂරය; පණකුරුවුව, ප්‍රාණාක්ෂරයක්වූ කල්හි; ඔහුවෙත, ඒ ප්‍රාණාක්ෂරය සමීපයෙහි; න අගම්, නකාරයක් ආගමවේ.

**පෙරපසු විබත්හැර සෙසුසන් විබත් අත්පද**
**පරපද හා සමස් වන එ විබත් සමස් නම්වේ-a**
**ගතකරනුයේ-ගත්කරු, කිවි. කිඩිකරනුයේ-කිඩිසර. ඉඳු**
**රුඳලි. මියපල්ණේ-මිපල්, කැත්. මිබොනුයේ-මිපා, සපු.**
**පනබොනුයේ-පිනිපා, කිටි, නිස කරනුයේ-නිසයුරු, සඳ.**
**කිරඅවුරනුයේ-කිරවරණ, සත්, මේ ඈ නම්විබත් සමස්-b**

එකෙක් නොවන්නේ, එකක් නොවන්නේම; අනේ, අනේනම්වේ; අදර නොවන්නේ, ආදරය නොවන්නේ; අනදර, අනදර නම්වේ;* මේඈ, මේ ආදිය; ඒමසනු, පරීක්ෂාකරණුලැබේවා !

**අව්‍යය සමාසය මෙසේයි.**

a ප-පෙරපසු විබත්හැර, ප්‍රථමා විභක්ති ආලපන විභක්ති හැර; සෙසු, අවශෙෂවූ; සත්විබත් අත්පද, සප්තවිභක්ත්‍යර්ථ පදයන්; පර පදහා, පරපදයන් සමග; සමස්වන, සමාසවූ කල්හි; එවිබත් සමස් නම්වේ, ඒ විභක්ති සමාසනම්වේ.

**උදාහරණ.**

b ප-ගතකරණුයේ, ග්‍රන්ථයකරණ පුරුෂතෙම; ගත්කරු, එනම් වේ; කිවි, කිවිසි; කිඩිකරණුයේ, ක්‍රීඩාකරණ පුරුෂතෙම; කිඩියර, එනම්වේ; ඉඳුරුඳලි, ඉන්ද්‍රජාලිකයි-මිය පල්ණේ, පෘථිවිය පාලනය කරන්නේ; මිපල්, එනම්වේ; කැත්, ක්ෂත්‍රියයි; මිබොනුයේ, මධුව පානයකරන්නේ; මිපා, එනම්වේ; සපු, ෂට්පාදයායි (මීමැස්සායි;) පන

* පුරනොවන්නේ යන තන්හි, පුරශබ්දයද; නොවන අර්ථයෙහි හෙවත් ප්‍රතිෂෙධාර්ථයෙහි-න යන නිපාතයද යොදා විභක්ති ලොප්කොට, නයන් තට අකාරය ආදෙශකළකල්හි; අපුරයිවේ-අයින් යන සමාසය වනකලැ, දෙනලද යන අර්ථයෙහි දින්නශබ්දය ප්‍රතිෂෙධාර්ථයෙහි න යන නිපාතයද යොදා විභක්ති ලොප්කොට නකාරයට අකාරයද, ආදෙශකළකල්හි අයින් යනුවේ-අනේ යන තන්හි, ඒකශබ්දයේ අන්ත්‍යාක්ෂරය ලොප්කොට එකාර්ථයෙහි ඒ ශබ්දයද, න යන නිපාතශබ්දයද සමාසකොට-ඒ යන ප්‍රාණාක්ෂරය පරහෙයින්, න යන නිපාතයට අකාරාදෙශය හා ඒ අකාරය සමීපයෙහි නයන්නක් ආගමයි-මේ නකාරාර්ථ සමාසය-තදන්‍ය, තත්සදෘශ, තද්විරුද්ධ, තදභාවයයි චතුර්විධවේ-මෙහි අයින් යනු දෙනලදදෙන් අන්‍ය හෙයින් තදන්‍යයි, අපමණ යනාදියත් එසේයි-අපුර යනු දෙවියන් සමාන ස්වජාතියක් කියනහෙයින් තත් සදෘශයි-අකුසල් යනු කුසලට විරුද්ධහෙයින් තද්විරුද්ධයි, අනිස යනාදියත් එසේමයි, මාගධසංස්කෘත භාෂාවල, අකාලො යනාදිය තදභාව සමාසයි ඒත් සමග මේ නකාරාර්ථසමාසය සතරවැදෑරුම්වේ-සිංහල භාෂාවෙහි, නොකොට, නොගොස්, යනාදියේ නකාරයට අකාරාදෙශව "අකොට" යනාදියක් නොවන බැවින් ඒ තදභාවය සමාසයට නොනැගේ—නුමුත් අනාත්මය යන අර්ථයෙහි අනත්යනු මෙහි තදභාවයයි සැගේ-තවද මේ සමාසය ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධ පර්‍යුදාශ ප්‍රතිෂෙධවශයෙන් දෙයාකාරයි, ඊයින් ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධය වස්තුහුගේ අභාවය ප්‍රකාශකෙරේ-ඒ තදභාවයයි පර්‍යුදාශ ප්‍රතිෂෙධය වස්තුහුගේ අන්‍යාවෘත්තියවේ-ඒ තදන්‍යාදි තුන්අකාරයි-අව්‍යය යනු විභක්ති ක්‍රමයෙන් වර නගනු නොලබන නිපාතොපසර්ගයි-ඒ සමග නාමයන් සමාසවූ හෙයින් මේ "යවදිව" යනාදිය අව්‍යය සමාසනම්වේ.

**පරාවිසින් පුටුයේ=පරපුටු, සමත්-යදිහෝ, බඹහුවිසින් දෙනලද්දේ=බඹදත්, සිවුරු, දෙවිහුවිසින් දෙනලද්දේ=දෙව්දත්, බොජුන්, මේඇ කතු විබත් සමස්-a**

බොනුයේ-නැවත පානය කරන්නේ; පිනිපා, එනම් වේ; කිරි, හැකි යායි. හිර අවුරණුයේ, සූර්‍ය්‍යයාවසන්නේ; හිරවරණ, එනම්වේ; සත්, ඡත්‍රයයි. මේ ඈ, මේ ආදිය; කම්විබත් සමස්, කර්‍මවිභක්ති සමාස නම්වේ.*

a ප-පරාවිසින්, අන්‍යයාවිසින්; පුටුයේ, පෝෂණය කරණලද්දේ; පරපුටු, එනම් වේ; සමත්, කොකිලපක්‍ෂියායි; යදිහෝ, යාචකයා හෝ වේ; බඹහුවිසින්, බ්‍රහ්මයාවිසින්; දෙනලද්දේ, දානයකරණලද්දේ; බඹදත්, එනම්වේ; සිවුරු, චීවරයි; දෙව්හුවිසින්, දෙවයාවිසින්; දෙනලද්දේ, දානයකරණලද්දේ; දෙව්දත්, එනම්වේ; බොජුන්, භෝජනයයි; මේඈ, මේ ආදිය; කතුවිබත්සමස්, කර්තෘවිභක්ති සමාසයි †

* විභක්ති සමාස නම් කර්‍මාදිවිභක්ති පිළිවෙළින් විභක්ති සංක්‍ෂෙපකිරීමයි-ප්‍රථමාවිභක්ති ආලපනවිභක්ති දෙකින් විභක්තිසමාසය නොවේ—ගත්කරු යන සමාසය මෙසේ දතයුතු, කරු යනු ප්‍රත්‍යයාර්ථ ශබ්දයෙකි, ඒ කරයන ධාතුව කෙරෙන් කරනුයේ යන අර්ථයෙහි, උ ප්‍රත්‍යය යෙදීමෙන් සිඬයි—ගත් ශබ්දයා කෙරෙන් කර්මවිභක්ති ඒකවචන අ විභක්තිය යෙදූකලැ ගත යනුවේ; කරනුයෙ යන අර්ථයෙහි, කරු යනුවේ-මෙයින් ගතයන්නේ, විභක්තිය ලොප් කලකල්හි, ගත්ශබ්දය ශේෂවේ-එකල ගත්කරු යනුවේ, කම්කරු සිත්කරු යනාදි ශබ්දයෝද මෙසේයි-කිඹිසර යනාදී සමාසද මෙසේ දතයුතු.

† "පරපුටු" යන සමාසය මෙසේවේ-පෝෂණයකරණලද යන අර්ථයෙහි පුස යන ධාතුවෙන් 'පුටු'යන ප්‍රත්‍යයාර්ථශබ්දයවේ-පුටුගේ-යනු ප්‍රථමා ඒකවචන යෙහි රූපවිශෙෂයෙකි. එය අර්ථක්‍රියාශබ්දයක්ව පවති. 'පුටු' යනුදු ප්‍රකෘති යෙන් ප්‍රථමාඒකවචනයි, පරායනු පරශබ්දයෙන් ආ විභක්තිලත් කර්තෘ ඒක වචනයි, විසින් යනු එම අර්ථය ව්‍යක්තකරණ පිණිස විභක්තියෙන් පරව යො දනලද නිපාතනයි, පරශබ්දයෙන් පරකොට යෙදූ විභක්තිය හා නිපාතනය ද ලොප්කොට පුටු යන ප්‍රත්‍යයාර්ථනාමය යුක්තකලකල්හි "පරපුටු" ශබ්දය වේ, පරපුටු යනු කවුඩා විසින් පෝෂණයකරණලද හෙයින් කොවුලාට නම් වේ, ත්‍යාගියෙක් විසින් පෝෂණයකල හෙයින් යාචකයාටද නම්වේ, මෙසේ සෙස්සද දතයුතු.

† බොධිසත්වයන් අභිනිෂ්ක්‍රමණයකොට මහණවන කාලයෙහි බ්‍රහ්මයා විසින් දුන් සිවුරු බඹදත් සිවුරුයයි කියහැකිවේ. බඹදත් යන්න යමෙකුට නම් වශයෙන්ද යෙදේ, ඒ බ්‍රහ්මදත්තරාජ යනාදි තන්හිවේ-දෙවියන් විසින් සර්‍වඥයන්වහන්සේට දුන් දිව්‍යභොජනයක් කියනලද භොජනශබ්දයට විශෙෂණකොට දෙව්දත්යයි කියනුලැබේ. දෙවියන් විසින් දෙනලද්දේය යන අර්ථ යුක්තකොට යමෙකුට දෙව්දත්යයි නමක්ද කරනුලැබේ. සුරිඳු විසින් දුන්නේ සුරිඳු දුන් යනාදියද කර්තෘවිභක්ති සමාසයි.

**බමර කරණෙන් උදුලේ=බමරුදුල, හැති. අත්කරණෙන් වන කම්=අත්කම්. බාකරණෙන් සුරුවූයේ=බාසුරු, කෙසර. කැසින්බෙනූයේ=කැසුබු, දියෙන් හැනූබත්=දිබත්. කිරින්පිසූ බත්=කිරිබත්. මේ ඈ කරණවිබත් සමස්–a**

**බමුණන්ට දියයුතුදන්=බමුණුදන්, සිවුරුපිණිස පිරිනැමු පිළි=සිවුරුපිළි, මේ ඈ සපදන් විබත් සමස්–b**

**සොරුගෙන් බිය=සොරබිය, මිණීසෙන් මුතු=මිණිමුතු. රගු කෙරෙන් මුත්=රගුමුත්. මේ ඈ අවදි විබත් සමස්–c**

---

a ප–බමරකරණෙන්, භ්‍රමරයන් කරණකොට; උදුලේ, උජ්ජ්වලි තවූයේ; බමරුදුල, ඒනම්වේ; හැති, සතවකයයි; (මල්පොකුරයි) බා කරණෙන්, බාහුකරණකොට; සුරුවූයේ, සූරවූ සත්වතෙම; බාසුරු, එනම්වේ; කෙසර, සිංහයායි; කැසින්, කවජයෙන්; බෙනූයේ, පාතය කරණ සත්වතෙම; කැසුබු, එනම්වේ; දියෙන්හැනූ, දධියෙන් (දීකිරෙන්) හනනලද; බත්, බත; දිබත්, එනම්වේ; කිරින්පිසූ, ක්ෂීරයෙන් පිසනලද; බත්, භත්තය; කිරිබත්, එනම්වේ; මේඈ, මේ ආදිය; කරණවිබත් සමස්, කරණවිභක්ති සමාසයි.*

b ප–බමුණන්ට දියයුතු, බ්‍රාහ්මණයන්ට දානයකටයුතුවූ; දන්, දානය; බමුණුදන්, බමුණුදන්නම්වේ; සිවුරුපිණිස පිරිනැමූපිළි, චීවරප්‍රණීය පරිණාමිතවස්ත්‍ර; සිවුරුපිළි, සිවුරුපිළි නම්වේ; මේ ඈ, මේ ආදිය; සපදන් විබත් සමස්, සම්ප්‍රදාන විභක්ති සමාසයි. †

මෙහි බමුණන්ට යනතැනද සිවුරුපිණිස යනතැනද සම්ප්‍රදාන බහුවචනලොපයි–දියයුතු පිරිනැමූ යන අර්ථයන් සමාසයෙන් හැඟෙන හෙයින් ඒ අප්‍රයොග කරණලද්.

c ප–සොරුගෙන් බිය, සොරාගෙන්වූ භීතිය; සොරබිය, සොරබිය නම්; මිණියෙන්මුතු, බන්ධනයෙන් මුක්තවූයේ; මිණිමුතු, මිණිමුතු

---

* බමරකරණෙන් යන තන්හි බමරෙන් කියනු අව්‍යවහාර හෙයින් කරණ ශබ්දය යොදා කරණවිභක්තිය දක්වනලදී.

අත්කරණෙන් යනාදියද එසේමයි. අත්කම් යන තන්හි පූර්වරූපසන්ධියද පෙණේ. දියෙන් යන තන්හි දි ශබ්දයා කෙරෙන් එන් විභක්තිය හා යකාර ගමයි. ඒ ලොප්කොට සමාසකරණලදී. දිබත් යන සමාසයෙන් පිසනලද යන පක්වාර්ථය හැඟෙනහෙයින් පිසූ යනු ලොප්කරණුලැබේ. මෙනයින් සෙස්සද දතයුතු.

† බමුනුදන් කි පමණින් බ්‍රාහ්මණදානයයි හැඟේ. එසේ ඒ බ්‍රාහ්මණයන් ගේ දානයක් නොව බ්‍රාහ්මණයන් දන්ලබන අය හෙයින් ඔවුන්ට දියයුතු දානයයි හැඟේ. එය ගම්‍යවන පිණිස වාක්‍යයෙහි යොදනලද දියයුතු යන පදය උක්තාර්ථයන්ගේ අප්‍රයොගත්‍ය දක්තිහෙයින් සදරුත් යනාදි සූත්‍රයෙන් ලොප්වේ; සිවුරුපිණිස පිරිනැමු පිළි යන වාක්‍යයෙහි පිරිනැමු යනුද එසේමයි.

**රජුගේ පිරිස්=රජපිරිස්. බුදුන්ගේ ගුණ=බුදුගුණ. රියගේ හිමි=රියහිමි. සුරනට සතුරු=සුරසතුරු. මෙඇ සබඳවිබත් සමස්—a**

**උරෙහිඳු=උරදු දහම්හි සොඬ=දහම්සොඬ. නෙරළුයේතෙල්= නැලිතෙල්. තැඹිලියේ තෙල්=තැලිතෙල්. සරාකල්හිසඳ= සරාසඳ. මෙඇ අදරවිබත් සමස්-b**

---

නම්වේ; රහුකෙරෙන්මුත්, රාහුගෙන් මුක්තවූයේ; රහුමුත්, රහුමුත් නම්වේ; මෙඇ, මේආදිය; අවදි විබත් සමස්, අවධිවිභක්ති සමාස නම්වේ.

සොරුගෙන් යනතන්හි සොරශබ්දයා කෙරෙන් "පද අත් පැමැත් මට හිම්වූයේ" යනාදි සූත්‍රයෙන් කරණලද උගෙන් විභක්තියද මිණි යෙන් යනතන්හි මිණිශබ්දයා කෙරෙන් එසේමවූ එන් විභක්තියද රහු ශබ්දයාකෙරෙන් කරණලද සම්පාප්ති කර ශබ්දයාකෙරෙන්වූ එන්විභක්තියද කරශබ්දයන් සමගද ලොප්කරණලදි *

a ප-රජුගේ පිරිස්, රජහුගේ පිරිස; රජපිරිස්, එනම්වේ; බුදුන්ගේ ගුණ, සර්වඥයන්ගේ ගුණයතෙම; බුදුගුණ, එනම්වේ; රියගේ හිමි, රතියගේ ස්වාමිතෙම; රියහිමි, එනම්වේ; සුරනට සතුරු, දෙවතා වන්ගේ ශත්‍රුතෙම; සුරසතුරු, එනම්වේ; මෙඇ, මේආදිය; සබඳ විබත් සමස්, සම්බන්ධවිභක්ති සමාසයි.†

b ප-උරෙහිඳු, උරස්හි (ලයෙහි) ජාතවූයේ; උරදු, එනම්වේ; දහම්හි සොඬ, ධර්මයෙහි ලොල්වූයේ-දහම්සොඬ, එනම්වේ; නෙරළු යේ තෙල්, නාලිකේරයෙහි (පොලේ) තෛලය; නැළිතෙල්, එනම් වේ; තැඹිලියේ තෙල්, සත්තිරයෙහි (තැඹිලිගෙඩියේ) තෛලය; තැලිතෙල්, එනම්වේ ‡

---

* මිණියෙන් යනතන්හි, මිණිශබ්දයෙන් බන්ධනය කියනලදි, එහෙයින් මල් කැකුලෙහි තිබෙන බන්ධනයයි මුතුශබ්දයෙන් විකසිතවූ යන අර්ථය හැගේ, ඒ "මිණිමුතුකුසුම්" යනාදී තන්හිවේ. මිණිද මුතුද මිණිමුතු කියා ද්වන්ද්ව සමාසයවූ කලැ, මිණිමුතු ශබ්දයෙන් මණිමුක්තා කියනුලැබේ.

† සුරනට, යන තන්හි නට විබත් සම්බන්ධාර්ථයි,

‡ නැළිතෙල්, තැලිතෙල් යන දෙතන්හි, නෙරළු තැඹිලි ශබ්ද දෙකට නැළිතැලි, යන ආදෙශ සදරුත් ආදි අඩගසූත්‍රයෙන් සිඩයි. නෙරළුතෙල් තැඹිලිතෙල් කියාම ඇතම් පොත්වල පෙණේන හෙයින් ඒ තන්හි අමුතු ආදෙශ ඒ ශබ්දයන්ට නොකොට-විභක්ති ලොප්කොට සමාසකලබැව් දතයුතු.

**අතෑ වසනුයේ=අතෑවැසි. මේඇඟි විබත් නොලොපා නිපද වනු-a**

ඉති විබත් සමස්.

---

**විදෑවතින් තොර සියදෑවතට සමවත.**
**වෙසෙසා සබද සදවත වෙසෙසුන් සමස් එවිශු-b**
**නිල්වූයේද එම උපුල්වූයේද=නිලුපුල්. හෙලිලිවින් ඔම අඹුවින් =හෙලිල්ලඹු. (සිහ එව් සිහ) නරවුයේද එම සිහවූයේද=නරසි.**

---

a සරාකල්හිසඳ, ශරත්කාලයෙහි චන්ද්‍රතෙම; සරාසඳ, එනම්වේ; මේඇ, මේආදිය; අදරවිබත් සමස්, ආධාරවිභක්ති සමාසනම්වේ; අතැවසනුයේ, සම්පයෙහි වාසයකරන්නේ; අතැවැසි, එනම්වේ; මේඇහි, මේආදියෙහි; විබත්නොලොපා, විභක්ති ලොප්නොකොට; නිපදවනු, නිපදවීම කරණු.

**විබත්සමස්, විභක්තිසමාසය; ඉති, මෙසේයි.**

---

විශෙෂණ සමාසයේ ආකාර.

b ප-**විදෑවතින්**, විජාතිය වස්තුවෙන්; **තොර**, වෙන්වූ; **සියදෑවතට**, ස්වජාතිය වස්තුවට; **සමවත**, සමානවූ වස්තුව; **වෙසෙසා**, විශෙෂණ කොට; **සද**, ශබ්දය; **සබඳවත**, සම්බන්ධවනකල්හි; **එ වෙසෙසුන් සමස්විශු**, ඒ විශෙෂණ සමාසයයි කීහු.

එක්ප්‍රකාරයක්-මෙහි විජාතිය වස්තුයයි කියනලද්දේ භිනනාධිකරණ විශෙෂණයයි ස්වජාතිය වස්තුනම් සමානාධිකරණ විශෙෂණයයි රජුගේ උපුල් කිවහොත් උපුල්යන්නට රජුගේ යනු විශෙෂණයයි එසේත් විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනා එක් වස්තුවෙහි නොපිහිටි හෙයින් රජුගේ යනු විජාතියයි විශෙෂණ සමාසනොවේ, නිල් උපුල් යනතන්හි නිල්වූයේත් උත්පලයම හෙයින් විශෙෂණ විශෙෂ්‍ය දෙකේම අර්ථ එක්තන්හි පවති-එබැවින් නිල් යනු උපුල් යන්නට සමානාධිකරණ විශෙෂණයයි—එහෙයින් නිල්ශබ්දය විශෙෂණකොට උපුල් ශබ්දය සමග සමාසකරණුලැබේ.

c ප-**නිල්වූයේද එම**; නීලවර්ණවූයේත් එමය; **උපුල්වූයේද**, උත්පලවූයේත් එමය; (යන අර්ථයෙහි) **නිලුපුල්**, එනම්වේ; **හෙලිලිවින් ඔම**, ගෞරවර්ණ ඇත්තීත් ඕතොමෝය; **අඹුවින්**, අම්බිකාවිත් ඕතොමෝය; (යන අර්ථයෙහි) **හෙලිල්ලඹු**, එනම්වේ;

නිලුපුල් යනතන්හි විශෙෂණ විශෙෂ්‍ය දෙකම පුල්ලිඞ්ගයි*

හෙලිල්ලඹු යනතන්හි ස්ත්‍රීලිඞ්ගයි මේදෙකම විශෙෂණ පූර්වපදයි—විශෙෂණ විශෙෂ්‍ය දෙක්හිම විබත් ලොප්ව සමාසවේ මේ සමාසය පෙරවිබතින්ම වේ.

---

* මාගධ-නීලුප්පලං යන්නෙහිද, සංස්කෘත නීලොත්පලම් යන්නෙහිද විශෙෂණ විශෙෂ්‍ය දෙක්හිම නපුංසක ලිඞ්ගයි, ඒ භාෂාගත නපුංසකලිඞ්ගය මේ සිංහල භාෂාවෙහි පුල්ලිඞ්ගයසේ ව්‍යවහාරකරනුලැබේ.

**ලියඑව් කොමල ලිය කොමල**
**(සරාඑව්සරා) සරණම සරා සරණසරා—a**

**එකද එම විරුද-එකවිරු, ලෙව්හු දෙදෙනෙක් එක්කොටසල කනලදහු=දෙලෝනම්, තෙසරණ, සිවුසයුරු, පස්මහගඟ, සරස, සත්කුලපව්, අටනාකුල, නවදොර, දසරජදම්, ඈමෙමැගි b**

ඉති වෙසෙසුන් සමස්.

---

ප-සිහඑව්, සිංහයෙකු වැනිවූයේ; සිහ,(උපමෙයොපචාර වශයෙන්) සිහනම්වේ-නරවූයේද එම, මනුෂ්‍යයෙක්වූයේත් එතෙමේමය; සිහ වූයේද, සිංහසමවූයේත් ඒතෙමේමතුයි, නරසි-එනම්වේ, (මේ උපමානුත්තර පදසමාසයි-මෙහි සිහයන උපමානයට නරයනු විශෙෂ්‍යයි-මේ සමාසයෙහි එය පූර්වවේ.)

a ප-ලියඑව්, ලතාවක්මෙන්; කොමල, මොලොක්වූවා; ලියකොමල, එනම්වේ-(මේ උපමාන පූර්වපදයි) සරාඑව්, පද්මයක් වැනිවූයේ; සරා, එනම්වේ; සරණම, පාදයම; සරා, පද්මයක්මෙන් වූයේ; සරණසරා, එනම්වේ-(උපමානොත්තරයි).

b ප-එකදඑම, එකසඞ්ඛ්‍යා ඇත්තේත් ඒමය; විරුද, වීරවූයේත් එමතුයි, එකවිරු, එනම්වේ—(මේ සඞ්ඛ්‍යාවාචි විශෙෂණ පූර්වපදයි) ලෙව්හු දෙදෙනෙක්, ලොකයෝ දෙදෙනෙක්; එක්කොට සලකණලදහු, එක්කොට චින්තනයකරණලදහු; දෙලෝනම්, දෙලෝනම්වේ; (මේ දෙලෝ තෙසරණ යනාදිය මාගධ සංස්කෘත ව්‍යාකරණ ක්‍රමයෙන් ද්විගුසමාසයි-සමාසවූකල එකවචනවේ).

ප-තෙසරණ, ශරණත්‍රය; සිවුසයුරු, චතුස්සාගරය, පස්මහගඟ, පචමහාගඞ්ගාය; සරස, ෂඩ්රසය; සත්කුලපව්, සප්තකුලපර්වතය; අටනාකුල, අෂ්ටනාගකුලය; නවදොර, නවචාරය; දසරජදම්, දශරාජධර්මය; ඈ, යනාදිය; මෙමැගි, මෙම ආකාර ඇත්තේයි. *

මේ විශෙෂණ සමාසයි.

---

* මෙහි සමාසවාක්‍යයොජනා මෙසේයි, සරණ තුණක් එක්කොට සලකනලදහු තෙසරණනම්, සයුරු සතරක් එක්කොට සලකනලදහු, සිව්සයුරු නම්, සතරසයුරුනම් හෝ වේ, මහගං පසක් එක්කොට සලකනලදහු—පස්මහගඟ, රස සයක් එක්කොට සලකනලදහු සරස යනාදින් දතයුතු—මෙහි එක්කොට සැලකීමනම් එකට කියනු කැමැත්තයි, එසේහෙයින් එකවචනද වේ. එහෙයින් දෙලොව—තෙසරණ—සිවුසයුර පස්මහගඟ—යනාදින් එකවචනමුත් දෙලෝහු තෙසරණහු—යනාදින් බහුවචන නොයොදත්.

මේ දක්වූ විශෙෂණ සමාසයෙහි දෙලෝ තෙසරණ සිවුසයුරු යනාදියෙහි ලෙව්හු දෙදෙනෙක් සරණ තුණක් සයුරු සතරක් යනාදිය එක්කොට සලකනලදහු යන්න ගා යෙදූකල ලෙව්හු යනුද දෙදෙනෙක් යනුද විශෙෂණ

## අන්‍යාර්ථසමාසය.

**කියලොත අන්අරුත් පදනත් අනේ වැසියෝ,**
**එසමස් අන්අරුත්නම් එහිබේ සත්විබත්වේ-ෲ**

ඝ ප—අනත් අනේපද, අන්‍යාර්ථවූ අනෙකපදයන්; සියොවැ, සඩහනව; අන්අරුත්, අන්‍යාර්ථයක්; කියොලත, ප්‍රකාශකරණකල්හි; එසමස්, ඒ සමාසය; අන්අරුත්නම්, අන්‍යාර්ථනම්වේ; එහිබේ, එහිලාවන ප්‍රභෙදය; සත්විබත්වේ, සප්තවිභක්තියෙහිවේ.

විශෙෂ්‍යවේ, එසේකල්හි දෙදෙනෙක් යනු ලෙව්හු යන්නට විශෙෂණව පෙනේ. තුණක් යනුද සරණ යන්නට විශෙෂණව පෙනේ. හෙද සමානාධිකරණ විශෙෂණ විශෙෂ්‍යයයි සිව්සැරුරු යනාදියද එසේමය, එහෙයින් සමානාධිකරණ විශෙෂණ විශෙෂ්‍යයන්ගේම මුත් අන්‍යවූවන්ගේ විශෙෂණ සමාසයක් නොපෙනේ—වෙන් වෙන්ව පැවැත්ම නිමිත්තකොට ඇති ශබ්දයෝ එක් වස්තුවෙක්හි පවත්නෝනම් ඒ සමානාධිකරණයයි කියනලදී.

විජාතීය වස්තුවෙන් තොරවූ සජාතීය වස්තුවට සමාන වස්තුව සමාන කොට ශබ්ද සම්බන්ධවූකල ඒ විශෙෂණ සමාසයයි කීකල්හි එයින් සමානාධිකරණ ශබ්දජාතීන්ගේ සම්බන්ධයම සඳහා කියනලද්දේ නොවෙයි—පියුම්, උපුල්, යනාදි විවිධජාති ඇත්තන්ගෙන් වෙන්වූද නිල්රත්-ආදි උපුලටම සංඛ්‍යවූ නොයෙක් ජාතීන් අතුරෙන් සමානජාතික ශබ්දයන් විශෙෂණ කොට සමාසකිරීමයයිද ඇතම් කෙනෙකුන්ගේ මතයි—උපුල්, පියුමට සමානාධිකරණ විශෙෂණ නොවේ. එබඳු නානාවස්තුක ශබ්දයන් එක්කොට ගැලපීමෙහි ද්වන්ද්ව සමාසයමුත් විශෙෂණ සමාසයක් නොවේ. එහෙයින් සමානාධිකරණ විශෙෂණ විශෙෂ්‍යයන් සම්බන්ධවීමෙහි විශෙෂණ සමාසය වේයයි දතයුතු—යුවරජ-මත්බමර-යනාදිය යුවවූයේද එම රජවූයේද යුවරජ, මත්වූයේද එම බමරවූයේද මත්බමර, යනාදීන් ශබ්ද දෙදෙනෙකුගේ සම්බන්ධවීමෙහි එකසමාස ශබ්දයක් වශයෙන් විශෙෂණ සමාසය පෙනේ. එසේවුවත් කිසිතැනක බොහෝ ශබ්දයන්ගේද සම්බන්ධයෙහි විශෙෂණ සමාසය පෙනේ. සංස්කෘතභාෂාවෙහි-සච්චිදානන්ද ශබ්දය සංශචාසෞ චිච්චාසාවානන්දශ්චෙති සච්චිදානන්දඃ කියා ත්‍රිශබ්දයන්ගේ එක විශෙෂණ (කර්මධාරය) සමාසය පෙනේ—එලුවෙහි "සුවඳ මදනල" ශබ්දය ශබ්දත්‍රයක්හුගේ විශෙෂණසමාස වශයෙන් සෙවියහැකිවේ—මනාගඳ ඇතියේ සුවඳයයි අන්‍යාර්ථසමාසයෙහි සුවඳ ශබ්දයවූකල්හි සුවඳවූයේත් හෙම මදවූයේත් හෙම නලවූයේත් හෙම "සුවඳ මදනල" යයි විශෙෂණ සමාසයයි, එහි ශබ්දත්‍රයෙන් දෙකක් විශෙෂණයි.

මෙය මදවූයේද නෙම නලවූයේද මදනල-සුවඳින්යුත් මදනල සුවඳමදනල කියාද අත්පරිද්දෙකින් විශෙෂණ සමාස ගණිවූ විභක්ති සමාසවශයෙන්ද යෙදියහැකිවේ—"මනාගඳසුවඳ"යයි අවිග්‍රහසමස්වූකල ප්‍රධාන ශබ්දයක්ව සිට අන්‍යාර්ථ සමාසවූකල අනිකකට විශෙෂණවූ අප්‍රධාන ශබ්දයක්වේ-අන්‍යවූ අර්ථ ඇති නොයෙක් පදයන් එකතුව ඒ එකතුවූ පදයන්හි ව්‍යාමානාර්ථයෙන් අන්‍යවූ අර්ථයක් කියනහොත් ඒ සමාසය අන්‍යාර්ථනම්වේ.

හස්එරුණෝ සමකටද එතෙම එරුණුහස්නම්-තලාක්
දමනලද ඉඳුරෝ යමක්හු විසින්ද එතෙම දැම්දුරුනම්-මුනි
සම්කරුණෙන් බත්සුන් එතෙම සුන්බත්-අට.
දෙනලද වත් යමක්හටද එතෙම දුන්වත්නම්-බමුණු-a

## උදාහරණ.

a ප-හස්, හංසතෙම; එරුණෝ, අවතීර්ණවූයේ; යමකටද, යම්ස්ථානයකටද; එතෙම, ඒ (ස්ථානය) තෙම; එරුණුහස්නම්, එරුණුහස් නම්වේ; තලා, තඩාගයයි (කර්මවිභක්තියෙහිසි). දමනලද, දමනය කරණලද්දාවූ; ඉදුරෝ, ඉන්ද්‍රියයෝ; යමක්හු විසින්ද, යම් කෙනෙකු විසින්ද; එතෙම, ඒ (පුද්ගල) තෙම; දැම්දුරුනම්, එනම්වේ; මුනි තපස්විසි-(කර්තෘ විභක්තියෙහිසි.) *

යම්කරුණෙන්, යමක් කරණකොටගෙණ; බත්, භක්තය (බත); සුන්, ඡින්නවිද; (කඩවිද) එතෙම, ඒ කාරණයතෙම; සුන්බත්, එනම් වේ; අට, ඩබරයයි. † යම්කරුණෙන්, යමක් කරණකොටගෙණ; තුරු, වෘක්ෂය; සුන්, ඡින්නවිද; (කපනලදද) එතෙම, ඒශස්ත්‍රයතෙම; සුන්තුරු, එනම්වේ; පරසු, පොරවයි (කරණ විභක්තියෙහිසි).

දෙනලද, දානයකරණලද්දාවූ; වත්, වස්ත්‍රය; යමක්හටද, යම්කෙනෙකුහටද; එතෙම, ඒ (පුද්ගල) තෙම; දුන්වත්නම්, දුන්වත්නම්වේ; බමුණු, බ්‍රාහ්මණයායි (සම්ප්‍රදාන විභක්තියෙහිසි).

---

* මෙහි එරුණු ශබ්දයෙන් කියනලද අවතීර්ණාර්ථය හෝ හස්ශබ්දයෙන් කියනලද හංසාර්ථය හෝ ප්‍රධානවශයෙන් නොගෙණ ඒද්දෙක සමාසවූ එරුණුහස් ශබ්දයෙන් අවතීර්ණවූ (බැස්සාවූ) හංසයාඇති විල ගත්තාලද්—එහෙයින් සමකට යන අන්‍යපදයේ අර්ථය ප්‍රධානවූබව හැයේ—ඒ කර්මවිභක්තිසමාසයි එසේම දැම් ශබ්දයෙන් කියනලද දමිතාර්ථයද ඉඳුරු ශබ්දයෙන් කියනලද ඉන්ද්‍රියාර්ථයද හැර දැම්ඳුරු ශබ්දයෙන් ඉන්ද්‍රියයන් දමනයකල තැනැත්තෙක් කියනුලැබේ.

† යම්කරුණෙන් යනු කරණවිභක්තිය භගවත්නට යොදනලදි-යම්, යන ශබ්දයා කෙරෙන් කරුණුශබ්දය ගළපා ඉන් පරකොට එන් යන විභක්තිරූපය යොදනලදි—යමකින් කිවාත් මෙම අර්ථයි—මෙහිදු සුන් ශබ්දයෙන් කියනලද ඡින්නාර්ථය බත් ශබ්දයෙන් කියනලද භක්තාර්ථයද හැර බත්කඩවීමට කාරණයවූ ඩබරය සුන්බත් ශබ්දයෙන් කියවෙනහෙයින් අන්‍යාපි බැව් හැයේ-මේනයින් සුන්තුරු ශබ්දාදීයෙහිද අන්‍යාපිතාව දතයුතු.

**ගිලිහුනු ගොනහුල් සමකින් එතෙම ගුලු ගොනගුල් නම්-රුක්, සඳවත්වත් සිඟුවලගඇත්ති එනම්-දසබල පස්ඇස් ඇතියේ එනම්-මත්තේගජන් ඇතියේ එනම්-රත්-නත් සුරුවිරු බලත් ඇතියේ එනම්-එබඳු රණගන.** a

a ප-ගිලිහුනු, ගලිතවූ (වැටුනාවූ); ගොනහුල්, වානරතෙම; සමකින්, සම් ස්ථානයකින්ද; එතෙම, ඒ ස්ථානයෙහි අවධිය; ගුලුගොනහුල් නම්, ගුලුගොනහුල්නම්වේ; රුක්, වෘක්ෂයයි—(අවධිවිභක්තියෙහිය),

සඳවත්වත්, (ඇත්ති) චන්ද්‍රයාවැනිවූ මුහුනඇති ස්ත්‍රීතොමෝද;සිඟුවලග ඇත්ති, කෘශවූ මධ්‍යභාගයඇති ස්ත්‍රීතොමෝද; එනම්, එනම්වේ; හෙවත් සඳවත්නම්ද සිඟුවලගනම්ද වේ; දසබලඇත්තේ, බලදශයෙකු ඇත්තේද; පස්ඇස්ඇතියේ, පඤ්චවිධචක්ෂුස් ඇත්තේද; එනම්, එනම්වේ; හෙවත් දසබල නම්ද, පස්ඇස්නම්දවේ*.

මත්තේගජන් ඇතියේ, මත්තවූ නොයෙක් හස්තීන් ඇත්තේ; එනම්, මත්තේගජ නම්වේ; රත්, වනයයි; නත්සුරුවිරුබලන් ඇතියේ, නානාප්‍රකාර ශූරවීරභටයන්ඇත්තේ; එනම්, එනම් ඇත්තේය; එබඳු, එයාකාරවූ; රණගන, යුද්ධාඞ්ගනයයි-(ආධාරවිභක්තියෙහියි)†

* සඳවත්වත් සිඟුවලග ඇත්ති යනාදියෙහි සමාස වාක්‍ය සම්පූර්ණයෙන් මෙහි නොකීහෙයින් අධුනිකයන්ට දුරවබෝධවේ මේ සංක්ෂෙපයෙන් දක්විමයි. මේ අන්‍යාර්ථසමාසයෙහි හෙදය සත්විභක්තියෙහියි-සඳවත්වත් ඇත්තී සිඟුවලග-ඇත්තියන්නේ ප්‍රථමාවිභක්තිය පෙණේ. අන්‍යාර්ථසමාසයට යෙදෙන සම් ශබ්දයද නොපෙණේ—මේ සම්බන්ධ විභක්තියෙහිවූ අන්‍යාර්ථසමාසයි—එහෙයින් මෙහි වාක්‍යයොජනාව මෙසේ වියයුතුයි-සඳවත්වත් යමකගේද 'ඕතොමෝ සඳවත්' සිඟුවලග යමකගේද ඕතොමෝ "සිඟුවලග" දසයක් බල යමෙකුගේද එතෙම "දසබල" පසක්ඇස් යමෙකුගේද එතෙම "පසැස්" "චන්ද්‍රවිය්වදනං යස්‍යාසා චන්ද්‍රවදනා-චක්ෂුෂ්පවක්ෂු යස්‍ය සාවක්ෂුවක්ෂු" යනාදින් මාගධසංස්කෘත වාක්‍යක්‍රමයෙන් සැකහැර දතයුතු.

† මත්තේගජන් ඇතියේ යනාදියෙහිද සම්පූර්ණයෙන් වාක්‍යයොජනාව නොකරණලදි, මේ අධාර විභක්තියෙහි අන්‍යාර්ථසමාසයි, එහෙයින් මෙසේ වාක්‍යයෙදේ, මත්තේගජහු යමෙක්හිද එතෙම "මත්තේගජ" නත්සුරුවිරු බලෝ යමෙක්හිද එතෙම "නත්සුරුවිරුබල"මත්තා අනේකා ගජායස්මිංතං මත්තානේකගජං-වනං-යනාදින්ද සැකහැරියයුතුයි-නජත්යි කර්මවිභක්තිය ඇති යන්නේ සම්බන්ධයෙහිවේ.

**තරුවැල සහ වූයේ=සහතරුවැල නම්-අඹර, සහ උදර ඇතියෙ-සොහොවුරු. "ලඹසවන්" ඈ තගුණ නම් "ඉකුත්සයුරු" ඈ අතගුණ නම්-a**

ඉති අන් අරුත් සමස්.

---

a ප-තරුවැල සහ වූයේ, තාරකාවලින් හා සහිතවූයේ; සහ තරුවැලනම්, සහ තරුවැලනම්වේ; අඹර, ආකාශයයි; සහ උදර ඇතියේ, තුල්‍යවූ උදර ඇත්තේ; සොහොවුරු, සොහොවුරුනම් වේ; (සහෝදරයි) ලඹසවන් ඈ, ලම්බකර්ණ ඇත්තේ යනාදිය; තගුණනම්, තද්ගුණනම් වේ; ඉකුත්සයුරු ඈ, අතික්‍රාන්තසාගර ඇත්තේය යන ආදිය; අතගුණනම්, අතද්ගුණනම්වේ.*

---

* සහ තරුවැලයන්න අහසට විශේෂණවූ අන්‍යාර්ථ සමාස පදයක්වේ-මෙය ප්‍රථමා විභක්තියෙහි වේ-සහ හෙතුනා යො වත්තතෙ සො සහෙතුකො යනාදී මාගධ සමාසමෙති-තරුවැල සහ පවත්නේ යමෙක්ද එතෙම "සහ තරුවැල" සහ උදර ඇතියේ යමෙක්ද එතෙම "සොහොවුරු" යනුද එසේමැයි අන්‍යාර්ථ සමාසයෙහි භෙදය සප්ත විභක්තියෙහි වෙයි සූත්‍රයෙන් කියනලදී—ඒ සප්ත විභක්තියනම්, කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර යනමේයි-ප්‍රථමායෙහි අන්‍යාර්ථ සමාසජෙක ප්‍රයොග බැවින් ඒ සදරුත් යනාදි අයසූත්‍රයෙන් සිඩයි, සොහොවුරු යන්නෙහි පිළිපෙරැළි වර්ණලොපාදෙශද අන සූත්‍රයෙන් සිඩයි—"ලඹසවන්" යනුද සම්බන්ධ විභක්තියෙහි අන්‍යාර්ථ සමාසයි-ලඹසවන් යමෙකුගේද එතෙම ලඹසවන්, එල්බෙන්නාවූ කර්ණයෝ යමෙකුගේද එතෙම ලඹසවන් නම්වේ; මේ සමාසය තද්ගුණ සමාසයයි කියනලදී—මෙය තද්ගුණ සංවිඥානයයිද කියනුලැබේ—තද්ගුණනම් ඒ සමාසවූ ශබ්දයන්ගේ අර්ථයෙන් හැඟෙන ගුණය ඇත්තේය, තද්ගුණ සංවිඥානනම්ද—ඒ ගුණය හැඟුම් ඇත්තේයි

ලඹසවන්කැත්, ලඹකර්ණවූ ක්‍ෂත්‍රිය තෙමේයි යම් ක්‍ෂත්‍රියයෙකුට කියත්ද ඒ ක්‍ෂත්‍රියයා බලා ඒ එල්බෙන කන්ඇති ගුණය දතහැකිවේ-සිතුවලයා යනාදී යත් එසේයි "ඉකුත්සයුරු" යනු කර්තෘවිභක්තියෙහි අන්‍යාර්ථ සමාසයෙහි-ඉකුත් (කළ) සයුරු යමෙකු විසින්ද එතෙම ඉකුත්සයුරු, සාගරය අතික්‍රාන්ත කළේ යමෙකු විසින්ද එතෙම ඉකුත් සයුරුයි, සාගරයෙන් පරතෙරගිය යමෙකුට ඉකුත්සයුරුයයි කීමුත් ඔහු දුක ඔහු සාගර ඉකුත්කළ කෙණෙක කීමට යෝග්‍ය ගුණයක් ඔහු කෙරෙහි දක්නු නොහැකියි-එහෙයින් ඒ අතද්ගුණ අන්‍යාර්ථ සමාසයි-පුන් තුරු යනාදියද එසේමයි.

අඟපාමොක් වත සමුදු ම හෝ එපදන්,
දඅරුතැවූ පදසමාම් ද අරුත් සමස් නම්වෙ-a
හිරද සඳද-හිරසඳ, සැරියුත්ද මහමුගලන්ද-සැරියුත් මහ
මුගලන් නම්, ඇත්හුද අස්හුද රියද පදද-ඇත් අස් රියපද.b

## අන්‍යාර්ථ සමාසය මෙසේයි.

මේ අන්‍යාර්ථ සමාසයවූ පදයක් බොහෝසේම අනිකකට විශෙෂණ වේ-සිවුවත් සතත් සඳවත් යනාදිය එසේනොව විශෙෂ්‍යනාම වශයෙන් සිටිය නමුත් අන්‍යශබ්දයකට විශෙෂණ කළහැකිවේ; සතරක් වත් යමෙකුගේද හෙතෙම සිවුවත්-සත්අත්හි යමෙකුගේද හෙතෙම සතත්-සඳවත් යන්නේ වාක්‍යය සටකියනලදී සිවුවත් යනු බ්‍රහ්මයාට නමක්වන නමුදු, සිවුවත් බඹ කිවහොත් චතුර්මුඛවූ බ්‍රහ්මයායි බඹ ශබ්දයට විශෙෂණකළහැකිවේ—සිංහල භාෂාවේ මේ සමාසය පාලි සංස්කෘත භාෂාවලමෙන් බහුල නොවේ.

## දකාරාර්ථ සමාසය.

---

a ප-එපදන්, ඒ පදයන්ගේ; අඟපාමොක්වත, අවයව ප්‍රධානවූ කල්හි හෝ; සමුදුම හෝ (පාමොක්වත), සමුදායාර්ථයම ප්‍රධානවූ කල්හි හෝ; දඅරුතැ, ද යන නිපාතයාගේ අර්ථයෙහි; වූපදසමාම්, සිඩිවූපද සමාගමය තෙම; ද අරුත් සමස් නම්වේ, දකාරාර්ථ සමාස නම්වේ.

මේ දකාරාර්ථ සමාසයෙහි කිසිතැන අවයව ප්‍රධානවූ සමාස පදයද කිසිතැන සමුදායාර්ථ ප්‍රධානවූ සමාස පදයද වේ;*

b ප-හිරද සඳද, සූර්ය්‍යතෙමේද චන්ද්‍රතෙමේද; හිරසඳ, හිරසඳ නම් වේ; සැරියුත්ද මහමුගලන්ද, ශාරිපුත්‍ර (ස්ථවිර) තෙමේද මහාමෞද්ගල්‍යායන (ස්ථවිර) තෙමේද, සැරියුත් මහමුගලන්නම්, සැරියුත් මහමුගලන්නම් වේ—ඇත්හුද අස්හුද රියද පදද, හස්තිහුද අශ්වයෝද; රථයෝද; පදාතිහුද; ඇත් අස් රියපද, එනම් වේ.

---

* මේ දකාරාර්ථ සමාසය, පාලියෙහි චන්දනම්ද සංස්කෘතෙහි ද්වන්ද්ව නම්ද වේ-පිඩුකිරීම පිණිස යොදනලද ද යන නිපාතයද ප්‍රථමා විභක්තියද ලොප් කොට සාමාසන්තයෙහි විභක්තිහු යොදනු ලැබෙත්, හිර සඳ යන තන්හි හිර සඳ යන ශබ්ද ප්‍රකෘතිහුම ස්වභාවයෙන් සිට ප්‍රථමාවිභක්ති ගණීත්, එහෙයින් ඒ ලොප්කළකල්හිදු හිර සඳ කියාමවේ, වාක්‍යයෙහි ද යන නිපාතය පමණක් අධිකයි.

**මෙහි අඟපාමොක් තැන බුහුබස්ද රුසි-"බඹසුරනරෝ" නමදිත්, සමුදු පාමොක් තැන එකබස රුසි-"ගී නැටුම්" ද අරුත් සමස්-a**

## සමස් අදිකරපස්වනු.

---

### විශෙෂණ විශෙෂ්‍යාධිකාරය.

**පාමොක්අත වෙසෙස් වණනපද වෙසෙසුන් නම්,**
**වෙසෙසැ සෙදුලිඟු විබත් වෙසෙසුන් පෙදේ සමවේ-b**

---

a ප-මෙහි, මේ දකාරාර්ථ සමාසයෙහි; අඟපාමොක් තැන, අවයව ප්‍රධානතැන්හි; බුහුබස්ද රුසි, බහුවචනද අභිමතයි.

උදාහරණ

බඹසුරනරෝ, බ්‍රහ්මදේව මනුෂ්‍යයෝ; නමදිත්, නමස්කාරකෙරෙත්; සමුදු පාමොක් තැන, සමුදාය ප්‍රධානවූ තන්හි; එකබසරුසි, එකවචනය අභිමතයි; ගීනැටුම්, ගීතනෘත්‍යයි; * ද අරුත්සමස්, දකාරාර්ථ සමාසයි.

සමස් අදිකර පස්වනු.

**සමාසාධිකාරය පචමයි.**

---

b ප-පාමොක් අත, ප්‍රමුඛවූ හෙවත් ප්‍රධානවූ අර්ථය; වෙසෙස්, විශෙෂ්‍යනම්වේ; වණනපද, වර්ණනාකරණ පදය; වෙසෙසුන්නම්, විශෙෂණනම්වේ; වෙසෙසයෙදු, විශෙෂ්‍යයෙහි යොදනලද්දාවූ; ලිඟු විබත්, ලිඞ්ගවිභක්ති; වෙසෙසුන්පෙදේ, විශෙෂණපදයෙහි; සම වේ, තුල්‍යවේ.

එකට සම්බන්ධවූ පද දෙකක්වූ කල එකක් ප්‍රධානයි අනික අප්‍රධානයි, අප්‍රධාන පදය ප්‍රධාන පදාර්ථයාගේ විශෙෂ කියන්නක්වේ, ඉන්ප්‍රධානය විශෙෂ්‍යයි අප්‍රධානය විශෙෂණයි, විශෙෂ්‍යයෙහි පෙණෙන ලිඞ්ගවිභක්ති වචන විශෙෂණයෙහිද ඇතිවිය යුතුයි.†.

---

* අවයව ප්‍රධානවන තැන්නම්-සමාසයට එකතුවූ ශබ්දයෝ බොහෝවූවාහු සියල්ලෝම එකක්‍රියා සම්බන්ධයම අපෙක්‍ෂා නොකරන්නෝයි-වෙන්වෙන්ව ක්‍රියාකරන්නෝයි-එහෙයින් ගිර සද යනාදීහු අවයව ප්‍රධානයි-එහෙයින් ගිර සද උදුවෙති යනාදින් බහුවචන වශයෙන් යෙදියහැක්කි-බ්‍රහ්ම දෙව මනුෂ්‍යයෝ වෙන්වෙන්ව නමස්කාරාදි ක්‍රියා කෙරෙත්-එහෙයින් බඹසුර නරෝ නමදිත් කියා බහු වචන යෙදේ ඇත් ඇස් රිය පද යනු සමුදායාර්ථ ප්‍රධානයි-හස්ත්‍යශ්වාදි සේනාවක් එකතුව යුද්ධයෙහි ක්‍රියාකරණ හෙයිනි, ගී නැටුම් යනුත් එසේමයි, ගී හා නැටුම්ද එකතුව සංගීතයෙන් සභ්‍යයන් සිත්ගැන්මෙහි පවතී.

† නිලුපුල් යනතන්හි, උපුල් ප්‍රධානාර්ථවූ විශෙෂ්‍යයි නිල් යනු වර්ණනා කරණ පදවූ විශෙෂණයි, මැහැලි ගැහැණි, මෙහිදු ගැහැණි යනු විශෙෂ්‍යයි

**යොදන වෙසෙස් සමවේ**
**වෙසෙසු නැ ලිඟු විබත්බස්**
**නො යොදන තබ අනියමෙන්**
**කිවි කමිහි තෙරපතුයේ–**අ

---

අ ප–කිවි කමිහි, කවිකර්මයෙහි; තෙරපතුයේ, තීරප්‍රාප්තවූයේ; යොදත, යොජනය කරත්හොත්; වෙසෙසුනැ, විශෙෂණයෙහි; ලිඟු විබත්බස්, ලිඞ්ගවිභක්තිවචන; වෙසෙස් සමවේ, විශෙෂ්‍යයෙහි (ලිඞ්ගාදියට) සමානවන්නේය; නොයොදත, යොජනය නොකරත් හොත්; අනියමෙන් තබ, නියමයක් නැතිව තබන්නේයි.

විශෙෂ්‍යයට සමානලෙස විශෙෂණයාගේ ලිඞ්ගාදිය කවිකර්මයෙහි පරතෙර පැමිණි පණ්ඩිතතෙම යෙදියයුතුතැන යොදතහොත් සම වේ, එසේ නොයොදතහොත් අනියමෙන් තබයි–සමානාධිකරණ විශෙෂණයේ ලිඞ්ගාදිය විශෙෂ්‍යයේ ලිඞ්ගාදියට සමසේ යොදයි–එසේ නොව භින්නාධිකරණවූතන්හි අනියමින් තබයි, යුක්තිය එසේයි.

---

මැහැලී යනු විශෙෂණයි–හෙල පියුම–කිකල පියුමේ විශෙෂ · හෙලයන ගුණ ශබ්දයෙන් කියන හෙයින් හෙල යනු පියුමට විශෙෂණයි–හෙල ශබ්දයෙන්ද පියුම් ශබ්දයෙන්ද එකම කියනලද හෙයින් සමානාධිකරණ විශෙෂණ විශෙෂ්‍යයි–මැහැලි ගැහැණි යනුත් එසේමයි–ගැහැණි යන්නේ පෙණෙන ලිඞ්ගයද විභක්තියද වචනයද මැහැලි යන්නෙත් පෙණේ–රජහුගේ පිරිස–යනතන්හි පිරිස යනු ප්‍රධාන ශබ්දයයි–කවරෙකුගේ පිරිසක්දයි සෙවීමෙහි රජහුගේයයි වෙනස කියන හෙයින්, ඒ විශෙෂණයි අප්‍රධානයි–දෙක එකක නොපවත්නා හෙයින් භින්නාධිකරණයි–එහෙයින්ම ඒ දෙකේ ලිඞ්ගාදීන්ගේ සෙදීමද සරිලාභ විශයෙනි–නියමනැත්තේයි–පිරිස යන්නේ ස්ත්‍රීලිඞ්ග ප්‍රථමෛක වචනයයි—රජහුගේ යන්නේ පුල්ලිංග සම්බන්ධෛකවචනයි–මුනිඳුතුමා යනු විශෙෂ්‍යයි–ඊට සමාන සම්බන්ධ විශෙෂණ පබසරා යනාදියයි–මුනිඳුතුමා යන්නේ තිබෙන පුරුෂලිංග කර්ම විභක්ත්‍යෙක වචනය–පබසරා–සරාසිසි කල්දසනා අඳහු–යන සෑම පදයන්හිම තිබේ–පබසරා යනාදියෙන් මුනිඳුතුමා යන්නේ ගුණයම කියන හෙයින් එක්වයතුවෙහි පවතී.

**නමව මුනිඳුතුමා තුමාසිරින් පබසරා,**
**සරාසිසි කල්දසනා සනාරෙසෙනදඟු දියේ-a**

ඉත් වෙසෙසුන් වෙසෙස් සමලිඟු විබත්බස් පියෝ

**නමව පිරිසිඳ සැබැවින් අයු අනාවත් මන්,**
**පද අතුනෙක කෙණේදත් පවර මුනිරජඟු සරණ-b**

ඉති අනියමින්තුබූ වෙසෙසුන් පියෝ

**වෙසෙසුන් වෙසෙස්විදි කිවිකමසරින් වනුයේ,**
**අරුත් වියකන වරෙහි වෙසෙසුනැ යොදව් වූද-c**

---

උදාහරණ.

a ප-තුමාසිරින්, තමාගේ (දෙහ) ශොභායෙන්; පබසරා, ප්‍රභාස්වරවූ, සරාසිසිකල්දසනා, ශරච්චන්ද්‍රයාසේ කල්‍යාණදර්ශනීයවූ; දියේ, ජගත්හි (ලොකයෙහි); සනාරෙසෙනදඟු, ස්නෙහරසයෙන් ආර්ද්‍රවූ; (තෙත්වූ) මුනිඳුතුමා, මුනීන්ද්‍රාත්මයා; නමව්, වඳිව්; ඉති, මෙසේ; වෙසෙසුන් වෙසෙස්, විශෙෂණ විශෙෂ්‍යයන්හි; සමලිඟු විබත්බස් පියෝ, තුල්‍යවූ (සමානවූ) ලිඞ්ගවිභක්තිවචන ප්‍රයොගයි.

b ප-අයුඅනා වත්මන්, අතීතානාගත වර්තමානවූ කාලත්‍රයෙහි; පද අතුන්, පදාර්ථයන්; සැබැවින්, ස්වභාවයෙන්ම හෙවත් ප්‍රත්‍යක්‍ෂ කොට; පිරිසිඳ, පරිච්ඡින්නකොට; එකකෙණේදත්, එකක්‍ෂණයෙහි පරිඥානයකළාවූ; පවරමුනිරජඟු, ප්‍රවරවූ මුනිරාජයාගේ; සරණ, චරණය; (පාදයුග්මය) නමව්, වඳිව්.

ඉති, මෙසේ; අනියමින්තුබූ, නියමයක්නැතුව තැබුවාවූ; වෙසෙසුන්පියෝ, විශෙෂණ ප්‍රයෝගයි *.

c ප-වෙසෙසුන් වෙසෙස් විදි, විශෙෂණ විශෙෂ්‍ය විධිය; කිවිකමසරින්, කවීන්ගේ කාමාචාර වශයෙන්; වනුයේ, වන්නේය; අරුත් වියකන වරෙහි, අර්ථව්‍යාඛ්‍යානය කරණ කාලයෙහි; වෙසෙසුනැ, විශෙෂණයෙහි; වූද, වූ යන ධාතුව; † යොදව්, යුක්තකරව්.

---

* මෙහි-දත්-යනු පවර මුනිරජඟු යන්නට විශෙෂණයි-සරණ යන්නට, පවර මුනිරජඟු යනු විශෙෂණයි-ඒ භින්නාධිකරණයි-එහෙයින් විශෙෂණ විශෙෂ්‍ය දෙක්හි සමලිංගාදි ප්‍රයොග නොකරණලදී.

† විශෙෂණ විශෙෂ්‍යයන් යොදන විධිය කවීන්ගේ කැමැත්ත ලෙසවේ-එනම් විශෙෂණ විශෙෂ්‍යයන්ගේ ලිංගවිභක්ති සමසේ යෙදීමෙන් හෝ විශෙෂණයෙහි විභක්ති රූපයන් නොදක්වා ප්‍රකෘතියෙන් තැබීමෙන් ඉදිරිපසුකොට යෙදීම් වශයෙන් හෝ යෙදීම පණ්ඩිතයන්ගේ අභිප්‍රාය ලෙසවේ—සමානාධිකරණ විශෙෂණයේ අර්ථ ප්‍රකාශකරණ තැනදී විශෙෂණ පදාර්ථයට වූ යන ධාතුව යෙදියයුතුයි එසේ යොදා කී කල්හි

**තෙලෙ යත මහ වහැප් රුවන්නම, සඳනම් හෙලිල්ලඹු එන්නී–ඉති කමසරින්වූ වෙසෙසුන් වෙසෙස් විනිස–෨**

**වෙසෙසුන් වෙසෙස් අදියර සවනු.**

---

උදාහරණ.

෨ ප–තෙල යත මහ වැහැප්, අර යන්නාවූ මහාවෘෂභතෙම; රුවන් නම්, රත්න නම්වේ; (රතනායි) සඳනම්, චන්‍ද්‍රාභම්වූ; හෙලිලිඅඹු, ධවලාම්බරා තොමෝ; එන්නී, ආගමනය කරන්නීය; ඉති, මෙසේ; කමසරින්වූ, කාමාචාර වශයෙන්වූ; වෙසෙසුන් වෙසෙස් විනිස, විශෙෂණ විශෙෂ්‍ය විනිශ්චයයි *.

**විශෙෂණ විශෙෂ්‍යාධිකාරය සමාප්තයි.**

---

සමානාධිකරණ විශෙෂණාර්ථය ප්‍රකටවේ–වූයත ධාතුවවීමෙහි –පබසරා මුනිඳු කී කල්හි පබසරා යන්න මුනිඳු යන්නට සමානාධිකරණ විශෙෂණයි–එහෙයින් අර්ථ දයත කල්හි 'ප්‍රභාස්වරවූ' මුනීන්‍ද්‍රයායි කී කල්හි ප්‍රභාස්වර තාසෙන් මුනීන්‍ද්‍රයාගේ ගුණය වර්ණනාකළ බැව් හැයේ-භින්නාධිකරණ විශෙෂණයාගේ අර්ථ කීමෙහි වූ යත ධාතුවක් නොයෙදේ-මුනිරජහු සරණ-මුනිරාජයාගේ පාදයයි-මුනිරාජයාගේ යනු චරණයට විශෙෂණාර්ථයි–එහි වූ යන්න නොයෙදේ.

* තෙලයත මගවැහැප් රුවන්නම් යනතන්හි වැහැප් යනු විශෙෂ්‍යයි-පූර්වවූ තෙල යතාදියද පශ්චිමවූ රුවන්නම්-යනුද ඊට විශෙෂණයි–මෙහි යත කී ක්‍රියාශබ්දය වැහැප් යන්නට විශෙෂණකොට පූර්වභාගයෙහිද, රුවන්නම් යන සංඥශබ්දය අපරභාගයෙහිද යොදනලදී; සඳනම් හෙලිල්ලඹු එන්නී-යන වාක්‍යයෙහි වනාහී-එන්නී යන ක්‍රියාශබ්දය පරභාගයෙහිද. සඳනම් යන සංඥශබ්දය පූර්වභාගයෙහිද යොදනලදී-විශෙෂණ යන්ගේ විභක්තිරූප අප්‍රකටලෙස ශබ්දස්වරූප විභක්ත්‍යර්ථ භජනය කරණලෙස යොදනලද්-එන්නී යන ක්‍රියාශබ්දයෙහි ලිංගය ප්‍රකටකොට යොදනලදී-යත කී ක්‍රියා ශබ්දයෙහි ලිංගයක් ප්‍රකට නොවේ–එසේත් විශෙෂ්‍යයෙහිවූ ලිංගය භජනය කෙරේ-මෙසේ කවිකාමාචාර වශයෙන් විශෙෂණ විශෙෂ්‍ය යොදන බැව් දතයුතුයි.

"සිඛි සම්මාසම්බුදුන්ගේ අභිභූනම් මහතෙරකෙනෙක් බඹලොව සිට දසදහස්සක්වළ වැසියන්ට දම්දෙසූහු" මෙහි අභිභූනම් යනු මහතෙර කෙනෙක් යන්නට විශෙෂණව පූර්වභාගයෙහි සිටී. "ඔහුපින් අභයනම්වී" මෙහි අභයනම් යන්න පින් යන්නට විශෙෂණව අපරභාගයෙහි සිටී-ප්‍රධාන

ක්‍රියාධිකාරය.

**ඇතිසිටි ගිලිරෙදුම් නිදිරැඳිබිය වැසි සිනා,**
**තුටුහැඬිතිනුම් පැකුලුම් දිවි ඈඳ කම්විමුත්-a**

a ප-ඇති, අස්ත්‍යර්ථ (විද්‍යමානාර්ථ) ධාතුද; සිටි, ස්ථිත්‍යර්ථ (සිටීම අර්ථවූ) ධාතුද; ගිලි, ගලනාර්ථ (ගිලීමඅර්ථවූ) ධාතුද; රෙදුම්, රුජනාර්ථ (රිදීම-) ධාතුද; නිදි, නිද්‍රාර්ථ (නිදීම-) ධාතුද; රැඳි, රඤ්ජනාර්ථ; (රැඳීම-) ධාතුද; බිය, භයාර්ථධාතුද; වැසි, වර්ෂණාර්ථ (වැස්ස-) ධාතුද; සිනා, හාස්‍යාර්ථධාතුද; තුටු, තොෂණාර්ථ (සතුටුවීම-)ධාතුද හැඬි, ශබ්දාර්ථ (හඬනැගීම-) ධාතුද; තිනුම්, කම්පාර්ථ (සෙලවීම-) ධාතුද; පැකුලුම්, ප්‍රස්ඛලනාර්ථ(හැපීම-)ධාතුද; දිවි, ප්‍රාණාර්ථ (ජීවත්වීම-) ධාතුද; යන-ඈඳ, මේ ආදි ධාතූහු; කම්විමුත්, කර්මරහිතයි—අකර්මකයයි කේයි *

ක්‍රියාධිකාරය.

ක්‍රියානම් ද්‍රව්‍යයක් හෝ ගුණයක්නොවේ වීම හෝ කිරීමයි-රජ වේ-යුද්දකෙරේ යනාදිතන්හි වේ-කෙරේ යනු ක්‍රියාපදයි, ඒ ක්‍රියාපද ඉපදීමට මුල්වන ශබ්ද ධාතුයි-එනම්-වූ-කර-යනාදියයි, ඒ ධාතු සකර්මක අකර්මක වශයෙන් දෙයාකාරයි. ක්‍රියාධිකාරාරම්භයෙහි ඒ දෙයාකාර ධාතූන් දක්වති.

---

ශබ්දාර්ථයාගේ වෙනස කියන ස්වභාවයෙන් විශේෂණයත් ප්‍රධානාර්ථ ඇත්තාවූ ශබ්දවශයෙන් විශෙෂ්‍යයත් හැඳිනගතයුතුයි.

* යම්ධාතුවකින් ක්‍රියාපදයක් යොදාබලනකල එයලැබීමෙන් සම්බන්ධවන දෙයක් නොහැයේනම් ඒ අකර්මකධාතුයයිද එසේ යම් දෙයක් හැයේනම් ඒ සකර්මකධාතුයයිද දතයුතුයි-ඒ මෙසේයි. නිදයි, කීකල මිනිසෙක්හෝ යම් සතෙක් නිදයිකියා-ඒ නිද්‍රාවේ යෙදෙන කර්තෘවෙක් හැඟෙනුමිස ඒ නිද්‍රා ක්‍රියාව ලබන කෙනෙක් හෝ දෙයක් නොහැඟෙන හෙයින් ඒ නිදි යනු අකර්මකයි—රකී කීකල මිනිසෙක් ධනය රකියිහැඟෙන හෙයින් රැකීමකරණ කර්තෘහා රැකීමලබන ධනයත් හැඟෙන හෙයින් ඒ රක් යන ධාතුව සකර්මකයි-අකර්මක ධාතුවෙන් උපදනා ක්‍රියාපදයකට කර්මයක් නොයෙදේ-සකර්මක ධාතුවෙන් උපදනා ක්‍රියාපදයකට කර්මයෙදේ ගිලි යන ධාතුවක් සකර්මකවද ඇත්තේයි-එනම් මස්ගිලි යනාදී තැනයි ගයේ හිලේ ගැලේ යනාදී තන්හි-අකර්මකයි. ඇති—ඇත්—යන ධාතුව බලන් ඇත්තේ යනාදි අපිත්‍රියා ශබ්ද විෂයෙහි සකර්මකවේ.

දිස්ලබසිදි දනුම්යාරක්වදබඳ බොජුන්කර,
පිසිසිවැහි හරද නම් ඇද සකම්නම්-a
දපදඅකම් වත කතුහව්පියෝවනුයේ,
කතුකම්සි සව්පියෝ සහකම් ගෙණෙහි වනුයේ-b
අන්නම සදන්බඳ කිරිය දනු තෙකලේහි,
නිමියේ අපු නොනිමියේ වත්මන්නොපැවියේනා-c

a ප-දිස් දර්ශනාර්ථ (දැකීම අර්ථවූ) ධාතුද; ලබ, ලාභාර්ථධාතුද; සිඳි, ඡේදනාර්ථ (කැපීම-) ධාතුද; යා, ගමනාර්ථ ධාතුද; රක්, රක්ෂණාර්ථ (රැකීම-) ධාතුද; වද, වචනාර්ථ ධාතුද; බඳ, බන්ධනාර්ථ ධාතුද; බොජුන්, භොජනාර්ථ ධාතුද; කර, කරණාර්ථ (කිරීම) ධාතුද; පිසි, පචනාර්ථ (බත්ආදිය පිසීම-)ධාතුද; ඉසි, ඉච්ඡාර්ථ (ආලයකිරීම-) ධාතුද; වැහි, වහනාර්ථ (ඉසිලීම-)ධාතුද; හර, හරණාර්ථ (හැරගැණීම-) ධාතුද; දා, දානාර්ථ ධාතුද; නම්, නමනාර්ථ (නැමීම අර්ථවූ) ධාතුද; සකම්නම්, සකර්මකනම්වේ-(මෙයි අර්ථවශයෙන් සකර්මකාකර්මක ධාතු හැඳින ක්‍රියා යෙදියයුතුයි).

b ප-දපද, ධාතුපදය; අකම්වත, අකර්මකවූ කල්හි; කතුහව්පියෝ වනුයේ, කර්තෘ භාවප්‍රයොග වන්නේය; කතුකම්සි සව්පියෝ, කර්තෘ කර්මභාව යන, සියලු ප්‍රයොග; සහකම්ගෙණෙහි, සකර්මක ගණයෙහි; වනුයේ, වන්නේය *.

c ප-අන්තමසදන්, අන්‍යශබ්ද තශබ්ද මශබ්දයන්; බඳ, සම්බන්ධවූ; කිරිය, ක්‍රියාශබ්දය; තෙකලේහි; කාලත්‍රයෙහි; දනු, විජානනයකරව;

* කර්තෘ කර්ම භාවය ක්‍රියා සාධන හෙවත් කාරක තුනකි—එයින් අකර්මක ධාතුව කර්තෘභාව දෙක්හි පමණක් ක්‍රියාපද සෑදීමෙහි යෙදේ කර්මයෙහි නොයෙදේ-සකර්මක ධාතුව තුනෙහිම යෙදේ-සිටි-අකර්මක ධාතුවයි, මම මෙහි සිටිමි-යන තන්හි කර්තෘසාධනයයි-සිටිනු-සිටීම-යනු භාවයි-මෙතෙම්ම සිටවේ යනුත් භාවසාධනයි-කර්මයක් නොලැබෙන හෙයින් කර්මසාධනය නොවේ—පිසි-යනු-සකර්මධාතුවයි-මම බත පිසමි යනාදී තන්හි කර්තෘසාධනයි-අරක්කැමියා විසින් බත පැසෙන්නේ යනාදී තන්හි කර්මසාධනයි—පිසනු යනාදී තන්හි භාවයි—මේ ආදී ක්‍රමයෙන් දතයුතු

ඒ ඉ ර් උ ද අඥ, වත් මන් ඉ ඕ ඒ ආ
නේ යුත් අන් එනොන්නේ අන් කරු එකතැනායේ-a
හනුයුතු වියුතු උෟ බුහුබසැ ඕ උ උන්හා,
සලතිතෙතොත් අන්නෝ අන්නාහුනාහුද වෙත්-b

---

නිම්යේ, සමාප්තවූයේ; අඥ, අතීතනම් වේ; නොනිම්යේ, සමාප්ත නොවූයේ; වත්මන්, වර්තමානනම් වේ; නොපැටියේ, අරබ්ධ නුවූ යේ; (පටන් නොගත්තේ) අනා, අනාගතනම්වේ. *

a ප-ඒ ඉ ර් උ ද, ඒ ප්‍රත්‍යය ඉ ප්‍රත්‍යය ර් ප්‍රත්‍යය උ ප්‍රත්‍යය යන මොහු; අඥ, අතීතයෙහිද; ඉ ඕ ඒ ආ, ඉ ඕ ඒ ආ යන මේ ප්‍රත්‍යයෝ; වත්මන්, වර්තමානයෙහිද; නේයුත්, නේයන්නකින් යුක්තවූ; අත් එන් ඔත්, අත්-එන්-ඔත්-යන මොහුද; නේ, නේ යන ප්‍රත්‍යයද; අනායේ, අනාගතයෙහිද; අන්කරුඑකතැ, අන්‍යකාරක එකවචන යෙහි වෙත්. †

b ප-බුහුබසැ, බහුවචනයෙහි; හනුයුතු, හයන්නක්ද නුයන්නක්ද යුක්තාවූද; වියුතු, යුක්තනුවූද; උෟ, උෟ ප්‍රත්‍යයද; ඕ, ඕ ප්‍රත්‍යයද; උ, උ ප්‍රත්‍යයද; උන්හා, උන් ප්‍රත්‍යයද වන්නේය; (අතීතයි) සල, නැවැත; (වර්තමානයෙහි) අතිතෙතොත්, අත්-ඉත්-එත්-ඔත්-යන ප්‍රත්‍යයෝද වෙත්—(අනාගතයෙහි) අනෙනෝ අනානු නානුද; අන්නෝ-අනානු-නානු යන ප්‍රත්‍යයෝද; වෙත්, වන්නාහුය. ‡

---

* අන්‍යශබ්දය න ශබ්දය ම ශබ්දයයි-ශබ්දතුණ සම්බන්ධවූ කාරකතුණක්වේ- අභිමුඛත් නුවූ තමනුත් නොවූ කෙනෙක් කියන ශබ්දය අන්‍යශබ්දයයි-එනම් හෙතෙම හීකල අන්‍යශබ්දයවේ-අභිමුඛවූවකු කියන ශබ්දය න ශබ්දයයි- එනම් තෝ-තුඹ-තොපි-තමුසේ යනාදිය නශබ්දකාරකයි—මම-අපි—හීකල මශබ්දකාරකයි—කාලය පිළිබඳවද ක්‍රියාව තුන්ආකාරයි—නිමුකල ක්‍රියාව අතීතයි—නොනිමි ක්‍රියාව වර්තමානයි—ආරම්භනොකල ක්‍රියාව අනාගතයි.

† මෙහි අන්‍යකාරක එකවචනයෙහිවූ තුන්කල්හි ප්‍රත්‍යය කියනලදී—ඒ පිළිවෙළින් මෙසේයි.

අතීතකාලයෙහි අන්‍යකාරක එකවචන—ඒ-ඉ—ර්—උ—

වර්තමානකාලයෙහි—අන්‍යකාරක එකවචන—ඉ—ඕ—ඒ—ආ—

අනාගතකාලයෙහි—අන්‍යකාරක එකවචන,—අත්නේ—එත්නේ—ඔත් නේ—නේ—යනමෙයි.

‡ අතීත—අන්‍යකාරක බහුවචන—උෟහ-උෟහු—උෟ—උ-ඕ—උන්
වර්තමාන—අන්‍යකාරක බහුවචන—අත්-ඉත්—එත්—ඔත්—

අනාගත-අන්‍යකාරක බහුවචන—අනෙනෝ—අනානු-නානු

ඒ, දිවකුරු මුනි සමා ඉදුහු කෙළේ
ඉ, සව්ලෝද එ නරඹා තිව්
ඊ, මහදෙන් කෙලෙසුන් වැනහි
උ, එතැන බුදුසිරි සයුරෝරේකුමුවු-॥

## උදාහරණ.

ෲ ප ඒ (කර කිර්මෙහි යන ධාතුකෙරෙන්) ඒ ප්‍රත්‍යය (වේ); දිවකුරුමුනි, දීපඞ්කර (සර්වඥ) තෙම; යමාඉදුහු, යමක (නම්) සෘද්ධිය; කෙළේ, (සිදු) කෙළේය-ඉ-(තුස් තිස්මෙහි යන ධාතුකෙරෙන්) ඉප්‍රත්‍යය (වේ). සව්ලෝද, සකලලොක ධාතුතොම; එනරඹා, එයබලා, තිව්, සන්තුෂ්ටවූ; ඊ, (විපූර්ව නස නොදිසුම්හි යන ධාතුහු කෙරෙන්) ඊප්‍රත්‍යය (වේ). මහදෙනේ, මහජනතෙම; කෙලෙසුන්,‡ක්ලෙශයන්; වැනහි, විනාසකෙළේය-උ-(කුමුද ගැළ්මෙහි යන ධාතුහු කෙරෙන්) උ ප්‍රත්‍යය වේ; එතැන, ඒ ස්ථානයෙහි; බුදුසිරිසයුරෝරේ, බුඩශ්‍රී නැමැති සාගරයතුළ; කුමුවු, (මහජනතෙම) ගැලුනේය.*

* එක ධාතුවකින් සියලුම ප්‍රත්‍යයන්ගෙන් යෙදෙන ක්‍රියා පදයන් නොවන හෙයින් ඒ ඒ ධාතූන්ගෙන් යෙදෙන ක්‍රියාපද වෙන් වෙන් වශයෙන් දක්වනලදි-කෙළේ යන ක්‍රියාපදය සිඩවන්නේ මෙසේයි-කරයනු සකර්මක ධාතුවවේ, එයු කෙරෙන් පරව ඒ ඉ ඊ-යනාදී සූත්‍රයෙන්, ඒ ප්‍රත්‍යයවේ—එකලැ-කර-ඒ-සඳරුත් යනාදී සූත්‍රයෙන් රකාරයට ළකාරාදෙශවේ-එකලැ-කළ-ඒ-එම සූත්‍රයෙන්—කකාරයෙහි පිළිපෙරළි කළකල කෙළ—ඒ-පෙර පරවණන් යනාදි සූත්‍රයෙන්-ළකාරයෙහි අකාරය ලොප්කල කල්හි-කෙළ්-ඒ-එම සූත්‍රයෙන් ඒකාරය ගාත්‍රාරූඪකල කල්හි-කෙළේ යනු සිඩයි-තිවී-යනු සිදුවන්නේ මෙසේයි—තුස-යන ධාතුහු කෙරෙන් පෙර කීලෙස ඉප්‍රත්‍යයවේ-එකල—තුස--ඉ-සඳරුත් යනාදී සූත්‍රයෙන්--සකාරයට, ටකාරාදෙශවේ—එකල තුට-ඉ-තකාරයෙහි පිළිපෙරළිය කළකලැ-තිට-ඉ-පූර්වස්වරය ලොප් කොට පරස්වරය ගාත්‍රාරූඪකල කලැ-තිව් යනු සිඩයි-වැනහි යනු මෙසේ සිඩවේ—වි පූර්ව නස යන ධාතුහු කෙරෙන් යටකීපරිද්දෙන්, ඊ ප්‍රත්‍යයවේ—එකලැ විනස-ඊ සඳරුත් යනාදී සූත්‍රයෙන් සකාරයට හකාරාදෙශවේ එකල විනහ-ඊ-එම සූත්‍රයෙන් වකාරයෙහි පිළිපෙරළිකල කල්හි හෙවත් මාත්‍රාවෘඩිකල කල්හි වැනහ ඊ, පෙරපරවණන් යනාදී සූත්‍රයෙන් පූර්වස්වරය ලොප් කොට පරස්වරය ගාත්‍රාරූඪකළකල්හි වැනහී යනු සිඩයි

ඉති අත්කරු එකරුතැ අයුපස,
ඉ, අප සැසිඳු නවඟසසුන් පවති,
ඕ, මුළුලෙව් ඔබ දහමොද බෝ-
ඒ, ඔබ අරිසඟ නොවුවන් දෙනේ.

අන්‍යකාරකයෙහි එකවචනාර්ථයෙහි අතීතප්‍රත්‍යය මෙසේයි.

## වර්තමාන කාලයට උදාහරණ.

ප-ඉ, (ප පූර්ව වත යන ධාතුහු කෙරෙන්) ඉ ප්‍රත්‍යයවේ; අපසැසිඳු, අපගේ ශාක්‍යසිංහයාණන්ගේ; නවඟසසුන්, නවාඞ්ග ශාසනය; පවති, (දැන්) ප්‍රවෘත්තවේ.

ඕ, (පා යන ධාතුහු කෙරෙන්) ඕ ප්‍රත්‍යයවේ; මුළුලෙව්, සකලලොකතෙම; ඔබදහමොද, උන්වහන්සේගේ ධර්මනැමැති අමෘතය; බෝ, පානයකෙරේ; ඒ, (දන යන ධාතුව කෙරෙන්) ඒ ප්‍රත්‍යයවේ; ඔබඅරිසඟ, උන්වහන්සේගේ ආර්‍ය්‍යසඞ්ඝතෙම; නොවුවන්දෙනේ, තීර්ථකයන් ජයගණී.

පදසිද්ධිය-ප පූර්ව වත වැරීමෙහි (පැවැත්මෙහි) යන ධාතුව කෙරෙන් ඒ ඉ ඊ උ ද යනාදි උපාධික සූත්‍රයෙන්-ඉ ප්‍රත්‍යයවේ; එකල්හි-පවත-ඉ-කියාතිබේ. සදරුත් යනාදි අධිකසූත්‍රයෙන්-වතයන්නෙහි තකාරස්ථ අකාරයෙන් තකාරය පහකළ කල්හි-පවත්-අ-ඉ-කියාතිබේ. පෙරපරවණන් නිසිවිදිනි යනාදි උපාධිකසූත්‍රයෙන් පූර්වස්වරය ලොප්කොට පරස්වරය ගාත්‍රාක්ෂරයට ආරූඪකළකල්හි පවති යනුවේ.

පා පීමෙහි යන ධාතුවකෙරෙන්-ඒ ඉ ඊ උද යනාදි සූත්‍රයෙන් ඕ ප්‍රත්‍යයවේ-එකල්හි-පා ඕ කියාවේ. ආකාරයෙන් පකාරය වෙන් කළ කල්හි-ප්-ආ-ඕ-කියාවේ. පෙරපරවණන් යනාදි උපාධික සූත්‍රයෙන් ආකාරය ලොප්කොට-පකාරයට බකාරාදෙශකොට ස්වරය ගාත්‍රාරූඪකළකල්හි-බෝ යනුවේ.

දන දිනීමෙහි යන ධාතුව කෙරෙන්-ඒ ඉ ඊ උද යනාදි සූත්‍රයෙන් ඒ ප්‍රත්‍යයකොට නකාරයෙහි අකාරය පෙරපරවණන් යනාදි සූත්‍රයෙන් ලොප්කොට සදරුත් යනාදි සූත්‍රයෙන් පිළිපෙරළකොට පැමිණවූකල දෙනේ යනු සිධවේ.

---

කුඹුටු-යනු මෙසේ සිධවේ-කුඹුදු යන ධාතුහු කෙරෙන් ඒ ඉ ඊ යනාදි අන සූත්‍රයෙන් දකාරයට ටකාරාදෙශවේ—එකල-කුඹුට-උ-පෙරපර යනාදි උපාධික සූත්‍රයෙන් පූර්වස්වරය ලොප්කොට පරස්වරය ගාත්‍රාරූඪකල කල්හි කුඹුටු යනු සිඩයි.

ආ-එතුනුරුවන් නිසවන් පුදා,
ඉති අන්කරුහි එකරුතැ වත්මන් පස-

---

අන්නේ-මෙනේ දිනිඳු පස්මරුන් දනන්නේ,
එන්නේ-අපවගඅමා දෙන්නේ.
ඔන්නේ=එ අම මහදෙනේ බොන්නේ.
නේ-එ උලෙල පොසොන්වැසි වස්නේ-b
ඉති අන්කරුහි එකරුතැ අනාංපස.

---

a ප-ආ, (පුද යන ධාතුව කෙරෙන්) ආ ප්‍රත්‍යයවේ; එතුනුරුවන්, ඒ රත්නත්‍රය; නිසවන්, සැණවත්තාතෙම; පුදා, පුදයොරේ; ඉති, මෙසේ; අන්කරුහි, අන්‍යකාරකයෙහි; එකරුතැ, එකවචනාර්ථයෙහි; වත්මන්පස, වර්ත්මාන ප්‍රත්‍යයයි.

පදසිද්ධිය-පුද පිදීමෙහි යන ධාතුවකෙරෙන් ආ ප්‍රත්‍යයවේ; එකල්හි පුද-ආ තියාතිබේ. යටහි පරිද්දෙන් දකාරයෙහි අකාරය ලොප්කොට ආකාරය ගාත්‍රාරූඪකළ කල්හි පුදා යනුවේ.

අනාගත කාලික අන්‍යකාරක එකවචනයට උදාහරණ.

b ප-අන්නේ, (දන යන ධාතුවකෙරෙන්) අන්නේ ප්‍රත්‍යයවේ; මෙනේදිනිඳු, මෛත්‍රෙය ජිනෙන්ද්‍රතෙම; පස්මරුන්, පංචමාරයන්; දනන්නේ, ජයගන්නේය; එන්නේ, (දා යන ධාතුව කෙරෙන්) එන්නේ ප්‍රත්‍යයවේ; අපවගඅමා, නිර්වාණනැමැති අමෘතය; දෙන්නේ, දානයකරන්නේය; ඔන්නේ, (පා යන ධාතුව කෙරෙන්) ඔන්නේ ප්‍රත්‍යයවේ; එඅම, ඒ අමෘතය; මහදෙනේ, මහජනතෙම; බොන්නේ, පානයකරන්නේය; නේ (වස යන ධාතුවකෙරෙන්) නේ ප්‍රත්‍යයවේ; එළලෙල, ඒ උත්සවයෙහි; පොසොන්වැසි, ප්‍රසූනවර්ෂාව; (මල්වැස්ස) වස්නේ, වර්ෂාය කරන්නේය—අන්කරුහි ඒකරුත, අන්‍යකාරකයෙහිවූ එකවචනයෙහි; අනාපස, අනාගත ප්‍රත්‍යය; ඉති, මෙසේයි.

අනාගත ක්‍රියා-දන යනු දිනීමෙහි වැටෙන ධාතුවයි-ඔහුකෙරෙන් ඒ ඉ ඊ උ ද යනාදි උපාධ්‍ය සූත්‍රයෙන් අන්නේ ප්‍රත්‍යයකොට ස්වරය ගාත්‍රාරූඪකළකල්හි දනන්නේ යනු සිඩවේ-මෛත්‍රෙය ජිනෙන්ද්‍ර යනු උක්ත කර්තෘයි-පස්මරුන් යනු අනුක්තකර්මයි-දීමෙහි වැටෙන දා යන ධාතුව කෙරෙන් එන්නේ ප්‍රත්‍යයවූ කල්හි දෙන්නේ යනු සිඩවීමද එසේය-බොන්නේ යන තන්හි පා යන්නේ පකාරයට සඳරුත් යනාදි අධ්‍යසූත්‍රයෙන් බකාරාදෙශකිරීමද වස්නේ යන තන්හි වස යන ධාතුහුගේ සකාරයෙහිවූ අකාරයට සඳරුත් යනාදි සූත්‍රයෙන් ලොප්කිරීමද දතයුතුයි.

(අතීතකාලික අන්‍යකාරක බහුවචනයට උදාහරණ.

ඌ-රුසිඟු මහගත් ගෙතූ (ගෙතූහ, ගෙතූහු)
හකරෙන් පස නැතිවද, හ හු, වෙ
ඕ-පඬිගු අරුත් පළකළෝ (කළහ, කළහු)
උ-ඒ නියවත්ගු උගත්තු, (උගත්හ, උගත්හු)
උන්-මරසෙන්හු බුන්, (බුන්හ, බුන්හු)-a

ඉති, අන්කරුහි බුහුබස අයුපස.

---

a ප-ඌ, (ගොතයන ධාතුවකෙරෙන්) ඌ ප්‍රත්‍යයවේ-රුසිඟු, සෘෂියෝ; මහගත්, මහග්‍රන්ථයන්; ගෙතූ, ග්‍රන්ථනයකළෝ; (ගෙතූහ, ගෙතූහු) යනුද වේ-හකරෙන්, සූත්‍රයෙහි කියනලද හකාරයෙන්* පස නැතිවද, ප්‍රත්‍යය නැතිවත්; හහුවේ, හයන්නද හුයන්නද වේ

ඕ, (කරයන ධාතුව කෙරෙන්) ඕ ප්‍රත්‍යයවේ; පඬිගු, පණ්ඩිතයෝ; අරුත් පළකළෝ, අර්ථ ප්‍රකාශකළෝ; කළහ කළහු කියාද වේ.

උ, (ගණයන ධාතුවකෙරෙන්) උ ප්‍රත්‍යයවේ. ඒ, එය; නියවත්තු, ඥාණවන්තයෝ; උගත්තු, ඉගෙණගත්තු; උගත්හ, උගත්හු කියාද වේ.

උන්, (බිඳයන ධාතුව කෙරෙන්) උන් ප්‍රත්‍යයවේ; මරසෙන්හු, මාරසේනාවෝ; බුන්, භග්නවූහ; බුන්හ, බුන්හු කියාදවේ-අන්කරුහි, අන්‍යකාරකයෙහි; බුහුබස, බහුවචනයෙහි; අයුපස, අතීත ප්‍රත්‍යය; ඉති, මෙසේයි.

ගෙතීමෙහි වැටෙන්නාවූ ගොතයන ධාතුවෙන් පරව හහුයුතු යනාදී උපාධිසූත්‍රයෙන් ඌ ප්‍රත්‍යය අතීතාර්ථයෙහි වේ-සදරුත් යනාදී අධිසූත්‍රයෙන් ගකාරයෙහි පිළිපෙරළිකොට පූර්වස්වරය ලොප්කොට පරස්වරය ගාත්‍රාරූඪකළකල්හි ගෙතූයි-සිඩයි-හයනු-හුයනු යුක්තවූ ඌ යෙදූකල්හි ගෙතූහ යනුද ගෙතූහු යනුද වේ-එම අර්ථයි

කිරීමෙහිවූ කර යන ධාතුවෙන් පරකොට "හහුයුතු වියුතුඌ" යනාදී සූත්‍රයෙන් ඕ ප්‍රත්‍යයකොට රකාරයට සදරුත් යනාදී සූත්‍රයෙන් ළ කාරාදේශකොට පූර්වස්වරලොපාදියකළ කල්හි කළෝ යනු සිඩයි—ඕ ප්‍රත්‍යය හ හු-යුක්තනොවන බැවින් කළෝහ යනාදිය නොවේ-හ-හු-පමණවූකල—කළහ-කළහු යනුද වේ-උ පූර්වගණ ගහණෙහි

---

* සූත්‍රයෙහි කියනලද හකාරයනම් "හහුයුතු වියුතුඌ බුහුබස ඕ උ උන් හා" යන්නෙහි හා යනුයි-එහි ස්වරය නොසලකා 'හකරෙන්' කියනලදී—මේ හා යන්න සමුච්චයාර්ථයි-එහෙයින් තවත් ප්‍රත්‍යය ක්‍රමයක් ගතයුතුබව ඉන් හැඟේ-එහෙයින් ඌ-උ-යනාදිය නැතිව හ-හු-යනුත් ඒ අර්ථයෙහි වේ යයි හැඟේ—එයින් කළහ-කළහු-උගත්හ—උගත්හු යනාදිය සිඩයි-ඕ යන්න හ-හු-යුක්තනොවේ.

(වර්තමානාන්‍යකාරක බහුවචනයට උදාහරණ.

අත්-වත්වත්හු මුනිගුණවණත්.
ඉත්-ලඇතියෝ එව්දිත්,
එත්-දනැතියෝ දන් දෙත්-a

(අන්‍යකාරක බහුවචන අනාගත ප්‍රත්‍යයන්ට උදාහරණ.)

අන්නෝ-සුසිරි කලහු මෙතේ දිනිඳු පුදන්නෝ.
අන්නාහු-ඒසස්නෙහි පැවිදිවන්නාහු
නාහු-අනතිරියපා කලහු ඔබ නොදක්නාහු.
දකාරෙන් උ වියුතුද වේ-b

ඉති අන්කරුහි බුහුබස අනාපස.

---

යන ධාතුවෙන් පරකොට-උ ප්‍රත්‍යය යෙදූකල උගත්තු යනු සිඩයි—ණකාරයට තකාරාදෙශකිරීම පමණක් විශෙෂයි—හ-හු පමණක් යෙදූකල-උගත්හ-උගත්හු යනුද සිඩයි—බිඳ, බිඳීමෙහි යන ධාතුවෙන් පරකොට යටකීසේ උත් යොදා ද යන්න ලොප්කොට පූර්වස්වරලොපාදිය කළකල්හි බුන් යනු සිඩයි--හයනු=හුයනු යුක්තකළකල්හි-බුන්හ-යනාදිය සිඩයි.*

a ප-අත්, (වණයන ධාතුහු කෙරෙන්) අත් ප්‍රත්‍යයවේ; වත්වත්හු මුඛඇත්තෝ; මුනිගුණ, බුඩගුණය; වණත්, වර්ණනාකරත්.

ඉත්, (විදයන ධාතුවකෙරෙන්) ඉත් ප්‍රත්‍යයවේ; ලඇතියෝ, හෘදය ඇත්තෝ; එව්දිත්, එය ලබත්.

එත්, දායන ධාතුව කෙරෙන් එත් ප්‍රත්‍යය වේ; දනැතියෝ, ධනය ඇත්තෝ; දන්දෙත්, දානයකෙරෙත්.

b ප-අනෙනෝ, (පුදයන ධාතුවකෙරෙන්) අනෙනෝ ප්‍රත්‍යයවේ; සුසිරිකලහු, සුචරිතකළ ජනයෝ; මෙතේදිනිදු, මෛත්‍රෙය නම් ජිනෙන්ද්‍රයන්; පුදන්නෝ, (මතු) පුජාකරන්නාහුය.

අන්නාහු, (වූයන ධාතුවකෙරෙන්) අන්නාහු ප්‍රත්‍යයවේ; ඒසස්නෙහි, ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ) ශාසනයෙහි; පැවිදිවන්නාහු, ප්‍රව්‍රජිත වන්නෝය.

නාහු, (දස්යන ධාතුවකෙරෙන්) නාහු ප්‍රත්‍යයවේ-අනතිරියපාකළහු, ආනන්තරිය පාපයකළෝ; ඔබ, ඒ මෛත්‍රෙය ජිනෙන්ද්‍රයන්වහන්සේ) නොදක්නාහු; දශ්නය නොකරන්නාහුය-දකාරෙන්, සූත්‍රයෙහි කියනලද දකාරයෙන් උවියුතුදවේ; උයන්නෙන් වියුක්තවද (ප්‍රත්‍යෙ)වේ † අන්‍යකාරක බහුවචනයෙහි අනාගත ප්‍රත්‍යය මෙසේයි.

---

* දා-දීමෙහි යන ධාතුවකෙරෙන් උත් යනාදිය කළකලහි දුන්-දුන්හ-දුන්හු-දුන්නු යනාදිය සිඩයි.

† සූත්‍රයෙහි අන්නාහු නාහුද කියා දකාරයක් තිබේ-ඒ සමුච්චයාර්ථවාචකයි-එහෙයින් අනාගතකාලික අන්‍යකාරක බහුවචනයෙහි-අන්නෝ-අන්

**තසඳකරු අරුත මෙම පස හි හු සියෝවේ**
**මසබඳ ඉ යුතු උ යුතු වියුතෝ යුතු මකරහා**-a
(තශබ්දකාරක අතීතාදියට උදාහරණ.)
**තෝ තෙප් පෙර සුසිරි කෙළෙහි කළහු.**
**දැන් රජකෙරෙහි කරහු.**
**මතු සෙත්පුර අත්පත්කරන්නෙහි කරන්නහු**-b
ඉති තසබඳ තෙකල්කිරිය.

---

පදසිද්ධිය-පිදීමෙහිවූ (පුදයන ධාතුව කෙරෙන්) "හනුදුතුවිදුතු" යනාදි සූත්‍රයෙන් අනාගත අන්‍යකාරක බහුවචනයෙහි "අනෙනෝ" යන ප්‍රත්‍යයවේ—"පෙරපරවණ්න්" යනාදි සූත්‍රයෙන් පූර්වස්වරයා ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකළකල්හි පුදන්නෝ යනු වේ—මෙසේම වීමෙහි වූ යන ධාතුව කෙරෙන් නාහු ප්‍රත්‍යය යෙදීමෙන් වන්නාහු යනු සිඩසි-දැකීමෙහිවූ දස්යන ධාතුවකෙරෙන් නාහු ප්‍රත්‍යය කොට සදරුත් යනාදි සූත්‍රයෙන් සකාරයට කකාරාදේශකළකල්හි දක්නාහු යනු සිඩසි-නො යනු-ප්‍රතිෂේධාර්ථවූ අව්‍යයශබ්දයෙහි.

a ප-තසදකරු අරුත, තශබ්දකාරකාර්ථයෙහි; මෙමපස, මෙම ප්‍රත්‍යයෙහි; හි හු සියෝවේ—හියන්නක්ද හුයන්නක්ද සංගතවේ; මසබඳ, මශබ්දකාරක සම්බන්ධයෙහි; ඉයුතු, ඉයන්නක් යුක්තාවද; උයුතු, උයන්නක් යුක්තාවද; වියුතු, වියුක්තාවද; ඔයුතු, ඔ යන්නක් යුක්තාවද; මකරහා, මකාරයාත් සමගද වන්නේය.

b ප-(උදාහරණ) තෝ, යුෂමත්; පෙර, පූර්වයෙහි; සුසිරිකෙළෙහි, සුචරිතකෙළෙහිය; තෙප්, යුෂමත්හු; කළහු, (පූර්වයෙහි සුචරිත)කළහුය-අතීතයි-දැන්, මේ කාලයෙහි; රජකෙරෙහි, (තෝ) රාජ්‍යයකෙරෙහිය; කරහු, (තොපි රාජ්‍යය) කරහුය-වර්තමානයි—මතු, අනාගතයෙහි; සෙත්පුර, නිවන්පුරය; අත්පත්කරන්නෙහි, (තෝ) හස්තප්‍රාප්ත කරන්නෙහිය; කරන්නහු, (තොපි අත්පත්) කරන්නහුය-අනාගතයි.

පදසිද්ධිය-කිරීමෙහිවූ කරයන ධාතුවකෙරෙන් "තසදකරුඅරුත" යනාදි සූත්‍රයෙන් අතීත තශබ්දකාරක එකවචනයෙහි හියන්නකින් යුක්තවූ එ ප්‍රත්‍යයවේ-"සදරුත් යනාදි සූත්‍රයෙන් රකාරයට ළකාරාදෙශ හා කකාරයෙහි පිළිපෙරළිකොට "පෙරපරවණ්න්" යනාදි සූත්‍රයෙන් පූර්වස්වරයා ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකළ කල්හි කෙළෙහි-කියා අතීත තශබ්දකාරක එකවචනය සිඩසි-බහුවචනය

---

අන්නාහු-නාහුද ඒ ඈර තවත් ප්‍රත්‍යයෝද වෙත යන අර්ථ හැසේ-එනම්, අන් නාහ-යනාදිය උකාරයෙන් වෙන්වූ ප්‍රත්‍යයයි-ඒ-අන්නාහ-නාහ-යන මොහුයි-ඒ ප්‍රත්‍යය වූකල වන්නාහ-දක්නාහ-කරන්නාහ-දන්නාහ-යනාදිය සිඩයි

(මශබ්දකාරක අන්තාදියට උදාහරණ.)

**මම ඇප් පෙර සපුරිසන් බිජිම්, බිජිමි,**
**බිජුමු, බිජුමෝ, බිජුම්හ, බිජුම්හු.**
**දැන් දුලබ මුනිපුත් තනතුරැ බෙජෙම් බෙජෙම්,**
**බජමු, බජමෝ, බජම්හ, බජම්හු,**
**මතු ලොව්තුරැදහම් බජන්නෙම්, බජන්නෙම්,**
**බජන්නෙමු, බජන්නමෝ-වහර සෙදෙනෙස් පස සොදනු-a**

ඉති මසබද තෙකල් කිරිය.

---

මෙම ධාතුවෙකරෙන් හුයන්නෙත් යුක්තවූ 'අ' ප්‍රත්‍යයකොට යටකී සේ ලකාරාදේශාදිය කළකල්හි 'කළහු' යනු සිඩයි.

තශබ්දකාරක සම්බන්ධයෙහි ත්‍රෛකාලික ක්‍රියා මෙසේයි.

a ප-මම්, මම්; පෙර, පූර්වයෙහි; සපුරිසන්, සත්පුරුෂයන්; බිජිම්, භජනයකෙළෙම්; බිජිමි කියාත් වේ-ඇප්, අපි; බිජුමු, භජනයකෙළෙමු-බිජුමෝ කියාද බිජුම්හ කියාද බිජුම්හු කියාද වේ අතීතයි.

දැන්, මේකාලයෙහි; දුලබ, දුර්ලභවූ; මුනිපුත්තනතුරැ, බුඩපුත්‍රස්ථානාන්තරය; බෙජෙම්, (මම) භජනයකෙරෙමි; බෙජෙම්, බෙජෙම් කියාද වේ—එම අර්ථයි-බජමු, (අපි) භජනයකරමු; බජමෝ, බජම්හ බජම්හු කියාද වේ-එම අර්ථයි-වර්තමානයි.

මතු; අනාගතකාලයෙහි; ලොවුතුරාදහම්, ලෝකෝත්තරධර්මය; බජන්නෙම්, (මම) භජනයකරන්නෙමි, බජන්නෙම් කියාද වේ-එම අර්ථයි-බජන්නෙමු, (අපි) භජනයකරන්නෙමු; බජන්නමෝ, කියාද වේ-එම අර්ථයි-අනාගතයි.

මසබද, මශබ්ද සම්බන්ධයෙහි; තෙකල්කිරිය, ත්‍රෛකාලික ක්‍රියා; ඉති, මෙසේයි.

පදසිඩිය-බජ සෙවීමෙහි යන ධාතුහුකෙරෙන්- ඒ ඉ ඊ උ ද යනාදී සූත්‍රයෙන් අතීතකාලයෙහි වන ඉ ප්‍රත්‍යයට තසදකරැ අරැත යනාදී සූත්‍රයෙන් මකාරයක් යුක්තකළකල්හි; බජ-ඉම්-කියා තිබේ—සඳ, රැත් යනාදී සූත්‍රයෙන් බකාරයාගේ පිළිපෙරළිකොට පෙරපරවණත් යනාදී සූත්‍රයෙන් ජකාරයෙහි අකාරය ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකළකල්හි බිජිම් කියාවේ--ඊටම ඉයන්න යුක්තකළකල්හි බිජිමි කියා වේ-බහුවචනයෙහි උයන්නට මකාරය උ යුක්තකොට යෙදූකල බිජුමු කියා වේ-සෙස්සද මෙම නයින් දතයුතු.

"දූන් සදහම් රජ කරන්නේ ගොයුමා"
"පණින් වෙලපන්නී අවිද" මායා තුසිපුරෙහි වුසු
මහමුහුනු සොම්නස්නම් පසේබුදුවනුයේ"
"විසාළවැසි රහත්පල බජන්නී"
ඈ සද්දහමින් අරුත්කිරිය සදවන කල්නොඇරඹැ පසලදින් ලිඟුවිබත් බෙජේ-a

---

a ප-දූන්, මේ (වර්තමාන) කාලයෙහි; සදහම් රජකරන්නේ, සද්ධර්ම රාජ්‍යය කරන්නේ; ගොයුමා, ගෞතමයි-පණින්, ප්‍රාණීන්; වෙළපන්නී, විඩම්බිත කරන්නී; අවිදු, අවිද්‍යාසී-මායා, මායාදේවීතොමෝ; තුසීපුරෙහි, තුෂිත නම් (දෙව) පුරයෙහි; වුසු, වාසයකළා-මහමුහුනු, ඊලුකපක්ෂිතෙම (බකමූනා); සොම්නස්නම්, සෞමනස්‍යනම්වූ; පසේබුදුවනුයේ, ප්‍රත්‍යෙක බුද්ධවන්නේයි-විසාළවැසි, විසාඛා උපාසිකා තොමෝ; රහත්පල, අර්හත්ඵලය; බජන්නී, භජනයකරන්නීය; ඈ, මේආදිය; සද්දහමින්, ශබ්දස්වභාවයෙන්; අරුත්කිරියසදවන, අර්ථක්‍රියා ශබ්දවූකල්හි; කල්නොඇරඹැ, කාලයක් අපෙක්ෂා නොකොට; පසලදින්, ප්‍රත්‍යයලත් හෙයින්; ලිඟුවිබත්, ලිඞ්ගවිභක්තීන්; බෙජේ, භජනයකෙරේ.

මෙහි සදහම්රජ යනු කර්මකාරකයි—කරන්නේ යනු අර්ථක්‍රිය ශබ්දයි-එහි නිෂ්පත්තිය මෙසේයි.

කිරීමෙහිවූ කරයන ධාතුහුකෙරෙන් දසින් නම්න්හොත යනාදි උපාඞ්ගසූත්‍රයෙන් හෝ සදරුත් යනාදි අඞ්ගසූත්‍රයෙන් හෝ අර්ථක්‍රියා ශබ්දයක් නිපදවීමෙහි කාලාපෙක්ෂානොකොට අන්න ප්‍රත්‍යයකොට පූර්වස්වරය ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකළකල්හි "කරන්න" යන ශබ්දය සිඩයි ඔහුකෙරෙන් ප්‍රථමාර්ථ කීමෙහි බජනුයේ පෙර විබත් යනාදි සූත්‍රයෙන් ප්‍රථමාවිභක්තිකොට එහි ඒකාර්ථයක් කීමෙහි 'ඒ' විභක්තිකොට පූර්වස්වරය ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪ කළකල්හි කරන්නේ යනුවේ-එය සදහම්රජ යන පදයාහා යෙදූ කල්හි සදහම් රජකරන්නේයි යෙදේ—මෙය වර්තමානාර්ථය ප්‍රකාශ කරන්නේ නමුත් අනාගතාර්ථයෙහිද වියහැකිවේ-වුසු යනු සිද්ධිලිඞ්ගික අර්ථක්‍රියාශබ්ද ප්‍රථමා එකවචනයි—එහි නිෂ්පත්තිය මෙසේයි:-විසීමෙහිවූ වස යන ධාතුහුකෙරෙන් අර්ථක්‍රියාශබ්දයක් නිපදවීමෙහි කාලයක් අපෙක්ෂානොකොට සදරුත් යනාදි සූත්‍රයෙන් හෝ දසින් නමෙන් හොත යනාදි සූත්‍රයෙන් හෝ අප්‍රත්‍යයකොට පූර්වස්වරය ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකොට සදරුත් යනාදි සූත්‍රයෙන් ස්ත්‍රීලිඞ්ගාර්ථයෙහි ඌප්‍රත්‍යයකොට වකාරයෙහි පිළිපෙරළිකොට ස්වරලොපාදියකොට ඔහුකෙරෙන් ප්‍රථමෛකවචනයෙහි ඒ විභක්තිකොට ලොප්කළකල්හි සිඩයි—තුසිපුරෙහි යන ආධාරයකා මායා යන උක්තකර්තෘ ප්‍රථමාද යුක්තවේ—මේ නයින්සෙස් සද දතයුතු.

**පියදු කිරියෙබ් අන්තසද්විදි ආසි**
**කමරුත නෙකල්කිරියද දනුපද අසබහව්හා–a**
**පරාවිසින් මෙහෙයනලදහු කිරිය පියදු කිරියනම්,**
**මෙහි දසින් පරවැ වපස රුසි.**
**කම්කෙලෙස් සසර පණන් බැමවි–මනයොනා යෝනන්කෙ**
**ළවා මෙමෙත් සුගතිඳු ලෙවන් ගලවන්නෝ–තමසද දෙක්හිද**
**යෙදියයුතු-b**

a ප–පියදුකිරිය, ප්‍රයොජ්‍යක්‍රියාහුගේ; බෙ, භෙදයද; අන්තසද්විදි, අන්‍යශබ්ද තශබ්ද සම්බන්ධවූ විධි (ක්‍රියා)ද; ආසි, ආශිර්වාද (ක්‍රියා)ද; කමරුත, කාම්‍යාර්ථයෙහි; නෙකල්කිරියද, ත්‍රෛකාලික ක්‍රියාවද; අස බහව්පදහා, අසම්භාවනීය (ක්‍රියා) පදද; දනු, අවබොධකරව.

මෙහි ප්‍රයොජ්‍යක්‍රියානම් යමෙකුවිසින් අනුන්ට නියොගකොට හෝ නිමන්ත්‍රණයකොට කරවන ක්‍රියාව කියන පදයි–විධික්‍රියානම් අනුන්ට නියොගකිරිමට යෙදෙන ක්‍රියාපදයි–එය මශබ්දකාරකයෙහි නොවේ—ආශිර්වාදනම් ප්‍රාර්ථනාව කියන ක්‍රියාපදයි–කාම්‍යාර්ථනම් ක්‍රියාව කරණු ලබන්නා කියවෙන ක්‍රියාපදයි.

ඒ ක්‍රියාවන්ගේ ලක්‍ෂණ.

b ප–පරාවිසින්, අන්‍යයෙකු විසින්; මෙහෙයනලදහු, නියොගකරණලද්දහුගේ; කිරිය, ක්‍රියාව; පියදුකිරියනම්, ප්‍රයොජ්‍යක්‍රියානම්වේ–මෙහි, මේ ප්‍රයොජ්‍යක්‍රියායෙහි; වපස, ව යන ප්‍රත්‍යය; දසින් පරවැ, ධාතුවෙන් පරව; රුසි, අභිමතයි.

උදාහරණ.

කම්කෙලෙස්, කාමක්ලෙශතෙම; සසර, සංසාරයෙහි; පණන්, ප්‍රාණීන්; බැමවි, භ්‍රාන්තකරවී–(අතීතයි) මනයොනා, අනඞ්ගතෙම; යෝනන්, යූනයන්; කෙළවා, ක්‍රීඩාකරවා–(වර්තමානයි) මෙමෙත් සුගතිඳු, මෛත්‍රෙය සුගතෙන්ද්‍රතෙම; ලෙවන්, ලෝවැස්සන්; ගලවන්නේ, (සංසාරයෙන්) මුක්ත කරන්නේය–තමසදදෙක්හිද, තශබ්ද මශබ්ද කාරක දෙක්හිද; යෙදියයුතු, යොජනය කටයුතුයි.

පදසිඬිය–බැමීමෙහි වැටෙන්නාවූ; බම, යන ධාතුවකෙරෙන් අතීත අන්‍යකාරක ඒකවචනවූ, ඊ වෙසි ඒකල බම–ඊ කියාතිබේ–නැවත බමයන ධාතුවකෙරෙන් ප්‍රයොජ්‍යාර්ථයෙහි ව ප්‍රත්‍යයවේ–එකල්හි–

* තශබ්ද මශබ්ද දෙක්හි යොදන අපුරු තශබ්දකාරකයෙහි කෙළෙහි, කළහු යන ක්‍රියාපද කරවූයෙහි, කර වූහුයි යෙදූකල අතීතයි කරහු යනාදිය කරවනු යනාදින් යෙදූකල වර්තමානයි—පුදනෙහෝ යනාදිය පුදවනෙහෝ යනාදිය් යෙදූකලැ අනාගතයි—මශබ්දකාරකයෙහි-කරවීම්, කරවමි, කරවන්නෙමි යනාදින් සුගමය-පුර්වක්‍රියාදියෙහි කරවා යනාදි ප්‍රයොජ්‍යක්‍රියා සුගමයි.

**අකම් සකම් වෙ පියදුම්ලද විසාගි**
**බුහුකම් සකම් පියදුම් ලදහට ලවා හාවෙ-a**
**“ සුදෙම අනවැසිලවා මේ පිසවා” ඇගී —**
**හකාරෙන් කිසිතන්හි නොවේ.**
**“ මූවවස්නියුතු බුලත්දිදී දෙවාදරුවන්” මේ ඇගී-b**

ඉති පියදු කිරිය.

---

බමව-ඊසි තිබෙ-සදරුත් යනාදි සූත්‍රයෙන් බකාරයෙහි මාත්‍රාවෘධි හෝ පිත්‍රිපෙරළිකොට පෙරපරවණන් යනාදි සූත්‍රයෙන් වකාරයෙහි අකාර ලොප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකලකල්හි බැමවී යනු සිඬසි-කෙළවා යනාදියෙහි ආයනාදිය පරකල්හි ව ප්‍රත්‍යය කිරීමෙන් සිඬිය මේ නයින් දතයුතුසි.

a ප-අකම්, අකර්මක (ධාතු) තෙම; පියදුම්ලදවිසාගි, ප්‍රයොජ්‍ය (කාරිතය) ලැබූ විෂයෙහි; සකම්වේ, සකර්මකවන්නේය; සකම්, සකර්මක (ධාතු)තෙම (ප්‍රයොජ්‍ය ලැබූතන්හි) බුහුකම්, බොහෝ කර්ම ඇතිවේ; පියදුම්ලදහට, ප්‍රයොග (මෙහෙයීම) ලැබුවාහට; ලවා හාවේ, ‘ලවා’ යන ප්‍රත්‍යයදවේ.

උදාහරණ.

b ප-සුදෙම, සූදජ්‍යෙෂ්ඨතෙම; අතවැසිලවා, අන්තෙවාසිකයා ලවා; මේ පිසවා, භොජනය පිසවයි; ඇගී, යනාදි ආකාර ඇත්තේසි හකාරෙන්, (කව්හි ‘හා’ හි) හකාරයෙන්; කිසිතන්හි, (යම්) කිසි ස්ථානයෙක්හි; නොවේ-(ලවා ප්‍රත්‍යය) නොවන්නේය.

මූවවස්නියුතු බුලත්, මුඛවාසයෙන් යුක්තවූ තාම්බූලය; දිදී, දාන යකරමින්; දරුවන්, දාරකයන්ලවා; දෙවා, දානයකරවයි; මේ ඇගී, මේ ආදි ආකාර ඇත්තේසි—ඉති, මෙසේ; පියදුකිරිය, ප්‍රයොජ්‍ය ක්‍රියාව (වේ.)

පදසිඬිය-පිසවා කියා වර්තමාන අන්‍යකාරක ප්‍රයොජ්‍ය එකවචන ක්‍රියාපදයක් කළමනා තන්හි, පිසීමෙහි වන්නාවූ පිස යන ධතුව කෙරෙන් ඒ ඉ ඊ උද යනාදි සූත්‍රයෙන් අ ප්‍රත්‍යවේ-ධාතුවෙන් පරම සදරුත් යනාදි අධිකසූත්‍රයෙන් ප්‍රයොජ්‍යාර්ථයෙහි ව ප්‍රත්‍යය වේ— එකල පිස ව අ කියාතිබෙ-පෙරපරවණන් යනාදි උපාධිකසූත්‍රයෙන් වකාරයෙහිවූ අකාරය ලොප්කොට ආකාරය ගාත්‍රාරූඪකලකල්හි පිසවා යනු සිඬසි. දෙවා යනුද මෙම නයින් දතයුතු.

අකර්මක ධාතුවකින් ප්‍රයොජ්‍යක්‍රියාවක් වූකල සකර්මක ක්‍රියාවවේ- සකර්මක ධාතුවකින් ප්‍රයොජ්‍යක්‍රියාවක් වූකල කර්ම කිපයක් යෙදී බහුකර්මවේ.*

---

* සදවා සුදුවැලි පිපි තුරු—බ ද වා රන්දද පිය කරු
සිටුවා දෙර දෙර රඹ තුරු—තබවා පුන්කුඹු විසි තුරු-යනාදි තන්හි සදවා බදවා යනාදි ප්‍රයොජ්‍යපූර්වක්‍රියාවයි-මිට උදාහරණ දක්වීමෙහි ආචාර්‍ය්‍යයන් විසින් අකර්මකධාතුවක්හ් සකර්මකව යෙදුන ක්‍රියාවක් කොදක්

විධික්‍රියා.

**වත්මන් අනා රූ නොවෙන්වැ හොත අනදරින්**
**අදරින් හෝ න අන් සබඳහට විදහන් විදිනම්.**
**මෙහි-අ, ඒ, අන්නේ, අන්නැ, අව්, උ, පස රූසි-ඎ**

ඎ ප-වත්මන් අනාරූ, වර්තමාන අනාගත රූපයන්ගේ; නොවෙන් වැ, පෘථග්භාවයක් (වෙනසක්) නැතිවැ; අනදරින්හොත, අනාදර යෙන් (අගෞරවයෙන්) හෝ; අදරින්හෝ, ආදරයෙන් හෝ; න අන් සබඳහට, නශබ්ද අන්‍යශබ්දසම්බන්ධයට; විදහන්, විධාන (නියොග) කිරිම; විදිනම්, විධි (ක්‍රියා) නම් වේ-මෙහි, මේ විධි (ක්‍රියා) යෙහි; අ-ඒ-අන්නේ-අන්නැ=අව්-උ (ආදිවූ) පස, ප්‍රත්‍යය; රූසි, අභිමතයි.

මෙහි භාවය-වර්තමාන අනාගතවශයෙන් පදයන්ගේ ආකාරවිශෙෂයක් නැතිව ආදරයෙන්හෝ අනාදරයෙන්හෝ නශබ්ද කාරක අන්‍ය ශබ්දකාරක දෙකට නියොගයක් කරණපද විධික්‍රියායි—වර්තමාන අනාගත දෙක්හිම විධික්‍රියා එකාකාරයි—අතීතයෙහි පවතිනා විධි ක්‍රියාවක් නැත්තේයි-මශබ්දකාරකයෙහිද නැත්තේයි*

මේ විධික්‍රියාවෙහි ප්‍රත්‍යයනම් අ ඒ අන්නේ-අන්නැ-අව් උ යනමේයි†

---

වනලදි-පිසවා යනු පිසයන සකර්මකධාතුවෙන්වූ ක්‍රියාවයි-එහෙයින් එහි අත වැසි යනුද මේ යනුදූයි කර්මදෙකක්වී—දෙවා යනුද සකර්මකවූ-දා යන ධාතු වෙන්වූ ක්‍රියායි-එහිදු දරුවන් යනුද බූලත් යනුදූයි කර්මදෙකක් වි—එහෙයින් දූත් බාලයන්විසින් අකර්මකධාතුවෙන් සකර්මකවූ ක්‍රියාපද දතයුතුයි—දූන් සිත බවා—යන තන්හි, බවා යනු අකර්මකවූ ධාතුවෙන්වූ ප්‍රයොජ්‍ය පූර්වක්‍රියා පදයකි—ඊට දූත්සිත යන කර්මයක් සෙදේ—

> "කුළුණු සව්ලෙව් වෙත. නුවණ සව්නෝ පදරුත
> දහම් සත සිත සිත, පැවැත්වි අපමුනිඳු දියනෙත"

යන මෙහි "පැවැත්වි" යනු අකර්මකධාතුවෙන් සකර්මකවූ ක්‍රියායි—ප, යන උපසර්ග පූර්ව වතු වැටුම්හි යන ධාතුවෙන් ස්වතන්ත්‍රකර්තෘ වූකල-දහම් පවති-පැවති යනාදීන් අකර්මකක්‍රියායි—මුනිඳු දහම් පැවැත්වි කිහා ප්‍රයොජ්‍යක්‍රියාවූ කල සකර්මකයි—මෙහි, මුනිඳු යනු කර්තෘයි දහම් යනු කර්මයි—සත යනු සම්බන්ධයි, සිත. සිත යනු විප්සාර්ථයෙහි වීහවූ අධාරයි-කර්තෘ උක්තයි.

* තමාට තමාම නියොගයක් කරතහොත් තමහට අමන්ත්‍රණයකොට තෝය කියා නශබ්ද කාරකයෙන් යොදත් ගුත්තිලයෙහි "බලව" දූන්වූදේ—

† මෙහි අ-ඒ-අනනැ-යන තුන නශබ්දකාරක එකවචනයි—අව්—උ දෙක නශබ්දකාරක බහුවචනයි. අන්නේ-අන්‍යකාරක එකවචනයි. අන්‍යකාරක බහුවචනලෙස මෙහි ප්‍රත්‍යයක් හෝ උදාහරණයක් හෝ නොපෙණේ—අන් නාහුගයි සිතියයුතුයි.

අ-බමුණ පනද බොජ, ඒ-සැරදේ මහබා.
අන්නේ-මේ කරු මේ පිසන්නේ.
අන්නැ-හිමි නුඹ දහම් දෙසන්නැ.
අව්-ගුණෙකැත් නම් මෙහි බජව්.
උ-සජනෙනි යහක් දක්කු. මෙහි කිසිවිදි ආසිගැබ-a

ඉති විදි කිරිය

---

ඉටු නොපත් තෙසඳබඳ අනාඅරුත් පැතුම් ආසිනම්.
මෙහි පසින් පරවැ වා පස රුසි-b

---

## උදාහරණ.

a ප-අ-(බොද බොජුමෙහි යන ධාතුවකෙරෙන්) අ යන ප්‍රත්‍යය (වේ)-බමුණ, බ්‍රාහමණය; පනද, දෙවෙනිදින; බොජ, අනුභවකර; ඒ-(දි පණ දැරිමෙහි යන ධාතුව කෙරෙන්) ඒ ප්‍රත්‍යය (වේ)-මහබා, මහා බාහු ඇත්ත; හෝ, මහා භාග්‍යඇත්ත; සැරදේ, චිරකාලයක් ජීවත්වා-අන්නේ (පිස පිසීමෙහි යන ධාතුව කෙරෙන්) අන්නේ ප්‍රත්‍යය වේ) මේකරු, භක්ත කාරකතෙම; මේ පිසන්නේ, බත පිසන් නේය; අන්නැ-දෙස-(දෙසීමෙහි යන ධාතුව කෙරෙන්) අන්නැ ප්‍රත්‍යය (වේ)-හිමි, ස්වාමිය; නුඹ, නුඹවහන්සේ; දහම්, ධර්මය; දෙසන්නැ, දෙසනාකළමැනව; අව්, බජ-(සෙව්මෙහි යන ධාතුව කෙරෙන්) අව් ප්‍රත්‍යය (වේ)-මෙහි ගුණෙක් ඇත්නම්, මෙහි ගුණයක් ඇත්තේනම්; බජව් (තෙපි) භජනයකරව්; උ-දස (බැලිමෙහි යන ධාතුව කෙරෙන්) උ ප්‍රත්‍යය (වේ) සජනෙනි, සජ්ජනයෙනි; යහක්, යහපතක්; දක්කු, දර්ශනයකරව්; මෙහි, මේ විධි (ක්‍රියා) යෙහි; කිසිවිදි, කිසි විධානයක්; ආසිගැබ, ආශිර්වාදය ගර්භකොට ඇත්තේසි-ඉති විදි කිරිය-මේ විධික්‍රියාසි.

පදසිද්ධිය-බොජ කියා තශබ්දකාරක අනාගතකාලික එකවචන ක්‍රියාවක් කළමනාතන්හි වැලඳීමෙහිවූ බොද යන ධාතුව කෙරෙන් අප්‍රත්‍යයකොට පූර්වස්වරයා ලොප්කොට සඳරුත් යනාදීන් දකාරයට ජකාරාදේශකොට පරස්වරයා ගාත්‍රාරූඪකළකල්හි බොජ යනු සිඩසි- පණ දැරීමෙහිවූ දි යන ධාතුව කෙරෙන් ඒ ප්‍රත්‍යය වීමෙන් දේ යනු සිදුවීමාදිය සුගමසි.

b ප-ඉටු, ඉෂ්ටවූ; නොපත්, නොපැමිණියාවූ; තෙසබඳ, (අන්‍ය කාරක තශබ්දකාරක මශබ්දකාරක යන) ත්‍රිශබ්ද සම්බන්ධවූ; අනාඅරුත්, අනාගතාර්ථයක්හු; පැතුම්, ප්‍රාර්ථනාකිර්ම; ආසිනම්, ආශිර්වාදනම් වේ-මෙහි, මේ ආශිර්වාදක්‍රියායෙහි; පසින්පරවැ, ප්‍රත්‍යය කෙරෙන් පරව; වාපස, 'වා' යන ප්‍රත්‍යය; රුසි, අභිමතයි.*

---

* පසින් පරවැසි-ප්‍රත්‍යයෙන් පරවයයි අර්ථයමින් කී නමුත් වර්තමාන ක්‍රියා ප්‍රත්‍යයෙන් පරව යෙදුන ප්‍රයොග පෙණෙනහෙයින් එසේ ගතයුතු බුදුවෙම් වා යනාදීයෙන්ද එය ප්‍රකාශයි

සරසවිය මාමුව තඹර ඉස්බෙව්වා-
නරපවර වැජඹෙහිවා-
දියහිය කිරිමෙහි වත්වෙම්වා-a

ඉති ආසිකිරිය.

---

මෙවිසූ සව්කිරිය පෙදෙහි කිරියකමරුත්
බැරිවැ විවැකුව කම් පස යෙදෙනසේ කරණු.
අයුහි දුපසමැද නපස පිළිපෙරළිද අනාවත්මන්හි පිළිපෙර
ළිද මත්වැඩිද රුසි-b

---

## උදාහරණ.

a ප-සරසවිය, සරස්වතිතොමෝ; මාමුව තඹර, මාගේ මුඛනැමැති තාමරසයෙහි; ඉස්බෙව්වා, විශ්‍රාම කෙරේවා; (අන්‍යකාරකයි) නර පවර, නරොත්තමය; වැජඹෙහිවා, විජෘම්භණයකෙරෙහිවා (තශබ්ද කාරකයි) දියහිය කිරිමෙහි, ජගත් හිතකිරීමෙහි; වත්වෙම්වා, ප්‍රභූ වෙම්වා (මශබ්දකාරකයි) ඉති ආසිකිරිය, මේ ආශිර්වාද ක්‍රියායි.

පදසිද්ධිය-'ඉස්බෙව්වා' කියා ආශිර්වාදශෙෂකාරක එකවචන ක්‍රියාවක් කළමනාතන්හි අදන් දුරුකිරීමෙහිවූ ඉස්බ යන ධාතුව කෙරෙන් ඒ ඉ ඊ උද යනාදි උපාධිසූත්‍රයෙන් වර්තමාන තත්ශබ්දකාරක එකවචන ඒ ප්‍රත්‍යයකොට පෙරපරවණත් යනාදි සූත්‍රයෙන් පූර්වස්වර ලොප්කොට වර්තමාන තත්ශබ්දකාරක එකවචනය සිඩකොට ඒ වර්තමාන ප්‍රත්‍යයාකෙරෙන් ආශිර්වාදාර්ථයෙහි වා ප්‍රත්‍යය මෙහි කීසේ කළ කල්හි ඉස්බෙව්වා යන ක්‍රියාපදය සිඩයි—වැජඹෙහිවා වත්වෙම්වා යන පදද මෙම නයින් දත්නේයි.

කර්මකාරක ක්‍රියා.

b ප-මෙවිසූ, මේ කියනලද්දාවූ; සව්කිරිය පෙදෙහි, සර්වක්‍රියා පදයෙහි; කිරිය, ක්‍රියාව; කමරුත් බැරිවැ, කර්මාර්ථයෙහි භාරව; විවැකුව, විවක්ෂාකළහොත්; (කියන්නට ඉච්ඡාකළහොත්) කම්පස යෙදෙනසේ, කර්මප්‍රත්‍යය යෙදෙන පරිද්දෙන්; කරණු, කරණුලැබේවා.

අයුහි, අතීතයෙහි; දුපසමැද, ධාතුප්‍රත්‍යයන් දෙදෙනාගේ මධ්‍යයෙහි; නපස, 'න' යන ප්‍රත්‍යයද; පිළිපෙරළිද, ප්‍රාණස්වර විපර්‍ය්‍යාසයද; අනාවත්මන්හි, අනාගත වර්තමානයන්හි; පිළිපෙරළිද, ප්‍රාණස්වර විපර්‍ය්‍යාසයද; මත්වැඩිද, මාත්‍රාවෘද්ධියද; රුසි, අභිමතයි.

භාවය-මේ කියනලද අතීතාදි සියලු ක්‍රියාපදයන්හි ක්‍රියාව කර්මය උක්තකරණු කැමතිකල්හි-ක්‍රියාව කර්මය සමග යෙදෙන හෙයින් කර්මක්‍රියාවට යොග්‍ය ප්‍රත්‍යයාදිය යෙදියයුතුයි-ඊට යොග්‍යවූ ප්‍රත්‍යය හා පිළිපෙරළි ආදිය මේ කියනලදී.

අගමගගිනි කෙලෙස්කැස දැවිනි.
සුසිරි චතුරෙන් ඇතියග වැසේ.
සසුන් පිරියත දුතන්විසින් සතරරූ මැවෙන්නේ.
මෙ ඇ විමසනු-𑇡
මෙහි අරුත් වියතන වර ලබඳු සොඳනු රුසි
නිතැතින් සැපයෙන කතු අරුත් හටද මෙපස රුසි
" බැබලිනි"ඇගි
" කුසුල් තෙමබිදේ"මේ ඇ තෙමකතු තෙමකම් නම්-𑇢

---

## උදාහරණ.

𑇡 ප-අගමග අගිනි, අග්‍රමාර්ගීය (ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගී) නැමැති ගින්නෙන්; කෙලෙස්කැස, ක්ලේශනැමැති කචජය; (ලැහැබ) දැවිනි, දවනලදී; (අතීතයි) සුසිරිචතුරෙන්, සුචරිතනැමැති ප්‍රවාහයෙන්; ඇණියග, අණුතරවූ පාපයතෙම; වැසේ, ප්‍රච්ඡන්නවේ-(වර්‍තමානයි) සසුන් පිරියත, ශාසනපර්‍ය්‍යන්තයෙහි; දුතන් විසින්, ධාතූන් විසින්; සතරරූ, ශාසනාරූපය; මැවෙන්නේ, නිර්මිතකරණු ලබන්නේය; (අනාගතයි) මේ ඇ, මේ ආදිය; විමසනු, පරීක්ෂාකරණු ලැබේවා.

### පදසිඩිය.

දව, දැව්මෙහි යන ධාතුව කෙරෙන්-ඒ-ඉ-ඊ-උ-ද යනාදී උපාඩිශ සූත්‍රයෙන් අතීතකාලයෙහි ඉ ප්‍රත්‍යයවේ-දව-ඉකියාතිබේ-සඳරුත් යනාදි අධිකසූත්‍රයෙන් අයුහි දූපයමැද න පස යනාදීන් හි පරිද්දෙන් කර්මාර්ථයෙහි ධාතුප්‍රත්‍යයමැද 'න' ප්‍රත්‍යයකොට පිළිපෙරළි අඳීය කළකල්හි දැවිනි යනු සිඩයි-වස, වැසීමෙහි යන ධාතුවකෙරෙන් යටකිසේ වර්තමානයෙහි ඒ ප්‍රත්‍යයකොට කර්මාර්ථයෙහි මාත්‍රාවෘඩිකළ කල්හි වැසේ යනු සිඩයි.

මව නිපදවීමෙහි යන ධාතුවකෙරෙන් අනාගත අන්නේ ප්‍රත්‍යය වීමෙන් මැවෙන්නේ යනු දතයුතු.

𑇢 ප-මෙහි, මේ කර්මක්‍රියායෙහි; අරුත්වියතනවර, අර්ථව්‍යාඛ්‍යානය කරණුකල්හි; ලබඳුසොඳනු, ලබ යන ධාතුව යෙදීම; රුසි, අභිමතයි; නිතැතින්, නිරුත්සාහයෙන්; සැපයෙන, සම්පාදනයකරණු ලබන්නාවූ; කතුඅරුත්හටද, කර්තෘ අර්ථයටද; මේ පස, මේ කර්මකාරක ප්‍රත්‍යය; රුසි, අභිමතයි; බැබලිනි, විරාජමානවිය; ඇගි, මේ ආදී ආකාර ඇත්තේයි-කුසුල්, කුසලය; තෙමබිඳේ, තෙමේ භග්නවේ; මේ ඇ, මේ ආදිය; තෙමකතු තෙමකම්නම්, ස්වයංකර්තෘ ස්වයං කර්ම නම්වේ.

මේ කර්ම (ක්‍රියාවේ) අර්ථකියනවිට යෙදුන ධාතුවේ ක්‍රියාව භාව වශයෙන් යොදා (ලබ යන ධාතුවෙන්) කර්මකාරක ක්‍රියාව යෙදූකල්හි අර්ථය ප්‍රකාශවන බැවින් ලබ ධාතු යෙදීම අභිමතයයි කියනලද දේය-ඒමෙසේයි. 'වැසේ' යන්නෙහි අර්ථ වසනු ලබන්නේය කී කල්හි ප්‍රකටවේ.

විදිවිසාහි "කරනු බොජනු" ඇවෙ-මෙහි නුපසරුසි.
හම් තැන්හි යෙදෙනසේ බුහුබස් සලසනු-ඉති කම්කිරිය-a
තෙකල තෙසදරු නොවෙන් වැහොත අනියම් *
අරුතැ කල් අරුතැහොත කිරිය අසබහව් නම්—
මෙහි නපස රුසි—"නොබැරි තැනැතියනපවගයන"
"වණනබැරි මුනිගුණ සියල්" උරද කල්කරන ඔසුනිතනපාර
දවන් මේ ඇගි–b

ප ද සි ඞි ය.

'බබල'' 'සොබනෙහි' යන ධාතුහු කෙරෙන්-ඒ-ඉ-ඊ-උ-ද යනාදීන් (අතීතයෙහි ඉ ප්‍රත්‍යයකොට 'කර්‍ම'කාරක විෂයෙහි ධාතු ප්‍රත්‍යය දෙකමැද 'න' ප්‍රත්‍යයකොට පිළිපෙරළිකොට ලොපාදියකළ කල්හි බැබලිනි යනු සිඩසි-බිඳ-බිඳීමෙහි යන ධාතුහු කෙරෙන් (වර්‍තමානයෙහි) 'ඒ' ප්‍රත්‍යයකොට පූර්‍වස්වරලොපාදිය කළකල්හි 'බිඳේ' යනු සිඩසි-දකාරාර්‍ථයෙන් කිසිතැන පිළිපෙරළි නොවේ.

a ප–විදිවිසාහි 'කර්‍ම' කාරකයෙහිවූ; විධි 'ක්‍රියා' විෂයෙහි; 'කරනු' 'බොජනු' ඇවෙ 'කරනු' 'බොජනු' යනාදිය වේ-මෙහි, මේ 'කර්‍ම කාරක' විධික්‍රියා විෂයෙහි; නුපස, 'නු' ප්‍රත්‍යය; රුසි, අභිමතයි-†හම් තැන්හි, සැමතන්හි; යෙදෙනසේ, යුක්තවන පරිද්දෙන්; බුහුබස්, බහුවචනය; සලසනු, සිඩකරණුලැබේවා-ඉති කම්කිරිය, මේ කර්‍ම ක්‍රියායි-'කරනුලැබේවා' යනාදි කර්‍මකාරක විධික්‍රියාවෙහි-'කරනු' යනාදි පදයි. මෙහි ධාතුවෙන් පරව නු ප්‍රත්‍යයයි-වනු යනාදියත් මෙසේමැයි.

හම්තැන්හි, සකලස්ථානයෙහි; යෙදෙනසේ, යුක්තවන පරිද්දෙන්; බුහුබස්, බහුවචනය; සලසනු, යොදනු ලැබේවා-ඉති කම්කිරිය, මේ කර්‍මක්‍රියායි.

b ප–තෙකල, (අතීත වර්‍තමාන අනාගත යන) තුන්කාලයෙහි; තෙසද, (අන්‍ය ශබ්ද ත ශබ්ද ම ශබ්ද යන) ශබ්ද තුණෙහි; රූ නොවෙන්ව; රූපභෙදයක් නැතිව; අනියම් අරුතැහොත, අනියමාර්‍ථ

* බබල-යන ධාතුව අකර්‍මකයි-බබලා-යනාදීන් 'වර්‍තමානාදී, ක්‍රියාපද සිඩයි නිරුත්සාහයෙන් ඉබේම 'ක්‍රියා' සිඞිය ඇති තැන කර්‍මකාරකයට නියමවූ ප්‍රත්‍යය යෙදෙන හෙයින් 'බැබලිනී' කියා සිඩවී- වැඩුනී, 'වැඩේ' යනාදියත් මෙසේයි–වඩ වැඩීමෙහි' යන ධාතුවද අකර්‍මකයි-එහි කර්‍ම ක්‍රියා 'වඩී' යනාදීන් සිඩයි. "දුන පින් සමග යසසිරිවඩි පුත්රුවන" යනාදින් දනසුතුයි—නිරුත්සාහයෙන් සම්පාදනය දක්වා කියන තැන "වැඩුනී නවයදමෙන් දිනෙන්දින" යනාදියයි.

† කරනු, යනාදි තන්හි ප්‍රකෘතියෙන් 'නු' ප්‍රත්‍යය දක්නජයි—එසේම පැවැත්ම බොහෝ පුරාතන පාඨවල පෙණේ-එතකුදුවුවත් කර-දර යනාදි ධාතුන්කෙරෙන් පරවූ කල්හි-සදරුත් යනාදි අභූසුත්‍රයෙන් මූර්‍ධජාදෙශකොට 'කරණු' 'දරණු' යනාදින් යෙදීම ඇතැම් පණ්ඩිතයන්ට අභිමතයි.

**"ලෝවිසා නොසිතියහැකි, බව්නෙන් මොක් දක්නහැකි, සස් කිවයෙහෙකි, සුසිරිකල මැනවි"-මේ ඈද අසබහවිහි රුසි-පස යෙදෙනසේ සලසනු-a**

ඉති අසබහව් කිරිය.

---

යෙහි හෝ; කල්අරුතැහොත, කාලාර්ථයෙහි හෝ (වන); කිරිය, ක්‍රියාව; අසබහව් නම්, අසම්භාවනීය නම්වේ; මෙහි, මේ (ක්‍රියා) පද විෂයෙහි; තපස, 'ත' යන ප්‍රත්‍යය; රුසි, අභිමතයි.

## උ දා හ ර ණ.

තැතැතියන, උත්සාහ ඇත්තන්; අපවගයත, නිර්වාණයට යත හොත්; නොබැරි, භාර නොවේ; (දුෂ්කරනොවේ) සියල් බුදුගුණ, සකල බුද්ධගුණය; වණත, වර්ණනාකරත හොත්; බැරි, භාරයි; (දුෂ්කරයි) උරදු, උරෝජාතයා (පුත්‍රයා); කල්කරත, කාලක්‍රියාකළ කල්හි; ඔසුනි, ඖෂධයෙන්; තනපා, ස්තන්‍යක්ෂීරය (තනේකිරි); රද වන්, නවත්වන්-මේ ඈයි, මේ ආදි ආකාර ඇත්තේයි.

අසම්භාවනීය හෙවත් අනියත ක්‍රියායෙහි; අතීතාදි කාලවිශෙෂය සඳහා හෝ ප්‍රථමපුරුෂාදි පුරුෂ විශෙෂය සඳහා හෝ රූපවිශෙෂ යක් නොව අනියමාර්ථයෙහි හෝ කාලාර්ථයෙහි හෝ යෙදේ—මීට 'ත' ප්‍රත්‍යය යෙදේ. *

පදසිඩිය-යා ගමන්හි, යන ධාතුවකෙරෙන්; අසම්භාවනීයාර්ථයෙහි; ත ප්‍රත්‍යය කොට ධාත්වන්තයට මාත්‍රාහානිකළකල්හි යතයනු සිඩිසි-වණ, වැණුමෙහි යන ධාතුවකෙරෙන් ත කළ කල්හි (වණත) යනු සිඩයි-කර, කිරීමෙහි යන ධාතුව ෂකරෙන් ත ප්‍රත්‍යය කළකල්හි 'කරත' යනු සිඩයි.

### අසම්භාවනීය (ක්‍රියා) විශෙෂයකට උදාහරණ.

a ප-ලෝවිසා, ලොකවිෂය; නොසිතියහැකි, චින්තනයකළ නොහැක්කේය; බව්නෙන්, භාවනාහෙතුවෙන්; මොක්, මොක්ෂය; දක්නහැකි, දර්ශනයකළහැක්කේය; සස්කිව, සත්‍යය කිවොත්; යෙහෙකි, යහපතක්වේ; සුසිරිකල, සුචරිතයකළහොත්; මැනවි, යහපති; මේ ඈද, මේ ආදියද; අසබහවිහි, අසම්භාවනීය ක්‍රියා විෂයෙහි; රුසි, අභිමතයි-පස, ප්‍රත්‍යය; යෙදෙනසේ, යුක්තවන පරිද්දෙන්; සලසනු, කරණුලැබේවා. †

---

* මේ 'ත' ප්‍රත්‍යය කිසිතැනක ස්වරරහිතව 'ත්' [illegible] තැන පූර්වස්වරය පිළිපෙරළිවශයෙන් ඔකාරයවේ-ඒ මෙසේයි [illegible] වසත පුවත්—අප පිය මගරද ඇසුවොත්" 'ඇසුවහොත්' යන තන්හි [illegible] යන නිපාතයාගේ හකාරය ලොප්විමෙන් වෙනදැයි සැලකිය යුතුයි [illegible] යන නිපාතයද කිසිතැන හොනකියා ස්වරාන්තද [illegible] ඒ මෙසේයි. "ඉති [illegible] හොතෙ කියම්, ගුණාලොබිනිලෝහිමීයා".

† මෙහි අනියමාර්ථනම් හෙතෙම ආවොත් ඔහුට දෙමි යන [illegible] වයි-"නාවොත්" නොදෙමි යනු එහි අනන්තයයි—පාලියෙහි [illegible] යෙහි යෙදෙන සත්තමිවිභක්තියේ අර්ථය මෙහි. අසම්භාවනීය ක්‍රියායෙහිවේ-කාලාභිප්පත්ති ක්‍රියාවද මෙහිමවේ.

එක කතු කිරියහෙන් පෙර කිරියට ඇ ආ ඊ
ඉන්ලා යුතුද වියුතුද මුසු බැවැ මින් මින මිනිද-a
ඇ, බවණැව් තැරැ සගවිදින්-
ආ, පෙරුම් පුරා බුදුවූ-
ඊ, හිරිනිල් මල්කැනෙ කැසි සැ කි
ඉන්, පව්බූකොබෑ හොසුන් රැකේ-
ඇලා, දිමුමගුල් මතඟු දූකලා නැවැත්.
ආලා, කරණ් පිරික්සාලා කරනු-
ඊලා, බමර පොසොන් පතර මිබිලා යේ-
දකරින් 'අවුන්, අවුදු ගොස්' සනුද රුසි-b

ඉති අසබහව්කිරිය, මේ අසම්භාවනීය ක්‍රියායි-'සිතිය' 'දැක්ක' 'කිව' 'කළ' යනාදි (ක්‍රියාපදත් අසම්භාවනීය ක්‍රියා කොට්ඨාසයක් කොට දක්වනලදි මෙහි 'ත' ප්‍රත්‍යයක් නැත්තේයි-ප්‍රත්‍යය යෙදෙන පරිද්දෙන් කරන්නට කිහෙයින් 'සිත' සිතීමෙහි යන ධාතුවෙන් පරව 'ය' ප්‍රත්‍යයද 'දස්' දැකීමෙහි යන ධාතුවෙන් පරව 'ක' ප්‍රත්‍යයද 'කි' කීමෙහි යන ධාතුවෙන් පරව 'ව' ප්‍රත්‍යයද 'කර' කිරීමෙහි යන ධාතුවෙන් පරව 'අ' ප්‍රත්‍යයද සඳරුත් යනාදි සූත්‍රයෙන් අසම්භාවනීය ක්‍රියා විෂයෙහි කොට පිළිපෙරළී යනාදිය කළකල්හි සිතිය දැක්ක යනාදි ක්‍රියා පදසිද්ධියවේ.

a ප-එක කතු කිරියහෙන්, එක කර්තෘකවූ ක්‍රියාවන්ගෙන්; පෙර කිරියට, පූර්වක්‍රියාවට; ඇ-ආ-ඊ-ඉන්, 'ඇ' ප්‍රත්‍යය 'ආ' ප්‍රත්‍යය 'ඊ' ප්‍රත්‍යය 'ඉන්' ප්‍රත්‍යය යන මොව්හු; ලායුතුද, ලා යන්නකින් යුක්ත වද; වියුතුද, වියුක්තවද වන්නාහ; මුසුබැවැ, මිශ්‍රභාවයෙහි; (මිශ්‍ර වන ක්‍රියායෙහි) මින් මින මිනිද, 'මින්' ප්‍රත්‍යය 'මින' ප්‍රත්‍යය 'මිනි' ප්‍රත්‍යය යන මොහු වෙත්.

ක්‍රියා දෙකකට හෝ බොහොමයකට හෝ එක කර්තෘවක් වීනම් එයින් එකක් අපර ක්‍රියායි අන්‍යවූ එකක් හෝ බොහොමයක් හෝ පූර්වක්‍රියායි.

ඒ පූර්වක්‍රියාවට ඇ-ආදි ප්‍රත්‍යයයි * අන්‍ය ක්‍රියාවක් හා මිශ්‍රවන ක්‍රියාව මිශ්‍රක්‍රියායි-ඊට මින් ආදි ප්‍රත්‍යයයි.

## උදාහරණ.

b ප-ඇ-ඇ ප්‍රත්‍යයවේ; බවණැව්තරැ, භවාර්ණවය තරණයකොට; සගවිඳින්, සුඛානුභවකෙරෙත්; ආ, ආ ප්‍රත්‍යයවේ; පෙරුම්පුරා, පාරමී පූරණයකොට; බුදුවූ, සර්වඥවූහ-ඊ, ඊ ප්‍රත්‍යයවේ; හිරිනිල්මල්

* මෙහි කියන පූර්වක්‍රියාවට කියනලද ප්‍රත්‍යයන් අතුරෙන් 'ඊ' ප්‍රත්‍යය කිසි තැනෙක 'ඒ' ආදෙශයට නොහොත් පිළිපෙරළියෙන් එයන්නට පැමිණේ එසේවූතැන්-

සඳෙකින් නදුනුයනිනෙයි මලෙක පුරනබේ
සඳෙකින් ලොබින් වටලා නොදැමූද 'ඉබේ''-මෙයි 'ඉබේ' යනු

පූර්වක්‍රියාවයි එහි 'ඊ' ප්‍රත්‍යයට ඒ යනාදෙශයි-නොහොත් පිළිපෙරළියි.

“මුදුගණි, කිසාලන්නේ” ඈ පෙරකිරිය පසතින් වූ ගණ
ලපය ඈ දුවුසේ; ඉති පෙරකිරිය.
මින්, මරසක් තනමින් පැලා-ය
මින, සිකිනට පිසමින-මිනි, මුනිඳිවි උදුදෙන තිතුඑකැත්
මිලිසෙමිනි අතුරුදහන් තිබී.

ඉති කිරිය මුසු.

---

කැනෙකැයි, ශිනෙතර සුෂුප්තාවකයකහියා; සැකි, සඞ්කිතවී * ඉන්, ඉන් ප්‍රත්‍යයවේ; පවිටු, පාපිෂ්ඨතෙම; කොබගොසින්, කවර ස්ථානයකට ගමනය කොට; රුකේ, රක්ෂිතවේද?

(ඈ ආදියට ලායුක්තකළකල්හි එහි උදාහරණ.)

ඇලා, ඇලා ප්‍රත්‍යයවේ; දිටුමගුල්, දෘෂ්ටමඞ්ගලිකාතොමෝ; මතඟු දකලා, මාතඞ්ගයා දර්ශනයකොට; නැවැත්, නිවර්තිතවී; අලා, අලා ප්‍රත්‍යයවේ; කරණි, කටයුත්ත; පිරික්සාලා, පරීක්ෂාකොට; කරණු කරණුලැබෙවා; ඊලා, ඊලා ප්‍රත්‍යයවේ; බමර, භ්‍රමරතෙම; පොසොන් පතර, ප්‍රසූනපත්‍රයෙහි; (මල්පතෙහි) මීබීලා, මධුපානය කොට; යේ, ගමනයකෙරේ †. දකරින්, (ලායුතුද වියුතුද කිතන්හි) දකාරයෙන්; අවුත් අවුදු ගොස්යනුද, අවුත්, ආගමනයකොට; අවුදු, ආගමනයකොට; ගොස්, ගමනයකොට; යනුද, කියනලද පදද; රුසි, (පූර්වක්‍රියා විෂයෙහි) අභිමතයි.

අපරක්‍රියාවක් බලා කියනලද ක්‍රියාපද පූර්වක්‍රියායි-ඈ යනාදි ප්‍රත්‍යයන්ගෙන් සිඞවූ ක්‍රියාපද එක එක මෙහි දක්වනලදි

ප ද සි ඞි ය.

තර, පීනිමෙහි යන ධාතුවකෙරෙන් එකකතුකිරියනෙන් යනාදි උපාඞගසූත්‍රයෙන් ඇප්‍රත්‍යයකොට මාත්‍රාවෘඞිකොට ස්වරලොපාදිය කළකල්හි තැරුයනු සිඞයි-පුර පිරීමෙහි යන්නෙන් අ ප්‍රත්‍යය යෙදීමෙන් පුරා යනු සිඞයි-සැක සැකෙහි යන්නෙන් ඊ යෙදීමෙන් සැකි යනු සිඞයි-ගම ගමන්හි යන ධාතුවකෙරෙන් ඉන් ප්‍රත්‍යයකොට සඳරුත් යනාදියෙන් ගම යන්නට ගොස් ආදෙශකොට පැමිණවීමෙන් ගොසින් යනු සිඞයි, දස දකුම්හි යන්නෙන් ඇලාවීමෙන් දකලා යනු සිඞයි පිරි යන උපසර්ගය පූර්වකොට ඇති ඉක්ස බැල්මෙහි යන ධාතුවකෙරෙන් අලා යෙදීමෙන් පිරික්සාලා යනු සිඞයි-පා බීමෙහි යන්නෙන් ඊලා යෙදීමෙන් බීලා යනු සිඞයි අ උපසර්ග පූර්වවූ ගම යන ධාතුවෙන් අවුත් අවුදු යන පූර්වක්‍රියාපද නිපාතනයෙන් සිඞයි-ගොස් යනුදු ගම යන ධාතුවෙන් නිපාතනයෙන් සිඞයයි සැලකියයුතු-

---

* මේ ක්‍රමයෙන් මෙහි අපරක්‍රියාව නොපෙනේ සැකකොට කියා නවත්වනලදි-මෙහි ‘සි’ යන්න පූර්වක්‍රියා වශයෙන් ගත්කල සැක යනු අපරක්‍රියාව වේ—එකල සැකකළේයයි අර්ථයවේ.

† ‘බැ ණවි තැරූ යහවිදිත්” යන උදාහරණයෙහි විඥාතක්‍රියාව බලා තරණ ක්‍රියාව පෙදූහෙයින් තැරු යනු පූර්වක්‍රියායි—විදිත් යනු අපරක්‍රියායි පුරා යනා

**කල්කිරන අරුත් පවසනු වස් මෙහි සන්පමණක් විසනලදි විතර වහරෙන් විමසනු,**

ඔ ප–'මුදුනණි කියාලන්නේ' ඈ, මුදුගණි කියාලන්නේ, (මොව නයෙකොට ගන්නේය, කථනයකොට ලන්නේය)යනාදිය; පෙරකිරිය පසතින්වූ, පූර්වක්‍රියා ප්‍රත්‍යයාන්තයා කෙරෙන්වූ; ගණ ලපස ඈ, ගණ ප්‍රත්‍යය ල ප්‍රත්‍යය යන මේ ආදිවූ; දුවුසේ, ධාතුවු පරිදිසි–ඉති පෙර කිරිය, මෙසේ පූර්වක්‍රියාවවේ.

මුදුගණි, කියාලන්නේ යන පද මුදු යන පූර්වක්‍රියා ප්‍රත්‍යයා කෙරෙන්ද කියායන පූර්වක්‍රියා ප්‍රත්‍යයා කෙරෙන්ද ගණ ප්‍රත්‍යයත් ලප්‍රත්‍යයත්වි "මුදුනණ", 'කියාල' යන ධාතුප්‍රකෘති සිඩව එසින් පරව වතීමාන ඉ ප්‍රත්‍යයට මාත්‍රාවෘඩිකොට පෙරසරලොපා පැමිණවීමෙන් මුදුගණි යන පදයද අනාගත කාලයෙහිවූ අන්නේ ප්‍රත්‍යයකොට එසේම පැමිණවීමෙන් කියාලන්නේ යන පදයද සිඩවෙයි—මෙහි ත්‍රෛකාලිකාදි ක්‍රියාපදද ආදිශබ්දයෙන් වෙනත් මෙබඳු ධාතුප්‍රකෘති සිඩවීමද කියනලදි–මිදිමෙහි මුද යන ධාතුවකෙරෙන් එකකතුකිරියෙනන් යනාදි සූත්‍රයෙන් ආ ප්‍රත්‍යය කොට මුදු යන පූර්වක්‍රියාපදය සිඩවූකල්හි ඔහු කෙරෙන් 'සදරුත්'ආදි සූත්‍රයෙන් ගණප්‍රත්‍යයකොට එය ධාතුප්‍රකෘතියයි ගෙණ ඉන් පරකොට ත්‍රෛකාලිකාදි ප්‍රත්‍යය යොදු ක්‍රියාපද සිඩකිරිමද, කීමෙහි කි යන ධාතුවකෙරෙන්ද එසේම අකොට යකාරාගම හා ඊකාරමාත්‍රා හානිකොට කියා යනු සිදුකොට

---

දියද එසේයි–පූර්වක්‍රියා බොහොමයකින් මත්තෙහිද අපරක්‍රියාව යෙදේ–එසේ නැත අවසන් නොකරණ සියලු ක්‍රියාපදම පූර්වක්‍රියායි–

"පත් ගත පුල්මල් දෙබතුරෙක පියක රූ"
"සිත් 'පිණවා ඉද' සැලලිහිණින් අතු රූ"
"ගත් සරතස "හැරවිද" සුවද මදම රූ"
"කිත් සිරනම් වෙහෙරට වදුව පස්ව රූ"

මෙහි පිණවා, ඉද, හැර, විද යන පදසතරම පූර්වක්‍රියායි, වදු; යනු අපරක්‍රියායි. කුලකවශයෙන් සම්බන්ධවන පද්‍ය කීපයකද අවසන එක අපරක්‍රියාවක් බලා යෙදුන පූර්වක්‍රියා රාශියක්දවේ.

ගුත්තිලකාව්‍යයෙහි 'පුරවාසින් සමගව රජ ඉදයා' යනාදියෙහි කරවා යන පූර්වක්‍රියාව පටන්–ඇද, බැද. බදවා යනාදි පූර්වක්‍රියා දෑන්වූ සද යන තන්හි අපරක්‍රියා ශබ්ද සම්බන්ධයට යෙදතිබීම ඇඳුන් එය දතයුතුයි–අපරක්‍රියාව කියිනැත ප්‍රත්‍යයාන්ත ක්‍රියාශබ්ද වශයෙන්ද යෙදේ–"සිරසතපුරා දුටුමෙන් තුටුව මුනිතුම" යන මෙහි පුරා යන පූර්වක්‍රියාව දුටු යන ප්‍රත්‍යයාන්ත ක්‍රියාශබ්දය බලා යොදනලදි.

ඔහු කෙරෙන් ල ප්‍රත්‍යයකොට කියාල යන ධාතුප්‍රකෘතිය * සිද්ධකොට ඔහු කෙරෙන්—ත්‍රෛකාලිකාදි ප්‍රත්‍යයකොට ක්‍රියාපද සිඬිකිරීමද කියනලදී.

මිශ්‍රක්‍රියාවට උදාහරණ.

b-ප-මින්, මින් (ප්‍රත්‍යය) වේ; මරසක්, මාරසේනාතොමෝ; තන මින්පැලා, කම්පිතවෙමින් පැලවූ (දිවූ); මින, මින (ප්‍රත්‍යය) වේ; සිහිනට, මොනරුන්; පියමින, හරිමින්; මිනි, මිනි (ප්‍රත්‍යය) වේ; මුනිහිරු, සර්වඥසූර්‍ය්‍යයා; උදාදෙත, උදය දානයකළකල්හි; තිත්උළු කැන්, තීර්ත්‍ථක නැමැති තාරකා සමූහතෙම; ‘මිලියෙමිනි, ම්ලානික වෙමින්; අතුරුදහන්බිජී, අන්‍තර්ධාන භජනයකෙළේය; ඉති කිරිය මුසු, මේ මිශ්‍රක්‍රියාසි.†

පදසිඬිය සුගමයි.

කල්කිරිය අරුත්, කාලය ක්‍රියාර්ත්‍ථයත්ද; පවසනුවස්, ප්‍රකාශකරණු පණිස; මෙහි, මේ අධ්‍යායෙහි; සත්පමණක්, සංඥාමාත්‍රයෙක්; වියනලදී, කථිතයි; විතර, විස්තරය; වහරෙන්, ව්‍යවහාරයෙන්; විමසනු, පරීක්ෂාකරණු.

තනමින් පැලා කීකල්හි, කම්පිතවීම පලායාම හා මිශ්‍රයි-එහෙයින් තනමින් යන්න මිශ්‍රක්‍රියායි සැලකියයුතු-පියමින් යන්න හා මිශ්‍රවන අපරක්‍රියාවක් ආචාර්‍ය්‍යයන් විසින් නොදක්වනලදී-මිලියෙමිනි යන ම්ලානක්‍රියාවද-අන්‍තර්ධාන භජනය හා මිශ්‍රවේ.

ක්‍රියාධිකාර සප්තමයි.

---

* මෙසේ ධාතුප්‍රකෘතිකිරීම පිණිස කියනලද ගණ ල ප්‍රත්‍යයත් සවහාවෙ ධාතුයි-ගග-උපදන්හි යන ධාතුහුගේ හකාරයට ණ ආදෙශකළකල්හි-ගණ යනු වෙයි-එත් ධාතුප්‍රකෘතියි-එහෙයින් පූර්වක්‍රියාපදය කෙරෙන්වූ ධාතුප්‍රකෘතිය කෙරෙන් ප්‍රත්‍යය යෙදීමෙන් ක්‍රියාපදසිඬියද සැලකියයුතු-නැඟිසිටි-(නැඟිටි) බහාතබ-යනාදියද මෙසේම සිඬයි-මෙහි නැඟි යන පූර්වක්‍රියාපදය කෙරෙන් සිට යන ප්‍රත්‍යයවෙයි-හෙද ධාතුප්‍රකෘතියයි-බහා යන පූර්වක්‍රියාව කෙරෙන්ද තබ යන ප්‍රත්‍යයවෙයි-හෙද ධාතුප්‍රකෘතියි-එහෙයින් පූර්වක්‍රියාව කෙරෙන් ධාතුප්‍රකෘතිම මෙබඳු ක්‍රියාපද සෑදීමෙහි ප්‍රත්‍යය වශයෙන් ගත්බව දතයුතු— ‘ඈස තීදිගැට හැර නැඟිසිටු උදාහිර’’ යනාදී තන්හි යෙදුම් සැලකියයුතු.

† මේ මිශ්‍රක්‍රියාවට කියනලද ‘මින්’ මින’ යන ප්‍රත්‍යයදෙක පූර්වක්‍රියාර්ත්‍ථයෙහිද වේ-ඒ මෙබඳු තන්හිය.

“ තිලතුර භුට ‘නැගෙමින්’ රිවි දෙව්සිරිත’’

‘‘ දූ ලකර සේසත් මිණිබරණ කිරණී තා’’—මෙහි නැගෙමින්

යනු අරුඬව-යන අර්ත්‍ථයි-මේ මින් ප්‍රත්‍යය-පූර්වක්‍රියාර්ත්‍ථයෙහිවී.

‘ ප සි දූ තොනෙක් ඇඳුරන් රැස්කරමි න’’

‘‘ මැතිඳු තිදෙණ් දිඹු පුදලැති හිමගෙ න’’-මෙහි රැස්කරමින

යනු රැස්කොට යන අර්ත්‍ථයි-එහෙයින් මෙහි මින ප්‍රත්‍යය, පූර්වක්‍රියායෙහිවී-පූර්වක්‍රියාව ඒකරූපවූකල්හි-මිශ්‍රක්‍රියාව වේ-‘‘හිඹි තුටුවවි සවන දෙතින’’යනාදියෙහිවේ.

### ප්‍රත්‍යයාර්ථ ශබ්ද.

**දසින් තෙමෙන් හොත කර අරුතට නිසිපසන් –**
**සපයා සදන් පසරුත් හිමි නොලඟැලොව වහරන්–a**
**දසින් වන පස සකරු අරුත්හිද හව්හිදවේ.**
**කමයුතු=කරණී, පියයුතු=පැන්, බුදියුතු=බොජුන්,**
**කැපුතු=කඳු, ගොතනලද=ගත්, දෙනලද=දන්,**
**මේ ඇ කම්කරු පසින් නිපන්–b**

a–ප–දසින් (හොත), ධාතුව කෙරෙන් හෝ; තෙමෙන් හොත, නාමශකෙරෙන් හෝ; අරුතට නිස්, අර්ථයට නිශ්‍රිතවූ (අර්ථයට යොග්‍යවූ); පසත්කර, ප්‍රත්‍යයන්කොට; ලොවවහරන්, ලොකව්‍යවහාරයන් සම්බන්ධවූ; හිමි, සීමාව; නොලඟැ, උල්ලඞ්ඝනය නොකොට; පසරුත් සදන්, ප්‍රත්‍යයාර්ථ ශබ්දයන්; සපයා, සම්පාදනයකරව්.

මේ සිංහල භාෂාවෙහි ප්‍රත්‍යයාර්ථ ශබ්ද දෙකොටසකි- එනම් ධාතුව කෙරෙන් ප්‍රත්‍යයක් යෙදීමෙන් උපන් ශබ්දය, නාමශබ්දයක් කෙරෙන් ප්‍රත්‍යය යෙදී එසින් අන්පරිද්දෙකින් උපන් ශබ්දය යන වශයෙනි–අර්ථයට යොග්‍යවශයෙන් ධාතු නාමයන් කෙරෙන් ප්‍රත්‍යය කොට ලොකව්‍යවහාරයට විරුඬනොව ඒ ප්‍රත්‍යයාර්ථ ශබ්ද දෙකොටසම සපයනු මැනවැයි ආචාර්‍ය්‍යයන් විසින් මේ සූත්‍රයෙන් උපදෙශ දෙනලද්දේයි–මාගධි සංස්කෘත භාෂාවන්හි–නාමයා කෙරෙන් ප්‍රත්‍යය යෙදී වන ශබ්දයෝ තඬිතයයිද, ධාතුව කෙරෙන් ප්‍රත්‍යයන් යෙදීමෙන් උපදින ශබ්ද කිතක හෙවත් කෘත්‍යයිද කියනලදි–ඒ දෙකම මෙහි ප්‍රත්‍යයාර්ථශබ්දයයි උගන්වනලදී—ඒ මෙසේයි සුගත—යනු මාගධ සංස්කෘත දෙකටම සමානවූ ශබ්දයකි–එසින් සර්වඥයන්වහන්සේ කියනුලැබේ–එය–සු යන උපසර්ගය පූර්වකොට ඇති ගමනාර්ථවූ 'ගමු' යන ධාතුවකෙරෙන් ක්තප්‍රත්‍යයෙන් සිඬවූ කිතක හෝ එහිම කොටසක්වූ උණාද්‍යන්තයි, ඒ සුගත නම්වූයේ; සර්වඥයි –උන්වහන්සේ සරණපරායනවූ භක්ති ඇත්තෙක්–සුගතයන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූයේය යනාර්ථයෙහි සෞගත නම්වේ–ඒ සුගත ශබ්දයා කෙරෙන්වූ ණ ප්‍රත්‍යයාදියෙන් සිඬවූ තඬිත ශබ්දයි–සිංහල භාෂාවෙහි "සුගත්" යනු සු පූර්ව ගම යන ධාතුවෙන් සිඬහෙයින් ධාතුව කෙරෙන්වූ ප්‍රත්‍යයෙන් සිඬවූ ප්‍රත්‍යයාර්ථ ශබ්දයි–සෝගත් යනු සුගත් දෙව් මෝහට යන අර්ථයෙහි සුගත් ශබ්දයා කෙරෙන් ප්‍රත්‍යය යෙදීමෙන් සිඬවන ප්‍රත්‍යයාර්ථ ශබ්දයක්බව මේ අධිකාරයෙහි මතු දක්නු ලැබේ.

b–ප–දසින් වනපස, ධාතුව කෙරෙන් වන්නාවූ ප්‍රත්‍යය; සකරු අරුත්හිද, ෂට්කාරකාර්ථයෙහිද; හව්හිදවේ;භාවයෙහිද වන්නේය.*

* ෂට්කාරක–කර්තෘ, කර්ම, කරණ, සම්ප්‍රදාන අපාදාන අධාර යන මෙසි-භාවකර්ම–ක්‍රියාවිශෙෂයෙහි කියනලද; භාවසාධනයි "!කරණී" යනුවෙන් කර්තෘ විසින් කරණුලබන්නක් කියනුලැබේ–එහෙයින් එහිවූ ප්‍රත්‍යය කර්මකාරකාර්ථ

(ධාතුවෙන්වූ ප්‍රත්‍යයන්ගෙන් සිද්ධවන ශබ්ද දක්වීමට වාක්‍ය සහිතවූ උදාහරණ.)

කටයුතු, කර්තව්‍යය (කරන්ට යුත්ත); කරණී, කරණීනම්; පිය යුතු, පානය කටයුතුදෙය; පැන්, එනම්වේ; බුදියයුතු, භොජන කට යුතුදෙය; බොජුන්, එනම්වේ; කෑයුතු, ඛාදනය කටයුතුදෙය; කදු, කදුනම්; ගොතනලද, ග්‍රන්ථනයකරණලද්දේ; ගත්, ගත්නම්වේ; දෙනලද, දානයකරණලද්ද; දත්, දත්නම්වේ; මේඈ, මේ ආදිය; කම්කරුපසින්, කර්මකාරක ප්‍රත්‍යයෙන්; නිපත්, නිෂ්පන්නයි.

ධාතුව කෙරෙන් වන්නාවූ ප්‍රත්‍යය කර්මකාරකාදි ෂට්කාරකාර්‍ථයෙහිද භාවසාධනාර්‍ථයෙහිද වේ-නාමය කෙරෙන් වන ප්‍රත්‍යය අප ත්‍යාර්‍ථාදි අර්‍ථයන්හි යොග්‍යවූ විභක්තියකින් පරව වන බැවි මතු දක්නාලැබේ-උදාහරණයන්හි "කටයුතු" යනු වාක්‍යයි-"කරණී" යනු ධාතුව හා ප්‍රත්‍යයෙන් සිද්ධවූ ශබ්දයි-පියයුතු-පැන්-යනාදියත් එසේමය.

ප ද සි ද්ධි ය.

කිරීමෙහිවූ 'කර' යන ධාතුව කෙරෙන් දයින්නෙනමන්හොත යනාදී උපාධික සූත්‍රයෙන් කර්මාර්‍ථයෙහි නී ප්‍රත්‍යයකොට-සඳරුත් යනාදි අඩකසූත්‍රයෙන් නකාරයට ණකාරාදෙශකොට * ශබ්ද ප්‍රකෘතිය කෙරෙන් පෙරවිබත් එකබස-ඒ-විභක්තිකොට සඳරුත් යනාදි සූත්‍රයෙන් ලොප්කළකල්හි පෙරවිබත් එකබස-කරණී-යනු සිද්ධයි-පීමෙහිවූ පා යන ධාතුව කෙරෙන් මෙසේ-ඇන් ප්‍රත්‍යය කර්මාර්‍ථයෙහි වීමෙන් පැන් යනු සිද්ධයි-වැලඳීමෙහිවූ "බොද" යන ධාතුව කෙරෙන්-උන් ප්‍රත්‍යයවීම් ආදියෙන් 'බොජුන්' යනුද-කෑමෙහිවූ-කද යන ධාතුව කෙරෙන්-උ ප්‍රත්‍යය යෙදීමාදියෙන්-කදු යනුද † ගෙතීමෙහිවූ ගොත යන ධාතුවකෙරෙන් අප්‍රත්‍යයවීම් ආදියෙන් ගත් යනුද, දීමෙහිවූ-දා යන ධාතුව කෙරෙන් අන්ප්‍රත්‍යය වීමාදියෙන් දත් යනුද සිද්ධයි.

යෙහියි-'දත්' යන්නෙන්ද දෘශකවූ කර්තෘහු විසින් දෙනු ලබන්නක් කියනු ලැබේ-එහෙයින් එහිද අන් ප්‍රත්‍යය කර්මාර්‍ථයෙහිවූ-කතු යන්නෙන්-කරණු ලබන්නක් නොව ක්‍රියාවක් කරණ කර්තෘවෙක් කියනුලැබේ-එහෙයින් එහි උ ප්‍රත්‍යය කර්තෘ අර්‍ථයෙහි වියයි දතයුතු-මෙආදි ක්‍රමයි.

* මෙහි කරණී යන තන්හි කරණලද නී ප්‍රත්‍යය දන්තජ බැවිද 'කරණී' යන ශබ්දගත ණකාරය මූර්ධජ බැවිද පුරාණ ලියනලද පොත්වලින් පෙණේ එහෙයින් 'කර' යන ධාතුහුගේ රකාරයෙන් පර බැවින් දන්තජ නකාරයට මූර්ධජාදෙශවූ බැව් හැඟේ.

† කද යන ධාතුව කෙරෙන් උ ප්‍රත්‍යය වූ කල්හි කදු යනු සිද්ධවීම දුගමයි-මේ ඛාදනාර්‍ථයෙහි-කා-යන ධාතුව වශයෙන් ක්‍රියායෙදීම පෙණේ-කාකමින්-කෑ-කෑයුතු-යනාදි තන්හියි-එසේ කා යන ධාතුව වුවද-දු ප්‍රත්‍යය වශයෙන් සිද්ධවේ.

**කරණුයේ=කතු, ගණන්නේ=ගැණි, විදිනේ=වැදි, යදනේ=යදි, දුවන්නේ=දුවා, පයින් නොයන්නේ=පන්වා, උරෙන්යන්නේ=උරා, පැන් ඉස්නේ=පැනි. සොබන, කොබන, ලොබන, ලලන, ගලන, බබලන, වස්නා, තුස්නා, මුස්නා, උදුල, හමල, වහල, තිවි, සිවි, කුමුටු, කැපි, දූපි, කිපි, මේඈ, කතුරු පසින් නිපන්-**ඝ

ඝ-ප-කරණුයේ, ක්‍රියාකරණ තැනැත්තේ; කතු, කතුනම්; (කර්තෘයි) ගණන්නේ, ගණිතකරණ තැනැත්තේ; ගැණි, ගැණි නම්; (ගණකයි) විදිනේ, වෙධනයකරණ තැනැත්තේ; වැදි, එනම් වේ; (ව්‍යාධයි); යදනේ, යාචඤාකරන්නේ; යදි, එනම් (යාචකයි); දුවන්නේ, ධාවනයකරන්නේ; දුවා, එනම් (ධාවකයි); පයින්, පාදයෙන්; නොයන්නේ, ගමනය නොකරන්නේ; පන්වා, එනම් (නාගයායි); උරෙන් යන්නේ, වක්‍ෂසින්යන්නේ; උරා, එනම් (උරගයි); පැන් ඉස්නේ, පානිය ඉච්ඡාකරන්නේ; පැනි, එනම් (පානකයි) සොබන, සොභනවූ; කොබන, ක්‍ෂොභනවූ; ලොබන, ලොභවන්නාවූ; ලලන, ලලිතවන්නාවූ; ගලන, ගිලිහෙනනාවූ; බබලන, විරාජමානවනනාවූ; වස්නා, වර්ෂණයකරනනාවූ; තුස්නා, තොෂවනනාවූ; මුස්නා, මුසනවනනාවූ; උදුල, උජ්වලිතවූ; හමල, වහනයවූ; වහල, කෘශවූ; තිවි, තුෂ්ටවූ; සිවි, ස්ජිතවූ; කුමුටු, නිමග්නවූ;(කිමිදුනාවූ) කැපි, කම්පිතවූ (චලිතවූ) දූපි, දර්පිතවූ; (අභිමාන ඇත්තාවූ) කිපි, කුපිතවූ; මේ ඈ, මේ ආදිය; කතුකරුපසින්, කර්තෘකාරක ප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්නයි.

**කතු-යන්නෙන් කරණ තැනැත්තාම හැඟෙන හෙයින් ඒ ශබ්දය කර්තෘකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නබැව් හැඟේ.**

### ප ද සි ද්ධි ය.

කරණුයේ යන අර්ථයෙහි කිරීමෙහිවූ-කර, යන ධාතුව කෙරෙන් දසින්නෙමෙන්හොත යනාදින් කර්තෘකාරකාර්ථයෙහි—උ ප්‍රත්‍යය කොට රකාරයට තකාරාදෙශකොට ස්වර ලොප්කොට පත් කලකල්හි 'කතු'යන ශබ්දප්‍රකෘතිය සිඩයි-ඔහුකෙරෙන් අවිශිෂ්ට පදාර්ථයෙහි වන ප්‍රථමාර්ථයෙහි-ඒ විබත්කොට ලොප්කලකල්හි ප්‍රථමෙමෙකවචන යෙහි "කතු" යනුවේ-ගැණි යනාදියෙහි-ගිණීමෙහි ගණ-ධාතු-ඉ ප්‍රත්‍යය්-යැදීමෙහි-යැද-ධාතු ඉප්‍රත්‍යය, දිවීමෙහි, දව-ධාතු-අ ප්‍රත්‍යය මෙකී ධාතු ප්‍රත්‍යයන්ගෙන් ශබ්දයෝ සිඩයි—පන්වායි සිඩකටයුතු තන්හි-පයින්, යන කරණවිභක්තියෙන් පරව-නො-නිපාතයවේ—ඔහු කෙරෙන් ගමනෙහිවූ 'වා' ධාතුවවේ-එකල පයින්-නො-වා-කියා තිබෙ-විභක්ති සමාසවීමෙන් ඉන් විභක්ති ලොප්කොට අගම යකාරයද අප්‍රයොගකලකල්හි-පා-නොවා කියාතිබෙ-සදරුත් යනාදින් පායන්නෙ ආකාරයට මාත්‍රාහානිද නොයන්නෙ ඔකාර ලොපායද කලකල්හි, පන්වා-යන ශබ්දප්‍රකෘතියවේ-ඔහු කෙරෙන් විභක්තියෙදීමාදිය සුගමයි-උරා, යි සිඩකටයුතු තන්හි-උරෙන් යනුයේ යන

කෙමු, වැමු, ගැහැමු, වුහුමු, දූමු, පිවිමු, කැපු, සැපු, දූපු, දු, බැදු, ගැදු, දූරු, පිරු, වැරු, සැරු, මැරු, වැළු, හෙළු, තෙළු, වෙළු, පැළු, කියු, ලියු, පියු, කල, හලවල, සුන්, බුන්, හුන්, වුන්, දුන්, එන, කන, දෙන, මේ ඈ කම් කතු කරු දෙකම සමපසින් නිපන්-ෲ

වාක්‍යයෙහි, උරෙන් යන කරණ විභක්ත්‍යන්තයා කෙරෙන්-ගම; යන ධාතුකොට ඔහු කෙරෙන් අ ප්‍රත්‍යය කොට විභක්ති සමාසකොට විභක්තිලොපයෙන් පසු-ගමනාර්ථයෙහි-ගම ධාතුහට සදරුත් යනාදීන් ලොප්කොට පූර්වස්වර ලොප්කොට අකාරයට මාත්‍රාවෘද්ධිකළ කල්හි උරා යයි ශබ්දප්‍රකෘතිය සිඩවේ-ඔහු කෙරෙන් ප්‍රථමාදි විභක්ති කළකල්හි ප්‍රථමෙක වචනයෙහිදු උරා යනුවේ-පැන් ඉස්නේ, යන අර්ථයෙහි-පා-යන ධාතුව කෙරෙන් කර්තෘයෙහිවූ ඉච්ඡාර්ථයෙහි-ඇති-ප්‍රත්‍යයසි-සෙබීමෙහි සොබ-යන ධාතුව කෙරෙන්ද, ඇලලීමෙහි 'සොබ' යන ධාතුව කෙරෙන්ද, ලොබෙහි 'ලොබ' යන ධාතුව කෙරෙන්ද, කම්පාවෙහි හෝ ලෙලවීමෙහි 'ලල' යන ධාතුව කෙරෙන්ද, ගිලිමෙහි 'ගල' යන ධාතුව කෙරෙන්ද, බැබලිමෙහි 'බබල' යන ධාතුව කෙරෙන්ද, අනප්‍රත්‍යයවීමෙන්-සොබන, කොබන, යනාදී ශබ්දයෝ සිඩවෙත්-වැසීමෙහි-වස්-යන ධාතුව කෙරෙන්ද, තොසෙහි-තුස්-යන ධාතුව කෙරෙන්ද, මිදීමෙහි-මුස් යන ධාතුව කෙරෙන්ද * නාප්‍රත්‍යය වීමෙන් වස්නා, තුස්නා, මුස්නා යන මේ ශබ්දයෝ සිඩසි-උ-යන උපසර්ගපූර්ව-දිලිමෙහි දල යන ධාතුව කෙරෙන් අප්‍රත්‍යයෙන් 'උදුල'-හැමීමෙහි 'හම' යන ධාතුව කෙරෙන් ල ප්‍රත්‍යයෙන් 'හමල'-තොසෙහි හෝ පැසැදීමෙහි-තුස යන ධාතුව කෙරෙන්-ඉ ප්‍රත්‍යයෙන්-තිට්, සිටීමෙහි-සිට යන ධාතුව කෙරෙන් ඉ ප්‍රත්‍යයෙන් සිටි-තිමිදීමෙහි-කුමුද යන ධාතුව කෙරෙන් උ ප්‍රත්‍යයෙන් කුමුටු-මෙහි දකාරයට ටකාරාදෙශයි-වෙව්ලීමෙහි-කප-ඒහි යෙහි-දප, කිපීමෙහි, කිපි-යන ධාතූන් කෙරෙන් කර්තෘර්ථයෙහි ඉ ප්‍රත්‍යයෙන් කැපි, දූපි, කිපි, යන ශබ්දයෝ සිඩසි.

ෲ ප-කෙමු, කොටනලද්දේ හෝ කොටුයේය (බණ්ඩනයකළේය;) වැමු, වතීනය කරණලද්දේ හෝ වතීනයකෙළේය; ගැහැමු, සම්ණයකරණලද්දේ හෝ සම්ණයකළේය; වුහුමු, හරණලද්දේ හෝ හැරියේය; දුමු, දක්නාලද්දේ හෝ දුක්කේය; පිවිමු, ප්‍රවෙශ කරණලද්දේ හෝ ප්‍රවිෂ්ටවූයේය; කැපු, කපනලද්දේහෝ කැපුයේය; සැපු,

* වස්, තුස්, මුස් යන ධාතු-වස-යනාදීන් ස්වරයන වශයෙන්ද කියත්—දන්නා, ගන්නා, යනාදීයන් මේ නා ප්‍රත්‍යයෙනැයිද-යන, වන, හරණ, සරණ යනාදීය අන ප්‍රත්‍යයෙනැයිද දතයුතු

චර්වණය (චපීම) කරණලද්දේ හෝ චර්වණයකළේය; දෙඩු, ජල්පනය (කථාවිශෙෂයක්) * කරණලද්දේ හෝ ජල්පනය කළේය; ලූ, බහාලනලද්දේ හෝ බැහුයේය; බැලු, බලනලද්දේ හෝ බැලුම්කෙළේය ගැලු, ගලනලද්දේ හෝ නිමග්න කෙළේය, දුරු, දරණලද්දේ හෝ දැරුයේය; පිරු, පුරණලද්දේ හෝ පිරුයේය; වැරු, වළක්වන ලද්දේ හෝ වැළැක්වූයේය; සැරු, සරසනලද්දේ හෝ සජ්ජනය කෙළේය; මැරු, මරණලද්දේ හෝ මැරුයේය; වැළු, වළහනලද්දේ හෝ වැළහුයේය; හෙළු, හෙලනලද්දේ හෝ හෙලුයේය; නෙළු, නෙළනලද්දේ හෝ නෙළුයේය; වෙළු, වෙෂ්ටනය කරණලද්දේ හෝ වෙෂ්ටනය කෙළේය; පැළු, පලනලද්දේ හෝ පාටනයකෙළේය; කියු, කථනය කරණලද්දේ හෝ කියේය; ලියු, ලියනලද්දේ හෝ ලෙඛනය කෙළේය; පියු, වසනලද්දේ හෝ වැසුයේය; කළ, කරණලද්දේ හෝ කෙළේය; හළ, හරණලද්දේ හෝ හැරියේය; වළ, වරණලද්දේ හෝ වරණය (වැසීම) කෙළේය; සුන්, සිඳිනලද්දේ හෝ සින්දේය; බුන්, බිඳිනලද්දේ හෝ භින්නකෙළේය † හුන්, හිඳිනලද්දේ හෝ හුන්නේය; වුන්, විඳිනලද්දේ හෝ වින්දේය; දුන්, දෙනලද්දේ හෝ දුන්නේය; එන, එනුලබන්නේ හෝ එන්නේය; කන, කනුලබන්නේ හෝ ඛාදනය කරන්නේය; දෙන, දානයකරණුලබන්නේ හෝ දෙන්නේය; මේඈ, මේආදිය; කම්කතුකරු දෙකට, කම් කර්තෘ කාරක දෙකට; සමපසින්, සමවූ ප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්නයි.

### පදසිද්ධිය.

කෙරීමෙහි 'කොට' වැරීමෙහි 'වට' ගැහැරීමෙහි 'ගහට' යන ධාතූන් කෙරෙන් යටකිසේ කම් කර්තෘ අර්ථයන්හි උ ප්‍රත්‍යයකොට පිළිපෙරළි මාත්‍රාවෘද්ධි ආදිය කළ කල්හි-කෙටු යනාදි ප්‍රකෘතිසිද්ධි-වී යන උපසර්ග පූර්ව හැරීමෙහි 'හර' යන ධාතුවකෙරෙන් එසේම උකොට පිළිපෙරළි හා රකාරයට-ටකාරාදෙශ කළකල්හි-වුහුටු යන ප්‍රකෘතිය සිද්ධි-දැකුම්හි දස-පසුවී පිවිසුම්හි-විස, සිඳීමෙහි-කප-විකීමෙහි සප-දැපීමෙහි දප-ලෑමෙහි-ලා-බැලීමෙහි බල-ගැලීමෙහි ගල-දැරීමෙහි-දර, පිරීමෙහි-පුර, වැරීමෙහි-වර, සැරීමෙහි-සර, මැරීමෙහි-මර, වැළහීමෙහි-වළ, හෙළීමෙහි-හෙළ, නෙළීමෙහි-

* ජල්පන නම් තමන්ගේ මතයක් ස්ථිරකොට පිහිටුවන පිණිස කරණු ලබන්නාවූ කථාවෙකි—"පරමත නිරාකරණ පූර්වකං ස්වමතස්ථාපනරූපෙ වාක්‍යභෙදෙ"-ශබ්දසෙනාම-අනුන් මතය වැලකීම පූර්වකොට ස්වකීය මතය පිහිටුවන ලක්ෂණවූ වාක්‍යභෙදයෙහි (ජල්පනශබ්දය වැටේ)

† බුන් යන්න නිරුක්ත්‍යාගයෙන් සම්පාදිතවන කර්තෘ අර්ථයෙහි කර්මප්‍රත්‍ය යසිද්ධ නොවේ භග්නවීයයි හැගෙනහෙයිනි ස්වයංකර්තෘ ස්වයංකර්මයසිද්ධ ගැහේ-එසිනුත් කාරකවයේ අර්ථ වැටහේ—විශෙෂණර්ථ යගවනු පිණිස කොටන ලද්දවූ යනාදින් කියයුතු.

**එයින් යේනුයි-යන්, එයින් වසානුයි-වසන්**
**එයින් සනහානුයි-නහනු, එයින් කෙරේනුයි-කර**
**මේ ඈ කරණකරු පසින් නිපන්-a**
**ඕහට දෙනු ලැබේනුයි-දනි-බමුණු-**
**මේ ඈ සපදන්කරු පසින් නිපන්-b**

---

තෙළ, වෙළීමෙහි-වෙළ, පැළීමෙහි-පළ, කීමෙහි-කී, ලීමෙහි-ලී, වැසීමෙහි-පිය යන ධාතූන් කෙරෙන් යටකීසේ-ළ ප්‍රත්‍යයයි විකාරාදෙශ පිළිපෙරළි ආදිය කළකල්හි දුටු යනාදී ශබ්දප්‍රකෘති සිද්ධයි-කිරීමෙහි-කර, හැරීමෙහි-හර, වැරීමෙහි-වර යන ධාතූන් කෙරෙන් 'අ' ප්‍රත්‍යයයි ළකාරාදේශාදියෙන් කළ යනාදිය සිද්ධයි.

සිඳීමෙහි-සිඳ, බිඳීමෙහි-බිඳ, හිඳීමෙහි-හිඳ, විඳීමෙහි (ලැබීමෙහි) විඳ, යන ධාතූන් කෙරෙන් යටකීසේ, කර්ම කර්තෘ කාරකාර්ථයන්හි-දයින් නෙමෙන් ගොං යනාදි සූත්‍රයෙන් අ ප්‍රත්‍යය කොට-සඳරුත් යනාදි සූත්‍රයෙන් දකාරලෝපය කොට අර්ධමාත්‍රයට මාත්‍රාවෘද්ධි කොට ප්‍රත්‍යය ලොප්කළකල්හි-සුන්, බුන්, යනාදි ශබ්දප්‍රකෘති සිද්ධයි-දීමෙහිවූ 'දා' යන ධාතුව කෙරෙන් උන් ප්‍රත්‍යය යෙදී දුන් යනු සිද්ධයි—මේ කියනලද ප්‍රත්‍යයයෝ කාලවශයෙන් අතීතයෙහි වෙති.

ආගමනයෙහි (ඊමෙහි) 'ඉ' *කෑමෙහි, 'කා' දීමෙහි 'දා' යන ධාතූන් කෙරෙන් කර්ම කර්තෘ කාරකාර්ථයන්හි යටකීසේ 'න' ප්‍රත්‍යය කොට පිළිපෙරළි මාත්‍රාහානි යනාදිය කළකල්හි-එන, කන, දෙන යන ශබ්දප්‍රකෘති සිද්ධයි-වර්තමානයි.

කෙටූ යනාදිය කර්ම කර්තෘකාරකදෙක්හි වන ක්‍රමය නම් ගොවින් කෙටූ බිම් යන තන්හි කර්මකාරකාර්ථයෙන් කොටනලද යන අර්ථයි-බිම්කෙටූ ගොවි යන තන්හි කර්තෘකාරකාර්ථයෙහි හෙයින් භූමිය කෙටුවාවූ යන අර්ථයි.

“සිතුම්ණවත් යදි යදිනට දනින් දෙන” යන තන්හි 'දෙන' ශබ්දයෙන් දානය කරණු ලබන්නාවූ යන කර්මකාරකාර්ථය හැඟේ “දෙන නොමඳ සිරිසඟමොක්සැප තිසැදී” යන තන්හි දෙන ශබ්දයෙන් දානය කරන්නෙක්-හෙවත් දෙන්නාවූ යන අර්ථය හැඟේ, මේආදි ක්‍රමයෙන් දතයුතු.

a ප-එයින්, ඒ කරණකොටගෙණ; යේනුයි, ගමනය කෙරේනුයි; යන්, යන්නම් වේ; (යානාවයි) එයින්, ඒ කරණකොටගෙණ; වසානුයි, ඡාදනය කෙරේනුයි; වසන්, වසන්නම්වේ; (වස්ත්‍රයයි) එයින් සනහානුයි, ඒ කරණකොටගෙණ ස්නානය කෙරේනුයි; නහනු, නහනු නම් වේ; එයින් කෙරේනුයි; ඒ කරණකොටගෙණ කෙරේනුයි; කර, කරනම්වේ-මේඈ, මේ ආදිය; කරණකරුපසින්නිපන්, කරණකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

---

* අ උපසර්ග පූර්වවූ-ඉගමන්හිද විය හැකිවෙ

බහුනකෙරෙන් බත්නුයි-බෙමි-රකුසු
මේ ඈ අවදිකරු පසින් නිපන්-
එහි වෙත්නුයි-බිම්, එහි සැපත් පිරේණුයි-පුර,
මේ ඈ අදර කරුපසින් නිපන්-a
කරණු, දෙනු, වලදනු, මැගුම්, නැගුම්, සිදුම්, නැමදුම්-
මේ ඈ හවිපසින් නිපන්-ඉති දසින් පස-b

---

පදසිද්ධිය.

එසින් යේ යන අර්ථයෙහි, යා-ගමන්හි යන ධාතුව කෙරෙන්ද-එසින් වසාතුයි යන අර්ථයෙහි, වස-වැසීමෙහි යන ධාතුවකෙරෙන්ද දසින් නෙමෙන්හොත යනාදි උපාධිසූත්‍රයෙන් කරණාර්ථයෙහි අන් ප්‍රත්‍යයකොට පූර්වස්වර ලොප්කොට පරස්වර ගාත්‍රාරූඪකළකල්හි "යන් වසන්" යන ශබ්දප්‍රකෘති සිඩයි.

නැමෙහිවූ නා යන ධාතුවකෙරෙන් කරණාර්ථයෙහි දසින් නෙමෙන්හොත යනාදි උපාධිසූත්‍රයෙන් තු ප්‍රත්‍යයකොට, සදරුත් යනාදි සූත්‍රයෙන් හකාරාගම හා ආකාරයට මාත්‍රාහානිකළකල්හි නහතු යන ශබ්දප්‍රකෘතිය සිඩයි * කිරීමෙහිවූ කර යන ධාතුවකෙරෙන් සටයිනෙස් අ ප්‍රත්‍යය විමාදියෙන් කර යතු සිඩයි.

b ප-හිතට, ඒ පුද්ගලයාහට; දෙතු ලැබේතුයි, දුනය කරණුලැබේතුයි-දුනි, එනම් වේ-මේඈ, මේ ආදිය; සපදන්කරුපසින්, සම්ප්‍රදාන කාරක ප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්නයි.

පදසිද්ධිය.

දීමෙහි වූ දා යන ධාතුවකෙරෙන් දසින්නෙමෙන් යනාදි සූත්‍රයෙන් සම්ප්‍රදානාර්ථයෙහි නි ප්‍රත්‍යය කළකල්හි දුනි යන ශබ්දප්‍රකෘතිය සිඩයි.

a ප-ඔහුකෙරෙන්, ඔහුගෙන්; බත්නුයි, භිතවෙත්තුයි; බෙම්, එනම්වේ; රකුසු, රාක්ෂසයි; මේඈ, මේ ආදිය; අවදිකරුපසින්, අවධිකාරක ප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්නයි-එහි, ඒස්ථානයෙහි; වෙත්තුයි, පවතිත්තුයි-උපදිත්තුයි හෝ; බිම්, එනම්වේ; එහි, එතන්හි; සැපත්, සම්පත්තිය පිරේණුයි; පූර්ණවේතුයි; පුර, පුරනම්වේ; මේඈ, මේආදිය; අදරකරුපසින්, ආධාරකාරක ප්‍රත්‍යයෙන්; නිපන්, නිෂ්පන්නයි.

---

* නහයු යන ශබ්දයාගේ නිෂ්පත්තියෙහි ධාතුව නා නැමෙහියයි පුරාණ ව්‍යාඛ්‍යානයෙහි කියනලදී-සංස්කෘත ස්නා යන ධාතුවෙන් සිදු තද්භවවශයෙන් පවත් නා-ධාතුප්‍රකෘති දෙකක් සිංහල භාෂාවේ පවත්නාසේ පෙණේ-එනම්:- නහන නගුහා නා නගුයි—සැලලිහිණිසන්දේශයෙහි:

"මල් දම් පුවදදුම් දුන් සොඳ වරල සිනි
කල් හිම් නිවා නැහෙන සිහිලස ර සිනි"

ප ද සි ඞි ය.

බෙම යනු සිඬනටයුතු තුන්හි බිංචෙහිවූ, බා යන ධාතුව කෙරෙන් යටකීසේ අවධි අර්ථයෙහි එම් ප්‍රත්‍යයකොට පූර්වස්වරලොපාදිය කල කල්හි "බෙම" යන ශබ්දප්‍රකෘතිය සිඩවේ.

විමෙහි වූ යන ධාතුව කෙරෙන්–ආධාරාර්ථයෙහි ඉම් ප්‍රත්‍යයකොට වකාරයට බකාරාදෙශ පූර්වස්වරලොපාදිය කලකල්හි බිම් යනු සිඩයි පිරිමෙහි පුර යන ධාතුව කෙරෙන් අප්‍රත්‍යයාදිය පුගමයි.

b ප–කරණු, කිරීමයි; දෙනු, දීමයි; වලදනු, වැලදීමයි; මැනුම්, බැලීමයි; නැගුම්, නැගීමයි; සිඳුම්, කැපීමයි; නැමදුම්, වැඳීමයි; මෙ ඈ, මේ ආදිය; භව්පසින්, භාවප්‍රත්‍යයෙන්; ත්පත්, තුම්පත්නදි දසින්, ධාතුව කෙරෙන්, පස, ප්‍රත්‍යය; ඉති, මෙසේයි.

ප ද සි ඞි ය.

'කර' යන ධාතුව කෙරෙන්ද 'දා' යන ධාතුව කෙරෙන්ද යටකීසේ භාවාර්ථයෙහි නු ප්‍රත්‍යයකොට දා යන්නේ පිළිපෙරළි කලකල්හි, කරණු දෙනු යන ශබ්දප්‍රකෘති සිඩයි–රකාරයා කෙරෙන් නකාරයාට ණකාරාදෙශයි.

---

මෙහි සැනහෙන යනු සනානය කරණුලබන්නාවූ යන අර්ථයි–නා යන ධාතුවෙන්ම සිඩයි—නා යන්නට 'සනහ' යන ආදේශයක් කටයුතුයි–සනහ යන ධාතුවෙන්වූකලී කරණාර්ථයෙහි යු ප්‍රත්‍යයකොට පූර්වස්වරලොප මාත්‍රාවෘද්ධිද පිළිපෙරළිද කලකල්හි සිඩයි–

එහිම— 'ස ම හ ල  හිරි සිජ්ජු දිගුකල සොඬක සැ  ඊ
සි හි ල ල  ගඟ සිහිල් සනහා මුනි තොගැ  ඊ

මෙහි 'සනහා' යනු ස්නානයකොට යන අර්ථයි–සනහ යන ධාතුව කෙරෙන් පූර්වක්‍රියාර්ථයෙහි ආ ප්‍රත්‍යයකලකල්හි "සනහා" යනු සිඩයි.

"අහස් ගඟ යමු  නා
එන්මු තෑ නොහි ගොඩ  නා
පයාගය දිය  නා
හිමත් සනහා කුමරු දිය  නා"

යන්නෙහි තුන්වෙනි පාදයෙහි දියනා යන තන්හි–ජලයෙන්– නාලා (පයාගය නිසා ත පාඨයි, ප්‍රයාග ත්‍රිවේණි ප්‍රයාග යන් නාමයෙන්ද ව්‍යවහාරවන තෙසිනි) යන අර්ථයි–ඒ වන්හි–නා යන ධාතුවෙන් සිඩයයි හැගේ

* සංස්කෘතිකාරයෙහි නවනු ගයුගයාදින් ස්යනලද්දවූ භාවක්‍රියාත් මෙසේයි

### නාමයා කෙරෙන් ප්‍රත්‍යය.

**මනුහු පිත්=මන්වා, නර, දනුව පිත්=දන්වා, අසුර. සමණ හු පිත්=සෙහරණ, සුගත්දෙව මෝහම්=සෝගත්, උවසු, වා දෙව මෙදෙසම=වයඹ, නකත්දතුයේ=නැකැති-ඍ**

ඍ ප-මනුහුපිත්, මනුහුගේ (මනු නම් රජහුගේ) පුත්‍රතෙම; මන්වා, මන්වා නම්වේ; නර, මනුෂ්‍යයායි-දනුවපිත්, දනු නමැත්තියගේ පුත්‍රතෙම; දන්වා, දන්වා නම්වේ; අසුර, අසුරයායි-සමණහු පිත්, ශ්‍රමණයාගේ පුත්‍රතෙම; * සෙහරණ, සෙහරණ නම් (සාමණෙරයි) සුගත්, සර්වඥතෙම; දෙව්, දෙවතාවූයේ; මෝහට, මොහුටනුයි; සෝගත්, සෝගත්නම්වේ; උවසු, උපාසකයායි; වා, වාතයතෙම; දෙව්, දෙවතාවූයේ; මෙදෙසට, මේ දිශාවටනුයි; වයඹ, වයඹනම්වේ; නකත් දතුයේ, නක්ෂත්‍ර පරිඥානයකෙළේ; නැකැති, නැකැතිනම්වේ.

### පදසිද්ධිය.

මන්වායි, ශබ්දප්‍රකෘතියක් කටයුතුතන්හි මනු ශබ්දයා කෙරෙන් සම්බන්ධාර්ථයෙහි හු විභක්තිකොට මනුහු යන ෂෂ්ඨී විභක්ති ඒකවචනය සිද්ධකොට ප්‍රථමෛක වචනාර්ථයෙහි පිත් යනු යොදා වාක්‍ය සිද්ධකොට-දසින්නෙනමෙන් හොත යනාදී උපාධිකසූත්‍රයෙන් එයින් පරකොට පුත්‍රාර්ථයෙහි-වා ප්‍රත්‍යයකොට සඳරුත් යනාදී සූත්‍රයෙන් වාක්‍ය සම්බන්ධ පිත් යන්න අප්‍රයොගකොට හු යන විභක්තිය ලොප්කොට-නකාරගත උකාරය ලොප්කළකල්හි 'මන්වා'යි ශබ්දප්‍රකෘතිය සිද්ධයි—ඔහුකෙරෙන්-පෙරවිබත් එකබස අකොට ලොප්කළකල්හි මන්වායි පෙරවිබත් එකබසවේ.

දන්වායි, සිද්ධකටයුතු තන්හි; දනු ශබ්දයා කෙරෙන් සම්බන්ධාර්ථයෙහි අ විබත්කොට වකාරාගමකොට දනුව යන ෂෂ්ඨ්‍යන්තයා කෙරෙන් පිත් යන ප්‍රථමෛක වචනය යොදා වාක්‍ය සිද්ධකොට යටක්සේ පුත්‍රාර්ථයෙහි වා ප්‍රත්‍යයකොට වාක්‍ය අප්‍රයොගවිභක්ති ලොපකොට උකාරලොපය කළකල්හි දන්වායි අකාරාන්ත ශබ්දප්‍රකෘතිය සිද්ධයි- ඒ ශබ්දප්‍රකෘතිය කෙරෙන් නැවත විභක්ති කටයුතුයි-සෙහරණ යන ශබ්දප්‍රකෘතිය සිද්ධකටයුතු තන්හි-සමණ ශබ්දයා කෙරෙන් සම්බන්ධ ඒකවචන හු යන්න කළකල්හි සමණහු යනුවේ-ඔහු කෙරෙන් පිත්

* මනුහුපිත් යනාදී තන්හි පිත් ශබ්දයෙන් පුත්‍රයා කියනලද්දේය—පුත්‍ර තෙමිය සිරෙනි යනාදී තන්හි, පුත් ශබ්දයෙන්ද පුත්‍රයා කියනලද්දේය-උහු පිතෙක් යනාදී ප්‍රදීපිකා පාඨයන්හිද ජාතකපොත්හිද පිත් ශබ්දය පුත්‍රවාචකව පෙණේ-ඒ වනාහි පුත් ශබ්දයාගේ පිළිපෙරළුයෙන්වූ ශබ්දරූප විශෙෂයෙකි-මේ කාලයෙහි අධුනිකයන්ගේ බොහෝ පොත්පත්වල පුත් පිත් කියා පුත්‍ර පිතෘ යන අර්ථ ගගවන පිණිස යොදනලදී-පිත්‍රාර්ථයෙහි පිය ශබ්ද යමුත් පිත් ශබ්දයක් ජෙතපාඨයන්හි නොපෙණේ.

**පදනම හිස=පදි, දනන් සුමු=දෙනෙතා, සියල්ලෙව්=ලෝතා**
**ගම්හිවූයේ=ගැමි, සගෙහිවූයේ=සැගි, රුවනින්-දඹුයෙන්-**
**මවනලද=රුවන්මුවා, දඹුමුවා, තුරුමෙන්, තුරුවත්=නැව්**
**දවවනුයේ=නැවි. තොටහියුතුවූයේ=තොටි—ඉ**

යන ප්‍රථමෙක වචනයකොට-වාක්‍යය සිඩකොට ඉන් පරකොට පුත්‍රාර්ථයෙහි අප්‍රත්‍යයකොට වාක්‍යය අප්‍රයොගකොට විභක්තිප්‍රත්‍යය ලොප්කොට සකාරයට හකාරයක්ද මකාරයට රකාරයක්ද ආදෙශකොට, හකාරයේ පිළිපෙරළි කළකල්හි හෙරණ යන ශබ්දප්‍රකෘතිය සිඩයි පුගත්දෙව් මෝහට යන වාක්‍යයෙහි, දෙවතාර්ථයෙහි අප්‍රත්‍යයකොට ලොප්කොට දෙව්මෝහට යන වාක්‍යය, අප්‍රයොගකොට ප්‍රත්‍යයකළ හෙතුවෙන් පිළිපෙරළි කළකල්හි හෝගත් යනු සිඩයි—වාදෙව් මෝහට යන වාක්‍යයෙහි දෙවතාර්ථයෙහි යඹ ප්‍රත්‍යයකොට වායන්නේ ස්වරය මාත්‍රාහීනකළකල්හි 'වයඹ' යන ශබ්දප්‍රකෘතිය සිඩයි—නකත්දතුයේ යන වාක්‍යයෙහි දතුම් අර්ථයෙහි ඉප්‍රත්‍යයකොට වාක්‍යයෙහිවූ දතුයේ යනු අප්‍රයොගකොට නකාර කකාර දෙක්හි ස්වරයන්ට මාත්‍රාවෘඩිකළ කල්හි 'නැකැති' යන ශබ්දප්‍රකෘතිය සිඩයි.

ඉ ප-පදනට, පාදයන්ට; හිය, නිතවූයේ; පදි, එනම් වේ—දනන් සුමු, ජනයන්ගේ සමූහතෙම; දෙනෙතා, දෙනෙතා නම්වේ; සියල් ලෙව්, සකලලොකය; ලෝතා, ලෝතා නම්වේ; ගම්හිවූයේ, ග්‍රාමයෙහි ඇතිවූයේ හෝ හටගත්තේ; ගැමි, එනම් වේ—සගෙහිවූයේ, ස්වර්ගයෙහි ඇතිවූයේ; සැගි, එනම් වේ; රුවනින්, රත්නයෙන්ද; දඹුයෙන්, කාශ්ඨයෙන්ද; මවනලද, නිර්මාණය කරනලද්දේ; රුවන්මුවා-දඹුමුවා; රුවන්මුවා නම්ද දඹුමුවා නම්ද වේ—තුරුමෙන්, තාරකාවමෙන් දෝහෝ නොහොත් වෘෂයමෙන් යන අර්ථයෙහි; තුරුවත්, තුරුවත් යනුවේ—නැව් දවවනුයේ, නෞකා ධාවනය කරවන තැනැත්තේ; නැවි, එනම්වේ; තොට තියුතුවූයේ, තීර්ථයෙහි නියුක්ත තැනැත්තේ;—තොටි 'එනම්වේ.

පදසිඩිය.

පද ශබ්දයාකෙරෙන් හිතාර්ථයෙහි ඉ ප්‍රත්‍යය විමාදියෙන්, පදි ශබ්දය සිඩයි-දන ශබ්දයා කෙරෙන් සමූහාර්ථයෙහි, තා ප්‍රත්‍යයකොට දන ශබ්දයාගේ පිළිපෙරළි කළකල්හි;දෙනෙතා යන ශබ්දය සිඩයි, ලෝ ශබ්දයා කෙරෙන් සවර්ථයෙහි, තා ප්‍රත්‍යය කළකල්හි, ලොතා ශබ්දය සිඩයි-ගම්හි, සගෙහි, යන ආධාර විභක්තීන් කෙරෙන් වූයේ යනු යොදා භූතාර්ථයෙහි එසින් පරව දසින්නෙමෙත්හොත යනාදි උපාධිසූත්‍රයෙන් ඉ ප්‍රත්‍යයකොට සදරුත් යනාදි අධිසූත්‍රයෙන්—වාක්‍ය හා විභක්ති ලොප්කොට ගම සග ශබ්දයන්ගේ අන්ත්‍යස්වර ලොප්කොට ගම් ශබ්ද සග ශබ්ද දෙක්හිම පූර්වස්වරයන්ට මාත්‍රාවෘඩි

කුම්භකාරෙම්දූසි පිළිවිස කරණුයේ=කිකරු, දිපැතියේ= දිමුත්, නියඇතියේ=නියවත්, බල, කර, අත්, ඇතියේ-බිලි, කිරි, ඇත්, සබටරහ=සැබි, මේඇ, නමින්පරව ඒ ඒ අරුත් පසින් නිපන්-෴

කොට පැමිනවූකල්හි--ගැමි ශබ්දයද සැගි ශබ්දයද සිඩසි-යටකී නයින් රුවන් ශබ්දයා කෙරෙන්, කෘත්‍යාර්ථයෙහි 'මුවා' ප්‍රත්‍යය කළ කල්හි රුවන් මුවා ශබ්දය සිඩසි-දඹුමුවා යනුද මෙම නයසි—තුරු ශබ්දයාකෙරෙන් උපමාර්ථයෙහි 'වත්' ප්‍රත්‍යයකළකල්හි-තුරුවත් * යනු සිඩසි-නැව් ශබ්දයාකෙරෙන්ද, තොට ශබ්දයාකෙරෙන්ද, ධාව නකරණාර්ථයෙහිද, තියුක්තාර්ථයෙහිද, ඉ ප්‍රත්‍යය කිරීමාදීයෙන් නැව් තොටි යන ශබ්දප්‍රකෘති සිඩසි.

෴ ප-කුම්භකාරෙම්දූසි, කුම්භකාරම්දූසි; පිළිවිස, ප්‍රතිපෘච්ඡනය කොට; කරණුයේ, කරණ පුද්ගලතෙම; කිකරු, කිංකරු නම් වේ; දිපැතියේ, දීප්තිමත්වූයේ; දිමුත්, එනම්වේ; නියඇතියේ, ඤායය ඇත්තේ; නියවත්, නියවත් නම්වේ; බලඇතියේ, බලවත්වූයේ; බිලි, බිලිනම්වේ; කරඇතියේ, හස්තඇත්තේ; කිරි, කිරිනම් වේ; අත්ඇතියේ, හස්තඇත්තේ; ඇත්, ඇත්නම්වේ; සබටරහ, සභාවට අර්හ (යෝග්‍ය) වූයේ; සැබි, සැබිනම් වේ-මේඇ, මේ ආදියූ නමින් පරව, නාමයාකෙරෙන් පරව; ඒ ඒ අරුත්පසින්, තත්තදර්ථ ප්‍රත්‍ය යෙන්; (ඒ ඒ අර්ථඇති; ප්‍රත්‍යයෙන්) නිපන්, නිෂ්පන්නයි.

පද සිද්ධිය.

කිකරු, කියා ශබ්දප්‍රකෘතියක් සිඩකටයුතුකල්හි, කුම් යන නාම විභක්තිය පූර්වකොට කෙරෙම්දූසි යන වාක්‍යයා කෙරෙන් කිරීමෙ වූ 'කර' යන ධාතුව යොදා ඔහු කෙරෙන් පරකොට දයින්නෙමෙන් කොත යනාදි උපාධිසූත්‍රයෙන් කර්තෘඅර්ථයෙහි උ ප්‍රත්‍යයකොට-සඳ රුත් යනාදි අධිසූත්‍රයෙන් වාක්‍යය හා විභක්ති ලොප්කොට, ධාතු වේ අන්ත්‍යස්වරය ලොප්කොට, ස්වරය හ්‍රස්වරූඪකළකල්හි—කිකරු යන ශබ්දප්‍රකෘතිය සිඩසි-ඔහුකෙරෙන් නැවත විභක්ති ප්‍රත්‍යය කාට යුතුයි.

දිප, ශබ්දයාකෙරෙන් යටකිසේ අස්ත්‍යර්ථයෙහි මත් ප්‍රත්‍යයකොට සඳරුත්යනාදි සූත්‍රයෙන් දිපි ශබ්දයේ පකාරය ලොප්කොට මකාර යේ පිළිපෙරළිකළකල්හි දිමුත් යන ශබ්දප්‍රකෘතිය සිඩසි.

---

* නියවත් යනාදි ශබ්දයන් කෙරෙන් විභක්ති ප්‍රත්‍යයවිමෙන්, ඒ ඒ විභක්තිය වනබව-එතුනුරුවන් නියවත්පුදු යනාදියෙන් පෙණේ-තුරුවත් ශබ්දය ක්‍රියාවිශේෂණ වනබැව් පෙණේ.

ඉති තුරුණු පැලකෙවි; මෙද සැකවින් දක්වා
පලු පලමල් සසිරි, තුරුවත් විතර පානෙම්-මුවදෙව්දවත-
මෙහි තුරුවත්, ව්‍යාකරණයක්-මෙන් යන අර්ථයි.

**ඉඳුරු, ගිනි, යම්, ඈ දසගු තමහිමියන් නමින්ද**
**මල්, පිලි, ඈ ඒ ඒ ලියරුක් නමින්ද-අබෙදුවසරින් පසවත්**
**කිරීමෙන් හොත වහර යෙදේ-1**

නී, ශබ්දයාකෙරෙත් කම්මවිභක්ති එකවචන අ ප්‍රත්‍යයකොට-යකාරාගම හා ඊකාරයට හ්‍රස්වකොට නිය යනු සිද්ධකොට, ඇතියේ යනු යොදා වාක්‍ය සිද්ධකොට අසත්‍යර්ථියෙහි දයින්නෙමෙන් හොත යනාදි උපාධිසූත්‍රයෙන් වත් ප්‍රත්‍යය කොට ව්‍යවහාරානුකූල පරිද්දෙන් සදරුත් යනාදි සූත්‍රයෙන් ඇත්තේ යනු අප්‍රයොගකොට නිය යන්නේ විභක්ති ලොප්කොට නිපදවූ කල්හි නියවත් යන ශබ්ද ප්‍රකෘතිය සිද්ධයි-බල කර අත් ශබ්දයන් කෙරෙත් යටකීසේ ඉ ප්‍රත්‍යය කොට අත් ශබ්දයා කෙරෙන්වූ ඉ ප්‍රත්‍යය ලොප්කොට, බල යනාදියේ පිළිපෙරළිද අත් යන්නේ මාත්‍රාවෘද්ධිද කොට පැමිනවූකල්හි, බිලි යනාදි ශබ්දප්‍රකෘති තුණ සිද්ධයි-සබ ශබ්දයෙන් පරව ඉ ප්‍රත්‍යයකොට සකාරයේ මාත්‍රාවෘද්ධිකොට ස්වරලොපාදිය කළකල්හි, සැබි යන ශබ්දප්‍රකෘතිය සිද්ධයි.

1 ප-ඉඳුරු, ඉන්ද්‍රය; ගිනි, අග්නිය; යම්, යාම්‍යය; ඈ දසගු, මෙම්ආදි දිශාවෝ; තමහිමියන්නමින්ද, තමන්ගේ (ඒ දිසාවන්ගේ) ස්වාමීන් නමින්ද; මල්පිලි ඈ, පුෂ්පඵලාදීහු; ඒ ඒ ලියරුක්නමින්ද; ඒ ඒ ලතා වෘක්ෂනාමයෙන්ද; අබෙදුවසරින්හොත, අභෙදොපචාරයෙන් හෝ; පසවත්කිරීමෙන්හොත, ප්‍රත්‍යයවත් කිරීමෙන් හෝ; වහරයෙදේ, ව්‍යවහාරයෙහි යුක්තවේ.

භාවය-ඉඳුරු යනු ශක්‍රයාට නමකි-හෙතෙම පූර්වදිග අධිපතියි-ඉඳුරු කීකල පූර්වදිගද හැඟේ—ඒ අභෙදොපචාරයෙන් හෝ ප්‍රත්‍යය වත් කිරීමෙන් හෝ වියයුතුයි-ගිනි, අග්නියට හෝ අග්නිදෙවතාවාට නම්-හෙතෙම ගිනිකොණ අධිපතියි-ගිනි ශබ්දයෙන් ගිනිකොණද කියනුලැබේ. යාම්‍යාදියද එසේමය—පුෂ්පඵලාදියට කියන නාමද එසේ-යොහොඹු යනු මාධවීලතාවට නම්-එය මාධවී පුෂ්පයටද එසේම කියනුලැබේ-දෙළුම් යනු දාඩිම වෘක්ෂයට නම්-දෙළුම් ශබ්දයෙන් දාඩිම ඵලයද කියනුලැබේ-මෙද අභෙදොපචාරයෙන් හෝ ප්‍රත්‍යයවත් කිරීමෙන් හෝ ව්‍යවහාරයෙහි යෙදේ-ප්‍රත්‍යයවත් කළ කල්හි එය ලොප්කිරීමෙන් ශබ්දප්‍රකෘතිවේ—අභෙදොපචාරය පාලි භාෂාදියෙහි බොහෝ විස්තාරයෙන් කියනලදී-සාමීපාදි උපචාර දසයක් සමහර ආචාර්‍ය්‍යයන් විසින්ද තෙළෙසක් සමහර ආචාර්‍ය්‍යයන් විසින්ද දක්වනලදී. සාමීපොපචාර එකදෙශොපචාරාදිය ශබ්ද සාරාර්ථජාලිනී පඤ්චිකාප්‍රදීපාදියෙන් දතයුතු.

ස්ථානොපචාරයෙන් කියනකල, ස්ථානයේ නමින් ස්ථානවාසියා කියනුලැබේ-ස්ථානවාසියාගේ හෝ අධිපතියාගේ හෝ නමින් ස්ථානයද කියනුලැබෙයි දතයුතු—ඒ භෙදනොකොට සිතාගැණීමෙහි අභෙදොපචාරයද ප්‍රත්‍යයවත් කිරීමද හැමතැනම නොවේ—සමහර තැන සමාසයෙන්ද සමහරතැන අභෙදොපචාරාදියෙන්ද ව්‍යවහාර කරණබව හැඟේ-"සපුමල් යොහොඹුලා බැඳ වරළ මනරඟ" මෙහි "සපුමල්"යනු සමාසයෙන්ද "යොහොඹු" යනු අභෙදොපචාරාදි වශයෙන්ද යොදනලදී-මේ ආදි ක්‍රමයෙන් දතයුතු.

## පසරුත් අදිසර අටවනු-a

### උත් අවුත් අදියර.

**බජන තමවිබත් කම්කත්‍රු අරුතු අවුතු නම්,**
**ඔහු දෙදෙන උතුනම්වෙත් පලමුවිබත් බජනුවෝ,**
**ලබදසුතු කමත උතුනම් නැත අවුතුනම්,**
**උතුවතකම් කතු අවුත්-කතු උතුවත අවුත් කම්-b**

---

a ප-පසරුත් අදියර, ප්‍රත්‍යයාර්ථාධිකාරය; අටවනු, අෂ්ටමයේ.

---

b ප-කම්කතු අරුතු, කර්මකර්තෘ අර්ථය; තමවිබත්බජත, තමන්ගේ විභක්ති සේවනයකරණ කල්හි; අවුතුනම්, අනුක්තනම්වේ; ඔහු දෙදෙන, ඒ අර්ථයෝ දෙදෙන; පලමුවිබත් බජනුවෝ, ප්‍රථමාවිභක්ති සෙවනයකරන්නාහු; උතුනම්වෙත්, උක්තනම්වෙති.

ලබදසුතු, ලබ යන ධාතුවෙන් යුක්තවූ; කමත, කර්මාර්ථයතෙම; උතුනම්, උක්තනම්වේ; නැත, නැත්තේනම්; අවුතුනම්, අනුක්ත නම්වේ; කම්, කර්මය; උතුවත, උක්තවූකල්හි; කතු, කර්තෘතෙම; අවුත්, අනුක්තනම්වේ; කතු, කර්තෘ; උතුවත, උක්තවූකල්හි; කම්, කර්මතෙම; අවුත්, අනුක්තවේ.

භාවය-කර්මයට ස්වකීය විභක්තිය කර්මවිභක්තියමය, කර්තෘහට ස්වකීය විභක්තිය කර්තෘවිභක්තියමය—කර්මවිභක්තියෙන් යෙදුන කර්මය අනුක්තයි-ප්‍රථමාවිභක්තියෙන් යෙදුන කර්මය උක්තයි-ලබ යන ධාතුවෙන් යුක්තවූ කර්මාර්ථයනම්-ලබ යන ධාතුවේ අර්ථයෙන් යුක්තවූ කර්මාර්ථයයි-එනම් දුටිනි, කෙරුනි, මැවිනි, කැපුනි යනාදි ක්‍රියාපදවල ලබ යන ධාතුවේ අර්ථ පවතී-එනම් දවනලද්දේය, කරණුලැබිය, මවනුලැබිය, කපනලද්දේය යනාදි වශයෙනි-කල යනාදි ප්‍රත්‍යයාර්ථ ශබ්දවූ අර්ථක්‍රියා ශබ්දයෝ කිසිතැනෙක කලේයයි කී කල්හි කරණලද්දේය යනාදීන් ලබ ධාතුවේ අර්ථයෙන් යුක්තව සිටිත්-එබදුතන්හි කර්මය උක්තයයි දතයුතු-උක්තය යන අර්ථයෙන් හැඟෙන්නේ යම් ක්‍රියාකාරක සම්බන්ධයෙක්හි යෙදුන ප්‍රධාන ක්‍රියාවෙන් කියවෙන්නේ කර්මයනම් කර්මය උක්තබවද-කර්තෘනම් ඒ උක්තබවදවේ; කර්තෘ කර්ම දෙක යෙදුනු ක්‍රියාකාරක සම්බන්ධයෙක්හි-කර්මය උක්තනම් කර්තෘ අනුක්තයි-කර්තෘ උක්තනම් කර්මය අනුක්තයි—දෙකම උක්ත හෝ දෙකම අනුක්ත හෝ නොවේ-මෙමනයින් කර්තෘ කරණ දෙක යෙදුන තැනෙක කර්තෘ උක්තකල්හි-කරණය අනුක්තවේ-කර්තෘ සම්ප්‍රදාන දෙක යෙදුන තන්හිදු-කර්තෘ උක්තව සම්ප්‍රදානය අනුක්තව සිටී යනාදි ක්‍රමය ස්වභාවයෙන් හැඟේ-සියලුම කාරක

උදා: "දහම් නරදම් සැරිහු විසින් දෙසිති" මෙ ඇගි කම් උත්
කතු අවුත් නම්=a
"එදම් අරිසඟ පිළිපදනේ"යි මෙ ඇති කතු උත් කම්
අවුත්නම්-ඉතිහුදු කිරිය පෙදෙන් වුත් අවුත්-b
ගිම්රිවි තෙදිනදන් ගජරජ කුමුවු වනවිල්
එහි පිළිබිඹු බහුබලා නොසැහැ වනසන මෙනේනෙව්
මේ ඇ අකම් කිරියෙනෙන් උත්කතු-c

---

යෙදුන ක්‍රියාකාරක සම්බන්ධයෙහි කර්ම කර්තෘ දෙකෙන් එකක් උක්තවේ-අන්‍යවූ එක අනුක්තයි-අවශෙෂ කාරකද අනුක්තවෙත්-ඒ අනතුරුකොට කියනුලබන උදාහරණින් දතයුතුයි.

## උ දා හ ර ණ.

a ප-දහම්, ධර්මයතෙම; නරදම් සැරිහු විසින්, නරදම්මසාරථීහු විසින් (බුදුන් විසින්); දෙසිති, දෙසනාකරණලැබී; මෙ ඇඟි, මේආදී තන්හි; කම්, කර්මයතෙම; උත්, උක්තවේ; කතු, කර්තෘතෙම; අවුත් නම්, අනුක්තනම්වේ.

භාවය-මෙහි දෙසිති යන ක්‍රියාව කර්මයට භාරව යෙදුනේය, එහි ලබ යන ධාතුවේ අර්ථයද ඇත්තේය-ඒමෙසේයි-දෙසනුලැබුවේ ධර්මයයි-එහෙයින් ක්‍රියාව පිහිටියේ කර්මයෙහියි-එබැවින් ක්‍රියාවෙන් කියනලද්දේ කර්මයයි-දෙශනාක්‍රියාව ධර්මය ලැබූ හෙයින් ඒ ක්‍රියායෙහි ලබ යන ධාතුවේ අර්ථය පවතී-දෙසනුලැබුයේ කාවිසින්දැයි යන ආක්ෂෙපයෙහි බුදුන් විසිනැයි හැඟේ-කර්තෘහු ක්‍රියාවෙන් නොකියවූන හෙයින් ඒ අනුක්තයි.

b ප-එදම්, ඒ ධර්මය; අරිසඟ, ආර්‍ය්‍යසඞ්ඝතෙම; පිළිපදනේයි, ප්‍රතිපාදනයකරන්නේය යන; මෙ ඇඟි, මේආදී තන්හි; කතු උත්, කර්තෘතෙම උක්තවේ; කම් අවුත්නම්, කර්මතෙම අනුක්තනම්වේ-ඉති, මේ; හුදුකිරියපෙදෙන්, ශුද්ධක්‍රියාපදයෙන්; උත්අවුත්, උක්තානුක්තයි.

භාවය-මෙහි පිළිපදනේ යන ක්‍රියාව කර්තෘහට භාරව යෙදේ, කර්මයට භාරනොවේ-පිළිපදනේ කවරේද? ආර්‍ය්‍යසඞ්ඝතෙමේයි—එහෙයින් ක්‍රියාපදයෙන් කියනලද්දේ කර්තෘවූ සඞ්ඝතෙමේයි-කුමක් පිළිපදනේද යන ආක්ෂෙපයෙහි ලා-එදම්-යයි හැඟේ-ධාතුව සකර්මක හෙයින් කර්මය පෙණේ-එසේත් එහි ලබ යන ධාතුහුගේ අර්ථය නැත්තේයි-එබැවින්ම ක්‍රියාවෙන් නොකියනලද හෙයින් අනුක්තයි-මෙසේ (සකර්මකවූ) හුදක් ක්‍රියාපදයෙන් උක්තානුක්තවිධිය කියනලදී.

c ප-ගිම්රිවි තෙදින්, ග්‍රීෂ්මසූර්‍ය්‍යයාගේ තෙජසින්; අදන්, බිනනවූ (බැගැපත්වූ;) ගජ්රජ, හස්තිරාජතෙම; ඔහුපිළිබිඹු, ඒ සූර්‍ය්‍යයාගේ ප්‍රතිබිම්බය; එහි බලා, ඒ තඩාගයෙහි නිරීක්ෂණයකොට; නොසැහැ,

රුදුරු බියෙනිතුන් හද දුදුරට පිවිටු කම්
එහිදොහට කමොල්දෙත් වත්නට වැරද කොරුකෙත්
මෙ ඇ සකම් කිරියෙනෙන් උත් කතු-a
සලෙලු තිළු දූක පියවුරු බෙයද පියබඳ
වුහුටුමෙහි සක්නරද හිස් නැනම් උපුරණ සිංතනෙම්-
මෙ ඇ අරුත් කිරියෙනෙන් උත්කම්-b

---

සහනය නොකොට (නොඉවසාද;) වනසන මෙනෙන්එව්, විනාශකිරීමෙහි සිහින්මෙන්; වනවිල්, වනතටාකයෙහි; කුමුටු, නිමගනවී; මේ ඇ, මේ ආදිය; අකම්කිරියනෙන්, අකර්මක ක්‍රියායෙන්; උත්කතු, උක්ත කර්තෘසි. කුමුටු යනු අකර්මක ක්‍රියාවයි; ගජරජ යනු උක්ත කර්තෘසි.

a ප-කම්, අනඞ්ගතෙම; රුදුරුබියෙන්, ඊශ්වරයාකෙරෙන්වූ භීතියෙන්; ඉතුන්, ස්ත්‍රීන්ගේ; හදදුදුරට, හෘදය නැමැති කොටරයට; (හුඹුලට) පිවිටු, ප්‍රවිෂ්ටවී; (මැදුණේය) එහිදු, එතන්හිදු; (ඒස්ත්‍රීන්ගේ හෘදය නැමැති කොටරයෙහිද) ඔහට, උහුට; (ඒ අනඞ්ගයාට) කමොල්, කඨෝර; (වෙහෙස) දෙත්, (සලාලයෝ) දානයකරති; වත්නට, ප්‍රභූන්ට; වැරද, විරුඬව; කොරුකෙත්, කොහි රක්ෂිත වෙද්ද හෙවත් කවරහු රක්ෂිතවේද්ද; මේඇ, මේ ආදිය; සකම්කිරියනෙන්, සකර්මකක්‍රියායෙන්; උත්කතු, උක්ත කර්තෘසි.

මෙහි කම් හදදුදුරට පිවිටු, යන ක්‍රියාකාරක පදසම්බන්ධයෙහිවූ උක්තකර්තෘතෙම උදාහරණ කරණලදී–පිවිටු යනු ප යන උපසර්ග පූර්ව කොට ඇති වැදීමෙහිවූ විශ යන ධාතුව කෙරෙන්, 'ඒ ඉ ඊ උ ද' අයු–යනාදී සූත්‍රයෙන් අතීතකාලයෙහි උ ප්‍රත්‍යයකිරීමෙන් සිඬකරණලද අතීතකාලික ක්‍රියාපදයයි–මෙය–සකර්මකයි–පිවිටුවූයේ කවරේද, කාමතෙමේයි–එහෙයින් පිවිටු යන ක්‍රියායෙන් කම් නම්වූ කර්තෘ කියනලද හෙයින් උක්තකර්තෘනම්–කොතැනට පිවිටුයේද යන අපෙක්ෂායෙහි හදදුදුරටයයි හැඟෙන හෙයින් ඒ කර්මයි–ක්‍රියාවෙන් නොකියනලද හෙයින් අනුක්තනම් වේ–සැළලිහිණි සන්දේශයෙහි–

" සොඳ පුර අඟන පහ සුමුගින් පැහැ උදු ල
සෙද දුනි අඹර මතු ඇදරැස් මිණි මෙවු ල "

යන මෙහි "පුර අඟන රැස්මිණි මෙවුල දුනි" යන ක්‍රියාකාරකපද සම්බන්ධයෙහිද දුනි යනු සකර්මක ක්‍රියායි–පුරඅඟන යනු උක්තකර්තෘයි රැස්මිණි මෙවුල යනු අනුක්ත කර්මයි.

b ප–සලෙලු, සංලාලතෙම; පියබඳ, ප්‍රියාංගනියගේ; (ප්‍රිය ශරීර ඇති ස්ත්‍රියගේ)පියවුරුබෙයද, පයොධරනැමැති පර්වතය; දක, දර්ශන යකොට; තිළු, සතුටුවී; එහි, ඒ පයොධරනමැති පර්වතයෙහි; වුහුටු, (ඒ සංලාලයාජසින්) හරණලද්දාවූ; සක්නරද, ඇස්නැමැති නාරාචය

**ඒ ඒ විබත්හි අරුත්හි සමස්පස් තමතමවිබත් අරුත් උතුනම් කෙරේ, අන්කිරියක් නැත පෙරවිබත් අත්හට වූද යොදනු උත්අවුත් අදියර නවවනු. ඍ**

---

උපුරණිකිතෙනෙව්, උත්පාටනයකරණ අදහසින්මෙන්; කූස්, කිසීය; තැනවි, චලිතකෙළේය- මේඇ, මේ ආදිය; අරුත්කිරියෙනත්, අර්ථ ක්‍රියායෙන්; උත්කම්, උක්තකර්මසි; මේ උක්තකර්මයවීමෙහි, සලෙලු වුහුට සක්නරදසි ක්‍රියාකාරකපදසම්බන්ධය යෙදේ-තිලි යන අතීත ක්‍රියායෙන් උක්තවූ ප්‍රථමාන්ත සලෙලු යන පදයම මෙහි එනායෙදේ- එසින් අධ්‍යාහාර කළලද සලෙලු යන කර්තෘවිභක්ත්‍යන්ත පදයක් මෙහි කර්තෘවශයෙන් යෙදේ—එහෙසින් පුරාණ ව්‍යාඛ්‍යානයෙහි "සලෙලු යනු ඔහු විසින් අනුක්තකර්තෘසි" කියනලදී—මේ සම්බන්ධ යෙහි–වි යන උපසර්ග පූර්වවූ හැරීමෙහිවූ සද යන ධාතුවකෙරෙන් කර්මාර්ථයෙහි අර්ථක්‍රියාශබ්දයක් නිපදවීමෙහි ට ප්‍රත්‍යය කොට සකාර යට හකාරාදෙශද පිළිපෙරළිද දකාරලොපයද කොට සිඩකරණලද් දැවූ 'වුහුට' යනු ප්‍රථමාන්තඅර්ථක්‍රියාපදයසි, හරණලද්දේ කවරේදසි චොදනාවෙහි ලා සක්නරදයසි පරිහාරවශයෙන් ලැබෙන හෙසින් සක්නරද යනු ඒ අර්ථක්‍රියායෙන් උක්තකර්මසී-එහෙසින්ම ප්‍රථමාන්තසී- කාවිසිත්දසි චොදනාවෙහිලා සලෙලුයසි පරිහාර හෙසින් ඒ කර්තෘසී- ක්‍රියායෙන් නොකියනලද හෙසින් අනුක්තසී-එහෙසින්ම කර්තෘවිභ ක්ත්‍යන්තසී—සැළලිහිණි සන්දේශයෙහි.

" සැ දූ ලෙන් වරුණ දෙව්රද මුහුද වි සූ
ස දූ සහසකර එන මහවත සැල සූ
වි දූ උපුල් පිළමෙන් රත්පවිත් වැ සූ
සැඳෑ වලාපෙල පැලදිග පෙණුනු ප සූ "

මෙහි වරුණදෙව්රද සැලසූ විදූඋපුල්පිළ යන සම්බන්ධයෙහිදු කර්තෘකර්මාදීන්ගේ යෙදීම මෙසේසි-සැලසූ යන කර්මකාරකාර්ථ ක්‍රියායෙන් විදූඋපුල්පිළ යනු උක්තකර්මසි වරුණදෙව්රද යනු අනුක්ත කර්තෘසි.

ඍ ප-ඒ ඒ විබත්හි, ඒ ඒ විභක්තියෙහිද; අරුත්හි, (ඒ ඒ අර්ථයෙහි ද(වූ); සමස්පස්, සමාසභා ප්‍රත්‍යය; තමතමවිබත් අරුත්, තමතමන් ගේ විභක්ති හා අර්ථය; උතුනම්කෙරෙත්, උක්තනම් කරති; අන්කිරි යක්නැත, අන්‍යවූ ක්‍රියාවක් නැත්තේනම්; පෙරවිබත් අත්හට, ප්‍රථ මාවිභක්ත්‍යර්ථයට; වූද, වූ යන ධාතුව; යොදනු, යොජිතකරණු ලැබෙව්වා-උත් අවුත් අදියර, උක්තානුක්තාධිකාරය; නවවනු, නව මසි.

භාවය-කර්මවිභක්ති ආදිවූ යම් යම් විභක්තියක සමාසයෙවත් නම්- ඒ තමතමන්ගේ කර්මාදි විභක්තින් ඒ සමාසයෝ උක්ත කරති, කර්මාර්ථ

**කම්කතුකරණහා සපදන් අවදි අදරද.**
**මෙවියූ විබත් සයටම කරුණම් වියූ පඬුවෝ-ඝ**

කර්තෲර්ථාදි යම් යම් අර්ථයක ප්‍රත්‍යයෝවෙත් නම් ඔහු ඒ ඒ කර්මාර්ථ කර්තෲර්ථාදීන් උක්තකරත්-අර්ථයක් හඟවන්පිණිස ක්‍රියාවක් නැතිව යම් පදසමූහයක් යොදනලද්දේද-ඒ පදසමූදායෙහි පෙණෙන ප්‍රථමා විභක්තියේ අභිප්‍රකාශයට වූ යන ධාතුවෙන් නිපන් 'වේ' යනාදි ක්‍රියාපදයක් අධ්‍යාහාරකොට යෙදියයුතුයි-සමාසයෙන් විභක්තීන් උක්තවනක්‍රමය මෙසේයි-හස්එරුණෝ යමකටද එතෙම එරුණුහස් නම් යන සමාසයෙහි හස් එරුණෝ යමකට යන වාක්‍යයෙහි යමකට යනු කර්මවිභක්තියයි-එබැවින් මේ අන්‍යාර්ථසමාසය කර්මවිභක්තියෙහි කරණලද්දේය-යමකට යනු අප්‍රයෝගකොට විභක්ති ලොප්කොට එරුණුහස්, යන සමාසයවූකල්හි-ඒ හංසයාගේ බැසීමට කර්මයවූ විල ඒ එරුණුහස් ශබ්දයෙන් කියනුලැබේ-එහෙයින් එරුණුහස් යන සමාසයෙහි කර්මය උක්තයි-උක්තකල්හි සමාසමාත්‍රය හැඟෙනතැන ප්‍රථමාවිභක්තියි-එරුණුහස් තලා බලව යනාදීන් අන්‍යවූ ක්‍රියාසම්බන්ධ වනකල්හි නැවත එරුණුහස් ශබ්දය කර්මාදිවිභක්තීන් භජනයකෙරේ-"දමනලද ඉඳුරෝ යමෙකු විසින්"යන සමාස වාක්‍යයෙහි යමෙකු විසින් යනු කර්තෘවිභක්තියි-දැමිඳුරු යන සමාස ශබ්දයෙන් ඉන්ද්‍රියයන් දමනයකල කර්තෘතු හැඟෙනහෙයින් ඒ සමාසයෙන් කර්තෘ උක්තයි. දැමිඳුරු මුනි වඳිම් යනාදිවූ අන්‍යසම්බන්ධයන්හි නැවත කර්මාදි විභක්තීන් භජනයකරණබැව් දතයුතු. කටයුතුකරණ් යන තන්හි කරණ් යන ප්‍රත්‍යයාර්ථ ශබ්දය නිපදවීමෙහි කර යන ධාතුහු කෙරෙත් කර්මකාරකාර්ථයෙහි නි යන ප්‍රත්‍යය කරණලදි-කරණ් යන ශබ්දය නිපන්කල්හි එයින්ද කරණුලබන්නක්වූ කර්මයක් හැඟේ-එහෙයින් ඒ නි ප්‍රත්‍යයෙන් කර්මය උක්තයි-ඒ කටයුත්ත පමණක් නි මෙහි ප්‍රථමා විභක්ති වේ-කරණ් කරව යනාදීන් අන්‍ය ක්‍රියාසම්බන්ධයන්හි නැවත කර්මාදි විභක්තීන් භජනයකෙරේ-ක්‍රියාවක් නැත්තාවූ පදසමූදාය සම්බන්ධකිරීමෙහි වූ යන ධාතුවෙන් නිපන් ක්‍රියාපදයක් අධ්‍යාහාරකිරීම මෙසේයි-'නියකුරු ගෙණෙක් නම්' මෙහි ක්‍රියාපදයක් නැති හෙයින් නියකුරු ගෙණෙක් නම්වේ-කියා ක්‍රියාපදය යොදාගෙණ කියන ප්‍රථමාවිභක්ත්‍යර්ථය හා යෙදියයුතුයි-උසුරුවී මෙහි එක්මත් ඇතියේ ලුහුනම් යනාදීයත් මෙසේයි-"ලොවට කුළුණෙන් සදිසිමාතා" යනාදි තන්හිද වේ-වි යනාදීන් ක්‍රියාපද යෙදියයුතුයි.

ඝ ප-කම්, කර්මය; කතු, කර්තෘය; කරණහා, කරණයද; සපදන්, අවදි අදරද, සම්ප්‍රදානය; අවධිය, ආධාරයද; මෙවියූ, මේ කියනලද්දවූ; විබත්සයටම, විභක්තිෂට්කයටම; කරුනම්, කාරක යන නාමය; පඬුවෝ, පණ්ඩිතයෝ; වියූ, කථනයකළෝ-කර්මවිභක්ති කර්තෘවිභක්ති යනාදි විභක්ති සයටම කාරකය යන නම පණ්ඩිතයෝ කීවාහුය යනු භාවයි.

**කිරියනිපැත්මට හේතෙන් මෙසය කරුනම්,**
**සබඳ අලපෝ බිහිවූ මෙවෙනි අයුරක් නොලදින්-ෂ**

ෂ ප-කිරිය නිපැත්මට, ක්‍රියානිෂ්පත්තියට; හේතෙන්, හෙතුවන හෙයින්; මෙසය, මේ විභක්තිෂට්කය; කරුනම්, කාරකනම් වේ; සබඳ අලපෝ, සම්බන්ධආලපනයෝ; මෙවෙනි අයුරක්, මේබඳු ආකාරයක්; නොලදින්, නොලත්හෙයින්; බිහිවූ, බාහ්‍යවූහ.

භාවය-මේ කර්ම-කර්තෘ-කරණ-සම්ප්‍රදාන-අවධි-ආධාර යන විභක්තිසය ක්‍රියාඉපදීමට හෙතුහෙයින් කාරක යන නම ලබත් කාරක නම් යමක් කරන්නායි, කරන්නාම හෝ උපචාරවශයෙන් ක්‍රියාහුගේ උත්පත්තියට හෙතුවූයේ කාරකනම් වේ.

ඒ මෙසේයි-ගෙට යනු කර්මවිභක්තියයි-මෙය යෙදූකල්හි වදියි යයි යනාදි ක්‍රියාවක් ඒනිසා අවශ්‍යයෙන්ම ඉපදියයුතුයි-එහෙයින් කර්මවිභක්තිය කාරකයකි "සිපිහු" "තෙනෙත්හු විසින්" යනාදීන් කර්තෘ විභක්තියක් ඇතිකල්හිදු සිපිහුකළහම්, තෙනෙත්හු විසින් කම්දම් යනාදීන් අවශ්‍යයෙන්ම ක්‍රියාපද ඉපදියයුතුයි-එහෙයින් කර්තෘවිභක්තිය කාරකයි-ක්‍රියාවට කරුණුය යන අර්ථයෙන්ද කාරකයි නගුලෙන් යනාදීන් කරණවිභක්තියක් යෙදූකල්හිසාෙන්-යනාදීන් එක රුණෙන් ක්‍රියාවක් ඉපදවියයුතුමය-එහෙයින් කරණවිභක්තිය කාරකයක් වේ-බමුණාට-සදියාට යනාදීන් සම්ප්‍රදානයක් වූකල ඒ නිසා-දෙයි යනාදි ක්‍රියාපද නිපදියයුතුමයි-එසේ නැතුව අර්ථාවබොධයක් කොට නැවතියහැකි නොවේ-එහෙයින් සම්ප්‍රදාන විභක්තිය කාරකයකි.

ගමෙන්-ගසෙන් යනාදීන් අවධිවිභක්තියක්වූ කල්හි-යේ-වැටේ-යනාදි ක්‍රියාපදයන්ගේ නිෂ්පත්තිය අවශ්‍යයෙන්ම වියයුතුයි-එසේ නොකොට අර්ථාවගමයක් කළනොහැකියි-ඉන්නිසා අවධිවිභක්තියද කාරකයක්වේ—පුටුවේ—ගමේ—යනාදීන් ආධාරවිභක්තියක්වූ කල්හි-හිඳී-සිටී-යනාදි ක්‍රියාපද ඒනිසා නිපදවියයුතුමයි-නැතහොත් අර්ථාවගමයක් නොවේ-එසේ ක්‍රියා නිෂ්පත්තියට හේතුවන හෙයින් ආධාරවිභක්තියද කාරකයි රජුගේ-බමුණහුගේ-යනාදීන් සම්බන්ධ විභක්තියක්වූ කල්හි--ඒ නිසා ක්‍රියානිෂ්පත්තියක් නැතිව රජුගේ පිරිස-රට යනාදීන්ද-බමුණහුගේ-දම යනාදීන්ද අන්‍ය නාමයක් සම්බන්ධ වේ-එසේ ක්‍රියා නිෂ්පත්තියට හේතුනොවන බැවින්-සම්බන්ධය කාරකයක් නොවේ.

ආලපනය හෙවත් සම්බොධන විභක්තියද කාරකයක් නොවේ, කුමක්හෙයින්ද-පුතැ-බමුණැ-මිතුර යනාදීන් ආලපන විභක්තියක් යෙදූකල්හි යමෙකුට ආමන්ත්‍රණය කරණලද්දේද-ඔහුගේ අභිමුඛවීම ආලපනයෙන් කටයුත්තයි-ඔහු අභිමුඛවූකල්හි යව මලදව-රකුව

**යොදනු සබඳනම් මෙව්බත් කිරිය පදහා**
**මෙව්නා නොමැති වැකියෙක් විවකුඅරුත් පවසන–෧**

යනාදීන් නැවත ක්‍රියා නිෂ්පත්තියක්වේ–එය සම්බොධන විභක්ති හේතුවෙන් නොවේ-එහෙයින් ආලපනයද කාරකයක් නොවේ— සම්ප්‍රදාන-සම්බන්ධදෙකේ විශෙෂය මදක් දුරවබොධයි-දෙක බොහෝ තන්හි එකස්වරූප හෙයින් අවස්ථාභෙදයෙන් හැඳිනියයුතුයි- සම්ප්‍රදානය–"කර්මණායමභිප්‍රෛති සසම්ප්‍රදානම්" යන පාණිනීයසූත්‍ර ක්‍රමයෙන් දානයාගේ කර්මයෙන් යමක් අභිප්‍රායකරණලද්දේද, එහෙයින් අභිමතද-ඒ සම්ප්‍රදානයි "චතුර්ථි සම්ප්‍රදානෙ" යන සූත්‍රයෙන් සම්ප්‍රදානයෙහි චතුර්ථී විභක්තිය නියමකරණලද්දේය–දානලක්ෂණය නැතිතැන සම්ප්‍රදානය නොවේ–දානයට ප්‍රතිග්‍රාහකවීම තුන් ආකාරයකින් වේ–එනම් ප්‍රෙරකය අනිරාකර්තෘය, අනුමන්තෘය යනුයි– මෙදව කියා ඉල්ලීමෙන් මෙහෙයන්නා ප්‍රෙරකනම් යදියාට දනදෙයි සිතැන ප්‍රෙරක සම්ප්‍රදානයි–යමෙක් මම දෙමියි කීකල ඔව් කියා හොඳයි කියා හෝ අනුදනිනම් ඒ අනුමන්තෘ සම්ප්‍රදානයි-ගුරුහට පඬුරුදෙයි–සභනට දන්දෙයි යනාදී තන්හි අනුමන්තෘ සම්ප්‍රදානයි– දෙනදේකට අනුදැන්මක්වත් වැලැක්වීමක්වත් නොකරන්නේ අනිරාකර්තෘ සම්ප්‍රදානයි—හිරුට පුදදෙයි-බෝරුකට දියදෙයි යනාදී තන්හි අනිරාකර්තෘ–සම්ප්‍රදානයි–පිණ්ස යන්නට යොග්‍යතැනද සම්ප්‍රදානයි.

සම්‍යක් ශ්‍රෙයොබුද්ධ්‍ය ප්‍රදියනෙ යමෙක් තත් සම්ප්‍රදාන කාරකම්–මනාකොට ශ්‍රද්ධබුද්ධියෙන් යමෙකුට දෙනුලැබේනම් ඒ සම්ප්‍රදාන කාරකයි––එසේනොව රජහට දඩදෙයි–රදවාට රෙදිදෙයි යනාදී තන්හි සම්ප්‍රදානනොව සම්බන්ධයවෙයි දතයුතුයි–භෙද්‍ය භෙදක දෙදෙනාගේ එකතුවීම සම්බන්ධයි–එහි අප්‍රධානාර්ථයවූ භෙදකය සම්බන්ධනම් වේ.

සෙව්‍ය සෙවක, පූජ්‍ය පූජක, බොධ්‍ය බොධක, වාච්‍ය වාචක, වශයෙන් සම්බන්ධය යෙදේ-රජුගේ පුරිස් මෙහි රජ සෙව්‍යයි-පුරිස් සෙවකයි–මෙසින් පුරිස් භෙද්‍යයි, රජ භෙදකයි, එනම්-පුරිස් සාධාරණයි–කවරෙකුගේද? යත්, රජුගේයයි වෙන්කරණහෙයින් රජභෙදකයි–පුරිස් භෙද්‍යයි-රජ සෙව්‍යයි-පුරිස් සෙවකයි—සම්බන්ධයෙහි ප්‍රධානපදාර්ථය–පුරිස් යනුයි–රජුගේ යනු ඊට විශෙෂණයි—විශෙෂණ විශෙෂ්‍යාධිකාරයෙන් විස්තරවශයෙන් දතයුතු.

෧ ප–මෙව්බත්, මේ විභක්තීන්; කිරියපදහා, ක්‍රියාපදයන් සමග; යොදනු, යොජිතකිරීම; සබඳනම්, සම්බන්ධනම්වේ; මෙව්නා, මේ සම්බන්ධය හැර; විවකුඅරුත්, විවක්ෂිතාර්ථයක්; පවසන, ප්‍රකාශ කරන්නාවූ; වැකියෙන්, වාක්‍යයක්තොම; නොමැති, විද්‍යමානනොවේ.

**මුළුදෙව, පාපිඩු කනාඉකිලියේ, සඳුන්කපින්, පිස,**
**සඟනට, දී, බෙවෙන් මිදිනි-ඉති කිරියකරුපදන්**
**යොදන අයුරු-a**
**සියල්තැන සතලබින් යොදනු-b**

---

භාවය-මෙහි කර්තෘ ආදි විභක්තීන් අතීතාදි ක්‍රියාපදයන් සමග එකතුකොට කීම සම්බන්ධ නම්-නොහොත් ක්‍රියාකාරක පදසම්බන්ධ නම් වේ—මේ සම්බන්ධයහැර අභිප්‍රායකළ අර්ථයක් ප්‍රකාශකරණ වාක්‍යයක් නැත්තේයි සේයි.

## උදාහරණ.

a ප-මුළුදෙට, ඔදනකාර ප්‍රධානතෙම; පාපිඩු, පායාසපිණ්ඩය; කනාඉකිලියේ, කනකභාජනයෙහි; සඳුන්කපින්, චන්දනකාෂ්ඨයෙන්; පිස, පචනයකොට; සඟනට, සඞ්ඝයාට; දී, දානයකොට, බෙවෙන්, භවයෙන්; මිදිනි, මුක්තාවී.

මේ සම්බන්ධයෙහි කාරකසයම යෙදීතිබේ-කාරකනුවූ සම්බන්ධාල පන විභක්ති දෙක නැත්තේය-මුළුදෙට, ප්‍රථමායි; පාපිඩු, කර්මයි; කනාඉකිලියේ, ආධාරයි; සඳුන්කපින් කරණයි, සඟනට සම්ප්‍රදානයි; බෙවෙන්, අවධියි.

පිස-යනුද දී යනුද පූර්වක්‍රියායි-මිදිනි යනු ස්වයංකර්තෘ ස්වයංකර්ම යෙහිවූ ප්‍රධාන අපරක්‍රියායි මෙහි ප්‍රථමා උක්තකර්තෘයි හෙවත් කර්ම කර්තෘයි කර්මකාරකාදීහු අනුක්තයි.

b ප-සියල්තැන, සකලස්ථානයෙහි; සතලබින්, ස්ථාලාභවශයෙන්; යොදනු, යොජනයකරණු ලැබේවා.

භාවය-සැම සම්බන්ධයන්හි සියළුම කාරකයෝ නොලැබෙත්-කාරක ලත් පමණින් යොජනාකරණු ලැබේවයි සේයි.

### ඊට උදාහරණ මෙසේ දතයුතු.

පඬුවෝ දුනුම් වඩත්,
යන මෙහි පඬුවෝ උක්තකර්තෘවූ ප්‍රථමායි.

දුනුම් යනු අනුක්තකර්මයි-වඩත් යනු කර්තෘකාරකක්‍රියායි-මෙහි කර්තෘකර්මකාරක දෙක පමණයි-එකක් උක්තයි-අනික අනුක්තයි.

නිරිඳු සවනට නිස්මිනී-මෙහි නිරිඳු යනු උක්තකර්තෘයි-සවනට යනු පිණ්ස යන්නට යොග්‍ය තැනවූ අනුක්ත සම්ප්‍රදානයි-මෙහි කර්තෘ සම්ප්‍රදාන දෙක පමණයි.

බෙලේ යුදෙහි කගපතින් සතුරනු හිසකැපී.

මෙහි බෙලේ, උක්තකර්තෘයි යුදෙහි ආධාරයි-කගපතින්, කරණයි, සතුරනු සම්බන්ධ විභක්තියි-හිස, කර්මයි-කැපී, කර්තෘකාරක ක්‍රියාවයි-මෙහි කාරක සතරකි-කර්තෘ පමණක් උක්තයි අන්‍යවූ තුණම අනුක්තයි-කාරකනුවූ විභක්තියක්ද අනුක්තව තිබේ-එනම් අභිප්‍රායගේ යන අර්ථවත්වූ සතුරනු යන සම්බන්ධ විභක්තියයි.

## කිරියකරු පදසබඳ අදියර දසවනු-ය

ක්‍රියාකාරක සම්බන්ධයට ලැබුනුපමණ කාරකයෙදෙනනමුත්-ක්‍රියාපදයක් නැතිව සම්බන්ධයක් නොවන බැවින් "අන්කිරියක් නැත පෙරවිබත් අත්හටවූ දා යොදනුයි" කියනලදි-එබැවින් අන්‍ය ක්‍රියාවක් නැතිතැන වි වේ යනාදින් වූ යන ධාතුවෙන්වූ ක්‍රියාපදයක් යෙදියයුතුයි-පෙරවිබත් අත්හට වූ දා යොදනුයි-ප්‍රථමා විභක්ත්‍යන්තයට වූ යන ධාතුව යොදන්නට කියනලද්දේ-ක්‍රියාවෙන් උක්තාවන්නේ ප්‍රථමා විභක්තියයි දතයුතු හෙයිනි.

සඳදිලේ සිකල්හි දිලේ යන ක්‍රියායෙන් උක්තාවන කර්තෘතෙම සඳයි-ඒ උක්තහෙයින් ප්‍රථමායි-ක්‍රියාව අකර්මක බැවින් කර්මයක් නොයෙදේ-එහි අධ්‍යාහාර වන්නේත්-අගසේ කියා ආධාරයකි.

බෙළෙ බලාම්කෙරේ කි කල්හි කෙරේ යන ක්‍රියායෙන් උක්තාවන්නේ බෙළෙ යන කර්තෘතෙමේයි උක්තහෙයින් ප්‍රථමායි-ක්‍රියාව සකර්මකහෙයින් කර්මයක් යෙදේ-ඒ බලාම් යනුයි-එය අනුක්ත හෙයින් ස්වකීයවූ කර්මවිභක්තියෙන් සිටී-හරා අරා කොලෙස් කුළු යන තන්හි අරා යන ක්‍රියායෙන් හරා යන කර්තෘතෙම උක්තයි-එහෙයින් ඒ ප්‍රථමා විභක්තියෙන් සිටී-ක්‍රියාව සකර්මක හෙයින් කර්මයක් යෙදේ ඒ කොලෙස්කුළු යනුයි-අනුක්තහෙයින් ඒ ස්වකීයවූ කර්මවිභක්තියෙන් සිටී-අගමගගිනි කොලෙස්කැස දැවිනි-මෙහි කර්මකාරකයෙහි වූ දැවිනි යන ක්‍රියාවෙන් කියනලද්දේ කර්මයයි-ඒ කොලෙස්කැස යනුයි-එහෙයින් ප්‍රථමායෙන් සිටී-කර්මයක් කරණ කර්තෘවක් වියයුතුමහෙයින්-අගමගගිනි යනු කර්තෘයි-ඒ අනුක්තහෙයින් ස්වකීයවූ කර්තෘවිභක්තියෙන් සිටී-මෙසේ හෙයින් සියළුතැනම ක්‍රියාකාරක සම්බන්ධයෙහි උක්තවූ ප්‍රථමාව සෙවියයුතුයි-උක්තාවන්නේ එකෙකි, කර්ම හෝ කර්තෘ හෝ උක්තාවන එක ප්‍රථමායෙන් සිටී.

කිසිතැනෙක ප්‍රකෘතිකර්තෘ විකෘතිකර්තෘ වශයෙන් දෙකක්ව විශෙෂණ විශේෂ්‍යව පවතී-බෝසත් පඬිවී කි කල්හි බෝසත් යනු ප්‍රකෘති කර්තෘයි-පඬි යනු විකෘතිකර්තෘයි-මහමුනුනු සොම්නස්නම් පසේබුදු වනුයේ යන මෙහි මහමුනුනු යනු ප්‍රකෘති කර්තෘයි ප්‍රකෘති පුද්ගලයා හෙයිනි-පසේබුදු යනු විකෘතිකර්තෘයි-ප්‍රත්‍යෙක බුඩභාවසඞ්ඛ්‍යාත වෙනසක්වූ විකෘතිය ප්‍රකාශකරණ හෙයිනි.

කර්මයද කිසිතැනෙක ප්‍රකෘති විකෘති වශයෙන් සිටී-මහදගඳ කිළිකර යන තන්හි මහද යනු ප්‍රකෘතිකර්මයි-ප්‍රකෘති ද්‍රව්‍යවූ හෙයිනි-ගඳකිළි යනු විකෘතිකර්මයි-ගන්ධකුටිකාභාව සඞ්ඛ්‍යාත විශෙෂවූ විකෘතියක් ප්‍රකාශකරණ හෙයිනි-මේආදි නයින් ක්‍රියාකාරක පදසම්බන්ධය දැනගැන්ම ශබ්දශාස්ත්‍රාවබොධයෙහි ප්‍රධානයි.

**මෙ-කිරියකරුපෙද සබඳ අදියර, ක්‍රියාකාරකපද සම්බන්ධාධිකාරය දසවනු, දශමස්ථානික වේ.**



